ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

4 ඇසළ කෙළිය


ආහාර සුරක්ෂිතතාව 14
24 කෙසෙල් කොටුව


Pages 52 AUGUST 2016 Issue : 82 මාසික සංග්‍රහය. 2016 අගෝස්තු 82 කලාපය 50 ¢



අන්තර්ජාලයෙන් උපුටා ගත් ඡායාරූපයකි

# කැනඩා විදේශ ඇමති ශ්‍රී ලංකාවට යයි !

කැනඩාව සහ ශ්‍රී ලංකාව අතර පවතින රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගැනීම සඳහා කැනඩා විදේශ කටයුතු පිළිබඳ ඇමති ස්ටෙෆාන් ඩියොන් තෙදින නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට ගොස් තිබුණි. ශ්‍රී ලංකා රජයේ ආරාධනයකට අනුව ජූලි 27 වෙනි දින එහි ගිය මෙරට විදේශ අමාත්‍යවරයා දෙරට අතර වෙළඳ, ආර්ථික හා දේශපාලන වැනි අංශ රැසක් සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබුණි.

වසර 13 කට පසු කැනඩා විදේශ අමාත්‍යවරයකු ශ්‍රී ලංකාව වෙත ගිය පළමු අවස්ථාව මෙය බව සඳහන් වන අතර ඒ මහතා ශ්‍රී ලංකාවේ රැඳී සිටි කාලය තුළ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අගමැති රනිල් වික්‍රමසිංහ, විපක්ෂ නායක ආර්. සම්බන්ධන් වැනි ප්‍රධාන පෙළේ දේශපාලන නායකින් මුණ ගැසීමට කටයුතු කර තිබුණි.

ශ්‍රී ලංකා විදේශ අමාත්‍යාංශයේ පැවති විශේෂ හමුවකදී, ශ්‍රී ලංකාව හා කැනඩාව අතර පවතින සබඳතාව කැනඩා විදේශ ඇමතිවරයා විසින් හඳුන්වා දී තිබුණේ 'දෙරටේ ජනතාව අතර පවතින බැඳීමක්' ලෙසයි. කැනඩාව තුළ ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවක් ජීවත් වන බවත් එම ජන කොටස කැනඩාවේ සංවර්ධනයට මෙන්ම සංස්කෘතික විවිධත්වය සඳහා විශාල දායකත්වයක් දක්වන බවත් විදේශ ඇමතිවරයා විශේෂයෙන්ම සඳහන් කොට තිබුණි. කැනඩාවේ ජීවත් වන ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව පිළිබඳව අදහස් දැක්වූ ඔහු පවසා තිබුණේ, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව හැරුණු කොට විශාලතම ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාවකට නිවහන වී ඇත්තේ කැනඩාව බවයි.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කටයුතු සිදුවන ආකාරය හා සංහිඳියා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවද මෙහිදී කැනඩා විදේශ ඇමතිවරයා අදහස් පළ කොට තිබුණි. ඒ පිළිබඳව ඔහු පවසා තිබුණේ, ශ්‍රී ලංකාවේ සංහිඳියාව ඇතිකර ගැනීම සඳහා රට තුළ පවතින රාජ්‍ය භාෂා

8 වන පිටුව බලන්න

# ටොරොන්ටෝ සහ වැන්කූවර් නිවාස වෙළඳපොළ

වර්තමානයේ ටොරොන්ටෝ සහ වැන්කූවර් හි පවතින නිවාස මිල ගණන් ඉහළ යෑම අනාගතයේදී ගැටලුකාරී තත්ත්ව රැසක පෙර නිමිත්තක් බව කැනඩා උකස් හා නිවාස කටයුතු පිළිබඳ සංස්ථාව (CMHC) පවසා සිටියි.

වැන්කූවර් නිවාස වෙළඳපොළ තුළ ඇති ගැටලු සහගත තත්ත්වය පිළිබඳව ප්‍රබල සාක්ෂි ඇතුළත් වාර්තාවක් පසුගියදා එම පළාතේ නිවාස කේන්ද්‍රය විසින් නිකුත් කරනු ලැබූ අතර ඒ සමගම කැනඩාවේ ජාතික නිවාස ඒජන්සියද මේ සම්බන්ධයෙන් අනතුරු හැඟවීම් නිකුත් කරනු ලැබ ඇත.

8 වන පිටුව බලන්න

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative
RE/MAX Diamond

Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

Committed To Turning Your Dream Home Into Reality
Century 21
Percy Fulton Ltd.
Brokerage
(DISSA) Dissanayake Danapala Mudiyanselage
Sales Representative

Cell: 416 697 9925
Office: 416 298 8200
dissahomes@gmail.com
2911 Kennedy Rd, Scarborough, ON M1V 1S8

තිසල් මුදල් හුවමාරුව
THISAL BUSINESS SERVICES INC
විශ්වාසවන්ත හා සුහදශීලී සේවයක් සමගින් ශ්‍රී ලංකාවට මුදල් යැවීමට පහසු මගක්
Registered office:
1315 Lawrence Ave. E, Suit #509 Toronto, ON, M3A 3R3
Tel: 416 546 4488
CASH

JOBS JOBS JOBS
TEAM LEASE
FULL TIME ALL shifts available
WE ARE LOOKING FOR
General Helpers, Forklift Operators and many more positions in the Etobicoke, North York, Aurora, Scarborough and Vaughan area.
Please call : 905 266 0973
Or come in Mon - Fri 8.30 am - 5.30 pm
4000 Steeles Ave. W Unit # 27
Woodbridge, L4L 4V9

# 2016 ඔසක වරුණි



## කැනඩා සිංහල සංගමය සංවිධානය කරනු ලබන

# සිංහල සාහිත්‍යය හා සංස්කෘතික උත්සවය

**කැනඩාවේ වෙසෙන සිංහල භාෂක සමාජය වෙනුවෙන් කැනඩා සිංහල සංගමය විසින් සංවිධානය කරනු ලබන සිංහල සාහිත්‍ය හා සංස්කෘතික උත්සවය සාහිත්‍ය මාසයට සමගාමීව 2016 ඔක්තෝබර් 22 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.**

**එම විචිත්‍රවත් උත්සවයේ එක් ප්‍රධාන අංගයක් ලෙස සිංහල සාහිත්‍යය හා භාෂාව මුල් කොට ගත් තරඟාවලියක් සංවිධානය කෙරෙන අතර සිංහල සාහිත්‍ය නිර්මාණකරණයට උනන්දුවක් දක්වන කැනඩාවේ වෙසෙන ඕනෑම අයෙකුට මෙම තරඟාවලියට ඉදිරිපත් විය හැක.**

## සිංහල සාහිත්‍යය හා භාෂා තරඟාවලිය

### පද්‍ය, ගද්‍ය හා කෙටිකතා තරඟය

පද්‍ය රචනා තරඟය සඳහා තමන් කැමති ආකාරයකින් නිර්මාණය කරනු ලබන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය. ගද්‍ය රචනා තරඟය සඳහා නිර්මාණ පහත දී ඇති මාතෘකාවලට අනුව ඉදිරිපත් කළ යුතුය. කෙටිකතා තරඟය සඳහා තමන් කැමති ස්වතන්ත්‍ර කෙටිකතා නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

### ජන ගායනා හා පද්‍ය ගායනා තරඟය

විරිඳු, පැල් කවි, ගොයම් කවි, කරත්ත කවි, පාරු කවි, නෙලුම් කවි, ජන ගී, ජන කාව්‍ය (යසෝදරාවත, වෙස්සන්තර කාව්‍ය, තුන්සරණ ආදි) පැරණි ප්‍රශස්ති ගී, ජන නාටක ගී ආදි කවර හෝ සිංහල ජන ගායනාවක් විනාඩි 03 කට නොවැඩි වන සේ සංගීත වාදනයෙන් තොරව විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ ගායනා කළ යුතුය. තරඟ කරුවන් අගෝස්තු 31 දිනට පෙර අයදුම් කළ යුතු අතර සැප්තැම්බර් මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත.

### කථික තරඟය

තරඟ කරුවන් අගෝස්තු 31 වෙනි දිනට පෙර අයදුම් කළ යුතු අතර සැප්තැම්බර් මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත. විනිශ්චය මණ්ඩලය විසින් ලබාදෙන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන ක්ෂණික කතාවක් ඉදිරිපත් කළ යුතුය. වයස අවුරුදු 20 න් ඉහළ කථික තරඟය සඳහා අදාළ මාතෘකා අයදුම්පත් ලැබුණු පසු තරඟකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

### තරඟ කොන්දේසි

- එක් අයෙකුට ඉදිරිපත් විය හැක්කේ උපරිම වශයෙන් තරඟ දෙකකට පමණි. එක් තරඟ කාණ්ඩයකට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- එක් එක් තරඟය සඳහා වෙන වෙනම අයදුම්පත් ඒ සමග අමුණා එවිය යුතුයි.
- සියලුම අයදුම්කරුවන් 2016 අගෝස්තු 31 වෙනි දිනට අදාළ වයස් කාණ්ඩයේ වයස සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙහි දක්වා ඇති වගුවට අනුව ඔබ තෝරාගන්නා තරඟ අංකයට අදාළව අයදුම් පත්‍රය පුරවා ඔබගේ නිර්මාණය සමග 2016 සැප්තැම්බර් මස 15 වෙනි දිනට පෙර සිංහල සංගමය වෙත ලැබෙන්නට සලස්වන්න. කථික තරඟ සහ ජන ගායනා සඳහා ඉදිරිපත් වන්නන් අගෝස්තු මස 31 වෙනි දිනට පෙර අයදුම් පත්‍ර සිංහල සංගමය වෙත යොමු කරන්න.
- ඔබ සම්බන්ධ වී සිටින සිංහල භාෂා පන්තිය, ප්‍රජා සංවිධානය, දහම් පාසල, ආදි ශිෂ්‍ය සංගමය, ආගමික සිද්ධස්ථානය, ප්‍රජා සංවිධානය මගින් මෙන්ම පෞද්ගලිකවද තරඟ සඳහා ඉදිරිපත් විය හැක.

| තරඟ ඉසව් අංකය | වයස් සීමාව | අදාළ තරඟය | ගද්‍ය රචනා මාතෘකා | ගද්‍ය රචනා වචන ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | අවුරුදු 6 - 8 | පද්‍ය ගායනා තරඟය<br>කථික තරඟය | | |
| 2 | අවුරුදු 9 - 11 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය | මගේ අම්මා | වචන 250 කට නොවැඩි රචනාවක් |
| 3 | අවුරුදු 12 - 15 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | මා දුටු කැනඩාව | වචන 500 කට නොවැඩි රචනාවක් |
| 4 | අවුරුදු 16 - 19 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | පරිසර සංරක්ෂණය හා මානව ප්‍රගතිය | වචන 750 කට නොවැඩි රචනාවක් |
| 5 | අවුරුදු 20 න් ඉහළ | කථික තරඟය<br>ජන ගායනා තරඟය<br>කෙටිකතා තරඟය | | |

- ඔබගේ නිර්මාණ තැපැල් මගින් මෙන්ම ඊ-මේල් මගින්ද එවිය හැකි අතර අදාළ ලිපිනයන් පහත දක්වා ඇත. තැපැල් මගින් එවීමේදී ලියුම් කවරයේ වම් උඩු කෙළවරේ අදාළ තරඟයේ නම සහ අංකය සඳහන් කරන්න.
- නිර්මාණ සමග සම්පූර්ණ කර එවිය යුතු අයදුම්පත්‍රය කැනඩා සිංහල සංගමයේ ෆේස්බුක් අඩවියට පිවිස ඔබට ලබාගත හැක.

**www.facebook.com/CanadaSinhalaAssociation**

**නිර්මාණ යොමු කළ යුතු තැපැල් ලිපිනය -**

The Secretary, Sinhalese Association of Canada
102-5 Richgrove Drive, Toronto. On. M9R 0A3

**Email** - sinhala.sangamaya@gmail.com

**ප්‍රශස්ත මට්ටමේ කෙටිකතා පොතක් ලෙස මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වේ.**

**විස්තර සඳහා විමසන්න**

**ගාමිණී අබේසිංහ - 416 822 2789**
**යසන්ත නවරත්න - 416 522 5325**
**අනුර රණවීර - 416 720 2386**

**සිංහල සාහිත්‍ය උළෙල සහ සංස්කෘතික සංදර්ශනය**

**2016 ඔක්තෝබර් 22 වන සෙනසුරාදා දොන් බොස්කෝ රඟහලේදී පැවැත්වේ.**

**www.facebook.com/CanadaSinhalaAssociation**

**තරඟවලට අදාළ අයදුම්පත්‍රය සඳහා 48 වන පිටුව බලන්න.**

# ආදායමට සරිලන නිවෙස්...!

දිනෙන් දින ඉහළ යන නිවාස මිල ගණන් නිසා ටොරොන්ටෝව තුළ නිවසක් මිල දී ගැනීම කෙසේ වෙතත් කුලියට ගැනීම පවා අසීරු වන ලකුණු පහළ වෙමින් පවතී. මෙයට විසඳුමක් ලෙස ආදායමට සරිලන ආකාරයේ නිවාස ඉදිකිරීම සඳහා නිවාස ඉදිකිරීම් සංවර්ධන කටයුතු සිදුකරන්නන් දිරිමත් කිරීමේ වැඩසටහන් මේ වන විට ටොරොන්ටෝවේ ක්‍රියාත්මක කරමින් පවතී.

දැරිය හැකි නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉදිරි පස් වසර තුළ ටොරොන්ටෝව ඩොලර් මිලියන 272 කට වඩා වැය කිරීමට අදහස් කර ඇති අතර මේ සඳහා කඩිනම් වැඩ පිළිවෙළවල්ද සූදානම් කර ඇත. ඒ යටතේ ගොඩනැගිලි අනුමැතිය, සංවර්ධන ගාස්තු නිදහස් කිරීම සහ දේපළ බදු විරාම ඇති කිරීම වේගවත් ආකාරයෙන් සිදුකෙරෙනු ඇත.

"මෙය නගරයේ පැවැත්ම සහ ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කළ යුතුම දෙයක්. නමුත් එය විශාල කටයුත්තක්" යි ටොරොන්ටෝ නගර සභා මන්ත්‍රිනි ඇනා බේලෝ මේ පිළිබඳව අදහස් දක්වමින් පවසා තිබුණි.

වසර 10 ක ඉලක්කගත වැඩ පිළිවෙළක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය තුළදී 2020 වසර වන විට දැරිය හැකි මිල ගණන් සහිත කුලී නිවාස 10,000 කුත් තමන්ටම මිල දී ගත හැකි නිවාස 3,000 කුත් නගරවැසියන් වෙත ලබාදීමට අදහස් කෙරේ.

ටොරොන්ටෝ නාගරික සීමාව තුළ affordable housing වැඩසටහන එලෙස ක්‍රියාත්මක වෙද්දී ඔන්ටේරියෝ පළාත තුළ affordable housing සඳහා ඇති ඉල්ලුමද දිනෙන් දින ඉහළ යමින් පවතී. පසුගිය වසර වන විට ඔන්ටේරියෝ වැසියන් 171,360 ක පිරිසක් ඒ සඳහා වන පොරොත්තු ලේඛනයන්හි පෙළ ගැසී සිටින බව සඳහන් වේ. මෙය ඔන්ටේරියෝ රජය බලාපොරොත්තු වූවාට වඩා කිහිප ගුණයක වැඩිවීමක් බැවින් මෙම පොරොත්තු ලේඛනයෙහි ඇති නිවාස ඉල්ලුමට අවශ්‍ය සැපයුම ලබා දීම මේ වන විට දැඩි අභියෝගයක් වී ඇත.

# පාරෙ යන ගමන් හලෝ තහනම්....?

ජංගම දුරකථන ක්‍රීඩකයනි, මැසේජස් ලෝලියනි, ඉන්ස්ටර්ග්‍රෑම්, ට්විටර්, ෆේස්බුක් වැසියනි ප්‍රවේසමෙන්. ඔබද අන් අයද අනතුරේ දමන මහමඟ ජංගම දුරකථන සෙල්ලම් ටොරොන්ටෝ නගර සභාව විසින් තහනම් කිරීම සඳහා නීති ක්‍රියාත්මක කිරීමට මේ දිනවල අවධානය යොමුකර ඇත.

නාගරික මාර්ග ආරක්ෂණ සැලසුම් පිළිබඳව ටොරොන්ටෝ නගර සභාව තුළ පසුගියදා පැවති දීර්ඝ විවාදයක් අවසාන වූයේ මේ සඳහා මෝසමක් සම්මත කර ගැනීමෙනි. ඇතැම් නාගරික මන්ත්‍රීවරුන්ගේ සිනා මධ්‍යයයේ සම්මත වුණු මේ මෝසමෙන්, ටොරොන්ටෝ නාගරික සීමාව තුළ ජංගම දුරකථන භාවිත කරන පදිකයින්ට තහනම් නියෝග පැනවීමේ අවකාශයන් පිළිබඳව නිල වශයෙන් සොයා බැලෙනු ඇත.

නගරසභා විසින් ගෙන එනු ලැබූ මෙම නව සංශෝධනය ඔන්ටේරියෝ ප්‍රවාහන අමාත්‍යවරයාගේ අවධානයට යොමු කිරීමට නියමිතව ඇත. එහිදී 'ඕනෑම මාර්ගයක ගමන් ගන්නා අවස්ථාවකදී රැහැන් රහිත සන්නිවේදන උපකරණයක් හෝ අතේ ගෙන යා හැකි ඉලෙක්ට්‍රොනික උපාංගයන් භාවිතය තහනම් කිරීම' මහා මාර්ග රථවාහන පනතට ඇතුළත් කිරීම පිළිබඳව විමසා බැලෙනු ඇත.

ටොරොන්ටෝ මාර්ග අනතුරුවලින් බහුතරයක් ජංගම දුරකථන හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංග භාවිතය නිසා සිදුවන ඒවා බවද විශේෂයෙන්ම ඉයර්ෆෝන් ආදිය පැළඳ ඊට අවධානය යොමුකරගෙන යාම නිසා අනතුරු බහුල වී ඇති බවද ඔන්ටේරියෝ ප්‍රධාන හදිසි මරණ පරීක්ෂකවරයා පවසා සිටී.

ටොරොන්ටෝ මාර්ග ආරක්ෂණ සැලසුම් වෙනුවෙන් ඉදිරි වසර 5 ක කාලය සඳහා නගරසභාව විසින් ඩොලර් මිලියන 80 ක් වෙන් කිරීමට කටයුතු යොදා ඇති අතර එහිදී මහාමාර්ගවල සිදුවන මාරාන්තික අනතුරු අවම කිරීමට ප්‍රධාන වශයෙන් අවධානය යොමු කිරීමට අදහස් කොට ඇත. විශේෂයෙන්ම ටොරොන්ටෝ ඩවුන්ටවුන් මධ්‍යයේ ඇති ප්‍රධාන මාර්ගයන් කිහිපයකම වේග සීමාවන් අඩු කිරීමේ අවකාශයන් පිළිබඳව මෙහිදී සොයා බැලෙන අතර ප්‍රධාන හරස්මාර්ග හුවමාරුවල පදිකයන්ට මෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ටද විශේෂිත ආරක්ෂිත කලාප ඇති කිරීමටද යෝජනා සම්මත වී ඇත.

# හතර රියනත් අහිමි වන ලකුණු ?

දිනෙන් දින වැඩිවන ජනගහනයත් සමගම ජීවත්ව සිටින අයටත් ඉදුම් හිටුම් සැපයීම ගැටලු සහගත වී ඇති වටාපිටාවක අන්තිම නින්දට පිවිසියන් පිළිබඳ කුමන කතාද?

මිය යාමෙන් පසු සමාදානයේ සැතපීම සඳහා ටොරොන්ටෝවේ සුසාන භූමියක හතර රියනක් සොයා ගැනීමට නොහැකි තත්ත්වයක් නුදුරු අනාගතයේදී මතුවිය හැකි බව ටොරොන්ටෝ නගරසභා කවුන්සිලර් ජස්ටින් ඩි. සියානෝ පසුගියදා අනතුරු ඇඟවා තිබුණි.

මිය යන්නවුන්ගේ අවසන් අයිතිය සම්බන්ධයෙන් අනාගතයේදී ඇතිවිය හැකි මේ තදබදය වැළැක්වීම සඳහා නගරසභාව දැන් සිටම සැලසුම් සහගතව කටයුතු කළ යුතු බව ඔහු පෙන්වා දේ. ඒ සඳහා දැනට පවතින සුසානභූමිවල ඉතිරිව පවතින ඉඩකඩ පිළිබඳව නිසි තක්සේරුවක් කළ යුතු බවට වූ යෝජනාවක් ටොරොන්ටෝ නගර සභාව වෙත ගෙන ඒමට කටයුතු සකස් කර ඇත.

පසුගිය ශීත සෘතුවේදී යෝර්ක් ප්‍රදේශයේ සුසානභූමිවල ඉතිරිව ඇති ඉඩකඩ සම්බන්ධයෙන් මෙවැනි ගණනයක් ක්‍රියාත්මක කර ඇති අතර ටොරොන්ටෝව තුළත් එය දැඩි අත්‍යවශ්‍ය කටයුත්තක් බව කවුන්සිලවරයා පෙන්වා දේ.

මේ වන විටත් ටොරොන්ටෝ අවට ප්‍රදේශ 905 ක සුසානභූමි ඉඩම්වල දැඩි තදබදයක් පවතී. වර්තමානයේදී නගරයේ සිදුවන මරණ අනුපාතිකය පිළිබඳ අධ්‍යයනයක් කර ඇති නාගරික සැලසුම් ශිල්පිනි නිකොල් හැන්සන් පවසන්නේ, ටොරොන්ටෝව කඩිනමින් මේ සම්බන්ධව නිසි කළමණාකරණ සැලසුම් සකස් නොකළහොත් ඉදිරි වසර 10-15 තුළදී සුසානභූමි තුළ පවතින තදබදය අවම කිරීම කෙසේවත් කළ නොහැකි වනු ඇති බවයි. 'නගරය තුළ ජනගහනය වැඩි වුණාට මෙහි ඉඩම් ප්‍රසාරණය වන්නේ නෑ. එය තේරුම් ගෙන ඊට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග ගත යුතුයි' යි ඇය පවසයි. සුසානභූමිවල බිම් අයිතීන් එක් එක් පවුල්වල 'පවුලේ සුසානභූමි' ලෙස වෙන් වී තිබීමද මළවුන්ගේ ඉඩකඩ සීමිත වීමට බලපා ඇති ප්‍රධාන හේතුවක් බව නිකොල් හැන්සන් පවසයි. මිනී වළවල් වෙළඳාමද දැන් හුදෙක් දේපළ වෙළඳාමක ලක්ෂණ ගෙන ඇති බවත් නගරයේ මිනී වළවල් මිලෙන් අධික වන විට තම මිනී වල නගරයෙන් බැහැර මිල අඩු සොහොන් පිට්වලින් සොයාගෙන යෑමට ජනතාවට සිදුවී ඇති බවත් ඇය පවසයි. ටොරොන්ටෝ මිනී වළවල්වල මිල ඉහළ යෑමත් සමග අද බොහෝ නාගරිකයන් තම ළබැඳියන්ගේ මළ සිරුරු වළ දැමීමට වඩා දවාලීමට හුරුවී ඇති බවද ඇය පෙන්වා දේ.

තම සමාගම සතු සුසානභූමිවලද ඉඩකඩ සීමිත වෙමින් පවතින නමුත් සුසානභූමි හයක තවමත් යම්කිසි ඉඩ පහසුකම් ඇති බවත් ParkLawn සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා මේ පිළිබඳව අදහස් දක්වමින් පවසා සිටී. එහෙත් ටොරොන්ටෝ සුසානභූමිවල ඉඩ අවකාශ පිරිහෙමින් පවතින බවට කිසිදු සැකයක් නොමැති බව ඔහුද පිළිගනියි.

ටොරොන්ටෝවේ ඉඩම් පරිහරණ සැලසුම්කරණයේදී සුසානභූමි පිළිබඳව සැලකිල්ල යොමු නොකිරීම නිසා මෙවැනි අර්බුදයක් පැන නැගී ඇති බවත් අලුතින් සුසානභූමි ඉදිකිරීමට හෝ පවතින සුසානභූමිවල ඉඩකඩ වැඩිකිරීමට හෝ ඉඩම් ලබාදීමට ටොරොන්ටෝව අපොහොසත් බවත් ක්‍රම සහ සම්පාදන උපදේශක මයිකල් ලර්කින් පවසයි.

# Pokémon Go උමතුව

ඉන්ස්ෆිල් ඔන්ටේරියෝහි වාහන නැවතුම් අංගනයක සිට Pokémon Go ස්මාර්ට් ෆෝන් ක්‍රීඩාවේ නියැළුණු කාන්තාවක් පසුගියදා රථයක ගැටී තිබුණි. පසුව සොයා බැලීමේදී හෙළිදරව් වූයේ මේ රිය පදවාගෙන ආ රියදුරාද රිය පදවන අතර සිය ස්මාර්ට් ෆෝනයෙන් Pokémon Go ක්‍රීඩාවේ නිරතව පැමිණ ඇති බවය.

තමා රියක ගැටුණු බවට මේ කාන්තාව පොලිසියට දැනුම් දී ඇත්තේ අළුයම 2 කට පමණ බව ඉන්ස්ෆිල් පොලිසිය පවසයි. පොලිස් නිලධාරීන් විසින් ප්‍රශ්න කිරීමේදී ඇය පවසා ඇත්තේ රියදුරා එම අවස්ථාවේදී ජංගම දුරකථන ක්‍රීඩාවක නිරත වෙමින් රිය පැදවූ බවයි.

මෙම අනතුරින් කාන්තාවට කිසිදු තුවාලයක් සිදුවී නැති නිසා රියදුරුට චෝදනා එල්ල කළ නොහැකි බව පැවසූ පොලිසිය වීඩියෝ ක්‍රීඩාවල නිරත වන්නේ නම් අවට පිළිබඳව දැඩි සැලකිල්ල යොමු කරන ලෙස එම දෙපාර්ශ්වයටම අවවාද කර ඇත.

පොකෙමොන් ගෝ මේ වන විට කැනේඩියානු හමුදාවද ආක්‍රමණය කර ඇති අතර ක්‍රීඩාවේ යෙදෙන හමුදාවල සියලුම නිලයන්හි සාමාජිකයන් වෙත ඒ පිළිබඳව අනතුරු ඇඟවීමේ නිවේදනයක්ද නිකුත් කරනු ලැබ ඇත. හමුදාවට අයත් කිසිදු දේපළක් තුළ සිට පොකෙමොන් ගෝ ක්‍රීඩා කිරීමත් හමුදා නිල ඇඳුම සහිතව හමුදා දේපළ තුළ සිට හෝ පිටතකදී පොකෙමොන් ගෝ ක්‍රීඩාවේ යෙදීමත් පිළිබඳව මෙහිදී අනතුරු ඇඟවා ඇත.

පොකෙමොන් ගෝ නිකුත් වූ පළමු සතිය තුළම කැනඩාවේ හමුදා කඳවුරු තුනකින් සිදුවීම් වාර්තා වී තිබීම නිසා මෙවැනි අනතුරු ඇඟවීමක් කිරීමට සිදුවූ බව ඒ පිළිබඳව අදහස් දැක්වූ හමුදා ප්‍රකාශකයකු පවසා ඇත.

පොකෙමොන් ගෝ මේ වන විට ලෝකය පුරාම උමතුවක් මෙන් පැතිර යමින් පවතින අතර ඉවක් බවක් තැනක් නොතැනක් නොමැතිව එහි නියැළීම නිසා මරු වැළඳගත් අයද අනතුරු සිදුකරගත් අයද පිළිබඳව දිනෙන් දිනම වාර්තා වෙමින් පවතී.

# Pearson - අවිවේකයි

එලඹි ගිම්හාන නිවාඩුවත් සමගම ටොරොන්ටෝ පියර්සන් ගුවන් තොටුපොළ අතිශයින්ම කාර්යබහුල වී ඇති බව ගුවන් තොටුපොළආරංචි මාර්ග දක්වා සිටී. වසරේ වෙනත් කාල සමග සැසඳීමේදී ගිම්හානය කවදත් කාර්යබහුල වුවත් මෙවර එය ආසාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කරමින් ඉහළ ගොස් ඇතැයි සඳහන් වේ.

2015 වසර හා සංසන්දනය කිරීමේදී මේ වසරේදී දිනකට මගීන් 10,000 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි. මේ තත්ත්වය අනුව ගිම්හාන කාලය තුළ ගුවන් මගීන් මිලියන 9.6 ක් පමණ පියර්සන් ගුවන් තොටුපොළ හරහා ගුවන් ගතවිය හැකි බවට ඇස්තමේන්තුගත කොට ඇත.

මේ පිළිබඳව අදහස් දැක්වූ ගුවන් තොටුපොළ ප්‍රකාශිකාවක වූ සබීනා හනීෆා, "මෙවැනි තත්ත්වයකට ඔරොත්තු දෙන ආකාරයකට කටයුතු කිරීමේ අත්දැකීම් අප සතුයි. ඒ ගැන කිසිදු බියක් විය යුතු නැතැ" යි සඳහන් කරයි.

කෙසේ වෙතත් පියර්සන් හරහා ගුවන්ගත වීමට බලාපොරොත්තු වන සියලුම දෙනා මේ ගිම්හානයේදී ඒ පිළිබඳව සිය අවධානය යොමු කොට කාර්ය මණ්ඩලයට සහයෝගය දක්වන්නේ නම් එය සියල්ලන්ගේම පහසුව පිණිස හේතු විය හැකි බව ඇය පවසයි. "මේ විදියට ගුවන් මගීන් සංඛ්‍යාව වැඩිවීම නගරයේ ඉදිරි කටයුතු පිළිබඳ සුභ නිමිත්තක්" ඒ ඇයගේ අදහසයි.

ඔබත් මේ ගිම්හාන නිවාඩුවේ පියර්සන් ගුවන් තොටුපොළ හරහා යෑමට බලාපොරොත්තුවෙන් සිටී නම් ඔබගේ ගුවන් ගමන් මග පිළිබඳ පූර්ව පරීක්ෂාවක් සිදුකොට ගුවන් තොටුපොළ වෙත යන්න. ඇතැම් විට මෙවැනි දිනවල ගුවන් ගමන් වේලාවල් වෙනස් වීමට බොහෝ සෙයින් ඉඩ ඇති නිසා එවැනි පරීක්ෂාවක් කොට යෑමෙන් සිදුවිය හැකි පීඩාවන් අඩුකර ගත හැක. එසේම නිවසේ සිටම වෙකින් විය හැකි ගුවන් මගක යන්නේ නම් ඒ සඳහාද අවශ්‍ය කටයුතු සිදුකරගෙන ගුවන් තොටුපොළ වෙත යෑම ඉතාමත් ප්‍රායෝගික පහසුවක් වේ. එක්සත් ජනපද පර්යන්තය හරහා යන ගුවන් මගීන්ට මෙම වෙකින් පහසුකම නිවසේදී කළ නොහැකි නිසා පියර්සන් ගුවන් තොටුපොළෙහි ඒ සඳහා අවශ්‍ය ස්වයංක්‍රීය යන්ත්‍ර ප්‍රමාණය වැඩි කර ඇති අතර ආරක්ෂක හා රේගු කටයුතු සඳහාද වැඩි පහසුකම් සපයා ඇත.

මේ කරුණු කෙලෙස සපුරා ගියත් සාමාන්‍ය දිනකට වඩා වැඩි කාලයක් මේ දිනවල ගුවන් තොටුපොළේදී වැය කිරීමට සිදුවන බව ඔබ සිහිතබාගත යුත්තකි. මෙහිදී අභ්‍යන්තර ගුවන් මගීන්ට පැය 2 ක පමණ පමාවකටත් අන්තර්ජාතික ගුවන් මගීන්ට පැය 3 ක පමණ පමාවකටත් මුහුණ පෑමට සිදුවිය හැකි බව ගුවන් තොටුපොළ තොරතුරුවල සඳහන් වේ. මේ නිසා කුඩා දරුවන් හා මහලු, රෝගී තැනැත්තන් ගුවන් තොටුපොළට රැගෙන යාමේදී ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීම සුදුසු වේ.

# ඇසළ කෙළිය



**බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කරගත් පසු 1817 දී පැවැත්වූ පෙරහැර ගැන 'වෙල්ලස්ස දිසාව' විසින් කරන ලද මේ විස්තරය 1817 සැප්තැම්බර් මස 13 වන දින 'ලංකා ගැසට් පත්‍රයේ' පළ කොට තිබුණි.**

යථා පරිද්දෙන් නම් 'ඇසළ කෙළිය' යනුවෙන් හැඳින්විය යුතු මේ පෙරහැර විෂ්ණු දෙවියන්ගේ උත්පත්තිය සැමරීම උදෙසා ඉපැරණි කාලයේ සිටම පැවතෙන උත්සවයකි. එය ආරම්භ කෙරෙන්නේ දෙවියන් උපත ලද දිනයේය. එනම් ඇසළ මස අලුත් හඳ උදා වන දිනයේය. මේ උත්සවය පවත්වන්නේ විෂ්ණු දෙවියන් විසින් දෙවියන්ගේ පසමිතුරන් වූ අසුරයන් ජය ගැනීම සිහි කිරීමට බව ඇතැම් පැරණි ග්‍රන්ථයන්හි දැක්වේ.

පෙරහැර ආරම්භ කරන්නේ මෙසේය. පල දැරීමට පටන් නොගත්, කඳෙහි වට ප්‍රමාණය වියත් තුනක් පමණැති, ළපටි කොස් ගසක් වෙත සතර මහ දේවාලයට අයත් ජනයා යති. ගස අවට බිම පිරිසිදු කරන ඔවුහු දුම්මල අනුවාසනය කිරීමෙන් හා විශේෂයෙන් පිළියෙළ කරන ලද සඳුන් දිය ආලේප කිරීමෙන් ගස කැප කරති. තවද වැටි නවයකින් යුත් දල්වන ලද පහනක් ගස පාමුල පුදති. බුලත් කොළ නවයක් හා මල් ජාති නවයක් අසුනක් මත පිළියෙළ කර එය ද පූජා කරති. මේ සියල්ල නිම වූ ඉක්බිතිව දෙහි තවරා ස්නානය කිරීමෙන් පසු පිරිසිදු වස්ත්‍රයෙන් සැරසී පෙහෙවූ මහ දේවාලයේ පොරෝකාරයා, පොරවකින් ගස මුලින් මැ කපා දමයි. කඳ හරස් අතට සම කොටස් හතරකට කපා, දේවාල හතරට බෙදා දෙනු ලැබේ. කඳෙහි මුල් කොටස නාථ දේවාලයටද දෙවැනි කොටස මහ දේවාලයටද තෙවැනි කොටස කතරගම දේවාලයටද අග්ගිස්ස පත්තිනි දේවාලයටද අයත් වේ.

පංච තූර්ය නාදය මධ්‍යයෙහි ඒ ලී කොට නියමිත දේවාලය වෙත මහත් හරසරින් රැගෙන යේ. ඇසළ මස නව සඳ උදා වන දිනයේදී දේවාල බිමෙහි නියමිත ස්ථානයක එකී කොටස සිටවනු ලැබේ. උඩින් පියස්සකින්ද හාත්පසින් රෙදිවලින්ද අසුරනු ලබන ඒ ස්ථානය අවට ගොක්කොළ ඇද, මල් පලතුරු ආදිය එල්ලා අලංකාර ලෙස සරසනු ලැබේ. මෙසේ සිටුවා පිළියෙළ කරන ලද ලී කොට 'කප' නමින් හැඳින්වේ.

කප් සිටුවා සතර දිනක් ගතවන තුරු සෑම දිනකම උදේ සවස කපුරාලවරු තම තමන්ගේ දේවාලය කැප කර තිබෙන දෙවිවරුන්ට අයත් දුන්න හා ඊතල කප වටා වැඩම කරවති. ඒවා රැගෙන යන්නේ උඩින් වියන් සහිත කුඩ, කොඩි, සේසත්, තල්පත්, අවාන් යනාදියෙන් සමන්විත අලංකාර පෙරහැරකින් පංච තූර්ය නාදය මධ්‍යයෙහිය. දුන්න හා ඊතල දෙවියන් ලෙස සලකන ලද අතර ඒවා කප වටා ගෙනයෑම 'දෙවියන් වැඩමවීම' නම් වේ. පෙරහැර පවත්වනු ලබන පස්වැනි දිනයේදී කපුරාලවරු දුන්න හා ඊතල දොරටුව අභිමුඛයෙහි වූ වීදියට වැඩම කොට ගෙනවුත් ඇතකුගේ පිටෙහි පිළියෙළ කර තිබෙන රන්හිලියෙහි ඒවා තැන්පත් කරති. මේ අයුරින් දෙවිවරුන් සතරදෙනාගේ දුනු හා ඊතල රැගත් දේවාල හතරෙහි හස්තීහු මහ දේවාලය හා නාථ දේවාලය අතර පිහිටි ප්‍රධානයන් හා මහජනයා රැස්ව සිටි මළුවට දක්කාගෙන යනු ලැබෙති.

මේ වේලාවටම මාලිගාවේ භික්ෂූන් වහන්සේලා ධාතු කරඬුව වැඩම කොට ගෙනවුත් මාලිගාවේ දොරටුව අබියස සිට ඇතකු පිට සවිකර තිබූ රන්හිලිගෙයි තැන්පත් කරති. අනතුරුව සර්වඥ ධාතු වැඩම කොට තිබෙන දොරටුව අසලින් පෙරහැර ගමනාරම්භ කරයි.

## පෙරහැරෙහි සැකැස්ම මෙසේය.

- ගජනායක නිලමේ රැගත් රාජකීය හස්තියා
- කොඩිතුවක්කු ලේකම් හා ඔහු පිරිවරාගත් කොඩිතුවක්කු රැගත් කණ්ඩායම
- කොඩිතුවක්කු, අත් තුවක්කු හා කොඩි රැගත් හතර කෝරලයේ දිසාවට අයත් වැසියන් පිරිවරාගත්, ඒ දිසාවේ දිසාව හා සෙසු සුළු ප්‍රධානයෝ.
- හත් කෝරලයේ වැසියෝ
- ඌවේ වැසියෝ
- මාතලේ වැසියෝ
- සබරගමුවේ වැසියෝ
- වලපනේ වැසියෝ
- උඩපළාතේ වැසියෝ
- යක්ෂයන් නිරූපණය කරන සංකේත වශයෙන් රෙදිවලින් ආවරණය කර රැගෙන යන ලද බම්බු කැබලි හෝ රූප
- කරඬුව රැගත් මාලිගාවේ ඇතා, මාලිගාවේ සෙසු ඇතුන් හා පරිවාර ජනයා අනතුරුව එති. දියවඩන නිලමේට හා නානායක්කාර ලේකම්ට පෙරටුවැ යන මොවුහු කුඩ, කොඩි සේසත්, ධජ, පතාක, පලස් යනාදිය රැගෙන යති. පංච තූර්ය නාදය පැවැත්වෙන අතර නැට්ටුවෝ නටමින් යති.
- දුන්න හා ඊතල රැගත් දේවාලයට අයත් ස්ත්‍රීන් විසින් පිරිවරන ලද නාථ දේවාලයේ හස්තියා, පූර්ව අංගයේදී මෙන් පරිවාර ජනයා පිරිවරාගත් බස්නායක නිලමේ ඉක්බිතිව ගමන් ගනී.
- පිළිවෙළින් මහා විෂ්ණු දේවාලයේ, කතරගම දේවාලයේ, පත්තිනි දේවාලයේ හස්තියා, දුන්න හා ඊතල සහ පරිවාර ජනයා
- තම ප්‍රධානයන්ට පෙරටුවැ තුවක්කු, ධජ පතාක යනාදිය රැගෙන ගිය මහ ලේකම් බද්දේ ජනයා
- පෙර පරිදි උපකරණ රැගත් අතපත්තු කාර්යාංශයේ ජනයා, අතපත්තු ලේකම් හා උඩුනුවර, යටිනුවර, තුම්පනේ, හාරිස්පත්තුවේ, දුම්බර, හේවාහැට යන මේ ප්‍රදේශවල රටේ මහත්වරු අනතුරුව ගමන් ගනිති.
- වෙඩික්කාර කාර්යාංශයේ ජනයා හා ඉක්බිතිව එහි ලේකම්
- තම ලේකම් කැටිව වඩනතුවක්කු කාර්යාංශයේ ජනයා
- තම ලේකම්වරුන් සමඟ පඩිකාර කාර්යාංශයේ ජනයා

පෙරහැර පවත්වනු ලබන සවැනි දිනයේදී පවත්වන්නා වූ ඉහත දැක්වූ උත්සවය පස් දිනක් මුළුල්ලේ පැවැත්වේ. සැන්දෑ වරුවේ හා රාත්‍රියේ හත්වන පැයේදී පැවැත්වෙන පෙරහැර සිව්මහ වීදි ඔස්සේ ගමන් ගනී. රාත්‍රි පෙරහැරට කරඬුව වැඩම කරවන්නේ නැත.

කීර්ති ශ්‍රී රාජසිංහ සමය වනතෙක්මැ ධාතු කරඬුව පෙරහැරේ වැඩම නොකරන ලදී. සියමෙන් පැමිණ සිටි භික්ෂූන්වහන්සේලා කීපනමක් සිටි බැවින් සැන්දෑ පෙරහැරට කරඬුවද වැඩම කරන ලෙස රජතුමා අණ කළේය. මෙකී නව විධානයට හේතු වශයෙන් රජතුමා දැක්වූයේ එසේ කිරීමෙන් ඒ උත්සවය දෙවියන්ට මෙන්ම බුදුන් වහන්සේටද ගෞරව පිණිස පැවැත්වෙන්නක් වන බවය.

ඉහත සඳහන් දින පහේදී පෙරහැරට සහභාගි වන විවිධ කොටස්වලට ඒ ඒ දිනයේ ප්‍රමුඛත්වය අනුපිළිවෙළින් ලැබේ.

මේ දින පහ ඉකුත් වූ පසු පෙරහැරෙහිම අනිවාර්ය අංගයක් ලෙස සැලකෙන 'රන්දෝලි බෙයිම' නමින් හැඳින්වෙන තවත් උත්සවයක් දින පහක් මුළුල්ලේ පැවැත්වේ. මෙය ආරම්භ වන්නේ 'දෝලා' දේවාලවලැ සිට වැඩම කිරීමෙනි. රන්දෝලි තුළ ඒ ඒ දේවිය උදෙසා පෙර පරිද්දෙන්ම කැප කරන ලද රන් කෙණ්ඩියක් හා කඩුවක් ඇත. මේ රන්දෝලි සැන්ඳෑ දවල් පෙරහැරෙහි අංගයකි. මේවා මිනිසුන් විසින් ඔසවාගෙන යයි. උත්සවයේ මුල් අවස්ථාවලටද සහභාගි වූ දේවාලවලට අයත් ස්ත්‍රීහු ආවතේවය සඳහා මෙයටද සහභාගි වෙති. පෙර පරිදි සියලුම ගරුසරු ඇතිව මේ පෙරහැරද පැවැත්වේ. රජ කාලයේදී නම් රජතුමා විසින් ප්‍රදානය කරන ලද රාජකීය වස්ත්‍රාභරණයෙන් සැරසුණු ප්‍රධානයන්ගේ දියණිවරු හා තරුණ භාර්යාවෝ එකී එකී දේවියගේ රන්දෝලිය කැටිව වාරයෙන් වාරය පෙරහැරෙහි ගමන් ගත්හ.

මේ උත්සවයේ සමාරම්භයේ පටන් රජක හා බඩහැල කුලවලට අයත් ස්ත්‍රීපුරුෂ දෙපක්ෂයේම අය ආවතේවය සඳහා පැමිණියහ. පූර්ව කුලයට අයත් පිරිමින්, සායම් කරන ලද ලී කැබැලි තම කිසිලි අස්සේ රුවාගෙන ගිය අතර කුලිකයෝ පොල් මල් ගසා සරසන ලද මැටි බඳුන් රැගෙන ගියහ. මේ උත්සවය පැවැත්වෙන සෑම දිනකදීම ප්‍රධාන පස් දිසාවලට අයත් පදු කුලිකයෝ ලොකු උණ බම්බු කැබැලි පහක් රැගෙන යති.

මේ අයුරින් පෙරහැර ඇසළ මහ පුර පසළොස්වක දිනය වනතුරු නොකඩවා පැවැත්වේ. පුර පසළොස්වක දින රාත්‍රියේදී පමණක් කරඬුව පෙරහැරෙහි වැඩම කරවනු ලැබේ.

පෙරහැර අවසන් වූ විගසම කරඬුව අස්ගිරි විහාරයෙහි තැන්පත් කෙරේ. රන්දෝලි සහ දුනු ඊතල නියමිත දේවාල වෙත ආපසු රැගෙන යනු ලැබේ. ඉක්බිතිව, බත්, ව්‍යඤ්ජන, කැවුම් යනාදී ආහාරපාන වර්ග දේවාලයෙහි වූ දේව රූප ඉදිරියේ පූජා කරනු ලැබේ. මේ පූජාවෙන් පසුව දුනු ඊතල හා රන්දෝලි යනාදිය රැගෙන නැවත ගමනාරම්භ කරන පෙරහැර ගැටඹේ හෝ ගන්නෝරුව හෝ අසලදී ගඟට සම්ප්‍රාප්ත වෙයි.

විසිතුරු ලෙස සරසන ලද ඔරුවක් ගං ඉවුරේ සූදානම් කර ඇත. දේවාලවල කපුරාලවරු ඉහළට මඳ දුරක් යති. ඔවුහු දේවීන් වහන්සේලාගේ කඩු හා පැන් කෙණ්ඩිද රැගෙන යති. අරුණෝදයේදී ළහිරු රැස් පතිත වත්මැ කපුරාලවරු කඩුවෙන් දිය දෙබෑ කරති. එකෙණෙහිම අනෙක් අය ගත වූ වර්ෂයේදී පුරවාගත් පැන් ඉවත ලා කඩුව ගැටුන ස්ථානයේ ජලයෙන් කෙණ්ඩි නැවත පුරවා ගනිති.

මෙය නිම වූ පසු ඔවුහු ගොඩ වෙති. ජල කෙණ්ඩි හා කඩු රන්දෝලිවලැ නැවත තැන්පත් කිරීමෙන් පසුව ඔවුහු පෙරහැරින් ආපසු නගරයට පැමිණෙති. ඔවුන් මෙසේ ආපසු එන්නේ උදය පෙරහැර ආරම්භ කිරීමෙන් පසුව පැමිණි සොළොස් වන දින උදෑසන වේ. ගඟට ගිය පෙරහැර සමඟ ගමන් නොකළ අදිකාරම්වරු දෙදෙන හා සෙසු ප්‍රධානයෝ පෙරහැර පෙරළා පැමිණෙන විට කුමාර කපුව අසලදී එයට එකතු වී අස්ගිරි විහාරයට යති. අස්ගිරි විහාරයේදී කරඬුව නැවත වැඩම කරවාගෙන පෙරහැර මුලින්ම පටන් ගත් තැනට, එනම් මළුවට පෙරහැර යළි පැමිණේ. එතැන් සිට ඒ ඒ කණ්ඩායම තම තමන්ට නියමිත දේවාල වෙත පෙරළා යන අතර කරඬුව දළදා මාලිගාවට ආපසු වැඩම කරවාගෙන යනු ලැබේ. උත්සවය මෙයින් සමාප්ත වේ.

රන්දෝලි පෙරහැර පවත්වන දින පහේදීම, පෙරහැර අවසන් වූ පසු දේවාල හතරේ කපුරාලවරු මඟුල් මඩුවට පැමිණ මංගල අෂ්ඨක ගායනා කරති. දෙවියන්ගේ ගුණ ගැයීමෙන් පසුව රජතුමා ආරක්ෂා කර සියලුම යස ඉසුරු ළඟා කර දෙන මෙන් දෙවියන්ගෙන් අයදිති. මඟුල් මඩුවේදී ලබාගත් මල්දම්ද රැගෙන පෙරළා සිය දේවාලවලට යන ඔවුහු ඒ මල්දම්වලින් දේව රූප සරසති.

දිය කැපීමේ උත්සවයට අනතුරුව එළඹෙන සත්දින මුළුල්ලේ බෙරවා කුලිකයෝ සතර දේවාලයෙහිදී වල්ලි යකුන් නටති. වෙස් මුහුණු පැළඳගත් මෙකී නැට්ටුක්කාරයෝ බෙර තාලයට නටති.

මේ නැටුම් අවසන් වූ පසු තව සත් දිනක් මුළුල්ලේ බලිබත් කුලයට අයත් වූවෝ, ගොඩවල් වශයෙන් පිළියෙළ කරන ලද පිසූ බත්, එළවළු, ව්‍යඤ්ජන, කැවුම්, පලතුරු ආදිය වටා නටති. නැටුමෙන් පසුව ඔවුහු ඒ ආහාර අනුභව කරති. දහහතර දිනක් ගත වී සියලුම නැටීම් අවසන් වූ පසු ඉහතින් කළ විස්තරය අනුව දේවාල භූමියේ සිටුවන ලද 'කප' උගුළුවා, ධජ පතාක හා පංච තූර්ය නාදයෙන් යුත් පෙරහැරකින් ගඟට ගෙන ගොස් දියඹට විසි කරනු ලැබේ. දිය කපන දිනයේදී අගනා වස්ත්‍ර මිටි හතරක්, රන් රිදී කාසි සහ හඳුන් දර කැබලිද

**20 වන පිටුව බලන්න**

# මාගම්පුරයට කර්මාන්ත පුරයක් !

පසුගිය කාලෙ හම්බන්තොට මාගම්පුර වරාය ගැන කියවුණු බොහෝ තැන්වල 150 ගැනත් කියවුණා. දැන් ආයෙත් මාගම්පුර වරායත් සමග 150 ක කතාවක් කරළියට ඇවිත්.

මාගම්පුර වරාය හා 150 ගැන පසුගිය කාලෙ සඳහන් වුණේ, 2010 අගෝස්තු 15 වැනිදා මෙම වරාය විවෘත කිරීමේ උත්සවයේ නැටුම් ගැයුම් වෙනුවෙන් රුපියල් ලක්ෂ 150 ක් ගෙවා තිබූ සිද්ධියක් මුල් කරගෙනයි.

ඒත් මෙවර 150, වරාය හා සම්බන්ධ වී ඇත්තේ විශාලතම කර්මාන්ත ව්‍යාපෘතියක් මාගම්පුර වරාය ආශ්‍රිතව ආරම්භ කිරීමට වන ලකලෑස්තියක් සමගයි. ඒ අනුව ලබන වසරේ හම්බන්තොට මාගම්පුර වරාය ආශ්‍රිත කොටගෙන කර්මාන්ත 150 ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සූදානමක් පවතින බව විශේෂ ව්‍යාපෘති ඇමති සරත් අමුණුගම මහතා පවසා තිබුණි.

හම්බන්තොට මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය හා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ නිරීක්ෂණය කිරීම සඳහා විදේශ නියෝජිතයන් සහ මැති ඇමතිවරුන් කිහිප දෙනෙකු සමග චාරිකාවක නියැලෙමින් සිටියදී මාධ්‍යවේදීන් අමතා ඔහු මේ බව සඳහන් කර තිබුණි.

මෙහි ඇරඹීමට සූදානම් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ විශාලතම කර්මාන්ත ව්‍යාපෘතිය බවට පත් කිරීම සඳහා අවශ්‍ය සාධක සියල්ල එම ප්‍රදේශය ආශ්‍රිතව ඇති බව අමාත්‍ය වරයා සඳහන් කර තිබුණේ මෙසේය. 'සංවර්ධනය කළ පුළුල් මාර්ග පද්ධතියක්, ගුවන් තොටුපොළක්, නැව් තොටුපොළක්, ලොකු හෝටලයක්, හොඳ කාර්යාලයක් ආදි සියල්ල මෙහි තියෙනවා. මේ සියල්ල එකතු කරගෙන ඉක්මනින්ම හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරනවා'. මාගම්පුර කර්මාන්ත 150 ව්‍යාපෘතිය චීනය විසින් ඉදිකිරීමට යෝජිතව ඇති අතර මෙම වැඩ පිළිවෙළ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉක්මනින් සැපයීමට රජය අදහස් කරයි.

හම්බන්තොට චීනයට විකිණීමට යන බවට වූ චෝදනාවක් සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දී තිබුණේ මේ චාරිකාවට එක් වූ ජාත්‍යන්තර වෙළඳ හා වාණිජ කටයුතු ඇමති මලික් සමරවික්‍රමයි. ඔහු පැවසුවේ එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවයි. මෙහිදී චීනය සහ ශ්‍රී ලංකාව එක්ව සංවර්ධන කටයුතු සිදු කරන බවත් ආණ්ඩුවට අයත් කොටස්ද එහි තිබෙන බවත් මේ වන විටත් චීන ආයෝජකයෝ මේ වැඩපිළිවෙළට එකතු වී සංවර්ධන කටයුතු පටන් ගැනීමට සූදානමින් සිටින බවත් ඔහු පැවසීය.

# ලංකා බැංකුව ලොව හොඳම බැංකු 1000 අතරට

ලෝකයේ හොඳම බැංකු 1000 අතරට ශ්‍රී ලංකාවේ 'ලංකා බැංකුව' එක් වන බව 'ද බෑන්කර්' සඟරාව පවසයි. ලෝකයේ ප්‍රමුඛ බැංකුකරණ සහ මූල්‍ය සඟරාවක් ලෙස 1926 වසරේ සිට කටයුතු කරන 'ද බෑන්කර්' සඟරාව එක්සත් රාජධානිය මූලිකව ප්‍රකාශයට පත් කරයි.

එම සඟරාව විසින් සිදුකරන ලෝක බැංකු ශ්‍රේණිගත කිරීම්වලදී ප්‍රමුඛතම බැංකු 1000 අතරට මෙවර ලංකා බැංකුවද ඇතුළත් කොට ඇත. මෙම ලැයිස්තුව සෑදීම සඳහා ලෝකයේ සෑම රටකම සියලුම ප්‍රධාන බැංකුවල විස්තීරණ මූල්‍ය දත්ත තොරතුරු, තොරතුරු සැපයුම් සහ විධායක ඇමතුම් දත්ත ආදිය සැලකිල්ලට යොමු කරනු ලබයි. විශේෂයෙන්ම 2015 වසරේ ලංකා බැංකුව ලබාගෙන තිබූ ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් පසු මෙසේ හොඳම බැංකු 1000 අතරට තෝරාගෙන ඇත. මීට අමතරව ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අතින් ආසියා පැසිෆික් කලාපයේ (චීනය, ජපානය හැරුණු කොට) ඉහළම පෙළේ බැංකු පහ අතරටද ලංකා බැංකුව නම් කිරීමට 'ද බෑන්කර්' සඟරාව කටයුතු කර ඇත. මෙතෙක් මෙවැනි ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබාගත් එකම ශ්‍රී ලාංකේය බැංකුව ලංකා බැංකුවයි.

පසුගිය කාලයේදී ජාත්‍යන්තර සම්මාන කිහිපයක් හිමිකර ගැනීමට ලංකා බැංකුව සමත් වී තිබුණු අතර 'ඒෂියන් බෑන්කර්' සඟරාව විසින් ශ්‍රී ලංකාවේ ශක්තිමත්ම බැංකුව ලෙස නම් කරමින් ලබාදුන් සම්මානය මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ හැක.

'ද බෑන්කර්' සඟරාවේ ජූලි කලාපයේ ලංකා බැංකුව හඳුන්වා දී තිබුණේ ශ්‍රී ලංකාවේ අංක 1 බැංකුව ලෙසයි.

මේ සියලු කීර්ති ප්‍රශංසා මැද 'ජාතියේ මහා පහන් ටැඹ'- ලංකා බැංකුව, අගෝස්තු 01 වනදා 77 වන වසරට පා තබනු ලැබුණි.

# අන්තර්ජාලයෙන් කරදර කළොත් දැනුම් දෙන්න

අන්තර්ජාලය තුළින් හෝ ජංගම දුරකථන ඔස්සේ අපයෝජනයට හා ලිංගික හිංසනයට ලක්වන ශ්‍රී ලංකාවේ දරුවන්ට සහ යෞවනයන්ට තම පැමිණිලි ඉදිරිපත් කිරීමේ අවස්ථාව දැන් සලසා ඇත.

ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ අධිකාරිය විසින් මෙම වැඩ පිළිවෙළ ආරම්භ කර ඇති අතර එම ආයතනය විසින් මේ සඳහා හඳුන්වා දී ඇති දුරකථන අංකය 077-3220032 ලෙස දැක්වේ. මෙම දුරකථන සේවාව පැය 24 පුරාම ක්‍රියාත්මකව පවතින අතර ඒ ඔස්සේ ඇමතීමට, කෙටි පණිවිඩ එවීමට හා what'sApp වයිබර් IMO වැනි දුරකථන යෙදවුම් මගින් පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

අන්තර්ජාලය සහ ජංගම දුරකථන හරහා සිදුකරන ඕනෑම ආකාරයක හිංසනයක්, උදාහරණ ලෙස - පෞද්ගලික ඡායාරූප හිමිකරුවන්ගේ අවසරයකින් තොරව බෙදා හැරීම, බිය වැද්දීම, විවිධ ලිංගික අපචාර සඳහා පොළඹවා ගැනීම, නින්දා අපහාස ආදිය සිදුකිරීම ආදි හිංසා රැසක් මෙවැනි අපරාධ ගණයට වැටේ.

මෙම පැමිණිලිවලදී ලබාදෙන සියලුම තොරතුරු උපරිම රහස්‍යභාවයකින් ආරක්ෂා කෙරෙන අතර අපයෝජනයට ලක්වන ළමුන් සහ යෞවනයන් උදෙසා විශේෂ උපදේශන සේවාවන්ද ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. මේ ආකාරයට අපයෝජනයට ලක් වන්නන් හට නීති මාර්ගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම්ද මේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරේ.

# සමාජ ජාල යොදාගෙන මැතිවරණ පිළිකුල දුරු කරමු !

ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව තුළ මැතිවරණ ක්‍රමය පිළිබඳව පවතින පිළිකුල දුරු කිරීමට සමාජ ජාල වෙබ් අඩවි යොදාගත හැකි බව මැතිවරණ කොමිසන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා පවසා සිටියි.

ඒ අනුව තරුණ පෙළ මැතිවරණ ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මැතිවරණ කොමිසම, සමස්ත ලංකා යෞවන සමාජ සම්මේලනය හා තරුණ සංවිධාන එක් වී සමාජ ජාල වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බව සභාපතිවරයා සඳහන් කර සිටී.

මෙම වැඩසටහන දියත් කිරීමෙන් දේශපාලනඥයන් බිහිකිරීමට අදහස් නොකරන බවත් මේ වන විට ලංකාවේ පවත්වන මැතිවරණ සම්බන්ධයෙන් තරුණ තරුණියන් තුළ පවතින අකමැත්ත හා පිළිකුල දුරු කොට ඒ සෑම අයෙකුගේම ඡන්ද අයිතිය ලබාදීම මෙහි ප්‍රධාන අරමුණ බවත් දේශප්‍රිය මහතා සඳහන් කොට ඇත.

ශ්‍රී ලංකාව තුළ ඡන්ද දායකයන් ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති අවුරුදු 18-35 අතර පසුවන තරුණ තරුණියන් ලක්ෂ තුනකට ආසන්න සංඛ්‍යාවක් ඡන්ද අයිතිය හිමිකර ගැනීම සඳහා මෙතෙක් ලියාපදිංචි වී නොමැති බව පෙන්වා දෙන සභාපතිවරයා මෙවැනි වැඩසටහන් මගින් ඒ පිරිස ඡන්ද නාමලේඛනවලට ඇතුළත් කර ගැනීමට අපේක්ෂා කරන බව පවසා සිටියි.

# වෙළඳ දැන්වීම් නියාමනය රැගුම් පාලනයට

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල පළවන සියලුම වෙළඳ දැන්වීම් සහ වෙනත් අංශ රැසක් නියාමනය කිරීමේ බලය ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වෙත ලබා දීමට අදහස් කර ඇත. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සභාපති සමන් අතාවුදහෙට්ටි මහතා මේ පිළිබඳව සඳහන් කරමින් පවසා ඇත්තේ ඒ සඳහා නව පනතක් ගෙන ඒමට අවධානය යොමු වී ඇති බවයි.

එම නව පනත පිළිබඳව මේ දිනවල මූලික සාකච්ඡා සිදුකෙරෙන බවත් දැනට රැඟුම් පාලක මණ්ඩලය සතු බලතලවලට වඩා වැඩි පුළුල් විෂය පථයක් හඳුන්වා දීමට අදහස් කර ඇති බවත් මෙහිදී සභාපතිවරයා පවසා ඇත. වර්ගීකරණ මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වෙමින් වෙළඳ දැන්වීම්, රූපවාහිනී වැඩසටහන්, ටෙලි නාට්‍ය වැනි අංශ මේ යටතේ නියාමනය කිරීම සඳහා බලතල හිමිවනු ඇත.

මහජනතාව විසින් නරඹන වෙළඳ දැන්වීම්, රූපවාහිනී වැඩසටහන්, ටෙලි නාට්‍ය වැනි අංශයන් පිළිබඳව කිසියම් පැමිණිල්ලක් කිරීමට ඇතොත් ඒ සඳහාද අවස්ථාව මෙම පනත හරහා ලබා දීමට තීරණය කර ඇති අතර දැනට ශ්‍රී ලංකාවේ පවතින චිත්‍රපට වර්ගීකරණය කිරීමද ආරම්භ කිරීමට අදහස් කර ඇත.

# යාල වන උයන තාවකාලිකව වසයි

යාල ජාතික වන උද්‍යානය ලබන සැප්තැම්බර් 01 වනදා සිට ඔක්තෝබර් 15 දා දක්වා සංචාරකයන් සඳහා තාවකාලිකව වසා දැමීමට තීරණය කර ඇත.

යාල වන උද්‍යානයේ සිටින වන සතුන්ගේ චර්යා රටාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට සහ උද්‍යානයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මේ ආකාරයට ටික දිනකට උද්‍යානය වසා දැමෙන බව වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පවසා සිටියි.

මෙය අසාමාන්‍ය තත්ත්වයක් නොවන අතර සෑම වසරකම මේ කාලයේදී තාවකාලිකව වන උද්‍යානය වසා දැමීම සිදු කෙරේ.

# කලවම් පොල්තෙල්

ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ අලෙවි කරන පොල්තෙල්වලින් 50% ක්ම විවිධ තෙල් වර්ග මිශ්‍ර කළ ඒවා බව පාරිභෝගික කටයුතු අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පවසා සිටී.

මෙහිදී පිටරටින් ඉතාමත් අඩු මුදලට ගෙන්වන විෂ සහිත පාම් තෙල් වර්ග පොල්තෙල් සමග මිශ්‍ර කිරීම බොහෝ විට සිදුවන අතර මේ විෂ පාම් තෙල් මිනිස් සිරුරට විවිධ අහිතකර තත්ත්වයන් ඇති කරන බව හෙළිදරව් වී ඇත. මේ වන විට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ SLS සහතිකය සහිතව අලෙවි කෙරෙන්නේ එකම පොල්තෙල් වර්ගයක් පමණක් වන අතර එසේ SLS සහතිකය ලබාගැනීම අනිවාර්ය වන අන්දමේ නීති පද්ධතියක් ශ්‍රී ලංකාවේ පාරිභෝගික සේවා අධිකාරිය විසින් පනවා නොමැත. පාරිභෝගිකයන් රවටමින් කූට ව්‍යාපාරිකයන් විසින් ගෙන යන මෙවැනි ජාවාරම් නැවැත්වීමට නම් ප්‍රමිති සහතිකයක් සහිතව නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කිරීම අනිවාර්ය කිරීමේ නීති පද්ධති ගෙන ආ යුතු බව මේ පිළිබඳව අදහස් දැක්වූ බොහෝ දෙනෙකු පවසා සිටී.

මෙම පාම් තෙල් පොල්තෙල් වලට කලවම් කිරීමේ ව්‍යාපාරය 2012 සිට කරගෙන ආ එකක් බව ඒ පිළිබඳව පරීක්ෂණ කිරීමේදී දැනගැනීමට ලැබී ඇත. ශ්‍රී ලංකාවට ආහාර සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය ගෙන ඒමේදී වරාය සහ ගුවන් තොටුපොළේදී ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ ක්‍රම ඇතත් ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීමෙන් මේ ජාවාරමේ වසර ගණනාවක් පුරා මේ ව්‍යාපාරය කරගෙන යෑමට මොවුන් සමත් වී ඇත.

මෙම විෂ පාම් තෙල් මිශ්‍රිත පොල් තෙල් පිළිබඳව පාරිභෝගික අයිතීන් සුරැකීමේ ව්‍යාපාරය මීට බොහෝ කලකට පෙර අනාවරණය කර තිබුණත් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමට කිසිවෙකුත් උනන්දු වී නැත. අද වන විට ඒ ප්‍රශ්නය උග්‍ර වී රටේ ලොකුම තැන වන පාර්ලිමේන්තු භෝජනාගාරයටත් විෂ පොල්තෙල් රිංගාගෙන ඇති බව පසුගියදා හෙළිදරව් විය. මේ වන විට වෙළඳසල්වල ඇති පොල් තෙල් සාම්පල ලබාගෙන කලවම් කළ පොල්තෙල් සෙවීමේ පරීක්ෂණ සිදුකෙරෙන නමුත් මෙම කූට ව්‍යාපාරය නැවැත්වීමට නම් එහි මුල් සොයාගොස් පිලියම් යෙදීම කළ යුතුව ඇත. එහෙත් තවමත් එය සාර්ථකව සිදුවන බවක් නොපෙනෙන්නේ මේ වන විටත් වරාය තුළ විෂ පාම් තෙල් සහිත කන්ටේනර 7 ක් රඳවා ඇති බව සඳහන් වීමෙනි. මෙම විෂ පාම් තෙල් සහිත කන්ටේනර මුදා නොහැර ඒවායේ ඇති සියලුම විෂ පාම් තෙල් විනාශ කරන ලෙස පාරිභෝගික අයිතීන් සුරැකීමේ ජාතික ව්‍යාපාරය රජයෙන් ඉල්ලා ඇත.

විෂ සහිත පාම්තෙල් මිශ්‍රිත පොල්තෙල් ආහාරයට ගැනීමෙන් ජනතාව විවිධ රෝගාබාධයන්ට ගොදුරු වීම සිදුවන අතර පසුගිය වසර කිහිපය තුළ හදවත් රෝග, පිළිකා ආදිය වැළඳීමේ ප්‍රවණතාව වැඩිවීමට මෙයත් එක් හේතුවක් වන්නට ඇති බව ඒ පිළිබඳ අදහස් දක්වන සමීක්ෂකයන් පවසා සිටී.

Dasatha
2016 අගෝස්තු August 2016

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editors - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Associate Editors - Nandana Prasadh
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada. «Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# ශ්‍රී ලංකාව ණය බරින් මුදවා ගැනීමට නම්....

අතීතයේ ශ්‍රී ලංකාව ආසියාකරයේ පැවති සශ්‍රීකම, සෞභාගයවත්ම රට ලෙස සුප්‍රකටය. කෘෂිකර්මාන්තය එහි එකල ප්‍රධාන ජීවනෝපාය වූ අතර ඇතැම් වකවානුවලදී පිටරටවලට පවා සහල් යවන්නට තරම් සශ්‍රීක බවක් එදා එහි විය. වසභ රජුගේ කාලයේදී ආසන්න රටවල සහල් ඉල්ලුම වැඩි වූයෙන් මහා වැව් බැඳ කෘෂිකර්මය නඟා සිටුවා ඒ රටවලට සහල් යවන්නට රජු කටයුතු කළ බව ඉතිහාසයේ සඳහන් වේ. එපමණක් නොව, කුළු බඩු ඇතුළු වෙළඳ භාණ්ඩවලටත් අතීතයේ මෙහි වූයේ ආසියාවේ පිහිටි අන් කවර රටකටත් වඩා සාඩම්බර සරුසාර බවකි. බටහිර ජාතීන් අප රට ආක්‍රමණය කළේද මේ සශ්‍රීක බව නිසා මිස අනෙකක් නිසා නොවේ. මේ නිසාම එදා ශ්‍රී ලාංකිකයෝ ස්වයංපෝෂිත තත්ත්වයක පසුවූහ. මේ තත්ත්වය අප නිදහස ලැබූ ආසන්නය වන විටත් යම් පමණකට පැවති බවට හොඳම සාධකයක් නම් එදා සිංගප්පූරු අගමැති ලී ක්වාන් යූ ප්‍රකාශ කළැයි කියන 'මම සිංගප්පූරුව ලංකාවක් බවට පත් කරන්නෙමි' යි යන සඳහනයි.

එහෙත් එහි වර්තමාන තත්ත්වය කුමක්ද? අද එය පුපුරා යාමට ආසන්න ගිනි කන්දක් සේ ණය බරින් මිරිකී සිටින රටකි. 1950-60 දශක වන විටත් ශ්‍රී ලංකාව ණය බරින් මිදුණු රටක්ව පැවති බව ශ්‍රී ලංකාවේ ආර්ථික වාර්තා සනාථ කරයි. ඒ වන විට අප මෙවන් ණයගැති බවක සිර වී සිටි බවට කොතැනකවත් සඳහන් නොවේ. එසේ නම් මේ ණය බර වසර 30-40 ක් ඇතුළත් ඇතිවූවක් බව පැහැදිලිය. ශ්‍රී ලංකාවේ ණය බරෙහි බරපතල කම කෙතෙක්ද යත්, පසුගියදා ජනාධිපතිවරයාම පවසා තිබුණු ආකාරයට එය රුපියල් කෝටි 850,000 කි.

මෙබඳු ණය උගුලකට අප හසුවූයේ කුමන හේතු නිසාදැයි පසු විපරමක් කරන්නට තවමත් කිසිවෙක් උත්සාහ දරන බවක් නොපෙනේ. එසේ වීමටද හේතුවක් තිබේ. මෑත කාලීන පාලකයන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට යැයි කියමින් එකට දහයක් ණය ලබාගනිමින් නවයක් නාස්ති කිරීම සෙල්ලමක් බවට පත්කර ගත් බව ඔවුන්ම දැන සිටීම එයට හේතුවයි. ශ්‍රී ලංකාව ණය ලබාගැනීමේ රඟ කොතරම්ද කිවහොත් මේ වන විට ගත් ණයට වඩා පොලී ගෙවන්නට සිදුවී තිබීමෙන්ම එය පැහැදිලි වෙයි. දැන් දැන් සිදුවන අන්දමට විවිධ ආකාරයෙන් ලබාගෙන ඇති ණයෙහි වාරික හා පොලී ගෙවන විට රටේ අත්‍යවශ්‍ය කටයුතුවලට වත් මුදලක් ඉතිරි නොවන තරමට ණය බර අධික වී තිබේ.

මැතිවරණයක් පැමිණි විට පෙරට එන බලය ලබා ගැනීමට සූදානම් වන අය පැවති රජය රට ණය කර ඇතැයි කීම සම්ප්‍රදායක් කොටගෙන සිටිති. එහෙත් ඒ අය පැමිණ කරන්නේත් එයම වීම කොතරම් නම් අවාසනාවක්ද?

මේ තත්ත්වය වෙනස් කරන්නට ගත යුතු එකම ක්‍රියාමාර්ගය ලෙස එන එන සියලු රජයවල් දකින්නේ ජනතාවගෙන් බදු අයකර ගැනීමය. ඒ හැර කෘෂිකාර්මික රටක් වන අප රටේ කෘෂිකර්මාන්තය වඩ වඩා දියුණු කොට එමගින් ආහාර අපනයනයට ඇති ඉඩකඩ අධික කර ගැන්මට හෝ අපනයනයට සුදුසු වන පරිදි අප රටේ නිපදවිය හැකි භාණ්ඩ ආදිය නිපදවීම සඳහා පර්යේෂණ කිරීමකට හෝ අද වන තුරු අත ගසාවත් නැත. ණයෙන් මිදෙන්නට නම් අප සතුව යම් වත්කම් තිබිය යුතුය. ජේන තෙක්මානෙකවත් එවැන්නක් නැති කොට අප ණය බරෙන් මිදෙන්නේ කෙසේද?

පළමුව කළ යුත්ත නම් ණයෙන් මිදීමය. ඒ සඳහා දැඩි අධිෂ්ඨානයක් පාලකයන් සතුව තිබිය යුතුය. අධිසුඛෝපභෝගී ජීවන රටාවෙන් කාට කාටත් සිදුවන්නේ තව තවත් ණය වීමට බව අවබෝධ කොටගත යුතුය.

යුද්ධය නිසා පීඩා විඳි පොදු ජනතාව පසුගිය කාලයේදී එක්තරා ප්‍රමාණයකට මේ පරිත්‍යාගය කළහ. එහෙත් එකල සිටි පාලකයන් නම් දශමයකවත් එබඳු පරිත්‍යාග යක් නොකළ අතර ආණ්ඩු පක්ෂයේ වේවා විපක්ෂයේ වේවා ඔවුහු මන්ත්‍රීකමෙන්, ඇමතිකමෙන් ලද හැකි සියලු සැප සම්පත් භුක්ති වින්දහ. දීමනාවක්ව තිබූ මන්ත්‍රී වැටුප පස් අවුරුදු කාලයකින් විශ්‍රාම වැටුප් සහිත වැටුපකට පරිවර්තනය කරගත් ඔවුහු අවුරුද්දට දෙවරක් තුන්වරක් ලක්ෂ හැට හැත්තෑ ගණන් වටිනා වාහන බද්දෙන් නිදහස් කොට ගෙන්වා ගත්තා පමණක් නොව ඒවා ලාභ ලබමින් විකුණා දැමූහ. ලොව වටා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා තානාපතීන් පත් කොට සිටියදී රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා යැයි කියමින් සිය නෑසියන් සිය ගණන් පිරිවරා ලොව වටා සවාරි ගියහ.

වර්තමාන රජයේ තත්ත්වය මීට වඩා එතරම් වෙනස් වී ඇතැයි කිව නොහැකිය. පෙරට වඩා ජනතා අවධානය දැඩිව යොමු වී ඇති බැවින් යම් යම් දේ වැළකී ඇතත් වර්තමාන පක්ෂ විපක්ෂ මැතිඇමතිවරුද එම සැප සම්පත් ලබාගැනීමට පොරකන බවක් පෙනෙන්නට ඇත. සුඛෝපභෝගී වාහන ගෙන්වීමට මේ වන විටත් යෝජනා ඉදිරිපත්ව ඇති අතර සිය කාර්යමණ්ඩල හා කාර්යාල අධික වියදමින් පවත්වාගෙන යෑමේ යෝජනාද ආවේය. යම් යම් හේතූන් මත ඒවා තාවකාලිකව නතර වුවද යළි යළි එම යෝජනා හිස ඔසවනු ඇත. එල දරනුද ඇත. පාර්ලිමේන්තුව හා අමාත්‍ය මණ්ඩල නඩත්තුව සඳහා දැනට යන අධික වියදම් වසරකට දෙකකට ණය බරින් මිදෙන තුරු වත් සීමා කළහොත් එබඳු පරිත්‍යාගයකට මැති ඇමතිවරු සූදානම් වුවහොත් දැනට ඇති ණය බරින් යම් තරමකින් හෝ මිදෙන්නට බොහෝ දුරට ඉඩකඩ ඇත. එපමණක් නොව දේශපාලනඥයන් පරිත්‍යාග කරනු දකින පොදු ජනයාද රට වෙනුවෙන් ඕනෑම ගැහැටක් විඳීමට සූදානම් වනු නොඅනුමානය. අවශ්‍ය කරන්නේ පාලක පන්තියේ ඉස්සර වීමය. එසේ නොමැති වුවහොත් ජනතාවට සිදුවන්නේ උන්ට වැඩිය මුන් හොඳද මුන්ට වැඩිය උන් හොඳද එසේත් නැතිනම් අලුතින්ම එන එකෙක් මුන් හැමෝටම වැඩිය හොඳද යන්න සිත සිතා සංසන්දනය කරමින් හූල්ලන්නටය.

# කවුරු කළත් වරද වරදමය

■ දූරදර්ශී විසිනි

ශ්‍රී ලංකාව දුප්පත් රටකි. 'රට දුප්පත්' ය කියනවාට සමහරුන් ලජ්ජා වුවත් ඇත්ත එයය. නිදහස ලබා වසර 68 ක් ගතව තිබියදීත් තවමත් දුප්පත් කමින් මිදීමට අපට නොහැකි වී ඇත්තේ මන්දැයි යන්නට පිළිතුර අත ළඟම ඇත. පිළිතුර නම් පාලනයෙහි නියුතු වූවන්ගේ අදූරදර්ශී භාවයත් දූෂණයට, වංචාවට වැඩකඩොළු බැඳීමට ඔවුන්ට අපොහොසත් වීමත් නිසාය යන්නය. වැඩියෙන්ම රජය කරවන දේශපාලකයන්ගේත් රාජ්‍ය නිලධාරීන්ගේත් දූෂණය, වංචාව හා නොසැලකිලිමත් අකාර්යක්ෂමභාවය මීට හේතු වී ඇත.

මෙම ලිපියට මෙලෙස මුල පිරුවේ අවුරුදු 68 ක් මුළුල්ලේ පැවතගෙන ආ පාලකයන්ගේ හා නිලධාරීන්ගේ පුරුද්ද, ඇබ්බැහිය අදත් තව විදියකින් කියනවා නම් වර්තමාන පාලන යුගයේදීත් එලෙසම පවතිනවාය යන්න කියන්නටය.

'පළමුව රට දෙවනුව තමන්' යන්න ලොව විසූ සියලුම විප්ලවවාදීහුත් ශ්‍රේෂ්ඨ නායකයෝත් ආදර්ශ පාඨය කොට ගත්හ. එහෙත් තුන්වෙනි ලෝකයේ බොහෝ රටවල පාලකයන්ගේ ආදර්ශ පාඨය වී ඇත්තේ එහි අනික් පැත්තය. 'පළමුව තමන් දෙවනුව රට' යන්නය. සැබවින්ම පාලන බලය ලබාගන්නා තුරු මේ සියලු පාලකයන් රට වෙනුවෙන්ම කිරීමට සැදී පැහැදී සිටිති. එහෙත් බලයට පැමිණ වසරක් දෙකක් ගතවන විට ඔවුන්ට එය අමතක වී තමන් දෙසට නෙත් හෙළීමට පටන් ගැනීම සිරිත වී තිබේ.

ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවත්නා රජය බලයට පත්වීමට පෙර කීවේද දුටුවේද සැබවින්ම පැවති රජයේ වූ මේ අඩුපාඩුකම් ගැනමය. කළා වූ දූෂණ යළි යළි උලුප්ප උලුප්පා පෙන්වූහ. 'අපි ආ වහාම මේවාට තිත තබන්නෙමු'යි ජනතාව ඉදිරියේ දිවුරමින්, කෑ ගසමින් පොරොන්දු වූහ. එහෙත් දැන් දැන් පදය වෙනස් වී ඇති බවක් පෙනෙන්නට තිබේ.

පසුගිය කෙටි කාලය තුළ එළිපිටම සිදුව ඇති දූෂණ හා වංචා දෙකක් පමණක් මේ බව දැක්වීමට ප්‍රමාණවත්ය. එනම්, මහ බැංකුවේ බැඳුම්කර මංකොල්ලය සහ ගල් අඟුරු ගෙන්වීමේදී සිදුවී ඇති මහා පරිමාණ වංචාවයි.

### බැඳුම්කර මගඩිය

මහ බැංකු බැඳුම්කර නිකුතුවේදී රටට කෝටි පනස්දාහක පමණ අලාභයක් සිදුවී ඇති බවට නැගෙන චෝදනාව එතරම් සරල වූවක් නොවේ. 9.5% ට පොළියට ගත හැකිව තිබුණු පොළී අනුපාතය 12.5% කට නංවා තම බෑණනුවන්ට වාසි සලසා දුන් බව මෙහිදී හිටපු මහ බැංකු අධිපතිවරයාට නැඟුනු චෝදනාවයි. එදිනෙදා ප්‍රශ්න විසඳා ගැනීමට වත්කමක් නැතිව ළතැවෙන රටකට මේ සා විශාල මුදලක අලාභයක් කෙසේවත් දැරිය නොහැක්කේය. මේ පිළිබඳව රටම කැළඹී තිබියදීත් අදාළ බැංකු අධිපතිවරයා වෙනුවෙන් වසරකට ආසන්න කාලයක් කිසිදු පියවරක් නොගැනීමම බරපතල වරදක් වන්නේය.

රටක පාලනය පැත්තෙන් ගත් කල අත්‍යවශ්‍ය යැයි මිනිසුන් කොට්ඨාසයක් සිටිය නොහැකිය. අර්ජුන් මහේන්ද්‍රන් මහතා අතීතයේ කාර්යක්ෂම දක්ෂ නිලධාරි මහතකුව සිටියා විය හැකිය. එහෙත් එබඳු අයෙකු අවස්ථාව ලත් හැටියේ කරනු ලබන වරද සැලකිය යුත්තේ වඩාත් බරපතල ලෙසය. වරද කොට තිබේ නම් කවුරුන් වුවත් රටට අහිතකර ලෙස සලකා අදාළ පියවර ගැනීම රජයක වගකීම වෙයි. මෙම සිද්ධියේදී සිදු වූ පළමුවන වරද නම් එසේ නොකිරීමය. එය බලයට පත්වන්නට පෙර පැවති වත්මන් රජයේ අධිෂ්ඨානය බිඳ දමන්නකි. දෙවැන්න නම් සිදුවී ඇති මෙම වරද නිවැරදි කරන්නට පියවර නොගැනීමයි. රටට යම් අලාභයක් සිදුවී තිබේ නම් එය වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට නීතිමය පියවර නොගැනීමයි. අධිකරණයටත් පාර්ලිමේන්තු කෝප් කමිටුවටත් යන තුරු දිග් ගැස්සෙන තෙක් බකංනිලාගෙන සිටීම හැර අන් කිසිදු පියවරක් ගත් බව අනාවරණය වූයේ නැත. අවසානයේ කෙසේ හෝ මහ බැංකු අධිපති ඉවත්ව ගොස් අලුත් මහ බැංකු අධිපතිවරයෙකු පත් වූ පමණින් ප්‍රශ්නය ඉවර යැයි ජනතාව සැනසිය හැකිද? නොහැකිය. ජනතාවගෙන් අයුතු ලෙස උදුරාගත් ධනය ඔවුන්ට යළි ලබා දී ඔවුන්ගේ ජීවිත යහපත් කරන්නට රජය වගබලා ගත යුතුමය. එය කරන්නට රජය හැර වෙන කෙනෙක් නැත. එසේ නැති වුවහොත් නිදහස ලද දා පටන්ම සිදුවූ පරිදි පුද්ගල මාරුවකින් සියල්ල වසා දමා රට දුප්පත්වම තබා ගැනීම තවදුරටත් සිදුවෙනු නොඅනුමානය.

### ගල් අඟුරු මගඩිය

වර්තමානයේ මතුව ඇති ගල් අඟුරු ටෙන්ඩරය පිළිබඳ සිද්ධියද ඉතා බරපතල පාඩුවක් රටට සිදුකොට රට දුප්පත්භාවය පත් කොට ඇත. පාඩුව රුපියල් මිලියන 1864 කි. මෙම ගල් අඟුරු ටෙන්ඩර් සිද්ධියේදීම දකින්නට ලැබුණු ඉතාමත් අශෝභන සිදුවීම නම් විදුලිබල ඇමතිවරුන් වශයෙන් සිටි ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න, රංජිත් සියඹලාපිටිය, පාඨලී චම්පික යන ඇමතිවරුන් (මොවුන් ගිය රජයේද ඇමතිවරුන් මෙන්ම වර්තමාන රජයේද ඇමතිවරුය) එකිනෙකා තමන් මෙම සිද්ධියට වගකිව යුතු නැති බවට ප්‍රකාශ නිකුත් කිරීමයි. අමාත්‍යාංශයකට අමාත්‍යවරයකු පත් කරන්නේ එහි සිදුවන හරි වැරදි සියල්ල ගැන අධීක්ෂණයක් සහ පාලනයක් ගෙන යෑමටය. හරි ඒවාවලදී අයිතිය භාර ගැනීමටත් වැරදි ඒවාවලදී ඇඟ බේරා ගැනීමටත් නොවේ. තමන් ඒ පිළිබඳව දන්නේ නැතැයි කියා හෝ තමන් එයට සම්බන්ධ වූයේ නැතැයි කියන්නට ඔවුන්ට අයිතියක් නැත. අවසාන වශයෙන් සියල්ලෙහි වගකීම පැවරෙන්නේ තමන්ට බව දන්නා ඇමතිවරයා කවුරුත් කරන දේ ගැනත් මනා විමසිල්ලෙන් සිට වැරදි දේ සිදුවන්නේ නම් වළක්වාලිය යුතුය. ඇමතිවරුන් සතු අන්න ඒ වගකීම ඔවුන් අතින් ඉටුවී නොතිබීම කණගාටුදායකය. ඒ මගින් ඔවුන් තම රට දුප්පත් කරන්නට දායක වී ඇති බව පැහැදිලිවම කිව යුතුය.

මෙතැනදීම නිලධාරීන් ගැනද යමක් සඳහන් කළ යුතුය. බොහෝ නිලධාරීන් කුමක් හරි වුවත් වැරදි වුවත් තම අභිමතය කවර ආකාරයකින් හෝ ජයගන්නට කටයුතු කරන බව අන් බොහෝ සිදුවීම්වලදී මෙන්ම මේ ගල් අඟුරු ටෙන්ඩර් සිද්ධියේදීද අනාවරණය වෙයි. 'වහ වහා ටෙන්ඩරය නොදුණහොත් ගල් අඟුරු නැති වී විදුලි අර්බුදයක් පැන නැගිය හැකිය' ආදි වශයෙන් අමාත්‍යවරයාට පෙන්වා තමන්ට අවශ්‍ය සැපයුම්කරුට ටෙන්ඩරය ලබාදීමට ඔවුන් ගත් උත්සාහයක් ගැනද මෙහිදී ප්‍රකාශයට පත්ව තිබීමෙන් ඒ බව පැහැදිලි වේ. කෙසේ

7 වන පිටුව බලන්න

# ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලසුම සුදු අලියෙක්ද?

■ චමරි අබේසිංහ

කැනඩා විශ්‍රාම වැටුප් සැලැස්ම වැඩි දියුණු කිරීමට ෆෙඩරල් රජය සමග අනෙකුත් ප්‍රාදේශීය පළාත් එකඟතාව පළ කර තිබියදී ප්‍රාදේශීය විශ්‍රාම වැටුප් සැලැස්මක් (provincial pension plan) ක්‍රියාත්මක කිරීම සඳහා ඔන්ටේරියෝ ලිබරල් රජය ඩොලර් මිලියන 70 ක් වැය කිරීම අනවශ්‍ය ක්‍රියාවක් බව ඒ පිළිබඳව අදහස් දක්වන බොහෝ දෙනෙකු පවසා සිටිති. එකදු සතයක්වත් ඉපයීමට පෙර මේ ආකාරයේ සැලැස්මක් වෙනුවෙන් මේ සා විශාල මුදලක් වැය කිරීම සැබවින්ම සුදුසු ක්‍රියාවක් නොවන බව ඒ වැඩිදෙනෙකුගේ අදහසයි.

මේ වැඩපිළිවෙළ යටතේ ඔන්ටේරියානුවන්ගේ විශ්‍රාම වැටුප් කටයුතු නියාමනය සඳහා අලුතින් පරිපාලන ආයතනයක් ආරම්භ කර ඇති අතර එහි සේවක පඩි නඩි ඇතුළු නඩත්තු කටයුතු සඳහා අතිවිශාල මුදලක් වැය වන බව ඇස්තමේන්තු ගත වාර්තාවල සඳහන් වේ.

මෙම ආයතනයේ කටයුතු සඳහා මේ වන විට බඳවාගෙන ඇති සේවක පිරිස වෙනුවෙන් වැය කර ඇති මුදල ඩොලර් මිලියන 3.7 ක් ලෙස සඳහන් වේ. මෙම වාර්තාවට අනුව එහි ඉහළ විධායක ශ්‍රේණියේ නිලධාරීන් හයදෙනෙකු සඳහා පමණක් ඩොලර් මිලියන 2 කට වැඩි මුදලක් වැය කර ඇති බව පෙන්නුම් කෙරේ. මේ නිලධාරීන්ගෙන් වැඩි පිරිසක් පසුගිය මාර්තු-අප්‍රේල් මාසවලදී බඳවාගෙන ඇත. මේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු වෙනුවෙන් ඩොලර් 335,000 ක වැටුප් දීමනාවක් හිමිවන අතර එහි සේවයේ නියුතු සෙසු නිලධාරීන් 27 දෙනෙකුගේ වැටුප් දීමනාව එක් අයෙකුට ඩොලර් 62,522 ක් ලෙස දැක්වේ.

ලිබරල් පක්ෂයේ මෙම අලුත් විශ්‍රාම වැටුප් සැලසුම් ක්‍රමය පිළිබඳව නව ඩිමොක්‍රටික් පක්ෂය දැඩි කණස්සල්ල පළ කර සිටින අතර ඔවුන් පවසන්නේ මේ ආකාරයට අනවශ්‍ය වියදම් සහිත විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගෙන ඒම නුසුදුසු දෙයක් බවයි. මෙය විශ්‍රාමය ලබාගැනීමටවත් සුදුසුකම් ලබාගත නොහැකිව ළතැවෙන ඔන්ටේරියෝ ජනතාවට කරන 'අපහාසයක්' බවයි ඔවුන් පෙන්වා දෙන්නෙ. මෙම ප්‍රාදේශීය විශ්‍රාම වැටුප් සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම අපහසු දෙයක් බව බොහෝ දෙනෙකුට රහසක් නොවන බව නව ඩිමොක්‍රටිකයන්ගේ අදහසයි.

සියලුම ප්‍රාදේශීය රජයයන් එක්ව කැනඩා විශ්‍රාම වැටුප ඉහළ නැංවීමට දායක වනවා මිස වෙන වෙනම ප්‍රාදේශීය විශ්‍රාම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් නොමැති බව NDP පක්ෂයේ ජෙනිෆර් ෆ්‍රෙන්ච් පවසයි. එවැනි දෙයකින් අනාගතයේ ඇතිවිය හැකි අහිසි ප්‍රතිඵල පිළිබඳ කැත්ලින් වේන් සහ ඇගේ රජයට දුරදිග සිතා බැලීමේ අවශ්‍යතාවක් නොමැති වීම කණගාටුවට කරුණක් බව ඇය වැඩිදුරටත් කියා සිටියි. මෙවැනි අනවශ්‍ය වැඩක් ආරම්භ කර සීමාවකින් තොරව විධායක නිලධාරීන් හා සේවකයින් බඳවා ගනිමින් ඔවුන්ට අතිවිශාල වැටුප් ගෙවීම් සිදුකිරීම තුළින් පෙනී යන්නේ සමස්ත ඔන්ටේරියානුවන්ගේ අවශ්‍යතාවන්ට වඩා ලිබරල් රජය සිය හිතවතුන්ගේ මනදොළ පිනවීමේ අවශ්‍යතාවට මූලිකත්වය දී කටයුතු කරන බව යැයි NDP නියෝජිතවරිය පවසා ඇත.

ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා ගැනීම සඳහාද විශාල වියදමක් දැරීමට මේ වන විට රජයට සිදුවී ඇත. මෙම නව ප්‍රාදේශීය විශ්‍රාම වැටුප් පරිපාලන ආයතනය පිහිටුවීම සඳහා මේ වසර මුලදී පස් අවුරුදු බදු පදනමකට යටත්ව ටොරොන්ටෝ නගර මධ්‍යයේ පිහිටි ගොඩනැගිල්ලකින් මහල් දෙකක් ලබාගෙන තිබුණේ ඩොලර් මිලියන 12 ක් වැය කරමිනි. ඒ බව සඳහන් වාර්තාවක් පසුගියදා එළිදක්වා තිබුණු අතර මේ කටයුතු සඳහා ඩොලර් මිලියන 31 ක ණයක් ප්‍රාදේශීය රජයෙන් ලබා දී ඇතැයිද එහි සඳහන් විය.

මීට අමතරව Ontario Retirement Pension Plan Administration Corporation හි උපදේශන කටයුතු වෙනුවෙන් ඩොලර් මිලියන 17.7 ක් වැය කොට ඇත.

විශ්‍රාම වැටුප් සැලසුම් පරිපාලන සංස්ථාවේ කටයුතු වෙනුවෙන් තවත් ඩොලර් මිලියන 15 ක් හිඟ මුදල් වශයෙන් ගෙවීමට ඇති බව මේ පිළිබඳව කරුණු දක්වමින් ඔන්ටේරියෝ මුදල් අමාත්‍ය චාල්ස් සූසා පවසා තිබුණි. තම රජය විසින් ක්‍රියාත්මක කිරීමට සැරසෙන මෙම විශ්‍රාම සැලසුම් ක්‍රමය පිළිබඳව ඔන්ටේරියෝ මුදල් අමාත්‍යවරයා පවසන්නේ මෙසේය. 'කැනඩා විශ්‍රාම වැටුප් ක්‍රමය වැඩි දියුණු කිරීමට සහාය දීම ඔන්ටේරියෝවේ පළමු තේරීම වුවත් ප්‍රාදේශීය විශ්‍රාම වැටුප් සැලැස්මක්ද තිබීම අවශ්‍යයි. යම් හේතුවකින් අනෙකුත් ප්‍රාදේශිකයන් හෝ ෆෙඩරල් රජය විසින් ජාතික ගිවිසුමට අවහිර වන යමක් කළහොත් ඊට සූදානම් වීමක් ලෙස මෙය පැවතීම වටිනවා' මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් මුදල් ඇමතිවරයා මෙසේද සඳහන් කර තිබුණි. 'ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලැස්ම හරහා වැඩකරන ජනතාවගේ විශ්‍රාම වැටුප ආරක්ෂා කිරීමට අපි දුන් මැතිවරණ පොරොන්දුව මත බහුතර ජනවරමක් දිනාගැනීමට අපට හැකි වුණා. කැනඩා විශ්‍රාම වැටුප් සැලැස්ම වැඩි දියුණු කිරීම කළ හැකිද යන අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් පැවතියදී අප වගකිව යුතු ප්‍රවිශ්ටයක් විදියට ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලසුම ස්ථාපිත කිරීමට කටයුතු කළා'

ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්පූර්ණ ඇස්තමේන්තු වියදම් වාර්තාවේ සඳහන් වන්නේ සේවා නියුක්තිකයන් 50 දෙනෙකු මේ වන විටත් රාජකාරි කටයුතු වල නිරතව සිටින බවත් තවත් 100 දෙනෙකු පමණ මේ මාසයේදී අලුතින් බඳවා ගැනීමට කටයුතු සකස් කොට ඇති බවත්ය. මීට අමතරව තවත් 100 ක පිරිසක් ලබන සැප්තැම්බර් මාසයේදීද 250 ක පිරිසක් ලබන වසරේ ජූනි මාසයට පෙරද බඳවා ගැනීමට නියමිතව ඇත.

මෙය ලිබරල් රජයේ නාස්තිය හා දූෂණයත් අවිධිමත් බවත් පෙන්වන හොඳම උදාහරණයක් බව කොන්සර්වේටිව් පක්ෂයේ අදහසයි. සක්‍රියව කටයුතු කිරීම සිහිනයක් වැනි මෙවැනි ප්‍රාදේශීය විශ්‍රාම වැටුප් ක්‍රමයක් අධික වියදමක් දරමින් ක්‍රියාත්මක කිරීමට පෙර අනිකුත් ප්‍රාදේශිකයන් සහ ඔටාවා ප්‍රධාන රජය වෙත මේ පිළිබඳ කරුණු පැහැදිලි කිරීමක් සිදුකිරීමට ඔන්ටේරියෝ රජය විසින් කළ යුතුව තිබුණු බව ඔවුහු වැඩිදුරටත් පවසා සිටිති.

'මෙය ඔන්ටේරියෝවේ ඉදිරි පියවරක්' බව පවසමින් ඔන්ටේරියෝ මුදල් අමාත්‍යවරයා මෙම විශ්‍රාම වැටුප් සැලසුම සකස් කිරීමට වැය කළ සහ කරන වියදම ආරක්ෂා කිරීමට සුදුහුණු ගෑවත් මේකෙන් වන අනවශ්‍ය මුදල් නාස්තිය ඕනෑම අයෙකුට වටහා ගැනීම අපහසු නොවන බව පළාත් සභා විශ්‍රාම වැටුප් විචාරකයකු වූ ජූලියා මුන්රෝගේ අදහසයි. මේ සිදුකරන නාස්තිය සම්බන්ධයෙන් කැත්ලින් වේන් ප්‍රමුඛ ලිබරල් රජය සමස්ත ඔන්ටේරියානුවන්ගෙන් සමාව ඉල්ලිය යුතු බව ඔහු පවසා සිටියි.

මෙම අලුත් ඔන්ටේරියෝ විශ්‍රාම වැටුප් සැලසුම පිළිබඳව මූල්‍ය සැලසුම් විචාරකයින් මෙසේ පවසා ඇත. 'සේවකයන්ට හා හාම්පුතුන්ට විශ්‍රාම වැටුප් සඳහා අතිරේක දායකත්වයක් පැනවීම තුළින් ඉදිරි කාලයේදී පළාතේ ආර්ථිකයට බලපෑම් එල්ල විය හැකි අතර එය කැනඩා විශ්‍රාම වැටුප් සැලසුමේ වැඩි දියුණුවද අනතුරේ හෙළීමකි'

මේ තත්ත්වය කුඩා සමාගම් සඳහා 'විනාශකාරී' එකක් වනු ඇතැයි Canadian Federation of Independent Business ආයතනය පෙන්වා දී ඇත.

(Keith Leslie විසින් ලියන ලද Ontario spent $70 million to create provincial pension plan that's not needed ලිපියේ සාරාංශය ඇසුරෙන් සැකසුනකි)

# අධික උණුසුම සහ ව්‍යායාම

මේ දිනවල පවතින අධික උණුසුමත් සමග එළිමහනේ ව්‍යායාම කිරීමේදී ඔබගේ අවධානය යොමුවිය යුතු කරුණු කිහිපයක් ගැනයි මේ.

ව්‍යායාම කිරීමේදී ශරීරයේ ඇති පරිවෘත්තීය ක්‍රියාවලිය වේගවත් වන බව ඔබ දන්නා කරුණකි. හෘද සහ පෙනහළුවල ක්‍රියාවලියත් මාංශ පේශිවල ක්‍රියාවලියත් මේ නිසා වැඩි වේ. මේ සියල්ල නිසා ශරීරය තුළ තාපය නිපදවීම වේගයෙන් ඉහළ යෑම සිදුවන අතර එසේ එකතු වන තාපය පිටවීම සිදුවන්නේ සන්නයනය මගිනි. එහිදී වැඩියෙන් තියෙන තැන සිට අඩුවෙන් තියෙන තැනකට තාපය ගමන් කරයි. ව්‍යායාම කරන ස්ථානය අවට ඇති වාතයත් උණුසුම් නම් ශරීරයේ නිපදවෙන තාපය පිටතට ගමන් කිරීම සීමා වෙයි. මේ තත්ත්වය නිසා ශරීරයේ උණුසුම ඉහළ යා හැකි අතර එය ඇතැම් විට රුධිර පීඩනයට සහ හෘදයට බලපෑම් කළ හැකි තත්ත්වයකි.

- උෂ්ණත්වය වැඩි වන මුල් අවස්ථාවේදී රෝග ලක්ෂණ කීපයක් දැකිය හැකියි. හිසරදය, මස්පිඩු පෙරළීම, ක්ලාන්තය, අධික මහන්සිය ආදිය දැක්විය හැක.
- උණුසුම් පරිසරයේ ව්‍යායාමවල නිරත වන්නේ නම් නිතරම ජලය පානය කිරීම සුදුසු වේ. මෙහිදී ව්‍යායාම ආරම්භ කිරීමට විනාඩි 30 කට පමණ පෙර ජලය යම් ප්‍රමාණයක් පානය කර ව්‍යායාම කරන අතරතුරදී මඳින් මඳ ජලය පානයට ගැනීම සුදුසුයි. පැයක් තුළ ජලය මිලි ලීටර 200 ත් 800 ත් අතර ප්‍රමාණයක් ගත හැකි නම් සෑහේ. ව්‍යායාම අතරතුර වෙනත් දියර සහිත ශක්තිජනක පානයන් වුවත් ඔබට ගත හැකියි. නමුත් ඒ සියල්ල මඳින් මඳ ගැනීමට සැලකිලිමත් වන්න.
- උෂ්ණත්වය දරාගත නොහැකි පුද්ගලයන් මෙවැනි පරිසර තත්ත්වයක ව්‍යායාම කිරීමේදී ඒ පිළිබඳව දැඩි ලෙස කල්පනාකාරී වන්න. ව්‍යායාමයේදී ඇතිවන වෙහෙසත් උෂ්ණත්වයත් සමග ඇතිවන සංකූලතාත් දරුණු ප්‍රතිඵල ගෙන දිය හැකියි. විශේෂයෙන්ම එළිමහනේ දිවීම වැනි ව්‍යායාමයක නිරත වේ නම් තද උණුසුම් දවස්වල එයින් බැහැරව සිටීම සුදුසු වේ.
- අව් රශ්මිය තදින් ඇති මධ්‍යහ්නයේ ව්‍යායාම කිරීමෙන් වළකින්න. ඒ සඳහා උදෑසන හෝ සවස් කාලය තෝරා ගන්න.
- ව්‍යායාම කිරීම සඳහා අඳින ඇඳුම් පිළිබඳවද සැලකිල්ල යොමුකළ යුතු අතර තද පැහැයෙන් යුතු තාපය අවශෝෂනය කරන ඇඳුම්වලින් වැළකීම සුදුසු වේ. විශේෂයෙන්ම මේ කාලයේදී සිරුරම ආවරණය වන ආකාරයේ තද ඇඳුම් ඇඳ ව්‍යායාම කිරීම සුදුසු නැත.
- කිසියම් ආකාරයකින් තාප අනතුරකට ලක් වුවහොත් ශරීරය හැකි පමණ සිසිල් කිරීම සිදුකරන්න. එහෙත් එකවරම ජල බඳුනක් හෝ අයිස් ගොඩක් දමා එය කිරීම සුදුසු නොවන අතර ක්‍රම ක්‍රමයෙන් ස්පොන්ජ් කෑල්ලක් වැනි දෙයක් හෝ තුවායක් යොදාගෙන සිරුර සිසිල් කිරීම සිදුකරන්න.
- ඇඳ සිටින ඇඳුම් ලිහිල් කොට රෝගියා පහසු ආකාරයකට තබන්න.
- සිහි මූර්ජා තත්ත්වයකට පත්ව ඇත්නම් වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම සුදුසු වේ.



# කවුරු කළත්...

6 වන පිටුවෙන්

වෙතත් තම නිලධාරීන් නිසි තැන තබා රටට පාඩු සිදු නොවන සේ, ඔවුන් වංචාවන්ට නොපෙළඹෙන සේ කටයුතු කිරීම දක්ෂ අමාත්‍යවරයකුගේ වගකීම වන්නේය. එහිදීද ඔහුට ගැලවීමක් නැත්තේය. මෙහිදීද පාර්ලිමේන්තුවේ හා වෙනත් තැන්වල සිද්ධිය ගැන කතා කිරීම පමණක් කොට අන්තිමේදී කිසිවක් සිදු නොවූ ලෙස සිද්ධිය යට යෑමට කටයුතු කරන්නේ නම් එයද බරපතල වරදක් වන්නේය. අද වරද කළ වුන්ට දඬුවම් නොලැබෙන්නේ නම් එය හෙට වරද කරන්නවුන්ට ආදර්ශයක්ද වන්නේය.

අවසාන වශයෙන් මෙහිදී තවත් එක් කරුණක් සඳහන් නොකරම බැරිය. එනම් රජයක් පත් වූ විට අමාත්‍යාංශ පැවරීමේදී ඒ ඒ අමාත්‍යාංශයේ විෂය පථය පිළිබඳව ඇමතිවරයාගේ ඇති දැනුම හා අවබෝධය නොවිමසා ඇමතිකමක් දිය යුතු නිසාම කුමන හෝ අමාත්‍යාංශයක් පැටවීමේ වැරදි පිළිවෙතයි. මේ නිසා ඇමතිවරයාට සිදුවනුයේ කලක් මුළුල්ලේ වැජඹුනු නිලධාරීන් ගහන ගහන පදයට නටන්නටය. මේ සෑම දෙයකින්ම සිදුවනුයේ රටේ දුප්පත් කම අධික කිරීමට පාලකයින් යහමින් සම්මාදම් වී තිබීම නොවන්නේදැයි සිතා බැලීමට කාලය පැමිණ තිබේ.

# යුද්ධය ඕනෑ අනික් පිරිසටයි...

මේ වන විට ලෝකය යුද කලාපයක් බවට පත්ව ඇති බව අතිඋතුම් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ පවසා සිටී. පෝලන්තයේ සිදුකළ පස් දින නිල සංචාරයක් අතරතුරදී මාධ්‍යවේදීන් පිරිසක් සමග Krakow වෙත ගුවනින් යමින් සිටියදී උන්වහන්සේ මෙම ප්‍රකාශය සිදුකොට ඇත.

ප්‍රංශයේ නොමන්ඩි දේවස්ථානයේ පූජකවරයාගේ ඝාතනයත් මෑතකදී යුරෝපයේ ප්‍රදේශ රැසකත් ලොව පුරාත් තැනින් තැන සිදු වූ මනුස්ස ඝාතනත් පාප් වහන්සේ මෙහිදී දැඩි ලෙස අවධාරණය කරමින් කතා කර තිබුණි.

'මේ ඝාතන හා විනාශ සම්බන්ධව නොයෙක් නොයෙක් වචන භාවිත වුණත් මේ සඳහා නියම වචනය යුද්ධය. ලොව පුරා සාමය අතුරුදහන් වී තියෙන නිසා මේ වගේ යුද තත්ත්වයක් හටගෙන තියෙනවා. ඒ ගැන එළිපිට කතා කරන්න බිය විය යුතු නෑ' යි ලොව වර්තමාන තත්ත්වය පිළිබඳ උන්වහන්සේ පැවසීය.

'මෙය ආගමක් සඳහා කරන යුද්ධයක් නෙවෙයි. කැමැත්ත සහ අකමැත්ත අතර යුද්ධයක්. මුදල් සඳහා වන යුද්ධයක්. ස්වභාවික සම්පත් සඳහා වන යුද්ධයක්. ජනතා ආධිපත්‍ය සඳහා වන යුද්ධයක්. මේක තමයි යුද්ධය. ඔබට තේරෙනව නේද මේ දේ.... සෑම ආගමකටම සාමය ඕනෑ. යුද්ධය ඕනෑ අනික් පිරිසටයි...'

# Hillary Clinton vs. Donald Trump

සෑම වසර 04 කටම වරක් පැවැත්වෙන ඇමරිකානු ජනපතිවරණය මෙවර 2016 නොවැම්බර් 08 වෙනි දින පැවැත්වීමට නියමිතයි. ජනපද 50 කින් සහ කොලොම්බියා දිස්ත්‍රික්කයෙන් සැදි එක්සත් ජනපදයේ අස්සක් මුල්ලක් නෑර මේ වන විට මැතිවරණ උණුසුම පැතිර ගොසින්. සාමාන්‍යයෙන් බටහිර රටවල මැතිවරණ අපේ රටවල වගේ නොවෙයි. මහත් ඇල්මැරුණු ස්වභාවයක් ගන්නවා. සාමාන්‍ය ජනතාව නම් මේ මැතිවරණ ගැන කිසිම උනන්දුවක් දක්වන්නෙ නෑ. හුඟක් අය ඡන්දය ප්‍රකාශ කිරීමට යන්නෙත් නෑ.

ඒ වුණත් මේ සැරේ ඇමරිකාවේ පවත්වන්නට සූදානම් වන ජනාධිපතිවරණය නම් ඒ ස්වභාවයෙන් ටිකක් මිදිල වෙනස් හැඩයක් අරන් තියෙන බවක් තමයි පේන්නෙ. ඡන්ද දායකයො වගේම අපේක්ෂකයොත් හරිම ආවේගශීලියි. ජනපතිවරණයේ තීරණාත්මක පක්ෂ දෙක ලෙස සැලකෙන ඩිමොක්‍රටික් සහ රිපබ්ලික් පක්ෂ දෙකේ ජනපති අපේක්ෂකයා තෝරා ගැනීමට තිබුණොත් ලොකු පොරයක්.

ඒ සඳහා රට පුරා පවත්වපු ජනමත විචාරණවලින් පසුව පක්ෂ දෙකම දැන් ඊට සුදුස්සන් තෝරාගෙන අවසන්. රිපබ්ලිකන් පක්ෂය වෙනුවෙන් ජනපති සටනට අවතීර්ණ වී සිටින්නේ ප්‍රකෝටිපති ව්‍යාපාරිකයකු වන 70 හැවිරිදි ඩොනල්ඩ් ට්‍රම්ප්. ඩිමොක්‍රටික් පක්ෂය සිය අපේක්ෂකයා විදියට ඉදිරිපත් කරල තියෙන්නේ හිටපු ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ භාර්යාව වන 68 හැවිරිදි හිලරි ක්ලින්ටන්.

ජනපති අපේක්ෂකයා තේරීමේදී රිපබ්ලිකන් පක්ෂයේ ඩොනල්ඩ් ට්‍රම්ප්ට එයාගෙ පක්ෂයෙන්ම විශාල අභියෝග එල්ල වුණා. විශේෂයෙන්ම ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රසිද්ධ වේදිකාවල කියන ඇතැම් වාචාල කතා පක්ෂයේ වගකිවයුත්තන් ප්‍රසිද්ධියේම විවේචනය කළා. ඒත් මේ එකකින්වත් ඩොනල්ඩ් ට්‍රම්ප් සැලුණෙ නෑ. ඒ වගේම ඔහුගේ කතා කරන විලාශය වෙනස් කරගත්තෙත් නෑ. මුස්ලිම් අන්තවාදය විතරක් නෙවෙයි සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඔහුගේ දෝෂ දර්ශනයට හසු වුණා. චීනය වැනි රටවල් ඇමරිකාවට අත පොවන්නට තැත් දරන එක ගැන ඔහු සිය අප්‍රසාදය පළ කළා. එපමණක් නොව මෑතකදී ඔහු නේටෝ සංවිධානය පිළිබඳව පළ කර ඇති අදහස් දැක්වීමද මේ වන විට දැඩි මතභේදාත්මක ස්වරූපයක් ගෙන තියෙනවා. ඔහුගේ කෙළින් කතා කරන විලාශයට ජනතාව වැඩියෙන් මනාම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ රිපබ්ලිකන් අපේක්ෂකයා තෝරාගැනීමේදී බහුතර ජනමතයක් හිමිකර ගැනීමට ඩොනල්ඩ් ට්‍රම්ප් සමත් වුණා.

කරුණු එසේ සැකසෙද්දී අකමැත්තෙන් හෝ ට්‍රම්ප්ගේ අපේක්ෂකත්වය පිළිගැනීමට රිපබ්ලිකන් පක්ෂයටත් සිදුවුණා. ඒ අනුව පසුගිය ජූලි 19 වෙනිදා ඔහියෝහි ක්ලේව්ලෑන්ඩ්වලදී පැවැත්වුණු රිපබ්ලිකන් පක්ෂයේ ජාතික සමුළුවේදී ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපති අපේක්ෂකයා ලෙස තෝරාගත් බව නිල වශයෙන් ප්‍රකාශ කිරීම රිපබ්ලිකන් පක්ෂය විසින් සිදු කළා. එසේ වුවත් පක්ෂයේ ඉහළ තානාන්තර කිහිපයක්ම මේ පත්කිරීමට විරෝධය පළ කර පැවසුවේ ට්‍රම්ප් ඇමරිකාවේ ජනාධිපති වීමට නුසුදුස්සෙකු කියලයි. ඔහු දක්වන අන්තවාදී අදහස් නිසා ඇමරිකානු ජනාධිපතිවරයකුට තිබිය යුතු ප්‍රතිරූපය මුළුමනින්ම විනාශ කරගෙන ඇති බව ඒ පිරිස පෙන්වා දුන්නා. කෙසේ වුවත් මේ සමුළුවේදී අදහස් දැක්වූ පක්ෂයේ කතානායකවරයා පැවසුවේ ඩොනල්ඩ් ට්‍රම්ප් ගැන විවිධ මතවාද, ගැටුම් කොපමණ තිබුණත් ඒ සියල්ල මඳකට පසෙකට දමා රිපබ්ලිකන් පක්යේ අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමට සියල්ලන්ම ට්‍රම්ප් වටා එක් වන්න කියලයි.

මේ පිළිබඳව දේශපාලන විචාරකයින් පවසා තිබුණේ, ප්‍රාන්ත අතර පැවති ජනමත විමසුම්වලදී මෙන්ම ක්ලේව්ලෑන්ඩ්හිදී පැවති ඡන්දයෙනුත් ට්‍රම්ප් වෙත ප්‍රසාදය පළ කළ පිරිස වැඩි නිසා ඩොනල්ඩ් ට්‍රම්ප් ජනපති පුටුවට ළං කරනවා හැර වෙනත් විකල්පයක් පක්ෂයට නොතිබුණා කියලයි.

මේ අතර ඩිමොක්‍රටික් පක්ෂයද එම පක්ෂයේ සමුළුවේදී සිය ජනාධිපති අපේක්ෂයා පිළිබඳව නිල වශයෙන් දැනුම් දුන්නා. ඒ හිලරි ක්ලින්ටන්ගේ නමයි. මේ ප්‍රකාශයත් සමගම හිලරි ක්ලින්ටන් ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ නොමැකෙන සනිටුහනක්ද තැබුවා. ඒ ඇමරිකාවේ ජනාධිපතිවරණයකට ඉදිරිපත් වූ පළමු කාන්තාව ලෙසයි. යම් හෙයකින් ඇය ජනාධිපති වුවහොත් එයද ඉතිහාසගත ජයග්‍රහණයක්. ඒ ඇමරිකාවේ පළමුවන ජනාධිපතිවරිය ලෙසයි.

හිලරි ක්ලින්ටන්ගේ මේ තේරී පත්වීමත් සමග ඇමරිකාවේ වත්මන් ජනාධිපති බරක් ඔබාමා ඇය වෙත සුභ පැතුම් පිරිනැමූ අතර සමුළුව අමතමින් කතාවක්ද පවත්වනු ලැබුවා. එහිදී ජනාධිපතිවරයා හිලරි ක්ලින්ටන් සතු දේශපාලන ඥානය පිළිබඳව වෙසෙසින්ම සඳහන් කරනු ලැබුවා. ඇමරිකාවේ ජනාධිපති තනතුරු දැරීමට ඇය සෑම අතකින්ම සුදුසු බවද පෙන්වා දෙනු ලැබුවා. විශේෂයෙන්ම ඇගේ ප්‍රතිවාදියා වන ඩොනල්ඩ් ට්‍රම්ප් සමග බැලීමේදී පැහැදිලි යහපත් වෙනස්කම් රැසක් හිලරි තුළ ඇති බව ඔබාමා ජනාධිපතිවරයා පවසා තිබුණා.

ඩිමොක්‍රටික් පක්ෂය විසින් හිලරි ක්ලින්ටන් ජනාධිපති අපේක්ෂකත්වයට තෝරා පත්කරගත් අන්දම ගැනත් මේ වන විට විවිධ කටකතා පැතිරෙනවා. එක් අතකින් බැලූ විට මේවා කටකතාම නොවෙයි. ඔප්පු කළ හැකි සාධකද සහිතව ඒවා මුළු ලෝකයටම දැන් හෙළි වෙලා. එම හෙළිදරව්ව කරල තියෙන්නෙ කාගෙත් ඕපදූප, රහස් තොරතුරු සොයා ප්‍රසිද්ධ කරන Wikileaks. එම වෙබ් අඩවියේ පළ කර තිබූ ඊමේල් පණිවිඩ තොගයක ඩිමොක්‍රටික් පක්ෂය එහි ජනාධිපති අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වූ බර්නි සෑන්ඩර්ස් පැරදවීමට කටයුතු කර ඇති අන්දම දැක්වෙනවා. ඊ මේල් 20,000 ක් පමණ අඩංගු මේ තොගය 2015 ජනවාරි සිට 2016 මැයි වෙනකම් හුවමාරු වූ ඒවා. බර්නි සැන්ඩර්ස්ගේ ජනප්‍රියත්වයෙන් ක්ලින්ටන්ගේ අපේක්ෂකත්වයට එල්ල වන අභියෝග සමග ගනුදෙනු කරන ආකාරය ඩිමොක්‍රටික් පක්ෂ කාර්ය මණ්ඩලය විසින් මේ ඊමේල්වලින් සාකච්ඡා කර තියෙනවා.

මේ හෙළිදරව්ව ගැන හිලරි ක්ලින්ටන් චෝදනා නගන්නෙ රුසියාවට. විකිලීක්ස් සිදුකළ මේ හෙළිදරව්ව පිටුපස රුසියාව සිටින බවත් එරට ජනාධිපති පුටින්ද මීට වගකිව යුතු බවත් ඇය කියනවා. ඇය මේ ඊමේල් හෙළිදරව්ව හඳුන්වන්නෙ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපති කරවීම සඳහා රුසියාව ගෙන යන උපක්‍රමවලින් එකක් විදියටයි.

ඒත් හිලරිගේ මේ චෝදනාව පිළිගන්න රුසියාව සූදානම් නෑ. ඔවුන් ඒක තරයේම ප්‍රතික්ෂේප කරනවා. තමන්ගෙ නමත් ඈඳී ඇති මේ සිද්ධියට ඩොනල්ඩ් ට්‍රම්ප්ද අපූරු පිළිතුරක් දී තබුණා. හිලරිගේ මේ ප්‍රකාශවලින් ඇයගේ නොහැකියාව තහවුරු වන බව කියලයි ඔහු පවසන්නෙ.

මේ හෙළිදරව්ව ගැන කරුණු කියන්න විකිලීක්ස් නිර්මාතෘ ජූලියන් අසෑන්ජ් මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා තිබුණා. මේ ඊමේල් ගැන හිලරි නගන චෝදනා අසත්‍ය බව සහ ඊමේල් තුළ තියෙන සියලුම තොරතුරු සත්‍ය බව එහිදී ඔහු කිව්වා.

1 වන පිටුවෙන්

## කැනඩා විදේශ...

ගැටලුව විසඳීමට කටයුතු කළ යුතු බවයි. රාජ්‍ය භාෂා ගැටලුව විසඳීම සඳහා කැනඩා රජයේ සහාය ලබා දීමට සූදානම් බව පැවසූ විදේශ ඇමතිවරයා, රාජ්‍ය සේවයේදී සිංහල හා දෙමළ යන භාෂා ද්විත්වයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීමේ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කළ යුතු බවද පවසා තිබුණි. මේ වෙනුවෙන් ඩොලර් බිලියන 11.2 ක මුදලක් වසර පහක කාලයකට ශ්‍රී ලංකාවට ලබා දීමට කැනඩා රජය තීරණය කර ඇතැයිද ඩියෝන් විදේශ ඇමතිවරයා පවසා ඇත.

ශ්‍රී ලංකා රජය විසින් ගෙන යන සංහිඳියා ක්‍රියාවලිය දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ඉතාම වැදගත් බවත් ඒ නිසාම ජගත් මානව හිමිකම් කවුන්සිලය මගින් සම්මත කෙරුණු යෝජනාවට සම අනුග්‍රහය ලබා දීමට කැනඩාව ඉදිරිපත් වූ බවත් විදේශ ඇමතිවරයා ප්‍රකාශ කර ඇත. ශ්‍රී ලංකාව තුළ සාමය හා සංහිඳියාව ඇති කිරීමේදී ජාත්‍යන්තර සහභාගිත්වයේ ඇති වැදගත් කමද ඇමතිවරයා මෙහිදී පෙන්වා දී තිබුණි.

මෙම තෙදින නිල සංචාරය අතරතුරදී කැනඩා විදේශ ඇමතිවරයා උතුරේ සංචාරයක නිරත වීමටද අමතක නොකළ අතර එහිදී උතුරු පළාත් ආණ්ඩුකාරවරයා මෙන්ම උතුරේ මහ ඇමතිවරයාද හමුවීමට කටයුතු කර තිබුණි.

එහිදී ආණ්ඩුකාරවරයා සහ කැනඩා විදේශ ඇමතිවරයා අතර උතුරේ අවතැන් ජනතාව නැවත පදිංචි කරවීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වුණු අතර මේ වන විටත් පවුල් එක්ලක්ෂ හැටදහසකට වැඩි ප්‍රමාණයක් නැවත පදිංචි කර ඇති බවත් පවුල් 120,000 ක් පමණ යාපනය ප්‍රදේශයේ පදිංචි කර ඇති බවත් ආණ්ඩුකාරවරයා පෙන්වා දී තිබුණි. මේ පිරිස පදිංචි කිරීමට ඉඩම් අක්කර 2500 ක් නිදහස් කරවීමට කටයුතු කර ඇති බවත් ඉතිරි ඉඩම්ද පියවරෙන් පියවර අයිතිකරුවන්ට ලබා දීමට කටයුතු කරන බවත් ආණ්ඩුකාරවරයා එම යාන්ත්‍රණය පිළිබඳව වැඩිදුරටත් පැහැදිළි කර තිබුණි. යුද්ධය නිසා අනාථභාවයට පත්ව සිටින කාන්තාවන් සඳහා ආධාර ලබාදීමටත් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට අවශ්‍ය කටයුතු සොයා බැලීමට මෙහිදී කැනඩා විදේශ ඇමතිවරයා එකඟතාව පළ කොට තිබුණි.

යාපනය සංචාරය අවසන් කරමින් අදහස් පළ කළ විදේශ ඇමතිවරයා මෙසේ පැවසීය. 'ලොව කිසිම රටක් අපේ රටේ ආණ්ඩු ක්‍රමය අනුකරණය කළ යුතු නෑ. ෆෙඩරල් හා ඒකීය කියන වචනවල එල්ලී වාද විවාද කරනවාට වඩා තමන්ගෙ රටට අත්‍යවශ්‍ය කුමන සුවිශේෂී ක්‍රමයද යන්න ප්‍රායෝගිකව සොයා බලා රට තුළ ජීවත් වන ජාතීන් අතර එක්සත් කම රැක ගත හැකි ක්‍රමයකට එය යොදා ගැනීමට සාකච්ඡා කිරීමත් එය ක්‍රියාත්මක කිරීමත් තමයි වඩාත්ම වැදගත් වන්නේ'

## ටොරොන්ටෝ...

මෙවර CMHC විසින් නිකුත් කර ඇති 'කාර්තුමය නිවාස වෙළඳපොළ තක්සේරු වාර්තාව' දෙස බැලීමෙන්ද වැන්කූවර් නිවාස වෙළඳපොළ තුළ පවතින අවදානම් තත්ත්වය පැහැදිලි වේ. පසුගිය වසරේ මෙම වාර්තාව නිකුත් කිරීමෙන් පසු පළමු වතාවට වැන්කූවර් නිවාස වෙළඳපොළේ අවදානම් මට්ටම ඉහළම අගයකට ගොස් ඇති බව එය පෙන්නා දේ.

ඉල්ලුම හා සැපයුම අතර පවතින තරගකාරිත්වය ඉහළ යෑමේදී දරාගත නොහැකි වෙළඳපොළක් නිර්මාණය වීම පිළිබඳව මෙය හොඳම සාක්ෂියක් බවත් මෙය තුළින් නගරයේ දේපළවල මිල තවදුරටත් ත්වරණය වෙමින් පවතින බවත් නිවාස ඒජන්සිය පවසා සිටියි. මේ වන විට නාගරික සීමාවල තනි නිවාසයන්හි (detached homes) මිල ගණන් තීරණය වන්නේ පුදුම සහගත අන්දමින් වන අතර එය සැබවින්ම ආර්ථික මූලධර්මයන් පවා ඉක්මවා යන ආකාරයක් පෙන්නුම් කරන්නක් බව ආර්ථික විශ්ලේෂකයන්ගේ අදහසයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ CMHC හි ප්‍රධාන වෙළඳපොළ විශ්ලේෂකයකු වූ රොබින් ඇඩ්මැවෙ පැවසුවේ, කාලයක් තිස්සේ වැන්කූවර් නිවාස වෙළඳපොළ තුළ පවතින අධික උණුසුම් ධාවනය පාලනය කිරීමට කඩිනමින් පියවර ගැනීම අත්‍යවශ්‍ය බවයි.

මේ තත්ත්වය රට පුරාම පෙන්නුම් කරන්නක් වන අතර විශේෂයෙන්ම ටොරොන්ටෝව තුළද නිවාස වෙළඳ පොළෙහි අධික උණුසුමක් පෙන්නුම් කෙරේ. අඩු අදායමක් ඇති අයෙකුට තනි නිවසක් නොව කොන්ඩො නිවාසයක්වත් මිල දී ගත නොහැකි තරමට ටොරොන්ටෝවේ නිවාස මිල ගණන් අහස උසට නැග ඇත.

වැන්කූවර් සහ ටොරොන්ටෝවට අමතරව කැල්ගරි, සස්කැචූන් සහ රෙජිනා, එඩ්මන්ටන් සියලුම පළාත්, විනිපෙග්, හැමිල්ටන්, මොන්ට්‍රියල්, ක්විබෙක් යන ප්‍රදේශවලද දේපළ වෙළඳපොලෙහි දැඩි අසමතුලිත බවක් පෙන්නුම් කරන බවට සාක්ෂි වර්තමානයේදී දක්නට ලැබේ.

ඉතිහාසයේ කවරදාවත් නොමැති ආකාරයට කැනඩාවේ ප්‍රධාන නගර තුළ නිවාස වෙළඳපොළ මේ ආකාරයට ඉහළ යෑම නිසා අනාගතයේදී සමස්ත කැනඩාවේම ආර්ථිකයට එයින් විශාල බලපෑමක් එල්ල විය හැකි බව මේ පිළිබඳව කරුණු දක්වන ආර්ථික විශේෂඥයින්ගේ අදහසයි.

# TRICO MARITIME

(Sole Authorized Agent of Trico Maritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka

**Serving People Worldwide Reliably for 35 Years**

## SRI LANKA'S BEST AND LARGEST CLEARING FACILITIES IN THREE MAJOR CITIES SINCE 1980

# COLOMBO - GALLE - KURUNEGALA




**DOOR TO DOOR SERVICE**

**Colombo, Jaffna, Kilinochchi, Batticaloa, Trincomalee, Vavuniya, and Mannar**

**Contact**
**DERRICK ANTON:**
**647-833-3020**
**416-335-8800**

## සැනසිල්ලේ ගමට යන්න
## ට්‍රයිකෝ මෙරිටයිම් වෙත ඔබගේ භාණ්ඩ භාර දෙන්න

**TRICO OFFERS ANOTHER NEW SERVICE**
**"SPECIAL DOOR TO DOOR DELIVERY"**
EXCLUSIVELY TO - COLOMBO AND ALL OTHER GREATER COLOMBO AREAS COVERING UP TO PANADURA, HOMAGAMA, KADUWELA, PILIYANDALA, JA-ELA ETC.
SHORTLY THIS SERVICE WILL BE EXTENDED TO ALL OTHER MAJOR DISTRICTS IN SRI LANKA
FOR FURTHER DETAILS: CONTACT - DERRICK ANTON

## Trico Maritime Customer Service in Sri Lanka

**Head Office**
Trico Maritime (Pvt) Ltd
50 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580/2345581
Fax: 2432000

**Colombo Warehouse**
Trico Maritime (Pvt) Ltd
414/17 K.cyril Perera Mawatha
Colombo 13
Tel: 24444400/2444488
Fax: 2432000

**Kurunegala Warehouse**
Trico Maritime (Pvt) Ltd
Humbara Rd, Sandagala,
Uhumeeya
Tel: 037-2238924/037-2238925
F ax: 037-2238967

**Galle Warehouse**
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd,Kangoda
Galle
Tel: 091-2234842 Fax: 2234841

## Our Canadian Agents

Alberta : 587-708-5665 (Tony)
Calgary : 403-971-6721 (Saman)
Montreal : 514-884-8550 (Vickie)
Ottawa : 613-513-6106 (Saman)
Winnipeg : 204-800-2364 (Mangalika)

**Trico Maritime Freight Forwarding Canada Inc.**
151 Nashdene Rd, Unit # 5, Scarborough, ON, M1V 4B9
Intersection: Markham Rd / Nashdene Rd

Tel: 416-335-8800 Fax: 416-335-8848
Email: info@tricomaritime.ca
www.tricomaritime.ca

# ලෙඩට ඔසුවක් වූ භාවනාව



සායනික මෝහන වෛද්‍ය
■ එච්. දමිත් හෙට්ටිආරච්චි

**'රෝගයකට ප්‍රතිකාර ගන්නා අයකු කළ යුතු වැදගත්ම දේ සිත ලෙඩ නොකරගෙන සිටීමයි. භාවනාව යනු දුකෙන් කලකිරීමෙන් ජීවත්වන අයට සුදුසු දෙයක් යැයි කීම සම්පූර්ණයෙන්ම වැරැදියි'**

පිටිසර කැළෑබද ප්‍රදේශයක පිහිටි බෞද්ධ භාවනා මධ්‍යස්ථානයක යුරෝපීය ජාතිකයෙක් නේවාසිකව සිටියේය. ඔහු ඉතාම උනන්දුවෙන් ගාථා කියමින් වන්දනාමාන කරන අතර වැඩි කාලයක් ගත කරන්නේ භාවනානුයෝගීවය. මම මේ අපූරු පුද්ගලයා සමඟ කතාවට වැටුණෙමි. ඔහු ඉතා සැප පහසු ජීවිතයක් ගත කළ ධනවත් අයෙකි. නමුත් පසු කාලයේදී ඔහුට රෝග කීපයක් වැලඳිණි. ඔහු ඒ සඳහා බටහිර නවීනතම ප්‍රතිකාර කළද එතරම් සුවයක් නොවීය. ඒ නිසා ඔහු මෙරට දේශීය වෛද්‍ය ප්‍රතිකාර අත්හදා බැලීම සඳහා මෙහි පැමිණ ඇත. ඒ අතරතුර ඔහුට භාවනාව මගින් සිතටත්, ගතටත් සුවයක් ලබාගත හැකි බව දැනගන්නට ලැබිණි. තම රෝගී තත්ත්වය පිළිබඳව කනස්සල්ලෙන් සිටි ඔහු වෛද්‍ය ප්‍රතිකාර කරන අතරතුරම භාවනා පුහුණු කිරීම ආරම්භ කළේය. කලක් භාවනාව ප්‍රගුණ කළ විට ගතට මහත් සුව පහසුවක් දැනෙන්න පටන්ගත් බවත්, රෝග පීඩාවලින් ඇතිවූ අපහසුකම් දුරු වී යන බවත් ඔහු පවසයි. ඊටත් වඩා තමාගේ මනසට මහත් සහනයක් සහ ප්‍රබෝධයක් ලැබුණු බවද ඔහු ප්‍රකාශ කළේය.

භාවනාවෙන් සිත එකඟ කරගත් විට එමගින් සිතට පමණක් නොව, ගතටද සුවදායක ප්‍රතිඵල ඇතිවන බව දැන් විද්‍යාත්මකව තහවුරු කරගෙන තිබේ. ඒ නිසා භාවනාව කායික - මානසික යන රෝග දෙවර්ගයටම සුදුසුය.

මනස සන්සුන්ව, නිසසලව පවතින මොහොතක, ශරීරය දෙස හොඳින් බැලුවහොත් එයද ඉතාම සන්සුන්, ප්‍රසන්න ලෙස පවතින බව අපට පෙනෙයි. එසේම මනස නොසන්සුන්ව, ව්‍යාකූලව පවතින විට කායික සමබරතාවද බිඳී යයි. ශරීර පීඩා, අපහසුතා වැඩියෙන් දැනෙයි. ශරීරයේ යහ පැවැත්මට මනසේ බලපෑම එයින් හොඳින් තහවුරු වෙයි.

## සැබැවින්ම භාවනාව යනු කුමක්ද?

භාවනාව යනු සිත වැඩීමයි. සිත වැඩීමට හෙවත් වර්ධනය කිරීමට නම් පළමුව සිත එකඟ කළ යුතුය. සිත එකඟ කිරීම සඳහා විවිධ අභ්‍යාස ක්‍රම තිබේ. එක් එක් පුද්ගලයාට ගැළපෙන අභ්‍යාස ක්‍රම එකිනෙකට වෙනස්ය.

නිවැරදි භාවනාව මඟින් සිත සහ කය පිළිබඳවත්, ලෝක ධර්මතාව පිළිබඳවත් ගැඹුරු වැටහීමක් ලබාගත හැකිය. එමගින් බොහෝ පීඩා, ගැටලු විසඳාගත හැකි වනු ඇත.

අවුලින් පිරුණු සිතක් ඇතිව ජීවත් වීම මහත් වූ පීඩාවකි. එය සිත මෙන්ම කයද නිරන්තර වෙහෙසට පත් කරවයි.

අප අකමැති සිදුවීමක් නැවත නැවත සිහිපත් වීම තුළ සිත නොසන්සුන් වෙයි. ඉන්පසු එයින්ද නොනැවතී හිසරදය වැනි රෝගයකින් එම පීඩාව ශරීරයටද ගමන් කරයි. එනමුදු හොඳ සිහි කල්පනාවකින් සිට, භාවනාවක යෙදුණොත් තමාට ඉහත සඳහන් කළ අපහසුතා ඇතිවීම වෙනුවට නිසසල, ශාන්ත බවක් අත්විඳිය හැකි වෙයි.

භාවනාව යනු එබඳු සිහිය මගින් අනවශ්‍ය දේ අත්හැර දැමීමකි. නැතිනම් අවබෝධයෙන් යුතුව මනස පවත්වා ගැනීමකි. සිත එලෙස පවත්වා ගත හැකි නම් කායික, මානසික පීඩාවල් බොහොමයක් දුරු වී යයි.

'භාවනාව' යන වචනයත් සමගම අපගේ සිතට නැගෙන්නේ යම් ආගමික කටයුත්තකි. නමුත් ආගමික පදනමකින් තොරව වුවත් ඕනෑම කෙනෙකුට සිතට ගතට සැහැල්ලුවක් ගෙන දෙන, මානසික ආතතිය අවම කරන ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවනාව යොදාගත හැකිය. ඒ නිසා භාවනාව අද ලෝකයේ විවිධ ස්ථානවල භාවිත වෙයි. භාවනාව තුළ වෛද්‍ය විද්‍යාත්මක පදනමක්ද තිබේ.

භාවනාව යනු නිරෝගීභාවයට හොඳම ඔසුවයි. භාවනාවෙන් තොර වූ විට අපගේ සිතුවිලි ධාරාව අයාලේ ගොස් මනසේ සමබරතාව පලා යයි. එසේ වූ විට අප හැසිරෙන්නේ උමතු වූවන් මෙනි.

කරන කියන දේ ගැන නිසි දැනීමක් නැතිව කිව යුතු නොකිව යුතු දේ ගැනද අවබෝධයක් නැතිව ජීවිත අවුල් කරගන්නා අය කොතෙක් සිටීද? එසේම හිතට එන දේ කරමින්, කියමින් ගැටලු ඇතිකරගෙන කල්පනාවේ නිමග්න වෙමින් නින්ද පවා අහිමි කර ගන්නා අයද බොහෝය. ඒවායින් මිදීමට භාවනාව යොදාගත හැකිය.

## දුර්මත

භාවනාව පිළිබඳව සමාජයේ දුර්මත බොහෝය. භාවනා කිරීමෙන් රෝග ඇතිවෙතැයි සිතන අයද සිටිති. එසේ වන්නේ වැරදි ලෙස භාවනා කළ විටය.

භාවනාව යනු සමාජයෙන්, ලෝකයෙන් දුරස් වී, ප්‍රශ්නවලින්, යුතුකම්වලින් පලා යන ආකාරයේ දෙයක්ද නොවේ. එසේම භාවනාව යනු දුකෙන්, කලකිරීමෙන් ජීවත්වන අය කළ යුතු දෙයක්ද නොවේ. එය සුදුසු වන්නේ නිරෝගී, සිත ශක්තිමත්, බුද්ධිමත් අයටය.

භාවනාව යනු හුදකලා තැනකට වී, එක්තරා විශේෂ ඉරියව්වකින් හිඳගෙන, කිසිවක් නොසිතමින් සිදුකරන හිස් අභ්‍යාසයක් යැයි ඇතැම් අය සිතති. ඒවා සම්පූර්ණ වැරදි අදහස්ය. භාවනාව යනු සිත එක අරමුණක හෝ සීමාසහිත අරමුණු ප්‍රමාණයක පිහිටුවාගෙන ඉතාම අවබෝධයෙන් සහ සිහි නුවණින් කළ යුතු දෙයකි.

## අත්දැකීම් සහ අවබෝධය

භාවනා කරන විට දැනෙන අත්දැකීම් සහ අවබෝධය වචනයෙන් විස්තර කළ නොහැකිය. එය තම තමන් විසින්ම අත්හදා බලා තේරුම් ගත යුත්තකි.

භාවනාවේ අවබෝධය මගින් අපගේ අනවශ්‍ය සිතුවිලිවල පාලනය ඇතිවෙයි. ඒ නිසා ශරීරයේ රෝග යන් වැලඳුණද ඒ පිළිබඳව කනගාටු නොවී සැහැල්ලුවෙන් සිටීම තුළ රෝග පීඩාව බොහෝ අඩු කරගත හැකිය. රෝගයකට ප්‍රතිකාර ගන්නා අතරතුර අප කළ යුතු වැදගත්ම කාර්යය වන්නේ 'සිත' ලෙඩ නොකරගෙන සිටීමයි. කය ලෙඩ වුවත්, සිත ලෙඩ නොවේ නම් කය සුවපත් කරගැනීම පහසු වෙයි.

භාවනා කිරීමට පුරුදු වීම මුලදී තරමක් අපහසු කටයුත්තක් විය හැකිය. එයට හේතුව සිත එකඟ කර ගැනීම අපහසු නිසාය. ඒ සඳහා ඒ ඒ පුද්ගලයාගේ චරිතයට ගැළපෙන ගුරු උපදේශ ලබාගත යුතුය. උපදෙස් ලබාගැනීම අනිවාර්ය වන්නේ භාවනාව වැරදුණහොත් කෙනෙකු මුළාවට පත්විය හැකි බැවිනි.

## වෛද්‍ය ප්‍රතිකාරයක්

භාවනාව වෛද්‍ය ප්‍රතිකාරයක් ලෙස යොදාගත හැකි ආකාරය පිළිබඳව නූතන ලෝකයේ බොහෝ පර්යේෂණ පැවැත්වෙමින් තිබේ. භාවනා ක්‍රම ඇතැම් රෝගී තත්ත්ව සඳහා නිර්දේශ කරන වෛද්‍යවරු සිටිති.

නූතන ලෝකයේ දැනට අංක එකේ සෞඛ්‍ය ගැටලුව ලෙස හඳුනාගෙන ඇත්තේ මානසික ආතතියයි. මානසික ආතතිය අධික වීම නිසා විවිධ ආකාර වූ මානසික හා ශාරීරික රෝග හටගනියි. මානසික ආතතිය සංසිඳුවීම සඳහා අංක එකේ ප්‍රතිකර්මයක් ලෙස භාවනාව හඳුන්වාදිය හැකිය.

භාවනාව මගින් රෝග සුව වන්නේ කෙසේද? යන්න මෙහිදී සාකච්ඡා කළ යුතු වැදගත් ප්‍රශ්නයකි.

සිත එක්තැන් කරගෙන භාවනා වඩන විට අප ශරීරයේ 'එන්ඩෝෆින්' නමැති හෝමෝනය වැඩි වශයෙන් ස්‍රාවය වෙයි. එම හෝමෝනය මගින් සිදු කරන්නේ ශරීරයේ වේදනාවල්, අපහසුතා සමනය කර ශරීරයේ විවිධ පද්ධතිවල යහ පැවැත්ම ඇති කිරීමයි. අපගේ සිතට සතුටක්, සැහැල්ලුවක් ඇතිවන හැම අවස්ථාවකම එන්ඩොෆින් හෝමෝනය ස්‍රාවය වෙයි.

බොහෝ වේලාවක් නොසෙල්වී එකම ඉරියව්වකින් සිටීම කාටත් අපහසු කටයුත්තකි. එයට හේතුව එසේ සිටින විට සිරුරේ විවිධ තැන්වල වේදනාවල් ඇතිවීමයි. නමුත් පළපුරුදු භාවනානුයෝගී පුද්ගලයන් එසේ එකම ඉරියව්වෙන් නොසෙල්වී බොහෝ වේලාවක් සිටින අයුරු ඔබ දැක තිබේද?

එයට හේතුව ඔවුන් තුළ ස්‍රාවය වන එන්ඩොෆින් නමැති හෝමෝනය නිසා කායික අපහසුතා නොදැනීමයි.

මීට අමතරව, භාවනාවේදී අපගේ ප්‍රතිශක්තිකරණ පද්ධතියද ශක්තිමත් වෙයි. එමගින් අපව රෝගවලින් ආරක්ෂා වෙයි. භාවනාව නිසා හිතේ ඇතිවන සැහැල්ලුව, සතුට මගින් සිතෙහි අඳුරු, සෘණාත්මක සිතුවිලිද බැහැර වෙයි. භාවනාව යනු හොඳ විවේකයකි. පැය කීපයක නින්දකින් ලබන විවේකය කෙටි කාලයක් නිවැරදිව භාවනා කිරීමෙන් ලැබෙයි. එබැවින් භාවනා කරන පුද්ගලයාට හොඳ නින්දක් සහ ප්‍රබෝධයක් ලැබෙයි.

අපගේ සිත සතුටින් සහ තෘප්තිමත්ව තබා ගැනීම සඳහා අප කොතරම් උත්සාහ කරමුද? කොතරම් මුදල් වියහියදම් කරමුද? නමුත් භාවනාව යනු කිසිඳු වියදමක් හෝ විශේෂ උපකරණයක් අවශ්‍ය නොවන ක්‍රමයකි.

දිනකට විනාඩි 20 ක් නිවැරදිව භාවනා කරන්නේ නම් කෙටි කලකින්ම අපගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයෙහි පැහැදිලි වෙනසක් ඇතිකළ හැකි බව දැන් තහවුරු වී ඇත. භාවනාව මගින් ලැබෙන ප්‍රතිඵලය වෙනත් ක්‍රමයකින් හෝ වෙනත් ඖෂධයකින් ලබාගත නොහැකිය. බෞද්ධයන් නොවන පුද්ගලයන් පවා භාවනාව පිළිබඳව දැඩි උනන්දුවක් දක්වන්නේ ඒ නිසාය.

## භාවනාව මගින් එක එල්ලේම පාලනය කළ හැකි රෝග ලෙස හඳුනාගත් රෝග රැසකි.

- අධික රුධිර පීඩනය
- හදවත් රෝග
- මානසික ආතතිය නිසා සිරුරේ හටගන්නා විවිධ රෝග
- පිළිකා
- ඇතැම් ආසාත්මිකතා
- ඇතැම් මානසික රෝග වැනි රෝග ඒ අතර ප්‍රධාන වශයෙන් දැක්විය හැක.

අධ්‍යාපනය ලබන සිසුන්ට භාවනාව මහත් රුකුලකි. එමගින් මතකය, බුද්ධිය මෙන්ම අවධානය වර්ධනය කළ හැකිය. මනසේ නිරවුල් බව අධ්‍යාපනයට මහත් රුකුලකි.

භාවනාවේ ප්‍රධාන ඉලක්කය වන්නේ ආධ්‍යාත්මික දියුණුවයි. භාවනාවෙන් ඇතිවන අවබෝධය සහ පරිණතභාවය ඕනෑම කෙනෙකුට සමාජයේ ජීවත්වීමට මහත් පිටුවහලකි. ඒ මගින් තමන්ගේ සිත පිළිබඳව ලැබෙන අවබෝධයෙන් තම ජීවිතයේ සියලු ගැටලුවලට පිළිතුරු සොයා ගත හැකිය.

ඇත්තෙන්ම මානසික ගැටලුවක් හෝ ප්‍රශ්නයක් යනු අපට අපේම සිත හඳුනාගත නොහැකි අවස්ථාවකි. එබැවින් බාහිර ලෝකයේ දොස් දැකීම වෙනුවට තමා තුළින්ම සැනසුම සොයා ගත හැකි ක්‍රමය භාවනාවේ සඳහන් වෙයි. බොහෝ අය බොහෝ දේට ආශා කරති. එය මිනිස් ස්වභාවයයි. නමුත් ඔවුන් ආශා කරන හැම දෙයක්ම ඒ අයුරින්ම ඉටුකර ගැනීමට නොහැකිය. එසේම ඒ ආශාවල් සංතෘප්ත කිරීම සඳහා දැරිය යුතු වෙහෙසද අපමණය.

එම බලාපොරොත්තු කෙසේ හෝ ඉටුකර ගත්තද එම සතුට පවතින්නේ තවත් දෙයක් අවශ්‍ය වනතුරු පමණි. මේ නිසා අපට වන්නේ සෑම දිනකම යම් අතෘප්තිකර ආශාවක් සමග ජීවත් වීමටය.

එහෙත් භාවනාවේ හරය වන්නේ ඉහත සඳහන් කළ ආශාවන් කළමනාකරණය කරගෙන ලද දෙයින් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට මඟ පෑදීමය. අපට එදිනෙදා ජීවිතයේ හමුවන සෑම ගැටලුවකටම බෙහෙත් නැත.

ඒවාට පිළිතුරු සොයාගත හැකි වන්නේ ඒ ප්‍රශ්න පිළිබඳව යථා අවබෝධයෙන්ම පමණි. එම යථාර්ථ අවබෝධය ලබා දී මිනිසුන් සුවපත් කරන, භාවනාවට සමාන වෙනත් ඔසුවක් නැත.

# LAL LAW OFFICE



- Real Estate
- Mortgages
- Immigration Law
- Family Law
- Tax Law



## Lal Handapangoda

Barrister & Solicitor

90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com






- Install Repair Service
- Furnace and Air condition
- Roof top Units Heating / Cooling
- Water Heaters
- Humidifiers
- Electronic Air cleaners
- Ultraviolet Air Treatment
- Gas stove and Gas Dryer
- Gas piping

RUUD, TRANE, Amana, HEIL, Rheem, Carrier, Goodman, American Standard, GOETTL, LENNOX, YORK, Coleman, Day & Night, bryant, Comfortmaker, TEMPSTAR

## Climax Comfort Air

Your Comfort is our Satisfaction

Contact: Kithsiri Mallawaarachchi
Certified Gas Technician TSSA Authorize Contractor
Call 416-889-5796
www.climaxcomfortair.com

7/24 Emergency service REPAIRS ON ALL MAKES AND MODELS WARRANTY ON REPAIRS



# TAX, ACCOUNTING AND BOOKKEEPING SERVICE

**We provide Personal and Corporate Tax Services**

- Friendly Personalized Service
- Fast Refund
- Provide tax planning advices to minimize your taxes

## OUR SERVICES

**Tax Services**

- Personal Tax Services
- Corporate Tax Services
- HST Filling

**Web Design**

- We can help you to design a website.

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Please contact Anura or Yacintha**

**PYNAX ACCOUNTING AND BUSINESS SOLUTIONS**
**Phone : 416-264-6850 | 647-789-7990**
18 Bedle Avenue, Toronto M2H 1K8
www.pynax.com

දසත Dasatha



# කොළඹ බයිලා නැටුම්

■ ලලිතා අමරසිංහ

දශක තුන හතරකට පෙර ප්‍රධාන ජනසන්නිවේදන මාධ්‍යයව පැවති ගුවන් විදුලිය මගින් 'බයිලා ගීත' සඳහා ගුවන් කාලයක් වෙන්කර තිබුණි. ඒ බව අප රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනතාවට මතක ඇති බව නිසැකය. එකල අති දක්ෂ බයිලා ගී ගායක පිරිසක්ද වූහ. 'නෝනා මගෙ නර්ස් නෝනා, හායි හූයි බබී ආච්චිගෙ බයිසිකල් එක, සුවඳ සබන් ගාලා නාපු රෝසා' වැනි ජනප්‍රිය බයිලා ගී බොහොමයක් එදා අසන්නට ලැබුණි. මේ ගීත හැරුණු විට ග්‍රාමීය හා නාගරික මට්ටමින් පැවති බයිලා විශේෂයක්ද වීය. ඒ බයිලා යනු දැනට ව්‍යවහාරයේ පවත්නා වැඩකට නැති අරුත් සුන් හිස් ප්‍රලාප කීමක් නොවේ. දෙපදයකට පද රචනය කර සිත් ගන්නා සුළු තාල කිහිපයකට හඬ නගා ගයන ලද ගායන විශේෂයකි.

උසී උසී බයිල නෝනා වැටේ මුරුංගා
කෙක්ක නැතුව අතින් කඩන කතුරුමුරුංගා....

අහලා නැද්ද මොරටු කොල්ලො බයිල කියනවා
වහල තියෙන පාලු ගෙවල් ඉබේ ඇරෙනවා....

රේල් පාරෙ මම යනකොට කඩල බදිනවා
කඩල ටිකක් ඉල්ලුවහම දෙමළි බනිනවා....

මෙවන් දෙපදයේ බයිලා එකල බාල මහලු කා අතරත් ජනප්‍රිය ගායන විශේෂයක් විය. අපේ ජන කවිවල මෙන් මේවායේ පද රචකයන් අවිනිශ්චිත වන අතර පාරම්පරිකව සමාජය තුළ දෝලනය වෙමින් සමාජගත වූ සංස්කෘතිකාංගයකි. මෙවන් බයිලා ගායනයට එවකට මොරටු ප්‍රදේශය නම් දරා තිබුණි. එදා පාසල් සිසුන්ගේ විනෝද චාරිකාවල (පාසලින් බැහැරව ගිය මේ චාරිකා එදා හැඳින්වූයේ 'අධ්‍යාපන චාරිකා' ලෙස නොව 'විනෝද චාරිකා' ලෙසිනි) මුඛ්‍ය පරමාර්ථය සිසු මනස සංතෘප්ත කිරීමට දායක වූ කවි, ගී සීපද ගායනාවලට මේ බයිලා ගායනයද එක්වීය.

වත්මන් ප්‍රබල ජනසන්නිවේදන මාධ්‍යයන් තුළින් බයිලා ගීත, වාද බයිලා, කපිරිඤ්ඤා බයිලා ගායනා සම්බන්ධයෙන් විවිධ කතිකාවන් ගොඩ නැඟුණත් ශ්‍රී ලංකාවේ ගීත සාහිත්‍යය ප්‍රමුඛ කොටගත් විවිධ කලා මාධ්‍යයන් පිළිබඳ පර්යේෂණවල නියැලී සිටින හා ඒවා පෝෂණය කිරීමට නිරතුරුව දායක වන විද්වතුන්ගේ මනසට හසු නොවූ පෑන් තුඩට යොමු නොවූ එක් ප්‍රබල සුවිශේෂී සංස්කෘතිකාංගයකි කොළඹ නගරයේ පැවති 'බයිලා නැටුම'.

බයිලා නැටුම යනුවෙන් ව්‍යවහාර වුවත් ඇත්තෙන්ම එය බයිලා නැටුම් සංදර්ශනයකි. වසර ගණනාවක්ම බයිලා නැටුම් දෙනෙතින් දැක හදවතින් රසවිඳි මගේ මතකයෙන් යම් යම් නර්තනාංග ගිලිහී ගොස් ඇතත් මෙවන් නැටුම් විශේෂයක් සමාජගතව පැවති බව නූතන පරපුරේ දැන ගැනීම සඳහාත් වත්මන් වයෝවෘද්ධ ජ්‍යෙෂ්ඨ නාගරික ජනතාවට තරුණ කල ලැබූ විනෝදාස්වාදය යළි සිහි ගැන්වීම සඳහාත් මේ ලිපිය සකස් කිරීමට සිතුණි.

## ගෙන් ගෙට යන බයිල නැටුම

හැටේ දශකයට පෙර කාලවකවානුවේ කොළඹ නගරයේ අති උත්කර්ෂවත් ලෙස සමරන ලද උත්සව ද්වයකි 'නත්තල් උත්සවය' හා 'ජනේරු උත්සවය'. ජනේරු යන වචනය වත්මන් පරපුරට නුහුරු වචනයක් වනු නොඅනුමානය. 'ජනේරු' යනුවෙන් කෙටියෙන් හැඳින්වූයේ ජනවාරි පළවෙනිදා පවත්වන උත්සවයයි. ජාති, ආගම් මොනම භේදයකින්වත් තොරව ලෝකවාසී හැමදෙනාම පාහේ එකට සමරන එකම උත්සවය ජනේරු උත්සවයයි. ලෝකයේ හැම ජන කොට්ඨාසයකටම එකවර උදාවන අවුරුදු උත්සවය එයයි. වසරක් පුරා බොහෝ වෙහෙස මහන්සි වී වැඩකළ නාගරික තරුණ පිරිස් ජනේරු උත්සවයේ එක් විචිත්‍රවත් අංගයක් ලෙස බයිලා නැටුම් සංදර්ශන පැවැත්වූහ.

දෙසැම්බර් මස 31 වැනි දින මධ්‍යම රාත්‍රියේ තොරතෝංචියක් නැතුව ඇසෙන රතිඤ්ඤා හා නැව්වල නළා ශබ්දය මධ්‍යයේ නැටුම් කණ්ඩායම දොරට වඩී. ගම්බදව රඟ දක්වන දෙවොල් මඩු, ගම් මඩු, කොහොඹ කංකාරිය මෙන් එක ස්ථානයක රඟ නොදක්වන බයිලා නැටුම ගෙන් ගෙට ගොස් රඟ දක්වන ලද නර්තනාංගයකි. මෙයින් දශක තුන හතරකට පෙර ජාතික සිරිත් විරිත් ඉතා ඉහළින් අගය කළ ආරක්ෂා කළ ජනතාවක් ජීවත් වූ කුඩා ගම් බොහොමයක් කොළඹ අග නගරයේද විය. මන්ද එවන් එක් ගම් පියසක මගේ බාල කාලය ගෙවූ බැවින් මේ සංස්කෘතිකාංගයෙන් කුල්මත් වීමේ වාසනාව ලැබූවෙමි.

නව අවුරුද්ද උදාවෙන්නට පෙර මෙම ගම්වල සිටි තරුණ කණ්ඩායම් වැඩිහිටියන්ගේද සහයෝගය ඇතිව බයිලා නැටුම් සංදර්ශනය සඳහා පුහුණු වන්නේ එළිමහන් බිමක හෝ නිවසකය. මේ ලිපිය ලිවීමට පාදක කර ගත්තේ වර්තමානයේ බොරැල්ලේ 'මොඩ්ල් ෆාම්' යන නමින් හැඳින්වෙන පැරැණි 'කපුහේන්තුඩුව' යන ග්‍රාමයේ පවත්වන ලද වාර්ෂික බයිලා නැටුම් සංදර්ශනයයි. ඒ එය නගරයේ ඉතා විචිත්‍රවත්ම නැටුම් සංදර්ශනය හා නැටුම් කණ්ඩායම වන හෙයිනි. බයිලා නැටුම නර්තනාංග කිහිපයකින් සමන්විත විය. වාද්‍ය වෘන්දයට අයත් වූයේ පෙට්ටි සර්පිනාව, රවිකිඤ්ඤයක් හෝ වයලීනයක් හා අත් රබානක් වයන්නකු පමණි. රාත්‍රි කාලයේ ගෙන් ගෙට ගොස් ගෙමිදුලේ රඟ දක්වන නර්තනාංගයක් වූ හෙයින් ආලෝකය සැපයුවේ පෙට්‍රල් මැක්ස් හා ඇලඩින් ලාම්පු දෙක තුනකිනි.

බයිලා නැටුම් සංදර්ශනය පැවැත්වූයේ ගමේ ප්‍රභූ පවුල් ජීවත් වූ නිවෙස් ඉදිරියේ පමණි. ඊට හේතු වූයේ සුදු වැලි අතුරන ලද විශාල ගෙමිදුලක් තිබීම, රාත්‍රි කාල තුළදී සීමිත දර්ශන වාර ගණනක් රඟ දැක්වීමට හැකිවීම, මුදල් ආධාර දීමේ හැකියාව යන කාරණාය. රටාවකට අමදින ලද ගෙමිදුල් එදිනදී ආලෝකවත් වූයේ නිවසේ ඇති එකම ලොකු ලාම්පුව (ඇලඩින් හෝ පෙට්‍රල් මැක්ස්) නිවස ඉදිරිපිට එළියේ එල්ලීමෙනි.

නැටුම් රඟ නොදැක්වුවත් සංදර්ශනයට සහාය දක්වන රසික පිරිස පිරිවරාගෙන පැමිණෙන නැටුම් කණ්ඩායම නිවසේ ප්‍රධාන දොරටුව අබියස ගෙමිදුලේ ක්ෂණික රඟමඬලක් තනා ගන්නේ අර්ධ කවාකාරව සිට ගැනීමෙනි. ඉදිරියෙන්ම සිටින්නේ වාදක මණ්ඩලයයි. නැටුම් ශිල්පීන් පිරිස අතරේ නොපෙනී සිටින්නේ නැවුම් බවින් යුක්තව ප්‍රේක්ෂකයන්ට සිය නර්තනාංග ප්‍රදර්ශනය කිරීම සඳහායි. කණ්ඩායමට අයත් නැට්ටුවන් හැමදෙනාම පුරුෂ පක්ෂයම විය. කන්තා චරිත නිරූපණය කළේද කාන්තා වෙස්ගත් පුරුෂ පාර්ශ්වයයි.

## නර්තන අංග

ප්‍රථමයෙන්ම රඟ දක්වන්නේ 'බහුබූත' නැටුමයි. එය කෝලම් සම්ප්‍රදායේ එන කෝලමා හෙවත් බහුබූතයාට නෑකම් කියන්නකි. කේතුවක ආකාරයේ දිග දිලිසෙන සරුව පිත්තල තොප්පියක් හිස පැළඳ පිජාමා කලිසමකින් හා අත්දිග පිජාමා කමිසයකින් සැරසුණු බහුබූතයාගේ මුහුණේ වත්සුණු තවරා කෝලම් ස්වරූපයක් ගන්වා ඇත. මොහු දෙඅත් දෙපසට දිගු කරගෙන දෙකකුල් ඉදිරියට වීසි කරමින් ඉල්පෙමින් මිදුලේ රඟමඬල පුරා රංගනයේ යෙදෙන්නේ,

රා රා රා බොම්බියා - සුද්දා එනවා නංගියා
දොර වහපන් මල්ලියා - රම්පිට පං පං පං

යන විසිළු බයිලා ගීයද ගයමිනි. මේ රංග විලාසය ප්‍රීතිය දනවනවා පමණක් නොව යුරෝපීය ආක්‍රමණ නිසා ලාංකේය සමාජයට ඇතිවූ බලපෑමද ව්‍යංගයෙන් කියා පායි. විනාඩි හතරක් පහක් රංගනයේ යෙදෙන මොහු දකුණතින් හිස පැළඳි තොප්පිය අල්ලාගෙන හිස නමා ආචාර කර සිය රංගනය නිමකර සෙනඟ අතරට වැදී නොපෙනී යයි.

ඊළඟට රඟදැක්වූ නර්තනාංග අනුපිළිවෙළින් මගේ මතකයේ නැතත් අංග කිහිපයක් ගැන හොඳට මතකය. 'රෝස නෝනා' ජවනිකාව ඉන් එකකි. යුරෝපීය කාන්තාවක මෙන් අත්දිග හැට්ටයක් හා රැලි තට්ටු කිහිපයක් සහිත දිග සායකින් සැරසී සිටින රෝස නෝනා ලස්සන කාන්තා තොප්පියක් හිස පළඳින්නීය. පිරිමියා යුරෝපියකු මෙන් දිග කලිසමකින් හා කමිසයකින් සැරසී ටයි බෝ එකක් පළඳියි. මේ රංගනයෙන් නිරූපණය වන්නේ කාන්තාවක පසුපස යන පිරිමියකුගේ විලාසයයි. රෝස නෝනා ආඩම්බරයෙන් ඉවත යන ආකාරයත්, තරුණයා ඇගේ ආදරය යදින ආකාරයත්, මන බඳිනා සුළුය. විශේෂයෙන් තරුණ කණ්ඩායම් සිත් ඇද බැඳ ගත් මේ රංගනයේ යෙදෙන්නේ... 'රෝස නෝනා මගේ පනේ....' යන බයිලා ගීය ගයමිනි.

ජිම් ජිනිකන් තප්පු තප්පු
බයිල පොළේ ඔට්ටු ඔට්ටු....

යන දෙපද බයිලා ගීය ගයමින් කරන රංගනයක්ද මේ සංදර්ශනයට අයත් විය. එය රඟ දක්වන්නේ අඹරන ලද අමු කහ සිරුර පුරා තවරාගත්, මේස් බැනියම් රෙද්දෙන් මසන ලද අත්දිග බැනියමක් හා කලිසමක් අඳින ලද පිරිමි දෙදෙනෙකි. මොවුහු විසුළු ස්වරූපයක් ගැනීම සඳහා කලිසමට උඩින් කොට ජංගි කලිසමක් ඇන්දහ. මොවුන් අතේ කෙවිටක්ද වෙයි. මේ කෙවිට දෙකොනින් අල්ලාගෙන එහා මෙහා කරමින් උරහිස් නටවමින් තාලයට පා තබමින් කරන මේ රංගනය වඩිග පටුන නර්තනාංගය සිහි ගන්වයි.

කාපිරි නැටුම කුඩා දරුවන් බියගැන්වූ හැඬවූ නර්තනාංගයයි. මේ නර්තනාංගයට සහභාගි වූයේ වෙස් ගැන්වූ කාපිරි ජෝඩුවකි. ඔවුනගේ සිරුරු පුරා තෙල් මිශ්‍ර පහන් දැලි තවරා ඇති අතර දෙතොල් හා ඇස්වට කැපී පෙනෙන සේ සුදු පාටින් පාට කර තිබුණි. කාපිරි කාන්තාවගේ දිග ගවුම සුදුපාට බින්දු හෝ කුඩා මල් සහිත රෙද්දකින් මසන ලද්දකි. පිරිමියා කළු පාට දිග කලිසමක් හා කමිසයක් ඇඳ සිටියේය. දෙදෙනාම හිසේ කළු පාට කාන්තා හා පිරිමි තොප්පි පැළඳ සිටියහ. කාපිරි පිරිමියා අත කළු පාට බස්තමක්ද විය. මොවුන් රංගනයේ යෙදෙන්නේ, 'කාපිරියා හුවා බකා' යන බයිලා පදයක් දෙතොලින් මුමුණමිනි. මැනවින් දෙතොල් චලනය කරමින් කරන මේ රංගනය අති විශිෂ්ට රංගනයකි. ක්ෂණික රඟමඬල සිසාරා පැතිරෙන අන්ධකාරය මොවුනගේ බියකරු බව තීව්‍ර කරයි. ගමේ බොහෝ කුඩා දරුවන් මෙන් මාද වයස අවුරුදු තුන හතරක දැරිවියක්ව සිටියදී මේ දෙපළට බියෙන් මරහඬ දී හැඬුවා මට හොඳ හැටි මතකය. ඒ නිසාම සමහර ගෙහිමියන් මේ නර්තනාංගය ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටි අවස්ථාද විය.

සංදර්ශනයේ අවසාන ජවනිකාව වූයේ නාට්කාංග නාවගේ නැටුමයි. ඇය ඉතා ලස්සන යුවතියක් ලෙස වේශ නිරූපණය කරන ලද තරුණයෙකි. සීකුවින්ස් හා පබළු අල්ලා හැඩ වැඩ කරන ලද දිලිසෙන හැට්ටයකින් හා සායකින් හෝ සාරියකින් සැරසී සිටියාය. සාරිය හෝ සාය වෙනස් වන්නේ කවර හේතුවක් නිසා දැයි නිශ්චිතව නොදන්නා නමුත් සපයා ගත හැකිවන ඇඳුම අනුව වෙනස් වූ බව සිතමි. හැට්ටය ඇන්දේ 'ඔබේ තීරය' (බඩ පෙනෙන) තිබෙන ලෙසය. ඇගේ ඇඳුම කණ්ඩායමේ අනෙක් ශිල්පීන්ගේ ඇඳුම්වලට වඩා බොහෝ විසිතුරු ආකර්ෂණීය වූ වැඩි මුදලක් වැයකර පිළියෙල කරගත් එකකි. ඇගේ ස්වභාවයද ඉතා පියකරුය. මුහුණේ වත්සුණු තවරා දෙතොල් රතුකර කම්මුල් රෝස පැහැ ගන්වා තිබුණි. දෙනෙත් අග කළු පාටින් හැඩගන්වන ලද අතර නියපොතුද රතු පැහැ ගන්වා තිබුණි. (එකල තිබුණේ රතු පාට හා රෝස පාට නිය ආලේපන කියුටෙක්ස් පමණි) හිස මුදුනට කර සකසන ලද කොණ්ඩා

16 වන පිටුව බලන්න

# ජැක්ගේ වාසනාව

ජැක් හරිම කම්මැලියෙක්. ඔහුගේ මේ කම්මැලි කමට සීත උණුසුම් කියල වෙනසක් නෑ. හැමදාම ළිප මුල්ලට වෙලා වකුටු වෙලා ඉන්න තමයි කැමතියි. මේ නිසාම ගමේ අය එයාට කිව්වෙ 'කම්මැලි ජැක්' කියලා.

ජැක්ගෙ මේ ගතිගුණ අද වෙනස් වෙයි. හෙට වෙනස් වෙයි කියල අම්මා හිතුවට ඒ කම්මැලිකම දවසින් දවස වැඩිවුණා. ජැක් දැන් තරුණයෙක්. ඉවසල ඉවසල බැරිම තැන දවසක් අම්මා ජැක්ට කතා කළා.

"ජැක්... මේ අහන්න... මම දැන් හොඳටම වයසයි. තවත් මට බෑ ඔයාටත් එක්ක කන්න සොයන්න. ඔයාට පුළුවන් වෙන්න ඕන මටත් එක්ක කන්න හොයන් එන්න. අඩුමගානෙ ඔයාගෙ කෑම වේලවත් ඔයාට හොයාගන්න පුළුවන් වෙන්න ඕන."

අම්ම මේ දේවල් කියද්දිත් ජැක් අහන් හිටියෙ හරිම කම්මැලි කමින්. ඒත් ජැක් මෙහෙම ඇහුවා.

"ඉතිං මං මොකක්ද කරන්න ඕන...? කවුද මට රස්සාවක් දෙන්නෙ....?"

"දවල් දවස තිස්සෙ ළිප මුල්ලෙ නිදාගෙන ඉන්නෙ නැතුව එළියට බැහැල යන්න. ඕන තරම් රස්සාවල් තියෙනවා. කම්මැලි නැතිව වැඩ කරන්න. ඔයා හෙට ඉඳලම රස්සාවකට යන්න ඕන. එහෙම නොගියොත් හෙටින් පස්සෙ මෙහෙ ඉන්න බෑ..."

ජැක් "හා හොඳයි" කියල ආයෙමත් ළිප මුල්ලෙ වකුටු වුණා. පහුවෙනිදා වෙනකොට ජැක්ට ඒ කතාබහ මතක නෑ. එදත් සුපුරුදු විදියටම ජැක් ළිප මුල්ලෙ හිටියා.

"ජැක්... ජැක්.... මොකක්ද මේකෙ තේරුම... කරුණාකරල ඔයා මේ ගෙදරින් යන්න... මට බෑ මේක තවත් කරන්න..."

ජැක්ගෙ අම්මා මහ හඬින් කෑ ගැහුවා. ජැක් උඩ ගිහින් නැගිට්ටා. අම්මට නොසෑහෙන්න කේන්ති ගිහින් බව ජැක්ට තේරුණා. දැන් ඉතිං රස්සාවකට නොගිහින් හිටියොත් අම්ම එයාව ගෙදරින් එළියට දාන බව ජැක් දන්නවා. එහෙම වුණොත් එයාට යන්න තැනක් නෑ. අකමැත්තෙන් වුණත් රස්සාවක් හොයන් යන්න ජැක් තීරණය කළා.

රස්සාවක් හොයාගන්න එක ජැක් හිතුව තරම් අපහසු වුණේ නෑ. පළවෙනිම දවසෙ අසල්වැසියෙකුගෙ ගොවිපොළේ වැඩකරන්න ජැක්ට ඉඩ ලැබුණා. හවස වැඩ ඉවර වුණාම කුලිය විදියට ජැක්ට පැන්සයක කාසියක් ලැබුණා. මීට පෙර කිසිමදාක ජැක් සල්ලි අතපත ගාල නෑ. ඒ නිසාම ඔහු ඒ කාසිය උඩ දමමින් සතුටින් ගෙදර එන්න පිටත් වුණා. ඒත් අවාසනාව කියන්නෙ අතරමග තිබුණු ඔයකින් එගොඩ වෙද්දි ඒ කාසිය ඔයට වැටිල නොපෙනී ගියා.

ජැක් ගෙදර ඇවිත් මේ බව අම්මට කිව්වා. අම්මට තරහයි. ඒත් මෙහෙම කිව්වා. "සල්ලි කියන්නෙ එහෙම උඩ දදා සෙල්ලම් කරන ජාතියක් නෙවෙයි කියල දන්නෙ නැද්ද? අනිත් දවසෙ ලැබෙන කුලිය කලිසමේ සාක්කුවට දාගෙන පරිස්සමින් අරන් එන්න" ජැක් එහෙම කරන බවට එකඟ වුණා.

ඊළඟ දවසෙ ජැක් වැඩට ගියේ ගව පට්ටියකට. එදා වැඩපළ අවසානයේ ජැක්ට කුලිය විදියට ලැබුණෙ කිරි පුරවපු ජෝගුවක්. ජැක් කල්පනා කළා මේක කොහොමද ගෙනියන්නෙ කියල. ඊයෙ අම්මා දුන්න උපදෙස මතක් වුණා. කිරි ජෝගුව කලිසමේ සාක්කුවේ රුවාගෙන ගෙදර එන්න පිටත් වුණා. අනේ අපොයි ! ජැක් ගෙදර එද්දි කිරි බිංදුවක්වත් නැති වෙන්න මුළු ජෝගුවම වැක්කිරිලා.

"දෙවියනේ... ඇයි දරුවෝ කිරි ජෝගුව හිස උඩ තියන් ආවෙ නැත්තෙ" අම්මා හරිම කණගාටුවෙන් කිව්වා. ජැක්ටත් දුකයි වෙච්ච දේට. එයා මෙහෙම කිව්වා.

"අනිත් දවසෙ මම එහෙම කරන්නම්"

ඔන්න අනිත් දවසෙත් ජැක් වැඩට ගියා. එදා එයා වැඩට ගියේ මුල්ම දවසෙ වැඩ කළ ගොවිපොළට. ඔහු එදා හවස ජැක්ගෙ කුලිය බේරුවේ චීස්වලින්. කලින් දෙවතාවෙම වැඩ කරල ගත්ත කුලියට වුණ දේ නිසා මේ සැරේ හොඳටම ප්‍රවේසම් විය යුතුයි කියල ජැක් තදින්ම හිතා ගත්තා. ඒ නිසාම ඒ රසවත් අනර්ඝ චීස් කුට්ටිය හිස මත තබාගෙන ගෙදර එන්න පිටත් වුණා. අනේ ඉතින් එදාත් ජැක්ට වැරදුණා. ඔහු ගෙදර එද්දි චීස් කුට්ටිය දියවෙලා. කොටසක් වැගිරිලා ගිහින්. අනික් කොටස ඔහුගේ හිසකෙස්වල රැඳිලා.

ජැක්ව දැක්කම අම්මාට හරිම තරහයි. මේ තරම් මේ දරුවා මෝඩ වුණේ ඇයි කියල ඇයට හරිම දුකයි. එයා හයියෙන් කෑ ගැහුවා.

"මෝඩයෝ... චීස් කවුද ඔලුව උඩ තියාගෙන එන්නෙ. ඒව පරිස්සමින් අතේ තියාගෙන අරන් එන්න ඕන..."

"අම්මා මට කිව්ව විදියටනෙ මම කළේ. හොඳයි අනිත් දවසෙ අම්ම අද කිව්ව විදියට කරන්නම්කො..."

ඊළඟ දවසෙ ජැක් වැඩට ගියේ පාන් බක්කරේ කෙනෙක් ළඟට. හවස වැඩ ඇරිල යද්දි ජැක්ට ලැබුණෙ අපූරු කුලී වේතනයක්. ඒ බළල් තඩියෙක්. මොනව වුණත් ඉතිං දවසේ කුලිය විදියට ලැබුණ



දේනෙ. ජැක්ට ඉස්සරින්දා අම්ම කිව්ව දේත් මතක් වුණා. ඔහු හරි පරිස්සමට ඒ බළල් තඩියව අත් දෙකෙන් උස්සගෙන එන්න පිටත් වුණා. ටික දුරයි ආවෙ. බළල් තඩියා ජැක්ව හූරලා අතින් පැනල දිව්වා.

ගෙදර ආවම සුපුරුදු විදියට අම්මගෙන් බැණුම් ඇහුවා. "මෝඩ ජැක්, ඒ සතාව ගේන්න තිබුණෙ ලණුවකින් ගැට ගහල ඇදගෙනනෙ...."

"අය්යෝ මම දන්නෙ නෑනෙ. අනිත් දවසෙ එහෙම කරන්නම්"

අනිත් දවසෙත් ජැක් වැඩට ගියා. එදා ඔහු වැඩ කළේ මස් කඩයක. සවස ගෙදර එද්දි ඔහුගේ කුලිය විදියට හොඳ ලොකු මස් කුට්ටියක් ජැක්ට ලැබුණා. ජැක් කල්පනා කළා. ඊයෙ අම්ම කිව්වෙ ලණුවකින් ගැටගහල ඇදගෙන එන්න කියලනෙ. ඔහු ලණුවක් සොයාගෙන මස් කුට්ටිය ගැටගහල පාර දිගේ ඇදගෙන ගෙදර එන්න ආව.

එදා නම් ඔහු ගෙනාපු මස් කුට්ටිය එහෙම පිටින්ම ගෙදරට ගෙනාවා. ඒ වුණත් ගෙදරට එනකොට ඒක කනවා තියා හිතන්නවත් බැරි තරමට අපිරිසිදු වෙලා. පාර පුරාම තිබුණු කුණු ජරාව ඒකෙ රැඳිලා. ජැක්ගෙ අම්මා ඒක දැක්ක හැටියෙම තරහෙන් පුපුර පුපුරා ගිහින් මස් කුට්ටිය කුණු බාල්දියට විසි කළා. ඒත් ඒ වෙලාවෙ ජැක්ට මුකුත් කියන්න ගියේ නෑ.

එදා රෑ ගෝවා සුප් එකක් හදාගෙන බොන ගමන් අම්මා මෙහෙම කිව්වා. "අද ඔයා ගෙනාව මස් කුට්ටිය පරිස්සමට ගෙනාව නම් අපිට සුප් එක්ක මසුත් කන්න තිබුණා. ඔයාට තිබුණෙ ඒක උරහිසේ තියාගෙන එන්න"

"ඔව් අම්මෙ මට තේරෙනවා. මම අනිත් දවසෙ එහෙම කරන්නම්" ජැක් මෙහෙම කියල හිස පාත් කරගෙන සුප් කෝප්පය බීගෙන බීගෙන ගියා.

පහුවදාත් ජැක් වැඩට ගියා. එදා ඔහු වැඩ කළේ සත්ව ගොවිපොළක. එදා හවසත් ඔහුට කුලිය ලැබුණා. ඒ හොඳ බූරු නාම්බෙක්. ජැක් හරිම අමාරුවෙන් බූරුවව උරහිස්සට ගත්තා. හෙමින් හෙමින් ගෙදර පැත්තට ගෑටුවා.

ජැක් ගෙදර එන පාරෙ ලොකු පොහොසතෙක් ජීවත් වුණා. මේ මනුස්සයට එකම එක ලස්සන දුවෙක් හිටියා. ඇය ලස්සන වුණාට ඇගේ කණ ඇහෙන්නෙත් නෑ. කතා කරන්නත් බෑ. ගොළුයි. ඒ ගැහැනු ළමයි එයාගෙ ජීවිත කාලයටම කවදාවත්ම සිනා වෙලා නෑ. කවදා හරි ඇය හිනා වුණොත් එදා ඉඳල ඇයට කතා කරන්නත් පුළුවන් වෙන බව වෛද්‍යවරු පවසල තිබුණා. ඒ නිසාම මේ පොහොසත් මනුස්සයා එයාගෙ එකම දුවව හිනස්සවන්න හැම දෙයක්ම කළා. ඒත් ඒ ගැහැනු ළමයා හිනා වුණේම නෑ.

එදා හවස ඒ තරුණ ලස්සන ළමයා මහා මන්දිරයේ ජනේලයක් ළඟට වෙලා පාර දිහා බලාගෙන හිටියා. හරියටම ඒ වෙලාවෙම ජැක් අර බූරුවත් උර මත තියාගෙන හරිම අමාරුවෙන් ගාට ගාටා ඒ මැදුර ළඟින් ගමන් කරනවා.ගැහැනු ළමයා ජැක්ව දැක්කා. ජැක් ගමන් කරන හැටියි, බූරුවා කරේ ඉන්න විදියයි දැක්කම ඒ ගැහැනු ළමයාට හයියෙන් හිනා ගියා. මුළු මන්දිරයම දෙදරුම් කන තරමට ඇය උඩ පැන පැන හයියෙන් හිනා වුණා.

ඇගෙන් පිටවුණු ඒ හිනාවත් එක්කම එතෙක් කලක් ගොළුවෙලා හිටිය ඇය කතා කරන්න පටන් ගත්තා. මේ සිද්ධ වුණ දේට ඇගේ පියාට අර පොහොසත් මිනිසාට හරිම සතුටුයි. මේ ප්‍රාතිහාර්ය කළේ ජැක් කියල ඔහු දැනගත්තා. පියා වහාම ජැක්ව හොයාගෙන ඔහුගේ නිවසට ගියා. එතෙක් කල් ගොළු වී සිටි තමන්ගෙ දුව ජැක් නිසා සුව වුණු බවත් ඒ නිසා ජැක් තමන්ගෙ දියණියව විවාහ කරගන්නවාට සතුටු බවත් කිව්වා.

ජැක් සහ අම්මා හරිම කැමැත්තෙන් ඊට එකඟ වුණා. එදා සිට ජැක්ගෙ ජීවිතය වාසනාවන්ත වුණා. ඔහුගේ කම්මැලි කම් මෝඩකම් ටිකින් ටික මග ඇරුණා. පොහොසත් මිනිසාගේ දේපළ සියල්ල බලාගෙන ඒ මහා මන්දිරයේ සතුටින් ජීවත් වුණා. ජැක්ගෙ අම්මත් එයාගෙ අවසාන කාලය ජැක් ළඟටම වී සැපෙන් සතුටින් ගත කළා.

## ළමා ගී

### සෙංකඩගල පුර

සෙංකඩගල පුර දළදා නුවරේ
මාළිගාවෙ ඉඳලා
මේ දැන් ආවේ මම වැව අයිනට
දන්ත ධාතු වැඳලා

වටේට කඳු පෙළ මහවැලි ගඟ යන
කඳුරට හරි සීතයි
උදේට පාවෙන අහසෙ වලාකුළු
මහ පොළොවට පාතයි

සෙංකඩගල පුර දළදා නුවරේ....

දුම්බර කඳු පෙළ හුන්නස්ගිරියේ
ඉහළින් ඈත කොනේ
දළදා සාදුට දොහොත් මුදුන් දී
ළා හිරු නැඟෙනු පෙනේ

ගායනය : ලංකා රාජිනී ගුණසේකර
පදරචනය : චන්ද්‍රසිරි සෙනෙවිරත්න
සංගීතය : සරත් දසනායක



# පෝෂණයේ නාමයෙන්...
# අප කා දමන්නේ ආහාරද? ආහාර සුරක්ෂිතතාවද?

■ වෛද්‍ය කේ. එම්. වසන්ත බණ්ඩාර

ලෝකයේ බොහෝ විද්‍යාවන් දියුණු මට්ටමක පවතින මේ යුගයේ දරුවන් මිලියන 800 කට අධික පිරිසක් නින්දට යන්නේ රාත්‍රී ආහාර වේල නොමැතිවය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට දිනකට ලැබෙන්නේ එක් ආහාර වේලක් පමණි. ඔවුන්ගෙන් අති බහුතරය බරපතල පෝෂණ ඌනතාවන්ගෙන් මෙන්ම ඒ ආශ්‍රිතව ඇති වන රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙති. අප රටේ ජනගහනයෙන් 40% කට වැඩි දරු පවුල් සංඛ්‍යාවක් මාසිකව ඉතාමත් අඩු ආදායම් තත්ත්වයක පසුවන්නන් වේ. එසේනම් මිල දී ගැනීමේ හැකියාව අනුව බලන විට අප රටේද ඉහත කී ගණයට අයත් දරුවන් යම් ප්‍රතිශතයක් සිටින බව රහසක් නොවේ.

## ආහාර සුරක්ෂිතතාව

ඉහත හුවා දක්වන ලද ආකාරයට බඩගින්න ජන ජීවිතයේ අනිවාර්යය ලක්ෂණයක් බවට පත් වී ඇති රටවල පවතින පොදු තත්ත්වයක් ඇත. එනම් යම් ප්‍රමාණයකට අප රට ඇතුළුව එම රටවල් තම ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළා ඇත. ඇත්ත වශයෙන්ම ආහාර සුරක්ෂිතතාව යනු කුමක්ද? එයින් මූලික වශයෙන් මැනෙන්නේ යම් රටක ජනතාවගේ ආහාර අවශ්‍යතාව බාහිර රටවල් මත යැපෙන්නේ නැතිව කොතෙක් දුරට එම රට තුළදීම දීර්ඝ කාලීනව සපුරා ගැනීමට ඇති හැකියාවයි. එහි පැතිකඩවල් දෙකක් ඇත. එකක් ජනගහනයට අත්‍යවශ්‍ය ආහාර තොගය රට තුළදීම නිපදවා ගැනීමයි. අනෙක එම ආහාර මිල දී ගැනීමට හෝ වෙනත් කුමන ආකාරයකට හෝ සපයා ගැනීමට මහජනයාට ඇති හැකියාවයි. එම පැතිකඩවල් දෙකෙන් එකක් හෝ දෙකම අනතුරේ වැටෙන විට රටේ සමස්ත ආහාර සුරක්ෂිතතාව අනතුරේ වැටෙයි.

රටක ආහාර සුරක්ෂිතතාව එම රටේ ජාතික ආරක්ෂාව තරම්ම වැදගත් වෙයි. එයට හේතුව ආහාර මිල දී ගැනීම සඳහා යම් රටක් තවත් රටකට හෝ රටවල් සමූහයකට අතපෑමට ක්‍රියාකරන්නේ නම් එම රටේ ස්වෛරීභාවය පවාදීමට සිදුවීමයි. එය එක්තරා ආකාරයකට ජාතියක් ලෙස නින්දාවට ලක්වන ක්‍රියාවකි. එහිදී මේ යටත්වීම ආකාර දෙකකට සිදුවේ. පළමුවැන්න ආහාර මිල දී ගැනීම සඳහා විදේශ විනිමය වැය කිරීම නිසා ඇතිවන ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමට විවිධ කොන්දේසි යටතේ ණය ලබා ගැනීමට සිදුවීමයි. දෙවැන්න ඇති තරම් විදේශ මුදල් තිබුණා වුවත් ආහාර තොග දීර්ඝ කාලීනව ලබා ගැනීම සඳහා බාහිර රටවල අනුකම්පාව ලබා ගැනීමට සිදුවීමයි. විශේෂයෙන්ම දැන් ශ්‍රී ලංකාව මුහුණ දෙන ජාත්‍යන්තර පීඩනය වැනි පීඩනයකදී කොන්ද කෙලින් තබාගෙන

තීන්දු ගැනීමට නම් එවැනි අනුකම්පාවක් බලාපොරොත්තු නොවී කටයුතු කිරීමේ හැකියාව තිබිය යුතුය.

සදාචාරමය වශයෙන් ඉතා නරකම තත්ත්වය වන්නේ රටේ ඇති තරම් දේශීයව නිපදවන ආහාර තොග තිබියදී මිල දී ගැනීමේ හැකියාව නොමැති නිසා මහජනයාට බඩගින්නේ සිටීමට සිදුවීමයි. ඉන්දියාවේ මෙම තත්ත්වය යම් පමණකට දක්නට ලැබේ. බොහෝ විට එම තත්ත්වයට මුහුණ දෙන්නේ නාගරික දුප්පත් ජනතාවයි. ඉන්දියාවේ ග්‍රාමීය ජනතාව අතර මෙම තත්ත්වය පාලනය වන්නේ කාරණා දෙකක් නිසාය. පළමුවැන්න වෙළෙඳපොළට නොයා ගෙවතු සහ කෘෂි බිම්වලින්ම යම් ආහාර ප්‍රමාණයක් සපයා ගැනීමට ඇති හැකියාවයි. එහිදී එක් ආහාර වර්ගයක් මත පදනම් නොවී විවිධ ආහාර වර්ග රාශියක් පරිභෝජනය කිරීමේ සංස්කෘතියද වාසියට හේතු වී ඇතත දෙවැන්න අතිරික්ත නිෂ්පාදනයක් ඇති යම් ආහාර වර්ගවල ග්‍රාමීය මිල මට්ටම් පහල මට්ටමක පැවතීමයි.

ඕනෑම රටක ආහාර සුරක්ෂිතතාව රැක ගැනීම මූලික ඓතිහාසික ජාතික අවශ්‍යතාවකි. කෘෂිකාර්මික ශිෂ්ටාචාරය ඓතිහාසිකව විකාශනය වන්නේ ආහාර සුරක්ෂිතතාව නමැති කොන්දේසිය මත පදනම්වය. ලෝකයේ වසර 150 කට පෙර ඉතිහාසය විමසා බැලුවත් විශාල ලෝක ආහාර වෙළෙඳපොළක් නොතිබූ බව පැහැදිලි වේ. සෑම රටක්ම පාහේ තම රටේ දේශගුණික තත්ත්වයන් සහ භෝග පැතිරී යාමේ රටාව අනුව යම් ආහාර සංස්කෘතියක් ගොඩනඟාගත් අතර ඊට සාපේක්ෂව ආහාර සුරක්ෂිතතාව රැකගත්තේය.

## ආහාර වෙළඳපොළ

නමුත් ලෝක යටත් විජිත පාලනයෙන් පසු වකවානුව තුළ ඊනියා ආහාර වෙළෙඳපොළක් බිහිවීම ආරම්භ විය. ක්‍රමක්‍රමයෙන් යටත් විජිතවල ආහාර අවශ්‍යතාව සපුරාගැනීමේ ක්‍රියාවලිය එම වෙළෙඳපොළ සමග ගැට ගැසුනි. ලංකාවේදී නම් එම තත්ත්වය ආරම්භ වන්නේ 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ සමගය. ඇත්ත වශයෙන්ම රටක් දේශපාලන වශයෙන් දීර්ඝකාලීනව යටත් කර තබා ගැනීමේ මූලික කොන්දේසිය ආහාර සුරක්ෂිතතාව අනතුරේ වැට්ටවීම බව යටත්විජිතවාදී බලවේග ඉතා හොඳින් දැන සිටියේය. එය තුවක්කු බලයෙන් භූමිය අත්පත් කරගෙන පවත්වාගෙන යෑමට වඩා පහසු බව ඔවුන් ඉතා හොඳින් තේරුම් ගෙන තිබිණි.

එම තත්ත්වය තුළ ලෝකය පුරා දුර්වල රාජ්‍යයන්ගේ ආහාර සුරක්ෂිතතාව අනතුරේ වැටෙන්නේ (විශේෂයෙන්ම අප වැනි යටත් විජිත ඉතිහාසයක් සහිත රටවල) යටත්විජිතවාදී බටහිර කුමන්ත්‍රණයක් ලෙස බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. අප වැනි රටක ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළීමෙන් බටහිර අධිරාජ්‍යවාදී බලවේග අරමුණු කරන ප්‍රධාන වාසි 3 ක් ඇත. ඉන් පළමුවැන්න ආහාර ආනයනය නිසා පුළුල් වන ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා දිගින් දිගටම කොන්දේසි සහිත ණය ලබා දීමේ අවස්ථාව නිර්මාණය කිරීමයි. ඒ මගින් අපට එරෙහිව අටවා ඇති ණය උගුල හිර කිරීමේ අවස්ථාව ඔවුන් ලබා ගනිති. දෙවැන්න ආහාර වෙළෙඳපොළ තුළ ආනයනික ආහාර සඳහා වැඩි ඉඩක් නිර්මාණය කිරීම සහ එම වෙළෙඳපොළ කොටස අත්පත් කරගැනීමයි. අධිරාජ්‍යවාදී රටවල් විශේෂයෙන්ම ඇමරිකාව, කැනඩාව, නවසීලන්තය සහ ඉන්දියාව වැනි විශාල භූමියක් සහිත රටවල නිෂ්පාදනය කරන අතිරික්ත ආහාර සඳහා වෙළෙඳපොළ මේ මගින් නිර්මාණය කෙරේ. උදාහරණයක් ලෙස නවසීලන්තයේ කිරි ආර්ථිකය එම රටේ දළ ජාතික ආදායමෙන් 25% ඉක්මවයි. එයින් 85% ක් අප වැනි රටවලට අපනයනය කරයි. අප නවසීලන්තයට පමණක් නවසීලන්ත ඩොලර් මිලියන 600 ක් ගෙවා කිරිපිටි මිල දී ගන්නා ජාතියකි. එම ආදායම් අහිමි වුවහොත් නවසීලන්තය අපට වඩා දුප්පත් වන බව පැහැදිලි සත්‍යයකි. තුන්වැන්න ක්‍රමානුකූලව දේශීය ආහාර නිෂ්පාදන පද්ධතිය බිඳවැට්ටවීම හරහා කෘෂි යෙදුම් වෙළෙඳපොළ (විශේෂයෙන් බීජ, පොහොර, පලිබෝධ නාශක ආදි) අත්පත් කර ගැනීමයි. ඒ මගින් අවසානයේ ඔවුහු දේශීය ආහාර නිෂ්පාදන පද්ධතිය සම්පූර්ණයෙන්ම අත්පත් කරගැනීම හෝ දැඩි ලෙස පාලනය කිරීමේ අවස්ථාව නිර්මාණය කරගැනීම අරමුණු කරති.

අධිරාජ්‍යවාදී රටවල් තම අරමුණු ඉටුකර ගැනීම සඳහා එනම් අප වැනි රටවල ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළීම සඳහා ඉතා සුවිශේෂී උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කරති. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා එසේත් නැතහොත් අප වැනි රටවල් මත පැටවීම සඳහා යොදාගන්නේ ණය දෙන ආයතන බව ඉතා පැහැදිලිව පෙනෙන්නට ඇත. ඔවුන් තම ණය උපාංග භාවිත කොට අප ලවා ඔවුන්ට අවශ්‍ය දේ කරවා ගැනීමට සමත් වී ඇත. ඒ සඳහා ඔවුන්ට බොහෝ දුරට අප වැනි රටවල ක්‍රියාත්මක වන ආර්ථික ඝාතකයන්ගේ නොමසුරු සහාය රජය අභ්‍යන්තරයෙන්ම ලැබේ. ආර්ථික ඝාතකයන්ගේ අති බහුතරය බටහිර මතවාදවලට යටත්වීම නිසා නොදැනුවත්වම ඝාතකයන් බවට පත් වූවන්ය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ආචාර්ය උපාධිය සඳහා බටහිර රටවලට කැඳවනු ලැබ මොළ සේදීමට ලක්වූවන්ය. අප වැනි රටවල විද්‍යාර්ථියෙකුට ආචාර්ය උපාධියකට ශිෂ්‍යත්වයක් ලබා දීම සඳහා බටහිර රටක් එම රටේ එක කම්කරුවෙකුගේ වැටුපවත් වැය කරන්නේ නැත. නමුත් ඔවුන් එකෙකුගේ මොළ සේදීමෙන් පසුව ඔහු හෝ ඇය තම මව් රටේදී උසස්තනතුරකට පත් වුවහොත් මුළු රටක් සූරා කෑම සඳහා අවස්ථාව නිර්මාණය කරගනිති. අවාසනාවකට මෙම තත්ත්වයට ගොදුරු වන්නේ බොහෝ විට ආර්ථික විද්‍යා සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විද්වතුන්ය.

මේ ආකාරයට අප රටේ ආහාර සුරක්ෂිතභාවය අනතුරේ හෙළීම සඳහා බටහිර රටවල් අනුගමනය කළ උපායමාර්ගික ප්‍රවේශය ඉතා දියුණු විචිත්‍රවත් එකකි. එම කාසියේ එක් පැත්තක් වන්නේ ආනයනික ආහාර සඳහා සහනාධාර ලබා දී පෙළෙඳපොළ තුළ මිල විකෘතියක් ඇති කිරීමය. එමගින් දේශීය ආහාරවලට වඩා ආනයනික ආහාර පරිභෝජනය දිරිමත් කිරීමයි. එහි අවසාන ප්‍රතිඵලය දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියෙන් ගොවියා ඉවත් කිරීමයි. එම තත්ත්වය පැහැදිලි කිරීම සඳහා වන හොඳම උදාහරණය පී.එල්. 480 ගිවිසුමයි. ඇමරිකානු තිරිඟු පිටිවලට සහනාධාර ලබා දී ඒවා අඩු මිලට දේශීය වෙළෙඳපොළට දැමීම සඳහා ණය දුන්නේ ඇමරිකා එක්සත් ජනපදයෙන්මය. එය ඌරාගේ මස් උගේ ඇඟේම තියා කැපීමකි. ඒ ණයවලට පොලිය ගෙවන්නේද අපමය. ඒ අනුව මීට අවුරුදු 30-40 කට පෙර ශත 75 කට කෑමට ගත් පාන් ගෙඩියකට අද පොලිය සමග රු. 300 ක් පමණ ගෙවයි. ඒ ණය තවම ගෙවා අවසන්ව නැත.

## ආර්ථික ඝාතක ප්‍රතිපත්ති

කෙසේවෙතත් එම කාසියේ අනෙක් පැත්ත කෘෂි කාර්මික නිෂ්පාදන පද්ධතිය බිඳ වැට්ටවීම සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට රජය පෙළඹීමයි. විවිධ රජයන්ගේ විවිධ කෘෂිකර්ම ඇමැතිවරුන් ඒ සඳහා දැනුවත්ව හෝ නොදැනුවත්ව පහසුකම් සැපයීය. එවැනි සුවිශේෂී ආර්ථික ඝාතක ප්‍රතිපත්තිමය තීන්දු රාශියක් අප රටේ කෘෂිකර්ම ඇමැතිවරුන්ගේ ඉතිහාසයෙන් සොයාගත හැක.

ඉන් පළමුවැන්න එදා සෑම කෘෂි නිෂ්පාදන බිම් අඟලකටම වග කියන ලෙස පවත්වාගෙන ගිය කෘෂි ව්‍යාප්ති

20 වන පිටුව බලන්න



# මේ වස්සාන කාලයයි



■ උතුරාවල ධම්මරතන හිමි

හේමන්ත, ගිම්හාන හා වස්සාන යනුවෙන් සෘතු තුනකි. මින් නොවැම්බර් මස මුල පටන් පෙබරවාරි මස අග දක්වා ඇති සාර මාසය හේමන්ත සෘතුව ලෙසත් මාර්තු මස මුල පටන් ජුනි මස අග දක්වා ඇති සාර මාසය ගිම්හාන සෘතුව ලෙසත් පිළිගැනෙන අතර ජුලි මස මුල පටන් ඔක්තෝබර් මස අග දක්වා ඇති සාර මාසය වස්සාන සෘතුව වශයෙනුත් සැලකේ.

## මහ වැසි මැද දහම් චාරිකා

වස්සාන සෘතුව පුරා එක දිගට වැසි හට ගනියි. එය එක් අතකින් සත්ව ප්‍රජාවට යහපත් කාල පරිච්ඡේදයක් වනවාක් මෙන්ම අනෙක් අතින් කරදරකාරී වකවානුවක්ද වේ. විවිධ පක්ෂීහු මෙන්ම සිවුපාවෝද මේ කාලය තුළ තම ලැගුම් හල් තුළට වී කල් යවති. ජනතාව තම ගමන් බිමන් පවා අඩු කරති. නමුත් භික්ෂූන් වහන්සේ ධාරාණිපාත වැසි නොතකා එකල දහම් චාරිකාවෙහි හැසිරුණාහ. ගෙපිළිවෙළින් පිඬු සිඟා වැඩියහ.මේ හේතුවෙන් වැස්සට මැනවින් වැඩෙන නිල් තණ භික්ෂූන් අතින් පෑගී පොඩි විය. කෘමි සතුන්ද එලෙසම පෑගී විනාශ විය. වැස්සට තෙමුන භික්ෂූන් මඩ දිය පාරේ මෙන්ම නියරේද වැඩම කිරීම නිසා ඇඟ මඩ තැවැරිණ. ලිස්සා වැටීමෙන් සමහර විටෙක පොරවන සිවුරුවලද මඩ තැවැරිණ. මේ සිද්ධි දකින්නට ලැබෙන බොහෝ මිනිස්සු භික්ෂූන්ට චෝදනා කරන්නට වූහ.

මේ මහජන චෝදනා පිළිබඳ බුදුරජාණන් වහන්සේටද අසන්නට ලැබුණි. උන්වහන්සේ බොහෝ විට ලෝකාපවාදය දුරු කිරීම පිණිස ශික්ෂා පද පැනවූහ. ඒ අනුව භික්ෂූන් රැස් කරවා කරුණු අවබෝධ කොට දී ලෝකාපවාදය දුරලනු සඳහාත් භික්ෂූන් වහන්සේගේ පහසු විහරණය පිණිසත් වස් විසීමට කරුණු දේශනා කළහ. එසේ වස් විසූ විට ශ්‍රද්ධාවන්ත දායක දායිකාවන්ට පින් සිද්ධ කර ගැනීමට හැකිවන බවත් දෙසූහ.

**අනුජානාමි භික්ඛවේ වස්සානේ වස්සං උපගන්තුං**

**මහණෙනි, වස්සානයෙහි වස් එළඹීමට අනු දනිමි**

යන ශික්ෂා පදය පැනවූහ.

වස් එළඹීම් දෙකකි. ඒ පෙර වස් විසීම හා පසු වස් විසීම යනුවෙනි. පෙර වස් එළඹීම කළ යුත්තේ ඇසළ මස පුර පසළොස්වක් පොහෝ දිනට පසු දිනයි. එනම් අව පෑලවිය දිනයි. යම්කිසි කරදරයක් හේතුවෙන් පෙර වස් එළැඹීමට නොහැකි වූ භික්ෂු නමක් පසු වස් සමාදන් විය යුතුය. එය කළ යුත්තේ නිකිණි මස පුර පසළොස්වක් පොහෝ දිනට පසු දිනයි. එනම් අව පෑලවිය දිනයි. යම් උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් තම නියමිත දින වස් නොඑළැඹියහොත් දුක්කටා පත්ති ඇවැත් සිදුවේ. එහෙයින් උපසම්පදා භික්ෂූන්ට වස් විසීමට ආරාධනා කළත් නොකළත් අනිවාර්යයෙන්ම වස් එළැඹීම සිදු කළ යුතු වේ.

වස් සමය ගිහි පැවිදි සබඳතා තර කෙරෙන කාල වකවානුවක් වශයෙන් හැඳින්විය හැකිය. විහාරස්ථාන සතර පේරුවේ දායක කාරකාදීහු පොහොය දින විහාරස්ථානයට රැස්වී දැහැත් වට්ටියක් පිළිගන්වා මේ තුන්මාසය වස් වාසය කරන ලෙස ආරාධනා කරති. එම ආරාධනාව පිළිගන්නා උපසපන් භික්ෂූන් වහන්සේ නියමිත දිනය සංඝ විනය කර්ම කොට වස් එළැඹෙති. අනතුරුව ස්වකීය විහාරස්ථානයේ වැඩ වෙසෙමින් බණ භාවනාදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරති. ඒ තුන් මාසයත්, චීවර මාසයත් යන සාර මාසය තුළ දායක දායිකාවන්ට නිතර ධර්ම දේශනා කරති. දායක දායිකාවෝද අනෙක් කටයුතුවලට වඩා උනන්දුවකින් හා කැපවීමකින් භික්ෂූන් වහන්සේට සලකති. සුවදුක් සොයා බලති. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය යන සිව්පසයෙන් උපස්ථාන කරති. එහෙයින් වස් සමය ගිහි, පැවිදි දෙපාර්ශ්වයම පින් දහම්හි නියැළෙන පින්බර කාල පරිච්ඡේදයක් හැටියට සැලකිය හැකිය.

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි භික්ෂූන්ට වස් එළැඹීමට නියමිත තැනක් නොවීය. ඒ හේතුවෙන් භික්ෂූන් වහන්සේ විශාල ගස් බෙනවල, ගස් දෙබල්වල සහ විශාල ගස් යට, වස් සමාදන් වූහ. එබඳු ස්ථාන වස් විසීමට සුදුසු නොවන හෙයින් මහජනයා භික්ෂූන්ට දෝෂාරෝපණය කළහ. ඒ ඇසූ බුදුරජාණන් වහන්සේ එබඳු ස්ථානවල වස් විසීම තහනම් කොට වදාළහ. විහාරාරාම, ගුහා, කුටි යනාදී යෝග්‍ය ස්ථාන වස් එළැඹීම සඳහා තෝරා ගන්නා ලෙස අනුදැන වදාළහ. එකී ස්ථානවල වස් එළැඹුණ නමුත් සිවුපා සතුන්ගෙන්, සර්පයන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන් හා ජලයෙන් යම් හානියක් සිදුවන්නේ නම් එකී ස්ථාන අතහැර යෑමට අවසර තිබේ. එමගින් වස් බිඳීමක් හෝ කඩවීමක් සිදු නොවේ.

'සත්තාහකරණයෙන්' යෑමටද වස් විසූ භික්ෂූන් වහන්සේට අවසර තිබේ. එමගින් ඇවැතක් සිදු නොවේ. සත්තාහකරණය යනු 'වස් එළැඹී භික්ෂු නමක් හදිසි අවස්ථාවක දී හෝ අත්‍යවශ්‍ය කටයුත්තකදී හෝ සත්වැනි රාත්‍රිය ඉක්මීමට පෙර එන්නෙමි' යි පිටත්ව යෑමයි. ඒ අනුව සත්වෙනි රාත්‍රියට පෙර නැවත ආරාමයට පැමිණීම කළ යුතුය. එහෙයින් වස් නොබිඳේ. සත්තාහකරණයෙන් යා හැකි අවස්ථා රාශියක්ම මහා වග්ග පාලියේ 'වස්සුපනායික්ඛන්ධකයේ' දැක්වේ.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටියදී එහි පැමිණෙමින් සිටි භික්ෂූන් වහන්සේ තිස් නමක් අතරමඟදී සාකේත නුවර වස් විසූහ. වස් අවසානයේ යළි පැමිණෙමින් සිටිය දී ධාරාණිපාත වර්ෂාවකට හසු වන්නට සිදුවිය. සිවුරු තෙමී ඇඟ මඩ ගෑවී සීතලෙන් මැඩුණද ගමන නොනවත්වා ජේතවනාරාමයට පැමිණි උන්වහන්සේ තමන් සතුව අතිරේක සිවුරක් නොතිබුණු බැවින් මෙම මහත් වූ විපතට පත් වූ බැව් බුදුරජාණන් වහන්සේ හමුවේ පවසා සිටියහ. ඒ අනුව '

**අනුජානාමි භික්ඛවේ වස්සං උත්ථනං භික්ඛූනං කඨිනං අත්ථරිතුං**

'මහණෙනි, වස් වැස නිම කළ භික්ෂූන්ගේ පහසුව සඳහා කඨිනයක් අනුදනිමි' යි කඨින චීවර පූජාව අනුදැන වදාළහ.

'කඨින' යනු ස්ථිර යන්නයි. අකම්පස යන්නයි. මහ පොළොව මෙන් මහමේරු පර්වතය මෙන් ඒක ඝන වජ්‍ර පර්වතයක් මෙන් කඨිනය ස්ථිරසාර වේ. කඨින පූජාවෙන් ලැබෙන ආනිසංසද මහත් සේ බලවත් වේ. කඨිනය යන්න භාවිත කෙරෙන්නේ මේ අරුත අනුවය.

ලොව ඇති ඉතා උසස් කුසල කර්ම අටක් පිළිබඳව බුදුදහමේ ඉගැන්වේ. කඨින පූජාව, අටපිරිකර පූජාව, ආවාස පූජාව, බුදු පාමොක් සංඝගත දක්ෂිණා පූජාව, බණ පොත් ලියවා හෝ මිලට ගෙන පූජා කිරීම, බුද්ධ ප්‍රතිමා කරවීම, කෙත්වතු පූජාව හා වැසිකිළි කැසිකිළි කරවීම යනුවෙන් වන මෙම අට මහා කුසල් සිදු කිරීමෙන් විශේෂ ආනිසංස ලැබෙන බැව්ද කියැවේ. ඒ අතරින් කඨින පූජාවට හිමිවන්නේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි. ඕනෑම පින්කමක් තමන්ට කැමැති වේලාවක සිදු කළ හැකි නමුත් කඨින පූජා පින්කම කළ හැක්කේ වසරකට එක් වරක් පමණි. පෙර වස් විසූ, වස් ආරක්ෂා කරගත් අනතුරුව මහපවාරණයෙන් වස් පවාරණය කළ භික්ෂූන් වැඩ වෙසෙන ස්ථානයක පමණි මේ පින්කම සිදුකළ හැක්කේ. ඒ සඳහාද පස් නමකට නොඅඩු භික්ෂූන් වහන්සේ සිටිය යුතුය.

විහාරස්ථානයක නම් සතර පේරුවේ දායක දායිකාවෝ එකතු වී කඨින චීවරය සඳහා සුදුසු වස්ත්‍රයක් සකස් කර ගනිති. එය චීවර මාසය තුළ එක් දිනයකදී අලුයම මහත් වූ පූජා සත්කාර ගරු සම්මාන පෙරහරකින් වැඩමවා ගෙනැවිත් **'ඉමං කඨින දුස්සං සංඝස්ස දේම'** යන වාක්‍යයෙන් තෙවරක් කියා මහා සංඝරත්නයට පූජා කරති.

කඨින වස්ත්‍රය නොඉරුණු, නොකිලිටි සහ තුන් සිවුරෙන් එක් සිවුරකට ප්‍රමාණ වන පරිදි තිබිය යුතුය. කඨින වස්ත්‍රය භාර ගන්නා සංඝරත්නය එදිනම සේදීම, කඩ බෙදීම, කඩ කැපීම, එක්කොට මැසීම, පඬු පෙවීම හා කප් බින්දු තැබීම යනාදී කරුණු සතක්ම එකම දවසේ සිදු කරති. එකී පූජා වස්ත්‍ර සිවුරක් කිරීමෙන් අනතුරුව එම චීවරය එම ස්ථානයේ වස් විසූ භික්ෂූන් අතුරෙන් සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේ නමකට සංඝ සීමාවක් තුළදී සම්මතයෙන් කර්ම වාක්‍යයක් කියා පවරති.

කඨින චීවර පූජාව සිදු කරන පාර්ශ්වයට පමණක් නොව එය ලබන භික්ෂූන් වහන්සේටත් විශේෂ ආනිසංස ලැබේ. මෙම චීවරය නිසා භික්ෂූන් වහන්සේට සිදුවන වරද පහක් දුරුවන අතර අසමාදානචාරය, ගණ භෝජනය, යාවත්ත චීවරය හා තත්ථ චීවරුප්පාදාය ආදී ආනිසංස පහක් ලැබෙන බැව් මහා වග්ග පාලියෙහි කඨිනක්ඛන්ධකය පැහැදිලි කරයි.

ඊට අමතරව අපදාන පාලියේ නාගිතාපදානයේ දැක්වෙන අන්දමට කුසල් සිත් පෙරටුව කඨින චීවරය මැසීමෙන් ඒ මැසු ඉදිකටු පාරක් පාරක් පාසා උදාරතර චක්‍රවර්ති රාජ්‍ය ලැබෙන අතර භවයක් භවයක් පාසා ප්‍රාදේශීය රාජ්‍ය පදවිවලට හිමිකම් කීමේ හැකියාව ලැබේ.

ලක්දිව රජ පැමිණි රාජමහාමාත්‍යාදී පිරිස ඉතා උත්කර්ෂවත් අයුරින් කඨින පූජා පින්කම් සංවිධානය කළ බැව් ඉතිහාසගත කරුණුවලින් අනාවරණය වේ. ලජ්ජිතිස්ස, අග්‍රබෝධි, සේන, පණ්ඩිත පරාක්‍රමබාහු ආදි නරපතීන් ඒ අතුරින් මුල් පෙළෙහි ලා සැලකිය හැකිය. සමාජ බලවේග හමුවේ වර්තමානයේ දුරස් වී ඇති ගමේත්, පන්සලේත් සම්බන්ධතාව යළි ගොඩනැංවීම සඳහා කඨින පින්කම තුළින් කළ හැකි මෙහෙවර අතිවිශාලය. ඒ සඳහා උත්සුක වීමට මේ එළැඹෙන වස් සමය වටිනා උදාරතර කාල පරිච්ඡේදයකි.

## දැනුම සමග කටට රසට



# බනානා මෆින්ස්

■ තිසරි ශිබා - **Shikifood**

මගේ නැන්දාගේ පුතා වන සුදිල් අයියා ඇතැම් විටෙක මට වීරයකු සේ පෙනුණත් ඇතැම් විටෙක මට ඔහු පෙනුණේ මහම මහ බක පණ්ඩිතයකු සේය. එකල ඔහු නොදන්නා දෙයක් තිබුණේ නැත. නියුටන්ගේ නියමය ගැන, පරිණාමවාදය ගැන, මැකියාවේලී සහ ලෙනින් ගැන, ලෝක දේශපාලනය ගැන, කෙනඩි ගැන, ඔහු කියූ බොහෝ කතා මම කට අයා අසා ගෙන සිටි අතර ඔහු තරම් වීරයකු මට සිටියේ නැත. අද එය මතක් වන විට සිනා යන්නේ ඔහු එදා ඇද බාපු බේගල්වල තරම සිහිවන විටය. එකට සෙල්ලම් කළත් මම සුදිල් අයියා හා රණ්ඩු වූ වාර ගැනිය නොහැක. පොර කුකුළන් සේ අප රණ්ඩු වුවත් එය බොහෝ විට පැයකින් හමාරකින් අවසන් වන්නේ සුදිල් අයියාට මා හා කතා නොකර සිටීමට නොහැකි නිසාය.

"චූටි නංගී තරහද....?"

මා බිම බලාගෙන රවාගෙන සිටින විට සුදිල් අයියා සඟවා ගත් සිනාවෙන් දිගු කරන පේර ගෙඩියට, අඹ ගෙඩියට, දං මිටට අප අමනාපකම්, සුළඟට හසු වී ඉබේම ඈතට ඈතටම ගසාගෙන යන්නේය. ඉන්පසුව එක් වී සෙල්ලම් කරන අපි නැවත නැවතත් රණ්ඩු වෙමින් යාලු වෙමින් ආයෙ ආයෙත් රණ්ඩු වෙමින් ගෙවූ ළමා කාලය සදාකාලික මතකයකි.

සුදිල් අයියා මට වඩා අවුරුදු කිහිපයක් වැඩිමහල් වූ අතර ඔහු පාසල් ගියේ මාතර රාහුල විද්‍යාලයටය. එය පිරිමි පාසලකි. මම මාතර සුජාතාවියක් වීමි. ඔහු හැම විටම සිතා සිටියේ මාතර සියලුම බුද්ධිමතුන් බිහි වූයේ රාහුලෙන් බවත්, සුජාතාවියන් හැමවිටම මෝඩ තීරණ ගන්නා ළඳ බොළඳ කෙල්ලන් බවයි. සුජාතාවට සමච්චල් කරන විට මට ඔහු ගැන ඇතිවන කෝපය නිම්හිම් නැත. ඒ හැම විටම අප රණ්ඩු බේරන්නේ ආත්තම්මා හෝ චම්මලාය.

සුදිල් අයියා ඔහුගේ පාසලින් සංවිධානය කළ අධ්‍යාපන චාරිකා එකක්වත් මග හැරියේ නැත. එසේ චාරිකාවක් අවසන් කොට පැමිණි දිනක මුළු සතිය පුරාම කියවන ඔහුගේ වීර චාරිකා මම අසා සිටින්නේ නොරිස්සුමෙනි. අප පාසලින් එවැනි චාරිකා සඳහා අප ගෙන යන්නේ නැත්තේ ඇයිදැයි මට තිබුනේ කණගාටුවකි.

"චූටි දෝණිටත් යන්න පුළුවන් ලොකු වුණාම. තාම මගේ දූ පොඩියිනෙ" ආත්තම්මා මා සනසවන්නීය.

දිනක් සෙල්ලම් කිරීමට පැමිණි සුදිල් අයියා පැවසුවේ ඔවුන් ඊළඟ සති අන්තයේ පාර්ලිමේන්තුව බැලීමට යන වගයි. එය මට කුතුහලය පිරි අපූරු ආරංචියක් විය. කිසි දිනෙක පාර්ලිමේන්තුව දැක නොතිබුණු මට සුදිල් අය්යා හා එහි යෑමට සිත් විය.

"අනේ අයියෙ මාවත් එක්ක යන්නකො..."

"අපෝ බෑ. කෙල්ලො යනවද කොල්ලො යන ට්‍රිප්වල...."

මගේ මැලවුනු මුහුණ දැක දුක සිතුණ ඔහු මට පොරොන්දු වූයේ පාර්ලිමේන්තු ට්‍රිප් එකෙන් පසු ඊළඟ සති අන්තයේ පාර්ලිමේන්තුවක් අප ගෙමිදුලේ පිහිටුවන බවයි. එයින් මම සෑහීමකට පත් වීමි.

පාර්ලිමේන්තු ගමනින් පසු සුදිල් අයියාගේ ස්වරූපය වෙනස් විය. ඔහු කතා කළේ ගැඹුරු කටහඬකිනි. ඇවිද්දේ ගාම්භීර විලාසයකිනි. කිසිදිනක ගමේ මිනිසුන් ගැන කතා නොකළ ඔහු එදායින් පසුව ගමේ මිනිසුන් ගැන කතා කිරීමට පටන් ගත්තේය. ගමේ අඩුපාඩු ගැන කතා කළේය. කෙදිනක හෝ ගමෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වී යන බව පැවසූ ඔහු මැති ඇමතිවරුන් සමග ඡායාරූපයන්ට පෙනී සිටි බව කියමින් බේගල් ඇද බෑවේය.කෙසේ වුවත් එළඹෙන සති අන්තය දෙස මා බලා සිටියේ සුදිල් අයියා සමග පාර්ලිමේන්තුවක් පිහිටුවීමටය.

ඉරිදා දින මා උදෑසන අවදිවීමි. කලින් කතා කර ගත් පරිදි සුදිල් අයියාත්, කපිල අයියාත්, රසිකා අක්කාත්, තරංගා අක්කාත්, චමල්ක අයියාත් අප වත්තේ දෙල් ගස යටට එකතු වීමු. පාර්ලිමේන්තු විවාද දිනයක් නිසා විපක්ෂ නායකකම සුදිල් අයියා බාර ගත්තේය. රසිකා අක්කාටත්, තරංගා අක්කාටත් ළමා හා කාන්තා කටයුතුත්, පාරිසරික කටයුතුත් ඇමතිනීන් ලෙස කටයුතු කරන්නැයි පැවසුණි. කපිල අයියා කතානායක වූ අතර චමල්ක අයියා අගමැති විය. මට තනතුරක් ලැබෙන තුරු මා බලා සිටියත් ඒ හැමෝටම මා අමතක වූ සැටියකි

"එතකොට මම කවුද?"

"ආ චූටි නංගි ඔයා සෙන්කෝලය අරන් එන්න...."

"මොකක්? බෑ බෑ මට බෑ..."

"එහෙනම් චූටි නංගි හෝජනාගාරෙ බාර ගන්න..." කපිල අයියා මට පාර්ලිමේන්තු භෝජනාගාරය බාර දෙනවිට මට ඇඬුම් ආවේය.

"මම කියපු නිසාමයි පාර්ලිමේන්තුවක් දැම්මෙ. ඒත් අන්තිමට මට කිසි දෙයක් නෑ...."

"නෑ නෑ චූටි නංගි ජනාධිපතිනිය වෙන්න. මුළු රටේම ලොක්කා තමයි දැන් ඔයා...."

එදා මට දැනුණ සතුට කියා නිම කළ නොහැකි තරම් විය. අපි දෙල්ගස යට පාර්ලිමේන්තුව පටන් ගතිමු.

ඉරිදා දිනයක් වූ නිසා අප සෙල්ලම් කරන අතර තුර චූටි චම්මා බනානා මෆින් සෑදීමට කලින්ම කළමනා සකසා ගත්තීය. ඒ සඳහා ආත්තම්මාත්, දීප්ති චම්මාත් උදව් කළේ ඒ චූටි චම්මා අතින් සැකසෙන පළමු වට්ටෝරුව නිසාය. ඉවීමට කම්මැලි චූටි චම්මා කඩයප්පන් සෑදීමට වඩාත් ආසා කළාය. ඒ අතරින් බනානා මෆින් විශේෂ වන්නේ ඇය කේක් සෑදීමටත් මෆින් සෑදීමටත් උපන් හපනියක් හෙයිනි. අප සෙල්ලම් කරන අතර කුස්සියේ සිටි ඔවුන් කාර්යබහුල වුවත් විටින් විට අප සෙල්ලම් කරන දිසාවටත් ඔලුව දමා අප ගැන විපරම් කළහ.

පාර්ලිමේන්තුවේ විවාදය උණුසුම් වූයේ කපිල අයියාත් සුදිල් අයියාත් නිසාය. අක්කලා දෙදෙනාත් විටින් විට කතා පැවැත්වූහ. මගේ වාරය එනතුරු බලා සිටියත් පැමිණෙන පාටක් නැත. ඒ අතර තුර සුදිල් අයියා විටින් විට ගෙට ගොස් මොනවදෝ කටේ පුරෝගෙන ආවේය.

"කෝ මගේ වාරෙ? මම දැන් කොච්චර වෙලා මෙතන වාඩි වෙලා බලන් ඉන්නවද?"

"අයියෝ චූටි නංගි. ජනාධිපති පාර්ලිමේන්තු යන් නෑ"

"එතකොට මට කරන්න කිසි දෙයක් නෑනෙ..." මම ඇසුවෙමි

"ඒකනෙ ඔයා ජනාධිපති කළේ..."

සුදිල් අයියා සිනාවෙමින් පවසන විට මා කෑ ගසා අඬමින් ගෙට ගියේ මගේ නඩුව ආත්තම්මාට කියන්නයි. ඒත් එක්කම අප සිටි දෙසට ආ චූටි චම්මා,

"කවුද මේසෙ උඩ තිබුණ මෆින් කෑවෙ. මෆින් සේරම ටික ඉවර කරලනෙ..."

මට උදාවී තිබුනේ කදිම අවස්ථාවකි. මා සුදිල් අයියා පාවා දෙමින් මගේ තරහ ඔහු පිටින් මුදා හැරියෙමි.

"සුදිල් අයියා මොනවද කකා ආවා සැරි සැරේ....."

"මම කෑවෙ පාර්ලිමේන්තුවෙ භෝජනාගාරෙ තිබුනු මෆින්. චම්මා හදපුවා කෑවෙ නෑ...."

"මොන භෝජනාගාරෙ.....??"

"පාර්ලිමේන්තු බෝජනාගාරෙ...."

සිදු වී ඇති දේ මනාව වටහා ගත් චූටි චම්මා අවසානයේ පාර්ලිමේන්තුව විසිරුවා හැරියාය.

**එදා සුදිල් අයියා හොරෙන් කෑ බනානා මෆින් අපි අද හදමු.**

### අවශ්‍ය දේ

- පිටි කෝප්ප 2 1/4
- බේකින් පවුඩර් තේ හැඳි 3
- ලුනු තේ හැඳි 1/2
- කුරුඳු පවුඩර් තේ හැඳි 1/2
- පොඩි කර ගත් ලොකු කෙසෙල් ගෙඩි 4
- (පොඩි ගෙඩි නම් 5-6 ක් විතර ගන්න)
- සීනි කෝප්ප 1 1/2
- බටර් කෝප්ප 3/4
- බිත්තර 2
- වැනිලා තේ හැඳි 1
- කුඩාවට කපා ගත් කජු කෝප්ප 1/2

### සාදන ආකාරය

ලොකු භාජනයක් ගෙන එයට පිටි, බේකින් පවුඩර්,කුරුඳු පවුඩර් සහ ලුනු දමා හොඳින් කලවම් කරන්න. වෙනත් භාජනයක් ගෙන එයට පොඩි කර ගත් කෙසෙල් හා සීනි දමා බීටරයකින් බීට් කර ගන්න. දැන් එයට බටර්, බිත්තර සහ වැනිලා එකතු කර නැවත බීට් කරන්න. දැන් එය පිටි මිශ්‍රණයට එකතු කර හැන්දකින් කලවම් කරන්න. කුඩා කජු කැබලි එකතු කර නැවත කළවම් කරන්න. මෆින් ට්‍රේ එකක් ගෙන බටර් තවරා ගන්න. දැන් මිශ්‍රණයෙන් ටික ටික ට්‍රේ එකට දමන්න. $350^0$ F උෂ්ණත්වයෙන් කලින් රත් කර ගත් අවන් එකක විනාඩි 15-20 ක් බේක් කර ගන්න. ටූත් පික් එකක් ගැහුවම මිශ්‍රණය එයට ඇලෙන්නෙ නැත්නම් හරියටම බේක් වෙලා. අවන් එකෙන් අවන් එකට උෂ්ණත්වය අඩු-වැඩි වෙන නිසා ඒ ගැනත් සැලකිලිමත් වෙන්න.

## කොළඹ බයිලා...

12 වන පිටුවෙන්

මෝස්තරය පබළු හා මුතු වැල්වලින් අලංකාර කර තිබුණි. කන දිගට එල්ලෙන තෝඩු දමා බෙල්ලේ ලස්සන මාල කිහිපයක් පැළඳ සිටි ඇය අත් පිරෙන්නට පැළඳ සිටි වීදුරු වළලුවලින් සිහින් සංගීත රාවයක් නැඟුණේ තාලයට දෙඅත් චලනය කරමින් නටන හෙයිනි. සමහර විට මේ වළලු බිඳුණු අවස්ථාද තිබුණි. ඇගේ රංගන සඳහා මනරම් හින්දි ගී තනුවක් වාදනය විය. සමහර වර්ෂවලදී කපුහේන්තුඩුව ගමට නුදුරුව පිහිටි වැලිකඩ ග්‍රාමයෙන්ද මේ චරිතය සඳහා රංගන ශිල්පීහු සහභාගි වූහ. නාරි ලාලිත්‍යය විදහා දැක්වෙන ආකාරයෙන් විනාඩි හතරක් පහක් රංගනයේ යෙදෙන ඇය රැඟුම අවසානයේ ගෙහිමියා ළඟට ගොස් බොහෝ ගරු සරුව හා සුහදශීලීව ආචාර සමාචාර පවත්වන්නේ තුටුපඬුරු ලබා ගැනීමටයි. ගෙහිමියාද ලියුම් කවරයක බහාලන මුදලක් ඇය අත තබන්නේය. එයද රැගෙන සෙනඟ අතරට වැදී නොපෙනී යන ඇය එය කණ්ඩායම් නායකයාට දෙයි. මෙසේ ලැබෙන මුදලින් සුළු වියදම් පියවා ඉතුරු මුදල කණ්ඩායමේ සාමාජිකයන් අතර බෙදා ගන්නේ බොහෝ සුහදශීලීවය.

### අනුග්‍රාහකයෝ

බයිලා නැටුම සඳහා අවශ්‍ය ඇඳුම් පැළඳුම් කණකර ආභරණ වේශ නිරූපණ අඩුවැඩිය හා කෑම බීම නොමිලයේ සැපයෙන නිසා වියදම් අඩු වේ. පුහුණුවන කාලයේදී පවා කෑම බීම නොමිලයේ සැපයෙයි. මේ සඳහා කොළඹ රාජකීය ගෝල්ෆ් ක්‍රීඩා සමාජයෙන් (ටොරින්ටන්හි පිහිටි 'ලේඩීස් ක්ලබ්' එකද ඇතුළුව) ලද සහාය සිහිපත් කළ යුතුමය.

මෙලෙස එක තැනකට ප්‍රේක්ෂකයන් රැස් නොකර, ගමක තරුණ හා වැඩිහිටි පිරිසක්ද පිරිවරාගෙන ගෙන් ගෙට ගොස් පවත්වන ලද මෙවන් නැටුම් සංදර්ශනයක් මා දන්නා තරමින් නම් තවත් නොමැත. එහි නර්තනාංග කිහිපයක් ගැන මගේ පැහැදිලි මතකයක් නැති නිසා මතකයේ ඇති අය වෙතොත් ඌණ පූරණයක් කරන්නේ නම් කෘතඥ වෙමි.

කොළඹ රාජකීය ගොල්ෆ් ක්‍රීඩා සමාජයෙන් ලැබුණු අප්‍රමාණ වූ සහාය නිසා කපුහේන්තුඩුව ගම බයිලා නැටුම් කලාවට ප්‍රසිද්ධ විය. ඒ නිසා අවට ගම්වාසීහු මෙය නැරැඹීමට පැමිණියහ. බයිලා නැටුම් කණ්ඩායම සිරිතක් ලෙස සිය මංගල දර්ශන වාරය පවත්වන්නේ ගොල්ෆ් ක්‍රීඩා සමාජය ඉදිරිපිටය. අලුත් අවුරුද්ද සැමරීම සඳහා කා බී විනෝද වෙමින් බාල් නටමින් රෑ පහන් කරන දේශීය හා විදේශීය ඉහළ පැලැන්තියේ වැඩිහිටියෝ (එදා ළමුන් මේ බාල් නැටුම් සඳහා සහභාගි කර ගැනීමේ සිරිතක් නොතිබුණි) බයිලා නැටුම බලා බොහෝ ප්‍රීති වූහ. ඇඳුම් පැළඳුම් හා වේශ නිරූපණ අඩුවැඩිය නොමිලයේ සැපයූ ඔව්හු තුටුපඬුරු දීමටද අමතක නොකළහ. අදද ගොල්ෆ් ක්‍රීඩා පිටිය හා ක්‍රීඩා සමාජය කපුහේන්තුඩුව ගමේ විරාජමාන වුවත්, බයිලා නැටුම් කණ්ඩායම හා එම නර්ථනාංගය අභාවයට ගොසිනි.



## Silvy Fernando, LL.B.
Barrister, Solicitor & Notary Public

Lawyer for:

- Home Refinance, Purchase and Sale
- Personal Injury (no legal fee until settlement)
- Debt Recovery/Debt Settlement
- Separation Agreements, and Divorce (Accept Legal Aid Certificates)
- Power of Attorney, Affidavits, and Wills
- All Immigration Matters
- Land Lord-Tenant Disputes
- Notarizing and Commissioning

Unit 111 – 7800 Woodbine Avenue, Markham, ON L3R 2N7
Tel: 416-272-6587/905-604-7771, Fax: 905-604-5529
Email: silvy@sflegalservice.com



# කැනේඩියානු නිවාස හා දේපළ උකස් සේවාවේ මූල්‍ය කටයුතු පිළිබඳ වසර ගණනාවක පලපුරුද්ද සහිතව ඔබගේ සේවයට කැපවී සිටිමි

**CALL ME ....LET'S DISCUSS ... FIND THE BEST WAYS ...!!!!**

# BANK SAYS "NO"
# WE SAY "YES "

**FREE CONSULTATION ON POSSIBILITIES OF HELPING YOU TO HAVE THE BEST HOME FINANCING OPTIONS;**

- PURCHASE OF NEW HOUSE OR CONDO FROM A BUILDER OR MLS LISTING
- NEW IMMIGRANTS
- SELF EMPLOYED
- SECOND HOME
- RENTAL PROPERTIES
- RE-FINANCE
- SWITCH (MATURITY OR RENEWALS)

**[I WILL BE AVAILABLE TO MEET WITH YOU AND YOUR FAMILY ALL ACCROSS GTA]**
**TORONTO, MISSISSUGA, BRAMPTON, MILTON, OAKVILLE, HAMILTON, MALTON, BURLINGTON, AJAX, PICKERING, GEORGETOWN, SCARBOROUGH**

## VIA FINANCIAL
SERVICES INC.
LIC# 10669

DIR: 647 933 6548
BUS: (416) 321-2227
FAX: (416) 321-2011

e.mail: kavinda@viafinancial.ca

www.viafinancial.ca

109-5805 Whittle Road
Mississauga, ON L4Z 2J1



කාවින්ද මයිලෑව
BSc.Mgmt, MBA
Mortgage Agent

* Certain conditions, Broker fees, early pre-payment interest penalties, CMHC, Genworth and CG Insurance fees may apply.
Interest rates are subject to change without notice.



# සිංහල උගනිමු

## පාඩම් අංක 1

සෑම රටකම පුරවැසියකුගේ මවුබස වනුයේ ඔවුන්ගේ මවුපියන් සතු භාෂාවයි. ඒ අනුව සිංහලයන්ගේ මවුබස වනුයේ 'සිංහල' යි. මවුබස ඉගෙනීම ඒ බස කතා කරන සැමට පහසුවෙන්ම කළ හැක්කකි. එසේ වනුයේ ප්‍රායෝගිකව එය උපන් දා සිට නිරන්තරවම භාවිතයට ගැනෙන හෙයිනි. මෙසේ වුවද විධිමත්ව මවුබස ඉගෙනීම උනන්දුවෙන් කළ යුත්තකි. ඒ සඳහා මූලික මාර්ගෝපදේශයක් අත්‍යවශ්‍යය. මෙම සිංහල පාඩම් මාලාව ඉතාමත්ම සරලව සහ විධිමත්ව සකස් කොට ඇත. අනුපිළිවෙළින් මෙය භාවිත කරන්නේ නම් ඔබට සිංහල පිළිබඳව පුළුල් දැනුමක් ලබාගත හැකිවනු නිරනුමානය. ඒ සඳහා සෑම පාඩමකම දෙනු ලබන අභ්‍යාසද කරන්නේ නම් ඒ වඩාත් පහසු වනු ඇත.

මෙම ලිපි පෙළ දීර්ඝ කාලයක් සිංහල භාෂා සාහිත්‍යය ඉගෙනීමෙනුත්, ඉගැන්වීමෙනුත් එමෙන්ම විභාග කටයුතු හා ගුරු පුහුණු කටයුතු කිරීමෙනුත් ලත් ප්‍රවීණත්වය මත ප්‍රකට අධ්‍යාපනඥයකු වූ සිරිසේන විතානගේ මහතා විසින් පිළියෙල කරන ලද්දකි.

### සිංහල අක්ෂර මාලාව

අක්ෂර යනු භාෂාවක් ලිවීමේදී භාවිතයට ගනු ලබන සංකේතයි. සිංහලයේ 'අ මි මා' යන අරුත රැගත් වචනය ලියා දැක්වීමේදී ඉහත දැක්වූ සංකේත තුන භාවිත කරනු ලැබේ. වර්තමානයෙහි අප භාවිත කරන සිංහල අකුරු දීර්ඝ කාලයක් මුළුල්ලේ වෙනස් වෙමින් පැමිණ අද පවත්නා ආකාරයට පත්ව ඇත.

භාෂාවේ මේ සංකේත මාලාව හෝඩිය යනුවෙනුත් වර්ණ මාලාව යනුවෙනුත් අක්ෂර මාලාව යනුවෙනුත් හඳුන්වනු ලැබේ. කෙමෙන් වැඩී විත් අද අප භාවිතයට ගන්නා අක්ෂර මාලාව හඳුන්වනුයේ 'මිශ්‍ර සිංහල අක්ෂර මාලාව' යනුවෙනි. එහි අකුරු 60 කි. ඒ අකුරු මෙසේ හඳුනා ගනිමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අං) | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

- ඉහත අක්ෂර මාලාව

ස්වර හෙවත් ප්‍රාණාක්ෂර (පණකුරු)
ව්‍යඤ්ජන හෙවත් ගාත්‍රාක්ෂර (ගතකුරු)
යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ලැබේ.

### ස්වර

වෙනත් අකුරක උපකාරයක් නැතිව තනිව ශබ්ද කළ හැකි අකුරු 'ස්වර' නම් වෙයි. ඉහත දැක්වූ අක්ෂර මාලාවේ 'අ' සිට 'ඖ' දක්වා ඇති අකුරු 18 ස්වර වේ.

මේ අකුරු හ්‍රස්ව (ලුහු) දීර්ඝ (ගුරු) යනුවෙන් යළි දෙකොටසකට බෙදේ. 'හ්‍රස්ව' යනු ඇදීමෙන් තොරව කියැවෙන අකුරුය. 'අ' යි කී විට එහි ඇදීමක් දක්නට නොලැබේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ඇ | ඉ | උ | ඍ | ඏ | එ | ඔ |

යන අකුරු අට හ්‍රස්ව අකුරුයි.

'ආ' යි කී විට එහි ඇදීමක් දක්නට ලැබේ. ඒ නිසාම ඒවා දීර්ඝ අකුරු වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආ | ඈ | ඊ | ඌ | ඎ | ඐ | ඒ | ඓ | ඕ | ඖ |

යන අකුරු දහය දීර්ඝ අකුරුයි.

### ව්‍යඤ්ජන

වෙනත් අකුරක උපකාරයක් නැතිව තනිව ශබ්ද කළ නොහැකි අකුරු ව්‍යඤ්ජන නම් වෙයි. ඉහත අක්ෂර මාලාවෙහි 'ක' සිට 'ෆ' දක්වා වූ අකුරු 28 ව්‍යඤ්ජනයි. මේවා කියැවීමේ පහසුව සඳහා ක, ග ආදි වශයෙන් දක්වා ඇතත් 'ක්' 'ග්' ආදි වශයෙන් තනිව ශබ්ද නොකළ හැකි ස්වරූපයක් ගනී. එබැවින් වෙනත් ස්වර අකුරක උපකාරය ඊට අවශ්‍යය. ක් + අ = ක ආදි වශයෙනි.

මෙම ව්‍යඤ්ජන අක්ෂර අල්පප්‍රාණ, මහාප්‍රාණ යනුවෙන් දෙකොටසකට බෙදේ. ඉහත අක්ෂර මාලාවේ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක | ග | ච | ජ | ට | ඩ | ත | ද | ප | බ |

යන අකුරු දහය අල්පප්‍රාණයි. සාමාන්‍ය හඬින් කියැවෙන බැවින් මේ අකුරු අල්පප්‍රාණ යනුවෙන් හැඳින්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඛ | ඝ | ඡ | ඣ | ඨ | ඪ | ථ | ධ | ඵ | භ |

යන අකුරු දහය මහාප්‍රාණයි. මේ අකුරු සාමාන්‍ය හඬට වඩා උස් හඬකින් උච්චාරණය වන බැවින් මහාප්‍රාණ නම් වේ.

අක්ෂර මාලාවේ 'ක' සිට 'ඹ' දක්වා වන අකුරු 30 වර්ග පහකට බෙදා 'වර්ගාක්ෂර' නමින් හැඳින්වේ. මේ අකුරු වර්ග කොට ඇත්තේ ඒ ඒ වර්ගයේ මුල් අකුරේ නමිනි. පහත වගුව බලන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ක වර්ගය | ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච වර්ගය | ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට වර්ගය | ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත වර්ගය | ත | ථ | ද | ධ | න | ඳ |
| ප වර්ගය | ප | ඵ | බ | භ | ම | ඹ |

ඉහත අක්ෂර අතර වන

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඞ | ඤ | ණ | න | ම | ං | සහ | ඥ |

යන සත 'නාසික්‍ය' නම් වේ. මේවා නහය හා සම්බන්ධ වී හඬ නිකුත් කරන බැවින් නාසික්‍ය නම් වේ. මෙහි එන 'ඥ' යන්න අක්ෂර මාලාවේ දක්නට නැතත් භාවිතයේ පවතින බැවින් එයද නාසික්‍ය ගණයට අයත් වේ.

වර්ගාක්ෂර අග එන

| | | | | |
|---|---|---|---|---|
| ඟ | ඦ | ඬ | ඳ | ඹ |

යන අකුරු සඤ්ඤක අකුරු ලෙස සැලකේ. අක්ෂර මාලාවේ දක්නට ලැබෙන ස්වරයක් එකතු වී සෑදෙන ව්‍යඤ්ජනයට නාසික්‍ය සංකේතයක් එක් වී සෑදෙන අකුරු සඤ්ඤකයි.

(ග් + අ = ග) 'ග්' යන ව්‍යඤ්ජනය 'අ' ස්වරය එක් වී 'ග' වෙයි. පසුව එයට නාසික්‍ය සංකේතය '෴' එක් වී 'ඟ' වෙයි. මේ සඤ්ඤක අකුරුවලට 'අනුනාසිකාක්ෂර' යයිද කියති.

| | | | |
|---|---|---|---|
| ය | ර | ල | ව |

යන අකුරු සතර 'අන්තඃස්ථ' අක්ෂර යනුවෙන් හඳුන්වනු ලැබේ. අක්ෂර මාලාවේ වර්ගාක්ෂර අග (අන්ත) යෙදී ඇති නිසා අන්තඃස්ථ නම් වෙයි.

| | | | |
|---|---|---|---|
| ශ | ෂ | ස | හ |

යන අකුරු සතර 'ඌෂ්මාක්ෂර' යනුවෙන් හැඳින්වේ. මෙම අකුරු උච්චාරණයේදී මුවින් දැඩිව වායුවක් නිකුත් වන බැවින් ඌෂ්මාක්ෂර නම් වේ. මින් 'ශ' තාලුජ 'ශ' ලෙසද 'ෂ' මූර්ධජ 'ෂ' ලෙසද 'ස' දන්තජ 'ස' ලෙසද හඳුන්වනු ලැබේ.

ව්‍යඤ්ජනාක්ෂර ඝෝෂ, අඝෝෂ වශයෙන්ද දෙකකට බෙදේ. ඉහත දැක්වූ අන්දමට ඒ ඒ වර්ගයන්ගේ 3, 4, 5 යන අකුරුද ය, ර, ල, ව, හ, ළ යන අකුරු ඇතුළත් අකුරු 21 ඝෝෂ නම් වේ. උච්චාරණයේදී උගුරේ නිනාදය මතු වන බැවින් ඝෝෂ යන නම ලබයි.

වර්ගයන්හි 1, 2 යන අකුරුද ශ, ෂ, ස යන අකුරු තුනද ඇතුළත් අකුරු 13 'අඝෝෂ' නම් වේ. උගුරේ නිනාදය ඇති නොවන සේ උච්චාරණය වන බැවින් අඝෝෂ නම් වේ.

අක්ෂර මාලාවේ දක්නට ලැබෙන 'ං' (බිංදුව) 'අනුස්වාරය' යනුවෙන් හැඳින්වේ. ස්වරයට අනුවම හෙවත් ස්වරයකට පසුවම යෙදෙන හෙයින් අනුස්වාරය යන නම යෙදී ඇත. 'ඃ' (බිංදු දෙක) විසර්ගය නම් වේ. මෙය සංස්කෘත භාෂාවෙන් අපේ අක්ෂර මාලාවට එකතු වූවකි. එහෙත් සිංහලයේදී මෙය භාවිත වනුයේ ඉතා විරලවය.

මෙහි ඏ, ඐ යන අකුරු දෙක දැන් භාවිත නොවන අතර 'ෆ' යන්න අලුතින් සිංහලයට එක්ව ඇති ඉංග්‍රීසි F ශබ්දය සහිත Fan, Fail වැනි වචන ලිවීමේ පහසුව පිණිස නිපදවා ගැනුණකි.

### අභ්‍යාස

1. මිශ්‍ර සිංහල හෝඩියෙහි අකුරු කීයක් තිබේද?
2. සිංහල අක්ෂර මාලාව ප්‍රධාන වශයෙන් දෙකකට බෙදේ. ඒ මොනවාද?
3. සිංහල හෝඩියෙහි වර්ග පහ මොනවාද?
4. එම වර්ග නම් කොට ඇති පදනම කුමක්ද?
5. සිංහලයෙහි සඤ්ඤක අකුරු පහ මොනවාද?
6. 'ං' කියන නම සහ 'ඃ' නම කුමක්ද?
7. සිංහලයට අලුතින් එකතුව ඇති 'ෆ' යන්නෙන් ඔබට ලිවීමට සිදුවන වචන පහක් ලියන්න.

# ඇසළ කෙළිය...

4 වන පිටුවෙන්

භාණ්ඩාගාරයෙන් දේවාලවලට සපයනු ලැබේ.

කලින් පැවැති පාලන ක්‍රමය අනුව රජතුමාද පෙරහැරට සහභාගි වූ අතර උත්සවය මහත් උත්කර්ෂවත් හා අත්‍යාලංකාරවත් ලෙසද පවත්වන ලදී. පෙරහැර පවත්වන ලද්දේ මෙහි දැක්වූ විස්තරයට වඩා විචිත්‍ර හා උත්කෘෂ්ඨ අන්දමින්ය. දේවාලය අසල යම් කිල්ලක් වී නම් උත්සව පැවැත්වීම තෙදිනකට අත්හිටවනු ලැබේ.

මේ මංගල්‍යය මුළුනින්මැ, කෙළවර වන්නේ 31 වැනි දින උදේ එකොළහටය. කොඩිතුවක්කු පත්තු කිරීමෙන් උස් හඬින් බෙර හා උඩරට නලා වාදනය කිරීමෙන් හා අදිකාරම්ගේ කස පිපිරවීමෙන් අවසාන පෙරහැරෙහි ආරම්භය හඟවන ලදී. එකිනෙකාට පිටුපසින් ලක්ෂණ ඇත්තු අට දෙනෙක් මුලින්මැ පැමිණෙති. අනතුරුව සර්වඥ ධාතු වැඩම කෙරේ. රන්කමින් වැඩ දමන ලද තද රතු පැහැති පලසක් හිස හා පිට දිගට අතුරා, රන් කොපු තුළ දළ බහාලීමාදියෙන් දර්ශනීය ලෙස සරසන ලද මංගල හස්තිරාජයකුගේ පිට උඩ සවි කරන ලද්දා වූද ස්වර්ණ වර්ණගත අලංකාර විතානයකින් ආවරණය කරන ලද්දා වූද රන්සිවිගෙයි සර්වඥ ධාතු කරඬුව තැන්පත් කර ඇත. හස්තිරාජයා දෙපස පිරිවර ඇත්තු දෙදෙනෙක් වෙති. පට රෙදිවලින් තැනූ විසිතුරු හස්ත්‍යාලංකාරයෙන් සරසන ලද ඇතුන් දෙදෙනාගේ ග්‍රීවයෙහි ඇතරුවන් වාඩිගෙන සිටි අතර රිදී අවන් හා ඡත්‍ර රැගත් ආවතේවකරුවෝ පිටුපස වාඩි වී සිටියහ. මැද ගමන් ගත් මංගල හස්තිරාජයාගේ පිට මත තිබුණේ සර්වඥ ධාතු තැන්පත් කරන ලද රන්සිවිගේ පමණකි. දිව නිලමේ වශයෙන් දෙවැනි අදිකාරම කරඬුව පිටුපස ගමන් ගත්තේය. ඔහු ඉදිරියෙන් කස පුපුරුවන්නන් ගමන් කළ අතර හෙළි රැගත් අයගෙන්ද සමන්විත පිරිවර ජනයා ඔහු පසුපස ගමන් ගත්තෝය. අනතුරුව ගමන් ගත්තෝ නාථ දේවාලයේ ඇත්තු පස්දෙනාය. මධ්‍යයෙහි ගමන් ගත් ඇතා දෙවියන්ගේ දුන්න හා ඊතල උසුලාගෙන ගියේය. ඉක්බිතිව, ඒ ඒ දෙවිවරුන්ගේ ලාංඡන රැගත් එකී එකී දේවාලයට අයත් ඇත්තු ගමන් ගත්හ. ආවතේවකරුවන් විශාල සංඛ්‍යාවකින් හා කුඩ කොඩි සේසත් දැරුවන්, බෙර වාදකයන්, නලාකරුවන් ආදීන් පිරිවරාගත් දිසාපතිවරු ඊළඟට ගමන් ගත්හ. පෙරහැරෙහි මේ කොටස ඉතා දික් වූ අතර එහි තැනින් තැන නැටුම් කණ්ඩායම් ද යක්ෂයන් පිළිබිඹු කෙරෙන විශාල රූපද ඇත. ඉක්බිති මහ අදිකාරම්ගේ කස පුපුරවන්නෝ පැමිණියහ. මහ අදිකාරම්ගේ වම් පසින් යටත් ප්‍රධානයන් තිදෙනකු ගමන් කළ අතර ආරක්ෂක හමුදාව සහිත විශාල පිරිවර පසුපස ගමන් ගත්හ. ඊට පසු දේවාලවලට අයත් දේවීන් වහන්සේලා වැඩම කරතැයි සලකන ලද දෝලා ගමන් ගති. මල්දම්වලින් අලංකාර ලෙස හිස සරසන ලද දර්ශනීය ඇඳුම් පැළඳුම්වලින් අලංකාරවත් ලෙස සැරසුණු ස්ත්‍රීහු දෝලා පිරිවර වශයෙන් ගමන් කළහ.

සෑම දිනකදීම පෙරහැර ආරම්භ කිරීමට පෙර කඹ උඩ ගමන් කරමින් තම දස්කම් පෙන්වූ නැටුම් කණ්ඩායම් හා නා නා මාදිලියේ නැට්ටුක්කරුවෝ පැයක් හෝ දෙකක් හෝ මුළුල්ලේ රැඟුම් දැක්වූහ. ඔවුන් රැස්වූයේ එවැනි උත්සව නැරඹීම සඳහා මහනුවර රජතුමා පැමිණීමට පුරුදුව සිටි රජ වාසල කවුළුවට පහළින් මහා විෂ්ණු දේවාලය හා නාථ දේවාලය ඉදිරිපසින් පිහිටි මළුවටය. කඹ උඩ ගමන් ගනිමින් විජ්ජා පෙන්වූවෝ ස්ත්‍රීහු දෙදෙනෙකි. සමබරතාව රැකගැනීම සඳහා රිටි භාවිත නොකළ බැවින් ඔවුන්ගේ දස්කම් හා සූර වීර භාවය සුළු කොට තැකිය නොහේ. එයින් එකියක් කඹය උඩ සිටියදීම අඩි හත අටකට නොඅඩු උසකට පිට පිටම ශීඝ්‍රයෙන් පැන්නාය. රඟන ස්ත්‍රීන්ගේ වේශයෙන් සැරසුන තරුණයන්ගෙන් හා ළමයින්ගෙන් සැදුණ කණ්ඩායමක් අත්පාවලැ ගෙජ්ජි බැඳගෙන තම සමත්කම් ප්‍රදර්ශනය කළහ. අලංකාරය පිණිස 'බාහිර ආභරණවලින් සුළු පිහිටක් ලද' වෙනත් කණ්ඩායමක් ලී කෙළි සෙල්ලමෙහි යෙදුණාහ. ලී කැබලිවල දෙකෙළවර සිහින් හණ කෙඳි මිට බැගින් එල්ලා තිබීම නිසා මේ දර්ශනයෙහි අලංකාරය තවත් වැඩි විය. මේ සියලුම නැටුම්වලට වඩා සිත් ඇදගන්නා සුලු වූයේ මොට කඩු හා මොට්ටුවක හැඩයෙන් යුත් පලිස් රැගත් ක්‍රීඩා ශූරයන් දෙදෙනකු දැක්වූ යුද නැටුමය. ඔවුන්ගේ දක්ෂතාව රඳා පැවැත්තේ පහරදීමේ හෝ පහර වැළැක්වීමේ හෝ ශාස්ත්‍රයේ නිපුණත්වය උඩ නොව අංග චලනයේ ශීඝ්‍රත්වය හා අත්, කර වේගයෙන් ඒ මේ අතට කැරකැවූ විලාසය උඩය.

සර්වඥ ධාතු හා දෙවියන්ගේ සංකේත නියමිත පූජ්‍යස්ථානයන්හි තැන්පත් කළ පසුව පෙරහැරෙහි වැඩ කටයුතුවලට සහභාගි වූ සියලුම ප්‍රධානයෝ අතිගරු ආණ්ඩුකාර උතුමාණන් බැහැදැක ගෞරව දැක්වීම පිණිස මඟුල් මඩුවට රැස්වූහ. උත්සවයේ කටයුතු සියල්ලම සාර්ථක ලෙස නිම කරන ලද බවත් මහා මංගල්‍යය අවස්ථාවේදී පහළ වූ අනාගත ශුභ නිමිති ගැනත් ඔවුහු කරුණු දක්වා සිටියහ.

---

# පෝෂණයේ නාමයෙන්...

14 වන පිටුවෙන්

සේවය බිඳ වට්ටවා එම නිලධාරීන් ග්‍රාම සේවකවරුන් ලෙස පත් කිරීමයි. දෙවැන්න දේශීය බීජ නිෂ්පාදන සහ ආදර්ශ ගොවිපල පවත්වාගෙන යාම පිළිබඳ රජයේ වගකීම පැහැර හැරීමයි. එය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කරන්නේ රජයේ හොඳම ගොවිපලවල් පෞද්ගලික අංශයට විකුණා දැමීම සහ ඉතිරිය ලාභ ලැබීමේ කොන්දේසි මත අකර්මණ්‍ය කිරීම හරහාය.

තුන්වැන්න, දේශීය ධාන්‍ය නිෂ්පාදනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා තීරණාත්මකව වැදගත් වන මහඉලුප්පල්ලම සහ බතලගොඩ ජාතික පර්යේෂණ ආයතනවල උසස් පර්යේෂණ සංස්කෘතිය බිඳවට්ටවා ඒවා ව්‍යාජ ව්‍යාප්ති උපාංග බවට පත් කිරීමයි. ඒවායේ අද පවතින වෘත්තීමය තත්ත්වය මීට අවුරුදු 30-40 කට පෙර තත්ත්වයට වඩා ඉතා පහත් මට්ටමක පවතින බව ක්ෂේත්‍රයේ විද්වතුන්ම පිළිගනිති.

හතරවැන්න, ගොවිජන බැංකුවට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා නොදී එම බැංකුව බිඳ වට්ටවා ගොවියා වාණිජ බැංකු වෙත තල්ලු කිරීම ලෙස හඳුනාගත හැක. අද රජය ගොවියාට සහන පොලියට ණය ලබා දීමේ වගකීමෙන් යම් ප්‍රමාණයක් නිදහස් වී ඇත. අප රටේ සෑම කන්නයකදීම හදිසියේ වී මිල පහත වැටීමේ ප්‍රවණතාවට හේතු වන්නේද ගොවියාගේ ණය බරයි. වී තොග එකවර විකිණීමට ගන්නා උත්සාහය නිසා කූඨ වෙළෙන්දාට වී මිල වැට්ටවීමට ඉඩ ලැබේ. ඒ බත ගැන, වී ගොවියා ගැන අපේ සැලකීමයි.

පස්වැන්න දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමට වැඩි ප්‍රමුඛතාවක් දීම වෙනුවට අපනයන කෘෂි කර්මාන්තයට ප්‍රමුඛතාව දීම ලෙස හඳුනාගත හැක. එහිම ප්‍රතිඵලයක් ලෙස කෘෂි පරිසර පද්ධති මුල් කරගත් නිෂ්පාදන ක්‍රමවේදය වෙනුවට බෝගය මුල්කරගත් ක්‍රමවේදයක් රටේ තහවුරු වෙමින් ඇත. එහි උච්ඡතම අවස්ථාව ලෙස එක් ගමකට එක් බෝගයක් නමින් අපට ගිල්ල වූ දිරච්ච ලණුව මතක් කරදිය යුතුව ඇත. විශාල භූගෝලීය ප්‍රදේශයක එක් බෝගයක් පමණක් වගා කිරීමට පෙළඹවීම ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළීම සඳහා ඉතා හොඳ ක්‍රමවේදයකි. ග්‍රාමීය ජනතාව අතර පැතිරෙමින් පවතින බඩගින්න ඉතා දැඩි ලෙස බැඳී පවතින්නේ පරිසර පද්ධතිය නොසලකා කෙරෙන කෘෂි කර්මාන්තය සමගය. විශේෂයෙන් සඳහන් කරන්නේ නම් පසට හානි සිදුවීම හෙවත් පස නිසරුවීම සහ බඩගින්න ඉතා දැඩි ලෙස එකට බැඳී පවතී. මේ තත්ත්වය වියළි කලාපයේ කෘෂි ගම්මානවල ඉතා පැහැදිලිව දක්නට ලැබේ. මීට වසර 50 කට පෙර එම ගෙවතුවල තිබූ ආහාරයට ගත හැකි බහු වාර්ෂික ශාකවලින් 50% ක් වත් අද දක්නට නැත. අද එම පවුල්වලින් අති බහුතරයකට වෙළෙඳපොළට නොයා එක් වේලක් හෝ සපයා ගැනීමට නොහැකි කණගාටුදායක තත්ත්වයක් උදා වී ඇත.

මීට අමතරව ඇමරිකානු පරිභෝජනවාදය විසින් ලෝකය පුරා ව්‍යාප්ත කරන ආහාර හිඟය, ආහාර මිල උද්ධමනය සහ බඩගින්න පිළිබඳවද සඳහන් කළ යුතුය. ඔවුන්ගේ අධිපරිභෝජනවාදය හුදු සංස්කෘතියක් පමණක් නොවේ. එය එම රටේ ආර්ථික ප්‍රතිපත්තිමය රාමුව තුළම සිදුවන්නකි. ඔවුන් ජෛව ඉන්ධන නිපදවීම සඳහා මිනිසාට ආහාරයට ගත හැකි ධාන්‍ය භාවිත කරති. එම ප්‍රමාණය අනාගතයේදී ලෝක ආහාර නිෂ්පාදනයෙන් 20% ක් තරම් ඉහළ අගයක් ගැනීමේ අනතුර ඇත. ඔවුන්ගේ මස් කෑමේ ගිජුකම නිසා එක් මස් කිලෝවක් නිපදවීම සඳහා ධාන්‍ය කිලෝ 4-8 අතර ප්‍රමාණයක් වැය වේ. ඔවුන්ගේ පෙරේත මස් කෑම 10% අඩුකළ හොත් ලෝක ආහාර සංචිතයට විශාල ධනාත්මක බලපෑමක් සිදුවේ.

## අප කා දමන්නේ ආහාරද?

ඉහත සඳහන් කළ ආකාරයට අපේ ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළීම සඳහා ආනයනික ආහාරවල වෙළඳපොළ මිල විකෘතිය සහ කෘෂි නිෂ්පාදන පද්ධතිය බිඳ වැට්ටවීම ප්‍රධාන වශයෙන් උපයෝගි කරගන්නා බව පැහැදිලිය. නමුත් අප රටේ ආහාර පරිභෝජන සංස්කෘතිය අද පවතින ලෙස ආහාර සුරක්ෂිතතාවට හතුරු දිශාවකට වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක කිහිපයක් ඇත. බොහෝවිට ඒ කාරණාවලට අදාළ වග උත්තරකරුවන් ලෙස හඳුනාගැනෙන්නේ සමහර 'පෝෂණවේදීන්' සහ වාණිජ අරමුණු මුල් කරගත් ජනමාධ්‍යයයි. අද දියුණු ආහාර සංස්කෘතියක් ගොඩනැඟීමට ඇති ප්‍රධාන බාධකය බටහිර සමාගම්වලට කුලීකාරකම් කරන ජාතික ජනමාධ්‍ය ආයතන බව ඉතා කනගාටුවෙන් පැවසිය යුතුව ඇත.

මේ සියලු පටලැවීම් ලිහනවා වෙනුවට අපේ සමහර පෝෂණවේදීන් කරන්නේ ඒවා තව තවත් පැටලවීමයි. ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් නිර්මාණය කරන්නේ බටහිර ආහාර සමාගම්වල අරමුණු ඉටුවන ආකාරයටය. ඔවුන් අපට කියන්නේ ආහාර වෙනුවට පෝෂණය පරිභෝජනය කරන ලෙසය. ඔවුන්ගේ ජෛව රසායන විද්‍යාවට අනුව අප පරිභෝජනය කළයුත්තේ ආහාර නොව කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේද, විටමින් හෝ විවිධ මූලද්‍රව්‍යයයි. ඒ රසායනික අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට ආහාර වර්ග දෙක තුනක් සෑහේ. (එහිදී ඒවා දේශීයව නිපදවනවාද ආනයනය කරනවාද යන්න ඔවුන්ට අදාළ නොවේ). එසේ සෑහෙන්නේ නැතිනම් මදිපාඩු ද්වෙල් පිටිකිරිවලට හෝ වෙනත් ආහාරවලට මිශ්‍ර කොට බෝතල්වල දමා විකිණීමට ඇත. ඒවා ආහාර පනතට පටහැනිව ප්‍රචාරණය කිරීමටද අප රටේ රූප මාධ්‍ය ආයතන ඉඩ ලබා දෙයි. පෝෂණවේදීන් කෙසේ වෙතත් පොදු මහජනතාව ඉතා ගැඹුරින් තේරුම්ගත යුත්තේ මේ ඊනියා රසායන විද්‍යා පෝෂණ මතවාදවලින් ආහාරයේ විවිධත්වය දිරිගැන්වෙන්නේ නැති බවයි. එපමණක් නොව, ඒ රසායන විද්‍යා ප්‍රවේශය තුළ ආනයනික ආහාර සහ දේශීයව නිපදවන ආහාර පරිභෝජනයේ වෙනස අවධාරණය වන්නේද නැත. බටහිර ආහාර සමාගම් ඒ වාසිය උපරිමයෙන් ප්‍රයෝජනයට ගනී.

අපේ රටේ මෑත ඉතිහාසය ගත්තද අප ප්‍රධාන වශයෙන් ශාක වර්ග 150 ක් පමණ බහුලව ආහාරයට ගැනීමට හුරු වී සිටි ජාතියකි. නමුත් අද වන විට යම් පමණකට හෝ ප්‍රධාන ආහාර ලෙස ගන්නා ශාක ලැයිස්තුව 30 දක්වා අඩු වී ඇත. විවිධත්වය දිරිගැන්විය යුත්තේ රසායන විද්‍යාවට අනුව නොවේ. එය සැබෑ ලෙසම ඉදිරි ගැන්විය හැක්කේ ආහාර සුරක්ෂිතතාව රැකීමේ අවශ්‍යතාවක් ලෙසය. ආහාර සුරක්ෂිතතාව රැකෙන්නේ නැති තැනක රසායන විද්‍යා දැනුම කොතෙක් ලබා දුන්නත් පෝෂණ අවශ්‍යතා ඉටුවන්නේද නැත. එනිසා පෝෂණය මුල් කරගත් කෘත්‍රිම ආහාර සංස්කෘතියක් වෙනුවට ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය එකවිට සුරැකෙන ආහාර සංස්කෘතියක් දිරිමත් කළ යුතුව ඇත.

ලංකාවේ ප්‍රධාන පෙළේ නිර්නාල ග්‍රන්ථි පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු වන සිසිර සිරිබද්ධන මහතාට අනුව අප රටේ දියවැඩියාව සහ ගැස්ට්‍රයිටිස් වැනි රෝග බහුලව පැතිරී යෑමට ප්‍රධාන හේතුව අපේ ශරීරවලට 'පත්තියං' නොවන තිරිඟු පිටි දීර්ඝ කාලයක් තිස්සේ ආහාරයට ගැනීමයි. දිවයිනේ කිසිදු රෝහල් ආහාර සැපයුම් සේවාවක හෝ රෝහල් ආපනශාලාවක තිරිඟු පිටි භාවිතය අවම කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන නැත. එම ආපනශාලා ටෙන්ඩර් දමන්නේ සෞඛ්‍යයට හිතකර ආහාර විකිණීමේ කොන්දේසිය යටතේ නොව සුඛසාධන සංගමයට වැඩිම මිල ලැබෙන ආකාරයටය.

කිරි වලට විශේෂ තැනක් ලබා දීමේදී එම කිරි ආනයනය කරනවාද දේශීයව නිපදවනවාද යන කාරණය සැලකිල්ලට ගත යුතුය. නමුත් පෝෂණයට පමණක් මුල් තැන දී කටයුතු කරන විට ආහාර සුරක්ෂිතතාවට අදාළ එම කාරණා සැලකිල්ලට ගැනෙන්නේ නැත. එහිදී දේශීයව නිපදවන ආහාර සහ ආනයනික ආහාර පරිභෝජනය පිළිබඳ වෙනස වගකිවයුත්තන් කිසිවෙකුත් මතු කරන්නේ නැත. එමෙන්ම ආනයනික ආහාර අධෛර්යය කිරීමක් හෝ දේශීයව නිපදවන ආහාර විශේෂයෙන් දිරිමත් කිරීමක් කෙරෙන්නේද නැත. එවැනි තත්ත්වයක් තුළ අවසානයේදී ආහාර සුරක්ෂිතතාව අනතුරේ වැටී පෝෂණයද අනතුරේ වැටෙන බව ඔවුන් කල්පනා කරන්නේ නැත.

කෙසේ වෙතත් අවසාන වශයෙන් ආහාර සුරක්ෂිතතාවය නමැති කාරණය හුදු බඩගින්න හෝ පෝෂණය සමග පමණක් බැඳී ඇති කාරණයක් නොවන බව අප තේරුම් ගත යුතුව ඇත. ඒ අවබෝධය සඳහා ඉතා සුළු දත්ත ප්‍රමාණයක් පිරික්සීම වුවත් සෑහේ. අප රටේ සුළු අපනයන බෝග ලෙස හඳුන්වන සියලු කෘෂි අපනයනවලින් උපයන විදේශ විනිමය ප්‍රමාණය අප රටට ගෙන්වන තිරිඟු පිටි තොගය මිල දී ගැනීම සඳහාවත් සෑහෙන්නේ නැත. ඒ අඩුව පුරවන්නේ මැදපෙරදිග දහදිය, කඳුළු සහ ලේ හෙළන අපේ නංගිලා, අක්කලා සහ අම්මලා විසිනි. එහෙත් ඒ ගැන ජාතියක් ලෙස අපට ලැජ්ජාවක් ඇතිවෙන්නේ නැත. එම සඳහන් කිරීමෙන් අදහස් කරන්නේ සුළු අපනයන වගාව අත්හළ යුතු බව නොවේ. නමුත් රටේ ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමට ප්‍රමුඛතාව ලබා දීම ආර්ථික වශයෙන්ද ඵලදායී වන බවයි.

ශ්‍රී ලංකාව ශුද්ධ ආහාර ආනයනය කරන රටකි. ඒ සඳහා අප වසරකට දළ වශයෙන් ඩොලර් බිලියන 1.5 කට අධික විදේශ මුදල් ප්‍රමාණයක් වැය කරයි. ඒ මුදල අප රටේ පාලකයන් පිටරැටියන්ට දස අතේ වැඳ නමස්කාර කර ඉල්ලා ගන්නා ණය මුදලට වඩා වැඩිය. අප නවසීලන්තයට පමණක් නවසීලන්ත ඩොලර් 600 ක් යවා කිරිපිටි ගෙන්වා ගනියි. ඒ මුදල අපේ ගොවියා අතට ලැබෙන්නේ නම් අප රට ආසියාවේ හොඳම රටක් බවට පත් කිරීමට ගතවන්නේ කන්න දෙකක කාලයක් පමණි.

ඒ අනුව අප ජාතියක් ලෙස දිනෙන් දිනම පෝෂණයේ නාමයෙන්, පෝෂණයද අනතුරේ හෙළමින් කා දමන්නේ ආහාරද, එසේ නැතහොත් ආහාර සුරක්ෂිතතාවද, එසේත් නොවේ නම් සමස්ත ජාතික ආර්ථිකයමද යන ප්‍රශ්නය ඉතා ප්‍රබල ලෙස අප ජාතියෙන් ඇසිය යුතුව ඇත.

LESSON 29

Dear Dasatha French lesson followers! First, we would like to apologize for not being able to provide you with the French lesson for the past issue of Dasatha. Hope you revised what we learnt previously in our lessons. In addition, it is sad that the summer is almost coming to an end but hope all of you are spending a wonderful time with your families! Hope you had fun learning all the terms provided in our last lesson. If you have any problems regarding the lessons and if something is not clear, you can always drop an email to kumudu4444@gmail.com. We will try our level best to answer your questions about the problematic areas in a more helpful way. Hope the vocabulary list provided in the last issue was helpful in getting to know the gardening tools and activities. As practice makes you perfect, you are expected to keep on studying and revising. If you are as dedicated and enthusiastic as we are, learning French will not be hard anymore.




This month's Dasatha issue presents you again with a very relevant vocabulary list that will help you enrich your French vocabulary and improve your French reading and pronunciation apart from improving your conversing skills. Moreover, it will help you get an idea about sentence structures and how the words are used in sentences. As usual, the grammar lesson aims to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!



## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The words presented in the last issue were related to nationalities. Knowing these terms in French would be very useful as we all are living in a bilingual country. Hope you have memorized these terms. It is very important to learn and review all the words in the vocabulary lists regularly. It will help you in enriching your vocabulary and remembering all the words without any difficulty. It is also very important to learn all the words in each lesson before the issue of the next. In order to converse well in a foreign language, it is necessary to have a rich vocabulary. This month's Dasatha issue will present you with a vocabulary that deals with desserts in French.

| Desserts in French | Meaning |
|---|---|
| La tarte | Pie |
| La tarte au sucre | Sugar pie |
| Le gâteau aux carottes | Carrot cake |
| Le gâteau au fromage | Cheesecake |
| La bûche de Noël | Christmas cake |
| Les bonbons | Candy |
| Les biscuits | Cookies |
| La crème anglaise | Custard |
| La crème glacée | Ice cream |

| | |
|---|---|
| Le flan | Flan |
| La madeleine | Small cake shaped cookie |
| Les croissants au beurre | Butter croissants |
| Les gaufres | Waffles |
| La tarte aux pommes | Apple pie |
| Le gâteau | Cake |
| Le gâteau aux pommes | Apple cake |
| Le gâteau au citron | Lemon cake |

| | |
|---|---|
| Le gâteau au chocolat | Chocolate cake |
| La mousse au chocolat | Chocolate mousse |
| Les crêpes | Crepes |
| La salade aux fruits | Fruit salad |
| La gélatine | Jello |
| Les choux à la crème | Cream puffs |
| La brioche | Sweet bun |
| Les muffins | Muffins |
| Les pâtisseries | Various pastries |
| Les fraises au chocolat | Chocolate strawberries |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



In the last issue, we learnt the verbs in French that come with the prepositions à and de. When well mastered, these verbs and prepositions can help you in constructing sentences that are grammatically well written. In this month's issue, we are going to learn the prepositions that are used with certain locations. In French language, depending on the gender of a location, they use certain prepositions.

**Prepositions with locations**

Prepositions are used in expressions express where you are, where you are going and where you are coming from. The preposition used in such expressions depends on the geographic location discussed.

| **Geographic Location** | **to/in - à** | **From - de** |
|---|---|---|
| | | |
| Cites (Paris, Londres, Colombo) | à Paris | de Colombo |
| Islands (Cuba, Sri Lanka) | à Cuba | de Sri Lanka |
| | | |
| **Feminine (nouns usually ending in -e)** | en | de (d') |
| Countries | en France | de France |
| States | en Californie | de Californie |
| Provinces | en Bourgogne | de Bourgogne |

| | | |
|---|---|---|
| Continents | en Europe | d'Europe |
| | | |
| **Masculine** | **au** | **Du** |
| Countries Provinces, States | au Canada<br>au Québec | du Texas<br>du Québec |
| | | |
| **Masculine (beginning with a vowel)** | **en** | **de (d')** |
| Countries Provinces/states | en Iran | d'Iran |
| | en Ontario | d'Ontario |
| | | |
| **Plurality of countries and regions** | **aux** | **Des** |
| | aux États-Unis | des États-Unis |

Ex :
a) Ils vont passer les vacances en Espagne.
b) Ces filles étudient à Austin.
c) Mon père veut aller au Japon
d) Mon amie est allée en France l'année dernière.
e) J'habite à Toronto.

## Exercices (එක්සැර්සිස්) – Exercises

Translation exercises are the best to test yourself on all the learnt grammar forms. Therefore, some sentences are provided here for you to translate. You will come across new French words in these exercises. You can simply refer to a dictionary for all the words that you do not know the meaning. This is also a good way to enrich your vocabulary. Note down the new words you come across along with their genders and the meanings in a separate book and study them. There is another exercise provided in order for you to practice the grammar lesson learnt in this issue. If you have any questions please direct them to the above mentioned email address.

1) Translate into French

a. Let us play a game now
b. These elephants are bigger than ants.
c. Our houses are new.
d. His wife is a very courageous woman.
e. I am thirsty and sleepy.
f. They are 72 years old.
g. She has a headache.
h. Do your homework.
i. When is your birthday?
j. Where are you living?
k. Who is your mother?
l. I have two dogs.
m. I am going to the beach. Let's play together.
n. They play with the flowers.
o. The cat is under the table.
p. Sing a song in loud voice.
q. The house you want to go is around the corner.
r. Next day I am going to visit my aunt.
s. Who is your best friend?
t. Listen to music. It helps you calm down.

**Kumudu Abeywardena**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com



# සන්දේශ සාහිත්‍යය

- 3 කොටස

# සැළලිහිණි සන්දේශය

■ සිරිසේන විතානගේ

## ව්‍යංගාර්ථ

'කැලණි පුර වැනුම' පිළිබඳව පාඨක මනසෙහි සදා රැඳෙන චිත්‍රයක් ජනිත කරන්නට රාහුල මාහිමියෝ සමත්ව සිටිති. කැලණි පුර වැනුම ඇරඹෙන්නේ මෙම පද්‍යයෙනි.

පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුරව රට

මෙහි අගය වනන මහාචාර්ය සරච්චන්ද්‍රයෝ මෙසේ සඳහන් කරති.

'පද්‍යයක' ඇතුළත් වචනවල ව්‍යංගාර්ථ කෙමෙන් එකට එක ගෙතී කෙළවරදී අපූරු රටාවක් මතු වූ කලක මෙන් අමුතුම ධ්වනියක් පැන නැගීම වූකලි නියම ධ්වනි කාව්‍යයක ලක්ෂණයයි. යට සඳහන් පද්‍යයෙහි එවැනි රටාවක් ඇත. එහි බාහිර ආකෘතිය ශ්‍රැති ගෝචර වූවකි. පැහැසරණිය, මිණි පැමිණිය, බඳ කිකිණිය, දද ගිගිණිය, නොව පැරණිය, වන රමණිය යන එළිසම පද හිනි මගක පෙති සේ අඩියෙන් අඩියට නැග ගොස් 'වදු කැලණිය' යන්නෙන් උච්චස්ථානයට පැමිණ කෙළවර වන අයුරේ හැඟීමක් රසිකයා තුළ ජනිත වේ. 'කැලණිය පුරවර' යි කියූ තන්හි හිනි මුදුනට පැමිණියා වූ ඔහුගේ ඇස් හමුවෙහි චමත්කාර දර්ශනයක් අනාවරණය වූ කලක් මෙන් ඔහුගේ සිත අපූර්ව ආස්වාදයකින් කුල්මත් වේ. මෙය සිදුවන්නේ කෙසේද? විවිධ මාර්ග ඔස්සේ ගොස් නොයෙක් අයුරේ අත්දැකීම් අනුභව කොට නොයෙක් ගම්මාන පසුකර කෙළවරදී තමාගේ ගමනේ අවසාන ස්ථානය වන කැලණි පුරයට පැමිණීම වූ කලී සැළලිහිණියාගේ ඉෂ්ටාර්ථය මුදුන් පැමිණීම වේ. ඔහුගේ මනදොළ පිරීම වේ. ඔහු පුල පුලා සිටියේ කැලණි පුරය බැලීමටය. දැන් ඔහුට එහි ගොස් සිය දූත මෙහෙය ඉටු කළ හැකිය. එබැවින් ඔහුගේ සිත පස්වණක් ප්‍රීතියෙන් පිනා යයි. අහසේ පියාසර කරමින් එන්නා වූ ඔහුට සර්වාලංකාරයෙන් හෙබියා වූ කැලණි පුරයේ ශ්‍රී විභූතිය දෑසට ගොදුරු වන්නේ ක්‍රම ක්‍රමයෙනි. එකින් එකටය. ඔහුට පළමුවෙන් පෙනෙන්නේ ප්‍රාසාදයන්ගේ මණි ශෘංගය. මේ වූ කලී එක පැහැර කැලණි පුරයේ ශ්‍රී සෞභාග්‍යය කියාපාන සලකුණකි. 'මිණි පැමිණිය කොත් අගට' යන යෙදුමේ ව්‍යංග්‍යාර්ථය සලකා බලන්න. ඒ නගරයේ හැම තැනම මුතු මැණික් අප්‍රමාණව ප්‍රාදුර්භූත වූ බැවින් පිරී ඉතිරී ගොස් කොත් අගට පැමිණියා සේය. ඉක්බිතිව පක්ෂියාට පෙනෙන්නේ නිරන්තර උත්සව විලාසයෙන් වැජඹෙන එම නගරයේ පියස් මුදුන්හි ඔසවා ඇති ධජ පතාක ආදියයි. මෙය දැක ඔද වැඩි සිතින් යුත් සැළලිහිණියාගේම මුවින් පිටවන උදාන වාක්‍යයකට බඳුය 'නොව පැරණිය වන රමණිය විටින් විට' යන පාදය. කැලණි පුර වැනුමෙහි මෙතැනින් ඉදිරියට එන පද්‍ය පහ ගතානුගතික අදහස්වලින් බර වුවද පිරිපුන් පුර වැනුමක ලකුණු පළ කරයි. දේව කතාවක් පාදක කොට ගත්තද කවියේ මූලික ගුණයක් වන ඖචිත්‍යය හෙවත් උචිත බව සනිටුහන් කළ පද්‍යයක් ලෙස කැලණිපුර වැනුමෙහි එන මේ පද්‍යය සැලකිය හැකිය.

දිය කඳ ගැඹර පිරී පුවතර මහ සයුර
මුව රඳ ලෙසින් වන් අගතිසි කර තඹර
මන නඳ කරන මිණිගන මෙන් දිසි එවර
පැහැනද පහන් එහි මහවෙය බල මිතුර

කැලණි පුරවරයේ වීථිවල දැල්වෙන පහන් අහසින් එන සැලළිහිණියාට පෙනෙන අයුරු දැක්වීම මෙහි ලා කවියාගේ අභිප්‍රාය වේ. 'අගස්ති ඍෂිවරයා එක් අවස්ථාවකදී මුහුදු දිය තම අත්ලට ගත්තේය' යි දේව කථාවක කියැවෙයි. එවිට මුහුදු පත්ලේ තිබුණු මැණික් සමූහය කාන්තිමත්ව බැබළුණි. සැළලිහිණියා කැලණිපුරයට එන විට රෑ බෝ වී තිබුණේය. කළුවරේ කැලණි පුර වීථිවල දල්වා තිබුණු පහන් අහසට පෙනුණේ මූදු පත්ලේ වූ බැබළුණු මැණික් මෙනැයි කවියා කියයි. කඳු මුදුනක සිටින්නකුට කළුවර රැයක කඳු පාමුල එළි පෙනෙන සැටි සිහියට නගා ගත හොත් මෙය කොතරම් උචිත සංසන්දනයක්දැයි සලකා ගත හැකිය.

කැලණිපුර වැනුමෙහි තවදුරටත් දැකිය හැකි විශේෂත්වයක් නම් පති-පත්ති සම්බන්ධය දක්වන පද්‍යයක් එයට ඇතුළත්ව තිබීමයි. බොහෝ විට සන්දේශයන්හි වර්ණනයට ලක්ව ඇත්තේ සළෙල ස්ත්‍රී පුරුෂයෝය. හංස සන්දේශය ජයවර්ධන පුරයෙහි රැයෙහි සැරිසරමින් සිටි අබිසරු ලියන් ගැන පවසන්නේ මෙසේය.

බිඳ ගනඳුරු එළි කරතත් රන් තොරණ
ළඳ බිසරුව බිය දුරලයි මිණි තොරණ
- හංස සන්දේශය

ගිරා සන්දේශයෙහි සලෙළුන් ගැන සඳහන් වන්නේ මෙසේය.

කොළ සන්තොසින් රැඳි සලෙළුන් හට නිතොර
සැඬ කර රසින් සැඬ ගිමනින් දුක් කවර
- ගිරා සන්දේශය

රහල් හිමියෝම පූර්වයෙහි කළ පරෙවියෙහිදී අබිසරුලියන්, සලෙළුන් ගැන පද්‍ය කිහිපයක් පුන පුනා සඳහන් කළහ.

■ පුරතුර සරන සලෙළුන් බල සකි නොයෙක
■ සලෙළ සළෙළු යදි දන මන නඳන කර
■ වෙති අබිසරු දිගැසියො සහතුටු උරණ
- පරෙවි සන්දේශය

මෙසේ වතුදු සැළලිහිණියෙහි සලෙළ සලෙළුන් ගැන කිසිවක් සඳහන් නොකරන අතර සතුටින් එක්ව හිඳින පති පත්තීන් ගැන මෙසේ සඳහන් කරති.

තවර කර කොකුම් සඳුනෙන් තුනු සියල
පවර සුවඳ මල්දම් පැළඳ මන කල
බැහැර සිතු නොලූ හිමිනඹුවො කෙළි ලොල
එපුර ඉඳිති සඳ පානේ සඳලු වල

කැලණිය බැහැර සිත නොලු හිමිනඹුවන්ගෙන් පිරිතැනක් කරන්නට කවියාට අවශ්‍ය වූ සේය.

'කැලණි වෙහෙර වැනුම' භක්ති රසය පෙරදැරි කරගත් වැනුමකි. එහි එන මේ පද්‍යය බලන්න.

දියතෙක් පැතිර සිටි බුදුගුණ කියා හැම
සගමොක් ලබනු වස් පිය යුග ඔබා බිම
සියසක් පුරා දුටු මෙන් තුටුව මුනි තුම
වඳුලක් තිලක ගෙහි වැඩ උන් මහ පිළිම

'හැම බුදුගුණ කියා, පියයුග බිම ඔබා, බුදු රජුන් ඇස් පුරා දැක මහ පිළිම වඳින්නැ' යි කියත්ම සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ අප දැක පුරුදු බුදුන් හමුවූ සැදැහැති උවසුවකුගේ ස්වරූපය අප හමුවෙහි මැවී නොපෙනේද? මෙම වර්ණනය පුරා ඇති පද්‍ය සියල්ල කැලණි විහාරයෙහි විහාරාංග විස්තර කිරීම සඳහා රචනා වූ ඒවාය.

සමාධි බුදු පිළිමය පිළිබඳව කියවෙන පද්‍යය කාව්‍යමය ගුණයෙන් හෙබි රසවත් එකකි.

සසරින් මුදා ලෙව් සදහම් අමාදී
එකගින් මුනිඳු හුන් වැනි නිපරමාදී
ලකුණෙන් සපිරි පිළිමය දැක සමාදී
වැඳගන් මිතුර තුන් සිත කර සමාදී
- සැළලිහිණි සන්දේශය

සමාධි බුදු පිළිමය ගැන පැවසෙන මෙම වැනුම උසස් කාව්‍ය නිර්මාණයෙකි. සමාධියට සම වැදී සිටින බුදුරජාණන් වහන්සේගේ ශාරීරික, මානසික, ශාන්ත ස්වභාවය හා පාරිශුද්ධත්වය එම ප්‍රතිමා ශිල්පියාගේ කලා කුසලතාව හේතු කොට ගෙන ඔප් නැංවී ඇති අයුරු මෙම කාව්‍යොක්තියෙන් සාර්ථක අන්දමින් දැක්වීමට කවියා සමත් වී ඇත. සාම්ප්‍රදායික ගතානුගතික උපමාවන්ගෙන් ඉවත්ව ස්වකීය ස්වාධීන නිර්මාණ ශක්තිය පිළිබිඹු වන පරිදි කොට ඇති මේ රචනයෙන් ශ්‍රේෂ්ඨ කවිත්වයෙක ලක්ෂණ ප්‍රකට වේ. මෙම පද්‍යය ශාන්ත රසය උතුරා යන්නක් බව කිව යුතුය.

කෝට්ටේ යුගයේ සෑම සන්දේශ කාව්‍යයකම වර්ණනයට පාත්‍ර වූ පැරකුම්බා රජු සැළලිහිණියෙහිද පද්‍ය දෙකකින් වර්ණිතය. සැළලිහිණි, පරෙවි පැරකුම් රජ වැණුම්හි ආරම්භක පද්‍යය බොහෝ දුරට සමානත්වයක් උසුලයි.

රිවි බිම්බා යුරු රිවිකුල කමල කර
පියුමම්බා නිතොරව රැඳි උර මැදුර
මෙනරම්බා හිමි රූ සිරිනි පැහැ සර
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර
- සැළලිහිණි සන්දේශය

සතකුම්බා ගිරියුරු ගුණැති තිරසර
මෙනකුම්බා යොන් පා කළ රුපු සයුර
බදකුම්බා සරි යැදි දන නඳන කර
පැරකුම්බා නරනිඳු දෙන මෙපුර වර
- පරෙවි සන්දේශය

සැළලිහිණි පැරකුම්බා රජ වැණුමෙහි එන පද්‍ය දෙකෙහි කාව්‍යමය විශේෂත්වයක් දක්නට නොලැබේ. එය හුදෙක් රජු ගැන සඳහන් කිරීමෙහි අවශ්‍යතාව නිසා පමණක් කළ පද්‍ය දෙකක් සේ පෙනේ.

පැරකුම්බා රජු දිගින් දිගට වර්ණනා කිරීම පුත් තනතුරේ වැඩුණු තමන් විසින් නොකළමනා යයිද එය ආත්ම වර්ණනයක් වනු ඇතැයිද වියපත් රහල් හිමියන් සිතුවා විය හැකිය.

'විබිසන සුරිඳු වැනුම' රහල් හිමියන්ගේ දෙවි බැතිය මතු කොට දක්වන වැනුමකි. මෙහි සෑම පද්‍යයකම ඇත්තේ විබිසන දෙවිඳුන් පිළිබඳ භක්ති පූර්වක විශේෂණයෝය. මෙය දේවකථා සහ දේව පුරාණයන්ගෙන් පිරී ගත්තකි.

තුන් ලෝ තමා නතු කළ රවුළු සොහොවුරු
තුන් කල් බලා රම්ඳුට වූ ඉටු මිතුරු
තුන් වේ ඇදුරු පුලතිසි කුල මිණි මිතුරු
තුන් විටෙකම වඳු එසුරිඳු පා තඹුරු

මේ කවියෙන් විබිසන දෙවිඳුන්ගේ විශේෂතා විවරණය වන අතර එක් වරක් නොව තුන් වරක්ම ඒ දෙවිඳුන්ගේ පා නමදින්නැ'යි සැළලිහිණියාට කියයි.

මේ දේව වර්ණනය මයුර, තිසර, පරෙවි හා කෝකිල දෙවි වැනුම් අනුව යමින් කෙරුණක් බව පෙනේ. දෙවියන්ගේ හිසෙහි සිට දෙපතුළ දක්වා සකල ශරීරාංග යන්ම වාගේ කවියාගේ වර්ණනයට හසු වෙයි. එහෙත් පෙර කී දේම මිස නව අරුතක් මතු කරන්නට, අපූර්ව වස්තු නිර්මාණයක් කරන්නට කවියා සමත්ව නැත. වර්ණනය අවසන් කරන්නේද පෙර කවීන් ගිය මගම යමිනි.

■ වත දහසක් තව ලදුවත් වනනු බැරි (මයුර)
■ කුලුණු වනනු කිම අමුතුව මිතුර නදුන් (තිසර)
■ මෙවැනි සුරිඳු කො සමවත වනන මෙදියත (පරෙවි)
■ මෙමා වනනු කිම මොහු තෙදබල අමුතු (කෝකිල)
■ මුවෙකින් කියා නිමවිය හැකිද රූ සිරි (සැළලිහිණි)

**ලබන කලාපයෙන් 'සැළලිහිණි සන්දේශ' කාව්‍යය පිළිබඳ තවදුරටත් විමසා බලමු.**



FLY HIGH WITH LOW PRICE
ශ්‍රී ලංකාව සඳහා විශේෂ මිල ගණන්
Simply Search your convenience flight option in
WWW.CANADIANFARES.COM
1-844-366-3273 - Toll Free
Our Services
International and Domestic Air tickets,
Vacation Packages, Hotel booking, Cruises,
Travel insurance, Group booking, Limo,
Airport parking pass,
Airport pick up and drop in Srilanka
අමතන්න
කිංස්ලි
Travel Expert
416 857 5747
Jamaica
Cuba
Mexico
Colombia
Bahamas
Dominican Republic
Costa - Rica
AIR CANADA
SriLankan
Emirates
ETIHAD
DELTA
KLM
United Airlines
sunwing.ca
transat
TURKISH AIRLINES
QATAR
WESTJET
JET AIRWAYS
CANADIAN FARES
fly high with low price
CanadianFares, Inc.
1085 Bellamy Road North, Suite 206
Scarborough, ON M1H 3C7
WWW.CANADIANFARES.COM
tico.ca
TICO approved travel agent
Toll Free - 1-844-366-3273
Tel - 416-438-3273 Fax - 416-438-3290
dixon@canadianfares.com, fares@canadianfares.com
vacation@canadianfares.com




JAY PLUMBING
WHY SPEND TWICE
WHEN YOU CAN DO IT RIGHT....
AT FIRST TIME !
YOU DESERVED TO GET YOUR WORK DONE BY
✱ LICENSED PLUMBER
✱ LICENSED GAS TECHNICIAN
✱ LICENSED ELECTRICIAN
PROBLEM IN YOUR
★ WATER TANK ★ FIRE PLACE
★ BBQ, DISH WASHER ★ FURNACE
★ WASH ROOMS
PLEASE CALL
JAYANTHA @ 905 450 9005
416 882 8591
Web : www.jayplumbing.ca
Electrical Contractor Registration Agency
of the Electrical Safety Authority
Licence No 7011266
WWW.esaecra.info
T S S A # 000261790



# ඔන්ටේරියෝවේ කෙසෙල් කොටුව

■ චමරි අබේසිංහ

අවුරුද්දෙ වැඩිම කාලයක් ශීත දේශගුණයක් පවතින කැනඩාවට මේ ඇවිත් තියෙන්නෙ ගිම්හාන කාලයයි. මේ දවස්වල තියෙන තද හිරු රශ්මියත් උණුසුමත් නිසා මේ ඉන්නෙ කැනඩාවෙමද කියලත් ඇතැම් වෙලාවට හිතෙනවා. හැමදාමත් අව්වෙන් නැහැවුණු නිල්ලෙන් පිරුණු නිවර්තන කලාපීය රටකින් ඇවිත් කැනඩාවේ පදිංචි වුණු අපි හැමෝම දැන් මේ ශීත-උණුසුම් දේශගුණ විපර්යාසයට හුරු වෙලා. ඊට අනුගතව ජීවත් වෙන්න හැඩ ගැසිලා. කොහොමත් ඉතිං දේශේ හැටියට බාසේ නොතිබුණොත් පැවැත්මක් නෑ කියනවනෙ.

ඒත් මේ කියන්න යන්නෙ ඒ වගේ දේශේ හැටියට බාසේ හැඩගසා ගත් කෙනෙක් ගැන නෙවෙයි. උඩුගම් බලා පීනමින් තමන්ට රිසි සේ දේශය, වටපිටාව හැඩගසා ගත්ත ඒ කාර්ය සාර්ථක කරගත්ත පුද්ගලයකු ගැනයි.

නමින් Terry Brake වන ඔහු කෙසෙල් කොටුවක හිමිකරුවෙක්. ඔහුගේ කෙසෙල් කොටුව තියෙන්නෙ ඔන්ටේරියෝවේම කිව්වොත් සමහර විට ඔබට පුදුමත් හිතේවි. නමුත් එය සැබෑවක්.

ලංකාවෙ සිට ආ අපට කෙසෙල් ගොවිපොළවල් අරුමයක් නොවුවත් කැනඩාවේ ඔන්ටේරියෝවෙ කෙසෙල් ගොවිපොළක් තියෙනව කියන එක නම් මහ ලොකු අරුම පුදුම ආරංචියක්. ඒ මෙහෙ තියෙන දේශගුණික තත්ත්වය නිසයි. විශේෂයෙන්ම උෂ්ණ දේශගුණ කලාපයට ඔරොත්තු දෙන කෙසෙල් වැනි භෝගයක් කැනඩාව තුළ වගා කිරීමත් එක්තරා විදියක අභියෝගයක්. ගිම්හාන කාලයේදී මේ පළාතෙ ඇතැම් මල් පැළ වෙළඳසල්වල කෙසෙල් පැළ විකිණීමට තිබුණත් ඒවා පෝච්චිවල වගා කොට වෙනත් විසිතුරු පැළ වගේ ගෙවල් ඇතුළෙ තබා ගැනීම පමණයි කරන්නෙ. කවදාවත් එවැනි පැළයක කෙසෙල් කැනක් හටගෙන තිබෙනවා මා දැක නෑ.

ඒත් Terry Brake ගොවි මහතා ඔන්ටේරියෝවේ කෙසෙල් වගා කරල කෙසෙල් එලදාව ලබා ගෙන ඒවා වෙළඳ පොළටත් එක් කිරීමට සමත් වෙලා තියෙනවා. ඔහු මේ අභියෝගය ජයගත් අන්දම ගැන පසුගිය දිනවල පුවත්පත් කීපයක්ම වාර්තා කරල තිබුණා.

ටොරොන්ටෝ සිට කිලෝ මීටර 200 ක් පමණ බටහිර දෙසට පැය තුනක පමණ කාලයක් ගමන් කිරීමෙන් පසු හමුවන උතුරු හුරොන් හි Blyth නම් ගමේදි ඔබට මෙම කෙසෙල් කොටුව සැබවින් දැක බලා ගන්න පුළුවන්. මේ ගොවිපොළේ වගා කර ඇත්තේ කෙසෙල් පමණක් නොවෙයි. නිවර්තන කලාපීය රටවල වගා කෙරෙන ගස්ලබු, අන්නාසි, දෙහි, පේර, දොඩම් වැනි පළතුරු වර්ග කීපයක්ම මෙතන සරුවට වගා කරල තියෙනවා.

ලොව ඕනෑම දේශගුණයක වැවෙන ඕනෑම ගසක් වැලක් ඕනෑම රටක වගා කළ හැකි වුණත් ඒ සඳහා අනුගමනය කළ යුතු තාක්ෂණික උපක්‍රම සඳහා වැය කළ යුතු පිරිවැය ඉතාමත් අධිකයි. උදාහරණයක් විදියට කෙසෙල් වගාවම ගනිමු. කැනඩාවේදී කෙසෙල් වැවුවොත් හිරු එළිය සමග ඊට අවශ්‍ය දේශගුණ සාධක තත්ත්වයන් පවත්වා ගැනීම අත්‍යවශ්‍යයි. ඒත් මේ රටේ ඍතු විපර්යාසයත් එක්ක එළිමහනේ නම් කෙසේ වත් මෙවැනි වගාවක් කළ නොහැකියි. ඒ සඳහා ස්වභාවික හිරු එළියද ලැබෙන උසස් තත්ත්වයේ ග්‍රීන්හවුස් (Greenhouse / Hoop House) තුළ අවශ්‍ය උණුසුම්කරණ පහසුකම් සමග මෙය කළ යුතුයි. එහෙත් එය අධික වියදම් යන වැඩක්. අවුරුද්දේ වැඩි මාස ගණනක් පැය 24 ක් පුරා විශාල ග්‍රීන්හවුස් රත් කිරීමට උණුසුම්කරන යන්ත්‍ර (heaters) භාවිත කිරීම කිසිසේත්ම ප්‍රායෝගික වන්නක් නොවෙයි. එසේ වගා කෙරෙන කෙසෙල් ගෙඩි වෙළඳපොළට දමනවා නම් ඊට නියමිත මිල කෙසේ තීරණය කරන්නද?

ඒත් Terry Brake ගේ ගොවිපොළේ වවල තියෙන නිවර්තන භෝග වගා කිරීමට නම් ඒ තරම් වියදමක් යන්නෙ නෑ කියලයි ඔහු කියන්නෙ. කොහොමද ඔහු අඩු වියදමින් ඝර්ම කලාපීය දේශගුණයක් ඔහුගේ කෙසෙල් කොටුවට ලබාදෙන්නෙ?

මේ භෝග වගාව සඳහාත් ග්‍රීන් හවුස් ක්‍රමයම ඔහු යොදාගෙන තිබෙනවා. එහි උණුසුම පවත්වාගෙන යෑම සඳහා දර යොදාගැනීමයි මේ අඩු වියදම් ක්‍රමයේ විශේෂත්වය. මේ දර පෝරණු ග්‍රීන්හවුස්වලට පිටතින් සවිකරල ඒවායෙන් නිකුත්වන උණුසුම් වායුව ග්‍රීන්හවුස් තුළට යන ආකාරයට සකස් කරල තියෙනවා. (මෙය සාමාන්‍ය තාපන යන්ත්‍රයකින් උණුසුම ලබාදෙන ආකාරයෙන්ම සිදුවන්නක්). ඒ සඳහා අවශ්‍ය දැව සපයා ගැනීම සිදුකරන්නෙත් ගොවිපොළෙන්මයි. මේ දර කැපීමේදී වසර 20 ක් පමණ පරණ ගස් තෝරාගෙන කැපීමට මේ අය ප්‍රවේශම් වෙනවා. ඒ වගේම සෑම වසරකම කපන ගස් වෙනුවට අලුත් පැල සිටුවීමත් සිදුකරනවා. මෙම ග්‍රීන් හවුස් සකස් කරන්න පොලිතින් තහඩු විශේෂයක් (polyethylene) යොදා ගෙන ඇති අතර තාපය වඩාත් හොඳින් රඳා පවත්වා ගැනීමට එය වඩාත් උපකාරී වෙන බවයි ටෙරී පවසන්නෙ.

ගොවිපොළේ ශාකවලට තමන්ගේ මුල් නිජබිම්වල සිටින ආකාරය දැනීමටත් මේ ගොවි මහතා අපූරු ක්‍රමයක් යොදාගෙන තියෙනවා. ග්‍රීන්හවුස් තුළ කැළෑවක් මවා පෙන්වීමයි (jungle-like) ඒ ක්‍රමය. අක්‍රමවත් විධියට වගා කරල තියෙන පැළ නිසා ඇත්තටම ඒ ගොවිපොළ කැළෑවක් වගේ. මෙයින් ගස්වල එලදාව වැඩිකරගන්න පුළුවන් බවයි ටෙරී කියන්නෙ.

"ඔබ මෙතෙන්ට ආවොත් හුදෙක් නිවර්තන ප්‍රදේශයකට ආව වැනි හැඟීමක් ඔබට දැනේවි" ටෙරී එයාගෙ ග්‍රීන්හවුසිය ඇතුළෙ පරිසරය ගැන පැහැදිලි කළේ එහෙමයි. "මේක ඇතුළෙ තෙතමනය නිවර්තන දේශගුණයට සමාන කමක් තියෙනවා. සාමාන්‍යයෙන් කැනඩාවේ සෑම ඍතුවක්ම දැඩි වියළියි. ඒත් මේ ගොවිපොළ ඇතුළෙ හැම වෙලාවකම 85 ත් 90 ත් අතර ආර්ද්‍රතාවක් තියාගන්න අපි වෙහෙසෙනවා"

වසර හයකට පමණ පෙර ආරම්භ කර ඇති මෙම ගොවිපොළෙහි විශාල ප්‍රමාණයේ ග්‍රීන්හවුස් තුනක් තුළ මේ භෝග වගාව සිදුවෙයි. ලබන වසරේදී ගොවිපොළ තවත් විශාල කොට වැඩිදියුණු කිරීම ටෙරීගේ බලාපොරොත්තුවයි. ඒ වෙනුවෙන් හෙක්ටයාර දෙකහමාරකට ආසන්න බිම් ප්‍රමාණයක ග්‍රීන් හවුස් 100 ක් හදන සැලසුමක් ක්‍රියාත්මක කිරීමටයි ඔහු අදහස් කර සිටින්නෙ.

"අපේ ලොකුම ඉලක්කය රටේ අනික් අයත් මීට එකතු කර ගැනීමයි. මේ නිවර්තන භෝග වගාව ඔන්ටේරියෝවේ මේ පළාතට, අපේ ගොවිපොළට පමණක් සීමා නොවී රට පුරාම පැතිර යනවා නම් අපි කැමතියි"

"අපේ ආහාර සපයා සැපයීම් විදෙස් රටවල් මත රඳා පැවතීම සුදුසු නෑ. ඒ සෑම දෙයක්ම අපටම සාදා ගත හැකියි. ඊට අවශ්‍ය ලාභ පහසු ක්‍රම සොයා බලා යොදා ගැනීමයි කළ යුත්තෙ" පිටින් ගෙනත් දෙනකන් කට ඇරන් සිටින හැමෝටම ටෙරි ටෙරීගේ ඒ අදහස ලොකු පණිවිඩයක් දෙනවා.

කිසිදු ලෙසකින් ගොවියකු වීමට නොසිතූ ගොවිතැනක් ගැන දැන හෝ නොසිටි ටෙරි බ්‍රේක් ඒ වෙත තල්ලු කළ කතාන්දරය තරමක ඛේදවාචකයකින් ආරම්භ වන්නක්. මීට වසර 11 කට පෙර කාර්මික ඉංජිනේරුවරයකු වශයෙන් කටයුතු කළ ටෙරීගේ ඉරණම ඔහු මුහුණ පෑ දරුණු රිය අනතුරකින් පසු නොසිතූ විරූ දිශාවකට පෙරළුණු අන්දම ඔහු පුවත්පත්වලට පවසා තිබුණා. එම අනතුරෙන් ටෙරීගේ මොළයටත් හානි සිදු වී ඒ හානිය නිසා ඔහුගේ සමහර ශරීර ක්‍රියාකාරකම් අඩපණව ගොස් තිබුණා. ඇවිදීම, කථනය වගේ දේවල් සකස් කරගන්න භෞත චිකිත්සක ප්‍රතිකාර සඳහා යොමුවීමට ඔහුට සිදුවී තිබුණා. මේ නිසා එතෙක් ඔහු කරගෙන

ආ රැකියාවට සමුදීමට සිදුවුණු ආකාරයත් එක තැනක එක දිගට සිටිමින් මොනම වැඩක්වත් කිරීමට දුෂ්කර වූ හැටිත් ඔහු පවසා තිබුණා.

ටෙරී තුළ ඇති වී තිබුණ මේ නොසන්සුන් මානසිකත්වය සමනය කිරීමට වෛද්‍යවරු නොයෙක් භෞත චිකිත්සක ක්‍රම යොදාගනු ලැබුවා. ඒ සඳහා ඔහුට ප්‍රතිකාර කළ දකුණු අප්‍රිකානු ජාතික වෛද්‍යවරයා වරෙක අමුතුම ක්‍රමයක් යොදාගෙන තිබුණා. වෛද්‍යවරයා විසින් ඒ සඳහා යොදාගත්තේ කෙසෙල් පැළයක්. කෙසෙල් පැළය ටෙරී වෙත ලබා දී ඔහුගේ මානසික ඒකාග්‍රතාව වර්ධනය කිරීමේ චිකිත්සක ක්‍රමයක් යොදාගනු ලැබුවා. කෙසේ වෙතත් මේ කෙසෙල් පැළය ටෙරීගේ සිතෙහි රෝපණය කළේ වෙනස්ම වූ බීජයක්. ඒ ඔස්සේ කල්පනා කිරීමේදී මෙවැනි නිවර්තන ගොවිපොළක අදහස ටෙරීගේ සිතට ඇවිත් තිබුණා.

එම අදහස යථාර්ථයක් කර ගැනීමට එවකට ඔහුට ඇප උපස්ථාන කළ පෞද්ගලික උපස්ථායක Laurie Macpherson ගේ සහායද ඉතාමත් ඉහළින් ඔහු වෙත ලැබුණා. ඒ වන විට උපස්ථායකයකු ලෙස කටයුතු කළත් ඔන්ටේරියෝවේ හුරොන් ප්‍රදේශයේ ලූරිට අයිති හෙක්ටයාර 40 ක ගොවි බිමකුත් තිබුණා. මේ ගොවිපොළ තම අදහස ඉෂ්ට කර ගැනීමට වෙස්වලාගෙන ආපු වාසනාවක් වුණ බවයි ටෙරී පවසන්නෙ. ටෙරී තුළ පහළ වුණු අදහසට අඩුවැඩිය සපයපු ලූරි, ඒ සිහින නිවර්තන ගොවිපොළ සැබෑවක් කර ගැනීමට තමාගේ හෙක්ටයාර 40 ලබාදීමට එක පයින්ම එකඟ වුණා.

අවසානයේදී හිම මිදෙන හුරොන් මිටියාවතේ මේ අපූරු විශ්මලන්ත නිවර්තන ගොවිපොළ බිහිවුණේ ටෙරී සහ ලූරි හවුල් ව්‍යාපාරයක හිමිකරුවන් කරමින්.

වැඩපිළිවෙළ ආරම්භයේදී දහසක් බාධක ඇවිත් තිබුණා. විශේෂයෙන්ම දේශගුණය ඇතුළු පරිසර තත්ත්වයන් ඍජුවම ඔවුන්ට බාධා කළා. ඒත් මේ සගයින් දෙදෙනා ඒ කිසි දේකින් බිඳක් වත් සැළුනේ නෑ. දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කරනු ලැබුවා. ඒ මහන්සියේ කැපවීමේ ප්‍රතිඵල අද ඔවුන් භුක්ති විඳින බව ගොවිපොළට යන කාටත් පෙනෙනවා. මුලදී නිවර්තන වගාවන් ගැන කිසිම අත්දැකීමක් නොතිබුණු නිසා ඩොමිනිකන් රාජ්‍යට ගිහින් ඒ ගැන අධ්‍යනය කර ඇවිත් ඒ ක්‍රම සහ විධි මේ ගොවිපොළට සුදුසු විදියට යොදා ගැනීමට කටයුතු කළ නිසා වගාව වඩාත් සාර්ථක වුණ බව ටෙරී කියනවා.

තම ගොවිපොළෙහි ඇති පළතුරුවල ඇති තත්ත්වයෙන් ඉහළභාවය ගැන ටෙරී කතා කරන්නෙ හරිම ආඩම්බරයෙන්.

"සුපිරි වෙළඳසැලකින් මිල දී ගන්න කෙසෙල්වලට වඩා අපේ කෙසෙල් සහ අනික් පළතුරු රසයෙන් ඉහළයි. නැවුම් බවින් ඉහළයි. ගුණයෙන් ඉහළයි"

සුපිරි වෙළඳසල්වල ඇති පළතුරු එළවළු ගැන ටෙරී තුළ තියෙන්නෙ මේ වගේ අදහසක්. 'කැනඩාවේ වෙළඳපොළේ තියෙන හුඟක් නිවර්තන කලාපීය පළතුරු, එළවළු මෙහෙට ගේන්නෙ කොස්ටාරිකාව වගේ දකුණු ඇමරිකානු රටවලින්. මාස ගණන් ශීත ගබඩාවල ගාල් කරල නැව් නංවා එවන ඒවා කල් තියා ගැනීමටත්, ඒවායේ වර්ණය තබා ගැනීමටත් නොයෙක් රසායනයන් යොදා ගන්නවා'

තම ගොවිපොළේ තියෙන පළතුරු සුපිරි වෙළඳසැලේ තියෙන රට පළතුරු හා සැසඳීමේදී ප්‍රමාණයෙන් කුඩා වුණත් රසයෙන් ගුණයෙන් හා නැවුම් බවින් අනූන බව ටෙරී පවසනවා.

ඔවුන්ගේ නිවර්තන ගොවිපොළේ පළතුරු සම්බන්ධයෙන් ටෙරී පවසන තොරතුරු සත්‍යදැයි අත්දැකීමෙන්ම දැනගැනීමට කැමති අයට ඒ සඳහා අවස්ථාව තියෙනවා. ඔන්ටේරියෝවේ Exeter හා Goderich ගොවිජන වෙළඳපොළවලට (farmer's markets) ගියොත් මේ පළතුරු ඔබට ලබාගන්න පුළුවන්. ටෙරී සහ ලූරිගේ නිවර්තන භෝග එම වෙළඳසල්වල විකුණනවා. මෙහිදී ගසෙන් කැපූ හැටියෙම අලුත් කෙසෙල් ගෙඩි හතරක් ඩොලර් 2 ක් වැනි මුදලකටත් අලුත්ම ගස්ලබු ගෙඩියක් ඩොලර් 3 කටත් මිල දී ගන්න පුළුවන්.



# ANTON DHARMASEELAN

## MORTGAGE AGENT

Available Till Midnight
Including Weekends & Holidays

CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS

PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY

**416 704 1200**

MAJOR BANKS-BEST RATES

MORTGAGE ALLIANCE
BROKER #10530

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- **REAL ESTATE - Residential & Commercial**
- **WILLS & POWERS OF ATTORNEY**

**EVENING & WEEK END CONSULTATIONS AVAILABLE BY APPOINTMENT**



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

## Abby Sri Haran

**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

දසත Dasatha

# www.dasatha.com

# දසත වෙබ් අඩවිය

## නව මුහුණුවරකින්...




දසත පුවත් සේවාව ඔබ වෙත තවත් සමීප කරමින්
www.dasatha.com වෙබ් අඩවිය
නව මුහුණුවරකින් එළි දක්වා ඇත.

දසත නව වෙබ් අඩවියට පිවිසීමෙන්
එතෙරෙ මෙතෙර විශේෂ පුවත්, කාලීන ලිපි,
කලා පුවත්, විනෝදාත්මක තොරතුරු සමග
සුපුරුදු දසත පුවත්පතද ඔබට ලබාගත හැක.

දසත Dasatha

# ඔබේ නිවසටම

## සෑම මසකම දසත Dasatha පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

Please make all Cheques payable to **Dasatha Publications**

**www.dasatha.com**



# ශ්‍රී ලංකාවේ තැපැල් සේවය

■ මුතුමාලි මුතුබණ්ඩාර

අසුන් බැන්ද කණුව post වූ අතර ම තැපෑල mail විය. මේ post mail එදවස Royal mail වීය. රාජකීයත්වය පිළිබඳව ගැඹුරින්ම පිළිගැණුනු 18 වන ශත වර්ෂයේ මෙ ලක සුවිශේෂී සංධිස්ථානයක් සටහන් කරමින් අදටත් උචිත අදටත් ඔබින පණිවුඩ හුවමාරුව හෙවත් සන්නිවේදනය ඇරඹියේ එකල විසූ ලක් දනන් අමන්දානන්දයට පත් කරමිනි.

වසර 1832 ජූලි 02 වන දින මීට හරියටම වසර 184 කට පෙර බ්‍රිතාන්‍ය මහ රැජිණගේ රාජකීය පණිවුඩ රැගෙන අසුන් බැඳි කරත්තය කොළඹ ආවේය. ගලවිදි හන්දිය පසු කරමින් අසුන් දෙදෙනාට කොළඹට එන්නට හෝරා දොළහක් ගත විය. තැපැල් අශ්ව කරත්තය සතියකට දින තුනක් ගලවිදි තැන පසු කළේය. ආසියාවේ ප්‍රථම වතාවට අශ්ව රථ මගින් තැපැල් ප්‍රවාහනය කිරීම සිදුවූයේ කොළඹ සහ මහනුවර අතරය. දෙවනුව කොළඹ සහ ගාල්ල අතරය. එංගලන්තයේ තැපැල් හුවමාරුව සිද්ධ වූයේ යම් සේද එපරිදිම සිරි ලංකාවේද තැපැල් අශ්ව කරත්තය බ්‍රිතාන්‍ය නීති රීති පද්ධතියට යටත්ව ධාවනය විය.

තැපෑල අශ්ව කරත්තය හරහා ක්‍රියාත්මක වීමට වසර තිස්හයකට පෙර තැපැල් ප්‍රවාහනය සිරිලක ආරම්භ විය.

පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම් ලිපි භාර ගැනීමේ කාර්යාලයක් කොළොම්පුරෙහි ආරම්භ කෙරිණි. ඒ වසර 1796 දීය. කැප්ටන් ඒ. කෙනඩි මෙසිරිලක පළමු පෝස්ට් මාස්ටර් ජෙනරාල්වරයා ලෙස පත් කරමින් තැපැල් දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබුයේ 1798 ඔක්තොබර් 12 වන දිනයේදීය. තැපෑලට ගාස්තුවක් සහ නීති රීති මාලාවක් හඳුන්වා දුන්නේ 1799 දීය. පැන්ස 6 ක වටිනාකමකින් යුත් ප්‍රථම තැපැල් මුද්දරය නිකුත් කළේ 1857 අප්‍රේල් 01 දාය. එහි වූයේ වික්ටෝරියා රැජිණගේ හිසෙහි අනුරුවය.

මිනිසාගේ නව සොයා ගැනීම් සඳහා කාලය සියුම් ලෙස සහාය වෙයි. තැපෑල හෙවත් පණිවුඩ හුවමාරුවද කාලය සමග සටන් කොට ජය ගැනීමකි. 1858 න් පසු ඉදිරි දශකයේ තැපෑල කාලය ජය ගනු ලැබීය. ඒ ඉන්දියාව සමග එක එල්ලේ පණිවුඩ හුවමාරු කළ විදුලි පණිවුඩ හුවමාරුව සමගය. කොළඹ, ගාල්ල, මහනුවර, ත්‍රිකුණාමලය දක්වාම විදුලි පණිවුඩ සේවාව ව්‍යාප්ත වූයේ හීයක වේගයකිනි. ඒ බැව් සනාථ කරමින් 1865 දී යුරෝපයේ සිට කොළඹට විදුලි පණිවුඩයක් ලැබිණි. 1866 අගෝස්තු 12 වනදා ඇමෙරිකා එක්සත් ජනපදයේ සිට කොළඹට එවූ විදුලි පණිවුඩයද ලැබී ඇත.

ඉන් නොනැවතී නිර්මාණශීලී මිනිසුන් සහිත ලෝකයත් සමග තැපෑලත් ඉදිරියට ගියේය. සබ්මැරින් කේබලයක් මඟින් ලංකාව ප්‍රථම වරට විදේශ රටවල් සමග සම්බන්ධ වූයේ, 1870 දීය. 1872 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකාවේ මුදල් භාවිතය රුපියල් ශතවලින් ආරම්භ විය. එය තැපැල් සේවාවේ මුදල් ඇණවුම් සේවාවට අත් පොත් තබන්නට ඉවහල් වූ කරුණක්ද විය. 1877 දී බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාව විශ්ව තැපැල් සංගමයට බඳවා ගනු ලැබීය. ඉතිරි කිරීමේ බැංකුව තැපෑල තුළට ආවේද මෙම වකවානුවේදීය.

මෙකල වනවිට ජනතාව තැපැල් සේවාව පිළිබඳ කුකුසක් නැති විශ්වාසයක් තබා තිබිණි. බ්‍රිතාන්‍ය කිසි විටකත් නව සොයාගැනීම්වලට හෝ නව ඉදිකිරීම්වලට තිත තැබුවේ නැත. ඔවුහු දිනෙන් දින තම රටට සැපයිය යුතු මූල්‍යමය පදනම තිර කිරීමට කටයුතු යෙදුවා මිස විවේක සුවයෙන් කල් ගෙවුයේ නැත. එහි තවත් ප්‍රතිඵලයකි දුම්රිය මාර්ගය තැනීම. මාර්ග හා මං මාවත් ඉදිවීම මත තැපෑලට නව පණක් ලැබිණි.

දුම්රිය මගින් තැපැල් ප්‍රවාහනය කොළඹ සිට පේරාදෙණිය අතර ධාවනය වූයේ 1892 දීය. එය 1928 දී මහනුවර දක්වාත් 1929 දී බදුල්ල දක්වාත් දීර්ඝ කෙරිණි. රුපියල් ශතවලින් වටිනාකම දැක්වෙන තැපැල් මුද්දරය නිකුත් කෙරුණේ 1893 පෙබරවාරි 1 දිනය. පළමු මුද්දරයේ වටිනාකම ශත 2 කි.

වසර 1832 දී අශ්ව කරත්තයෙන් රැගෙන ගියේ රැජිනගේ හෝ බ්‍රිතාන්‍ය බලවතුන්ගේ පණිවුඩ පමණක් වුවද, 1900 වන විට එය මුලුමනින්ම වෙනස් ස්වරූපයක් ගෙන තිබිණි. සාමාන්‍ය ජනතාව බොහොමයක් සේවා ලබා ගත්තේ තැපෑල හරහායි. එවකට සිරිලක සිසාරා ව්‍යාප්තව තිබූ තැපැල් කාර්යාල සංඛ්‍යාව 147 කි. ජාතික ඉතිරි කිරීමේ බැංකු ගිණුම් සංඛ්‍යාව 51,887 කි. උප තැපැල් කාර්යාල, ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාල පිහිටුවමින් ගුවන් ලිපි සේවාවද ඇරඹී තැපෑල ලොව දියුණු රටවල මෙන් ගෙයින් ගෙට යමින් තැපැල් බෙදීම ආරම්භ කළේය.

ජාත්‍යන්තර අධිවේගි තැපැල් සේවය (EMS) ඇරඹියේ 1989 ය. ඉන් වසරක් ගෙවුණු තැන දේශීය අධිවේගී තැපෑල (Speed Post) ආරම්භ කෙරිණි. 1990 ජූලි 02 වන දා ඇරඹී අධිවේගී තැපෑල කාලය සමග උරනුර ගැටෙමින් විජයග්‍රහණය අත්පත් කරගත්තේ මහනුවර සිට කොළඹ දක්වා ශ්‍රී ලංකා තැපැල් එක්දින බෙදීම් සේවය හෙවත් Sri lanka Speed Post Courier ආරම්භ කිරීමත් සමගය.

වර්තමානයේ කුමන මට්ටමක අධිවේගී සන්නිවේදන මාර්ග තිබුණත් තැපැල් සේවාව තරම් සාක්ෂි ඉතිරි වන නීත්‍යනුකූල පණිවුඩ හුවමාරු ක්‍රමයක් ලොව නැත්තේය. සිරිලක පුරා අද වන විට ප්‍රධාන තැපැල් කාර්යාල 636 ක් උප තැපැල් කාර්යාල 3440 ක් ග්‍රාමීය නියෝජිත තැපැල් කාර්යාල 158 ක් සහ පෞද්ගලික නියෝජිත තැපැල් කාර්යාල 397 ක් ක්‍රියාත්මක වේ. ලියුම් පෙට්ටි 15,302 ක් මහජනතාවගේ පහසුව තකා සවි කොට ඇති අතර තැපැල් කරුවන් 7278 ක් සේවයේ යෙදී සිටිති.

එදා අශ්ව කරත්තයෙන් ලිපි ගෙන ගිය තැපැල්කරුවන් දෙදෙනා වෙනුවට අද හත්දහස ඉක්ම වූ තැපැල්කරුවන් සිරිලක පුරා සේවය කරති. විසිපන්දහසක් පමණ මුළු සේවක පිරිසක් මේ වන විට තැපෑලේ යෙදී සිටින්නේ සුද්දා පෙන්වූ මඟෙහි අප පා නැගි නිසාය. වසර දෙසීයකට ආසන්න මතකයක් අප අද ස්මරණය කරන්නේද එහෙයිනි.




Diploma Programs
New batch starts every month
• Automation Technology
PLC - HMI - Drive - TCP/IP - DeviceNet
• CAD/CAM Technology
CNC-AutoCAD-SolidWorks-MasterCAM
• Computerized Accounting
• Food Service Worker
• Office Administration
• Accounting and Payroll

Certificate Programs
Electrical Exam Prep Course
(309A Construction & Maintenance and 442A Industrial Electrician)
Accounting Softwares
• QuickBooks
• Simply Accounting
• Accpac
Computer Technology
• PC Technician (A+)
• Programming
- C/C++, VB.NET, Java
• SQL Database
• Web Development (HTML, CSS, JAVA Script)
• LINUX systems
• CISCO
• Android App Development
Microsoft Office Apps
• Word
• Excel
• PowerPoint
• Outlook
Multi-Media
• Web Design
• Video Editing
• PhotoShop
• Illustrator
• QuarkXpress
• 3D Animation
• Canadian Securities Course
• Bank Teller
• Cashier Course
• Income Tax Course
• Food Handler Certificate

University and High Schools students are welcome for Special Classes

Second Career Funding
Covers tuition, living, transportation expenses upto $28,000 for those who qualify
EI or Laid off

Job counselling & assistance provided.

beta College
of Business & Technology

Visit us:
www.betacollege.ca
Location:
Bellamy & Ellesmere
416-449-2382
info@betacollege.ca
1085 Bellamy Road #208
Toronto ON
(All Certificate Courses are taught individually and each courses are less than 40hrs)


“කරදරයක් නැති උකසක් සමග
ඔබේ සිහින නිවසට පිවිසෙන්න.”
“නිසි රක්ෂණ සැලසුමක් සමග
ඔබේ පවුලේ අයගේ
අනාගතය සුරක්ෂිත කරන්න.”
MEGA Financial Group
MORTGAGE ALLIANCE
RIGHTBROKER = RIGHTMORTGAGE
රොයි විග්නරාජා
උකස් හා රක්ෂණ නියෝජිත
බලපත්‍ර අංකය M12001846
විමසන්න
416-457-1633
5694 Hwy 7 East 2nd Floor
Markham ON. L3P 1A9


MATTRESS !!!
MATTRESS !!!
MATTRESS !!!
Huge Manufacturer's Sale
Factory Direct Mattresses
Visit Our Factory Showroom Today
RayZzz
Personalize Your Mattress
RayZzz Custom Mattresses
31 Progress Ave. Unit 24
Scarborough Ont. M1P 4S6
(Kennedy Rd & Hwy 401)
Tel : 647 786 0865
Email : rayzzzcustommattresses@gmail.com

# උපාසක බිත්තර



**"මම වෙජිටේරියන්. ඒ වුණාට බිත්තර කනවා...."**

මෙය ඇසෙන විට 'මේ මොන හතරබීරි කතාවක්' දැයි යමෙකුට සිතුණා නම් එහි ඇති පුදුමයක් නැත. මේ කතාව පළමුවරට ඇසුණු මොහොතේ මටත් එසේ සිතුණු අතර 'වෙජිටේරියන් බිත්තරත්' වෙළඳපොළට නිකුත් කර ඇද්ද යන කුකුසද සිතට නැගුණි. පසුව සොයා බැලීමේදී ෆාම්වල සාදන කිකිළියන්ගෙන් ලබාගන්නා බිත්තර මෙසේ වෙජිටේරියන් ගණයේ ලා සලකා නිර්මාංශ වූවන් විසින් ආහාරයට ගන්නා බව දැනගැනීමට ලැබුණි. මෙම වෙජිටේරියන් බිත්තර එසේත් නැතිනම් ෆාම් බිත්තර වරෙක ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා හඳුන්වා තිබුණේ 'උපාසක බිත්තර' ලෙසිනි.

කුකුළන් හා මුහුන් නොකර කිකිළියන්ගෙන් ලබා ගන්නා ෆාම් බිත්තර 'ජීවයෙන් තොර' යැයි තර්කයෙහි පිහිටා ෆාම් බිත්තර ආහාරයට ගැනීමට නිර්මාංශ වූවන් හුරු වී ඇතිවා විය හැක. ඒ කෙසේ වෙතත් ගමේ ඇවිදින කිකිළිය හා ෆාම් එකේ ඇති කරන කිකිළිය දමන බිත්තරවල වෙනස කුමක්ද යන්න සොයා බැලීම මඳක් පසෙකට දමමු. කිකිළි බිත්තරය වෙනුවට නිපදවුණු pure vegetarian කෘත්‍රිම බිත්තරයක් ගැන පුවතක් සමග සාමාන්‍යයෙන් අප ආහාරයට ගන්නා කිකිළි බිත්තර ගැන තොරතුරු මෙතැන් සිට විමසා බලමු.

## Pure Vegetarian කෘත්‍රිම බිත්තර

මේ බිත්තරය ගැන පුවත වාර්තා වන්නේ ඇමරිකා එක්සත් ජනපදයෙනි. සම්පූර්ණයෙන්ම නිර්මාංශ වූවන්ගේ ප්‍රෝටීන අඩුව පිරිමැහීම සඳහා සත්ව කොටස්වලින් තොර බිත්තරයක් නිපදවීමට ලොව ප්‍රමුඛ පෙළේ ආහාර නිෂ්පාදනාගාර මීට අවුරුදු ගණනාවකට පෙර සිට පර්යේෂණ මෙහෙයවනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 වසරේදී මේ ශුද්ධ නිර්මාංශමය බිත්තරය නිපදවා ගැනීමට ඇමරිකාවේ Hampton Creek Foods නමැති සුප්‍රසිද්ධ ආහාර නිපදවීම් ආයතනය සමත් වී තිබුණි.

එම නිර්මාංශ බිත්තරය එසේත් නැතිනම් කෘත්‍රිම බිත්තරය එළිදැක්වීමත් සමග ඇතැම් පුවත්පත්වල එම පුවත වාර්තා කොට තිබුණේ 'The egg industry should be scared' යනුවෙනි. ඒ ආකාරයට බිත්තර වෙළඳපොළට අභියෝගයක් විය හැකි මේ බිත්තරය නිපදවීම සඳහා එම ආයතනය හා එක්ව ඩොලර් මිලියන 23 ක් ආයෝජන කර තිබුණේ ආසියාවේ දෙවන ලොකුම ධනවතා ලෙස සැලකෙන හොංකොංහි Li Ka-shing ය. ඔහුට අමතරව ලොව සුප්‍රකට සල්ලිකාරයන් රැසක්ම නිර්මාංශ බිත්තරයක් බිහිකිරීමේ පර්යේෂණ සිදුකරන කාලයේදී මෙම සමාගමට මූල්‍ය දායකත්වය සපයා තිබුණි. ඔවුන් අතර Yahoo හි සම අයිතිකරු Jerry Yang, මයික්‍රොසොෆ්ට් හිමිකරු බිල් ගේට්ස්, Pay Pal මුදල් හුවමාරුවේ හිමිකරු පීටර් නීල්, ෆේස්බුක් සම අයිතිකරු Eduardo Saverin වැනි සුපිරි ධනවතුන්ගේ නම් සඳහන් විය.

මේ ශුද්ධ කෘත්‍රිම බිත්තරය පිළිබඳ සඳහන් තොරතුරුවල දැක්වෙන ආකාරයට එය නිපදවීමේදී කිසිදු ආකාරයක සත්ව කොටසක් යොදාගෙන නොමැත. එහෙත් එහි පෝෂණ ගුණය සාමාන්‍ය බිත්තරයකටත් වඩා වැඩි බව පෝෂණවේදීන් සිය පර්යේෂණවලින් තහවුරු කර ඇත. ඉතා උසස් තත්ත්වයක කහමදයක් සහිත මෙහි බිත්තර කටුවෙහිද අධික කැල්සියම් ප්‍රමාණයක් අඩංගු කොට නිපදවා ඇති බැවින් එයද කුඩුකර ආහාරවලට එක්කර ගැනීමේ හැකියාව පවතින බව ඔවුහු පෙන්වා දෙති. මෙහි හැඩයද සාමාන්‍ය කිකිළි බිත්තරයක හැඩයට සමාන වේ.

කුකුළු ගොවිපොළවලට මේ කෘත්‍රිම බිත්තරය නිසා යම් පාඩුවක් සිදු වූවත් එළවළු ඇතුළු භෝග ගොවිපොළවලට මෙය සතුටුදායක ආරංචියක් විය හැකි බව කෘත්‍රිම බිත්තරය නිපදවීමට දායක වූවන්ගේ අදහසයි. ඔවුන් එසේ පවසන්නේ මෙම කෘත්‍රිම බිත්තරය නිෂ්පාදනය සඳහා එළවළු පමණක් යොදාගන්නා හෙයිනි. Rapeseed නමැති ඇට වර්ගයත්, කහ පරිප්පු හෝ යෙලෝපීස්, සූරියකාන්ත ඇටවලින් ලබාගන්නා lecithin නමැති සංයෝගය කෘත්‍රිම බිත්තරය සඳහා මූලිකව යොදාගන්නා අමුද්‍රව්‍ය ලෙස සඳහන් වේ.

කෙසේ වුවත් කෘත්‍රිම බිත්තරය නිසා කිකිළි බිත්තර වෙළඳපොළට සිදුවූ හානියක් ගැන පළ වූ වාර්තාවක් සොයාගැනීමට නොහැකි වූ අතර මෙය නිර්මාංශ භක්ෂක පිරිස වෙනුවෙන්ම නිපදවූවක් නිසා සාමාන්‍ය කිකිළි බිත්තරය වෙළඳපොළෙන් ගිලිහී යතැයි සිතීමද අවශ්‍ය නැත.

## බිත්තර කතා

ඒ කෘත්‍රිම බිත්තර පුවතින් පසු අපි සැබෑ කිකිළි බිත්තර කතා දෙසට යොමු වෙමු.

බිත්තර ගැන මේ රසවත් පුවත ප්‍රංශ විප්ලවය සිදු වූ 18 වන සියවස දක්වා අතීතයට දිව යන්නකි. කවදත් ප්‍රංශ වැසියන්ගේ ආහාර වේල තුළ බිත්තරවලට සුවිශේෂී තැනක් හිමිවන අතර ප්‍රංශ විප්ලවය සිදුවන කාලයේදී බිත්තර යොදාගනිමින් සාදාගත හැකි කෑම වට්ටෝරු 685 ක් පිළිබඳව ඔවුහු දැන සිට ඇති බව කියති. (වර්තමාන ප්‍රංශ ජාතිකයන් ඒ වට්ටෝරු පිළිබඳව දන්නවාද නැද්ද යන්න පිළිබඳ හරි තොරතුරක් දැනගැනීමට නොහැකි වුණි.)

බිත්තර ආහාරයට ගැනීමේදී ඇමරිකානුවන් ප්‍රංශ වැසියන්ට කිසිසේත් දෙවෙනි නොවන අතර දළ වශයෙන් ඇමරිකානුවකු වසරකට බිත්තර 250 ක් පමණ ආහාරයට එක් කර ගන්නා බව පැවසෙයි. මෙය සාමාන්‍යයෙන් එරට එක් අයකු බිත්තර කන අවම අගය වන අතර මෙහි උපරිමය කෙතෙක්දැයි පැහැදිලි ගණනයක් ගෙන නොමැත. දිනපතා බිත්තර 3 ක් හෝ 4 ක් ආහාරයට එක් කරගන්නා ඇමරිකානුවන්ද ඇමරිකාවේ බහුලව සිටින අතර එවැනි පුද්ගලයකු වසරකට බිත්තර දහසකට වැඩියෙන් ගිල දමනු ලබති. මේ සියලු දත්ත සලකා බලා සකසා ඇති වාර්තාවල සඳහන් වන ආකාරයට ඇමරිකාවේ වාර්ෂික බිත්තර පරිභෝජනය බිලියන 76.5 ක් බව කියති.

දුගී දුප්පත්ම රටෙහි දිළින්දාගේ සිට ධනවත් රටවල සුඛවිහරණයෙන් අනූන පුද්ගලයා තෙක් පොදුවේ ආහාරයට ගන්නා ආහාරයක් ලෙස බිත්තර දැක්විය හැකි අතර ලොව පුරා වාර්ෂික බිත්තර පරිභෝජනය ට්‍රිලියන 1.2 ක් ලෙස සඳහන් වේ. බිත්තර පරිභෝජනයේදී ඇමරිකාව හා ප්‍රංශය ඇතුළු සියලු බටහිර රටවල් අබිබවා යෑමට චීනය සමත් වී ඇති බව ඒ පිළිබඳව ඇති වාර්තා පෙන්වා දේ. ඒ අනුව ලෝක බිත්තර පරිභෝජනයෙන් සියයට 40 ක්ම කා දමන්නේ චීනුන් විසිනි. ඇමරිකානුවන් කා දමන්නේ සියයට 10 ක ප්‍රමාණයකි.

මේ කතාව බිත්තරවලින් පිහිට වූ ගිනස් ලෝක වාර්තාවක් ගැනයි. ඇමරිකානු ජාති හොවාර්ඩ් හෙල්මර් විසින් විනාඩි 30 ක් ඇතුළත බිත්තර ඔම්ලට් 427 ක් සෑදීමෙන් මේ වාර්තාව පිහිටුවා ඇත.

එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (USDA) මගින් ශ්‍රේණිගත කරන ලද බිත්තර එක්සත් රාජධානියේ සහ යුරෝපා සංගමයේ කිසිම රටක අලෙවි නොකරයි. ඒ එය තහනම් හෙයිනි. ඊට හේතුව ලෙස දැක්වෙන්නේ ඇමරිකාවේ අලෙවි කරන බිත්තර පාරිභෝගිකයාට නිකුත් කිරීමට පෙර සෝදා පිරිසිදු කිරීමයි.

මෙය තරමක් හාස්‍යජනක ලෙස පෙනුණද යුරෝපීයන් පවසන්නේ ඇමරිකාවේ බිත්තර සේදීම නිසා ඇතිවන තෙතමනයත් සමග බිත්තර කටුවෙහි විවිධ බැක්ටීරියා වර්ධනය විය හැකි බවයි. ඇමරිකාවද බ්‍රිතාන්‍යයට මීට සමාන්තර නීතියක් දමා ඇති අතර බ්‍රිතාන්‍යයේ බිත්තර ඇමරිකාවේ අලෙවි නොකිරීමට ඔවුන් පියවර ගෙන ඇත. බ්‍රිතාන්‍යයේ බිත්තර නොසෝදා වෙළඳ පොළට නිකුත් කිරීමෙන් විවිධ බැක්ටීරියාවන් ඒ මත වර්ධනය විය හැකි බව මීට හේතුව ලෙස ඇමරිකාව දක්වා සිටී.

## බිත්තර පෝෂණය

බිත්තර ගැන ආ ගිය කතා එසේ සටහන් වෙද්දී බිත්තර ගැන අප දැන සිටිය යුතුම තොරතුරු බිඳක් මෙතැන් සිට ගෙන එමු. ලෙහෙසියෙනුත් පහසුවෙනුත් මිල දී ගත හැකිවාක් මෙන්ම සකසා ගත හැකි වීමත් නිසා බිත්තර අප කාටත් නැතිවම බැරි ආහාරයක් වී ඇත.

බිත්තර පිළිබඳව ඇති දුර්මත නිසා ඇතැම් අය බිත්තර ආහාර වේලට එකතු කර ගැනීමට මැළිකමක් දක්වති. එහෙත් ශරීරයට අත්‍යවශ්‍ය එසේ වුවත් සිරුර තුළ නිපදවා ගත නොහැකි පෝෂක කොටස් රැසක් බිත්තරවලින් අපට ලබාගැනීමේ හැකියාව පවතී. අපේ සිරුරට අවශ්‍ය ප්‍රෝටීන සපයාගත හැකි අංක එකේ ආහාරයක් ලෙස බිත්තර දැක්විය හැකි අතර ප්‍රෝටීන්හි ඇති ඇමයිනෝ අම්ල සංඝටකය බිත්තරවල යහමින් අඩංගුව ඇත. සිරුරෙහි මාංශ පේෂි වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි ඇමයිනෝ අම්ලය.

බිත්තරයක අඩංගු ප්‍රෝටීනවලින් වැඩි ප්‍රමාණයක් එහි සුදුමදයේ අන්තර්ගතව පවතී. බීටා කැරොටින් නමැති සංඝටකය නිසා කහමදයෙහි ඇති කහ පාට වර්ණය ලැබී ඇත. කහමදය තුළ විටමින් කොටස් රැසක් (A, B12, D, E, B 2, B 5 ) යකඩ, මේදය, කැල්සියම්, පොස්පරස්, ඛනිජලවණ ආදි පෝෂණ පදාර්ථ යහමින් අඩංගුව පවතී. විටමින් A සම පැහැපත් කරන අතර, ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කිරීමට උපකාරී වේ. විටමින් B12 මගින් රතු රුධිර සෛල වර්ධනය කෙරෙන අතර ප්‍රතිශක්තිකරණ පද්ධතියේ හා ස්නායු පද්ධතියේ යහපත් ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යෑමට උපකාරී වේ. විටමින් D මගින් කැල්සියම් අවශෝෂණය කර ගැනීම සිදුකෙරෙන අතර අස්ථි හා දත් සෞඛ්‍යමත් කරයි. විටමින් E මගින් ප්‍රජනක පද්ධතිය, ස්නායු පද්ධතිය හා පේශි ශක්තිමත් කරයි. මේ අන්දමට සෙසු පෝෂණ පදාර්ථත් අපගේ ශරීර සෞඛ්‍ය මනාව පවත්වාගෙන යෑමට බෙහෙවින් උපකාරී වේ. විශේෂයෙන්ම බිත්තරවල අඩංගු කෝලීන් නමැති සංඝටකය මොළයේ ක්‍රියාකාරිත්වය නිසි පරිදි ලබා දී මතක ශක්තිය වැඩිදියුණු කරන බව සොයාගෙන ඇත.

බිත්තර, ගම් සහ ෆාම් ලෙස වර්ග කර ඇතත් මේ දෙකෙහිම ගුණාත්මක අතින් වෙනසක් නොමැත. ගම් බිත්තරයෙහි කහ මදයේ කැරොටින් බහුලව අඩංගු වන නිසා එහි කහ පැහැය පමණක් තරමක් තද වර්ණයෙන් දිස් වේ.

## බිත්තර කෑම

බිත්තර කුමන ආකාරයකට පිළියෙල කර ආහාරයට එක් කර ගත්තද එහි පෝෂණයෙහි අඩු වැඩි වීමක් දක්නට නොලැබේ. නමුත් අමුවෙන් බිත්තර ආහාරයට ගන්නේ නම් ඒ ගැන වැඩි අවධානයක් යොමු කිරීම

**46 වන පිටුව බලන්න**




6 කොටස

පියදාස වැලිකන්නගේ

# එයා හරි අපූරු ළමයෙක්

අම්මත් අප්පච්චිත් අතර කොතෙක් ගැටුම් හට ගැනුණත් අර තරම් සාහසික ලෙස ගහ මරාගන්නට ගිය අන් කිසි දවසක් ගැන මට සිහිපත් කළ නොහැක. එදා ජීවිත හානියක් සිදු නොවුණේ මල්ලිගේ තන්වැසි නුවණ නිසා යැයි ගමේ බොහෝ දෙනෙක් කීහ. විදුලි කොටන, අකුණු ගසන, එක සීරුවට වැසි ඇද හැලෙන බිහිසුණු ගනඳුරු රැයක දැඩි සීතලද කාගෙන සය හැවිරිදි ඔහු යාර දෙතුන් සියයක් පමණ ඈතට දිවෙන ප්‍රපාතාකාර අඩිපාර දිගේ හුදකලාව මුත්තාගේ ගෙදරට ගොස් සිදුවෙන්නට යන භයානක විපත ගැන දැනුම් දීම දෛවෝපගත සිද්ධියක් ලෙසද ඔවුනට පෙනී ගොස් තිබිණ.

ඉගෙනීම කෙරෙහි කිසි සැලකිල්ලක් නොදැක්වුවද, මී හරකුන් සමග කල් ගෙවීමට ආශාවක් දැක්වුවද එදා ඔහු කළ සුවිශේෂී හපන්කම නිසා නොවේ නම්, අම්මත් අප්පච්චිත් අතර හටගත් බිහිසුණු අරගලය මැඩලීමෙහි ලා අක්කාත් මාත් ගත් වෙහෙස ගඟට කැපූ ඉණී බවට පත්වෙන්නට ඉඩ තිබිණැයිද ඔවුහු කීහ. එසේ වී නම් ඒ බිහිසුණු රාත්‍රියේ අම්මා ඝාතනය වීමටත් අප්පච්චි හිරේ හෝ එල්ලුම් ගස් යාමටත් ඉඩ තිබිණැයි ඔවුන්ගේ කතාබහට කන් දීමෙන් මට තේරුම් ගත හැකි විය.

රිදී රේඛා ඇත්තේ කළු වලාකුළු මත පමණක් නොවන බව මට වැටහුණේ එදා සිදු වූ බිහිසුණු සිද්ධියෙන් බොහෝ කලකට පසුය. විදුලි කෙටිලි, අකුණු ගැහැලි, මහ වැසි, සැඩ සුළඟ, දැඩි සීතල හා ඝණ කළුවර රිදී රේඛා රැඳී ඇති තවත් තැන් යැයි මට සිතිණ.

උක්කුං මාමා, ලොකු මාමා, මුත්තා සහ අප්පච්චි ඇතුළු අසල්වැසි කීපදෙනෙකු විසින් ඉන් දින දෙක තුනකට පසු එළඹි වැසි තුරල් කළ දිනයේ අපේ අබලන් පැල්පත ප්‍රතිසංස්තරණය කරනු ලැබීම පසු කලෙක එසේ සිතන්නට මට අනුබල දුන්නා විය හැකිය.

වැහි අඳුර යන්තමින් පැවති එදා උදෑසනම ඔවුහු දිරාපත් ඉළුක් හා පරාල ඉවත් කොට නව ලී දඬු හා පිදුරුවලින් වහලය සැකසූහ. ගරා වැටෙමින් පැවති බිත්ති ප්‍රතිසංස්කරණය කළහ. අම්මාත්, නැන්දාත් සමග එක් වූ කාන්තාවෝ කීප දෙනෙක් ඔවුනට උදව් කළහ. වහලේ වැඩ අවසන් කළ සැටියේම ඔවුහු ගෙබිමද පිරිබඩ කළහ. කඩින් කඩ පැවති මඳ වැසි නොතකා උදේ සිට ඇඳිරි වැටෙන තෙක් ඔවුන් එක සීරුවට වැඩ කළ සැටි මට අදත් මැනවින් සිහිපත් කළ හැක. ඒ අයුරින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකෙළේ නම් ඒ වැසි කාලය තුළ නිසැකවම ගෙය ඇද වැටී අප මහත් අසීරු තත්ත්වයකට පත්වීමට ඉඩ තිබිණ.

ගෙය ප්‍රතිසංස්කරණය වුවද අපේ ජීවිතවල කිසි ප්‍රතිසංස්කරණයක් සිදු නොවීය. වැස්ස නිසා ලී ඉරන්නට නොහැකි වූ ඇතැම් දවසක අප්පච්චි බූරුවා ගැසීම සඳහා මුදල් සොයා ගත්තේ අම්මා විසින් දුකසේ වවාගත් මඤ්ඤොක්කා පඳුරු කීපයක් හාරා විකිණීමෙනි. නැතහොත් බතල පාත්තියක් හාරා විකිණීමෙනි. අම්මා කොතෙක් කෑ ගසා එපා යැයි කීවත් ඔහු ඊට කන්දුන් බවක් නොපෙනිණ.

"කෑ නොගහා ඉඳහන් ගෑනියේ. මං හවහට උඹට සල්ලි ගෙනත් දෙන්නම්..." යි ඔහු කියයි. ඇතැම් දිනෙක ඔහු අම්මා අතට කිසියම් මුදලක් දෙයි. වැඩිපුර මුදලක් දුන් දවසක "මං ඕව හිටෙව්වෙ මේ පොඩි උන්ගෙ සුදහ ගින්න නිවන්ට මිසක්කා විකුණන්ට නෙමෙයි..." යනුවෙන් පැවසීම අම්මාගේ පුරුද්දය. රුපියලක් හමාරක් දුන් දිනෙක ඇය කෑ ගසන්නේ "එතන රුපියල් තුනක විතර අල තිබුණා. උඹ මේකත් තියාගනින්..." යි කියමිනි. එසේ කීවත් ඒ මුදල අප්පච්චිට දුන් දවසක් ගැන මට සිහිපත් කළ නොහැක. සතයක්වත් නොදුන් දිනයක නම් ඇය අප්පච්චිට බැණ වදින්නේ "අනේ අම්මප උඹ මේ කොල්ලෝ බඩගින්නෙ මරන්නද බං හදන්නේ..." යි කෑගසමිනි. එවිට ඇගේ කටහඬ ලුණුගල කඳුවැටියේ හැපී දෝංකාරය දෙන්නා සේ මට ඇසේ. එවන් අවස්ථාවල අර බිහිසුණු අරගලයද මගේ සිහියට නගී. එවිට මුළු සිරුරම හිරි වැටීගෙන යන්නා සේද දැනේ.

"ඔය ඇති අම්මේ..." යි මම මගේ දුබලකම යටපත් කරන්නට උත්සාහ කරන්නෙකු මෙන් කෑ ගසමි.

"උඹ ඔහොම කෑ ගහනකොට මං කොහොමද පාඩම් කරන්නෙ...?" මා එසේ ප්‍රශ්න කළ පළමු දිනයේ ඇය පුදුමයෙන් මෙන් මා දෙස බැලූ සැටි අදත් මට මැවී පෙනෙන අවස්ථා ඇත. එදා අප්පච්චි මා දෙස මඳ වේලාවක් බලාගෙන සිට අඳුරේ මිදුලට බැස නොපෙනී ගිය සැටිද මට මැනවින් සිහිපත් කළ හැක.

මාසයකට වැඩි කාලයක් තිස්සේ ඇද හැලුණ වැස්ස නිසා ගමේ හැම දෙනාගේම ජීවිත බිඳ වැටී තිබිණ. එක පැත්තකින් වැස්සෙන් විනාශ වූ කුඹුරුය. ඇතැම් ලියද්දක් වතුරට ගසාගෙන ගොස් තිබුණේ එහි මායිම්වත් සොයාගත නොහැකි වන අයුරිනි.

මිනිසුන්ගේ කුසගින්න නිවූ කොස් ගස් හා දෙල් ගස් කීපයක් බිම පතිත වී තිබුණේ අවට ඇති වගාවන්ද පාළු කරමිනි. අතිවිශාල විනාශයක් සිදුවී තිබුණේ ඇල්ටැබ් තේ වත්තටය. එහි ලැයිම්වල ජීවත් වූ දෙමළ මිනිසුන් හත් අටදෙනෙකුද නාය යාම්වලට අසු වී මියගොස් තිබිණ. තේ ෆැක්ටේරියේ වහල උස්සා පොළොවේ ගසා ඇති සැටියක් පෙනෙති යැයි ගමේ මිනිස්සු කීහ. තාර පාර අයිනේ ඇතැම් තැනක ඉදිකළ ගල්වැටි කැඩී බිඳී පාර පුරා සී සී කඩ විසිරී ඇති සැටි අප දුටුවේ පාසලට යන එන විටය.

කුඹුරෙන් වී නොලැබිණ. වගා කළ බව බෝගවලින් කිසි පලක් නොවීය. තේ වත්තේ වැඩ කළ මිනිසුන්ගේත් ගැහැනුන්ගේත් ආදායම් මාර්ග බිඳ වැටී තිබිණ. බොහෝ දෙනෙකුට දවසට ගත හැකි වූයේ එක ආහාර වේලකි. ඒකත් බජරිවලට හෝ කම්බුවලට සීමා විය. පිදුරු කෑම ඊට වඩා පහසු යැයි මට සිතුණ වාර කොතරම්ද? අපේ දිව්‍ය භෝජනය වූයේ කොස්ය. දෙල්ය. රොටීය. අල බතලය. එහෙත් ඒවා ලැබුණේ කලාතුරකිනි. එහෙන් මෙහෙන් කඩාගෙන එන තේ දලු කුඩා කැබලිවලට කපා දුමේ තබා වේලීමෙන් පසු සාදන තේ වතුර අම්මා අපට බොන්නට දුන්නාය. ලෙඩ රෝග වසංගතවලින් කිසි අඩුවක් නොවීය. බොහෝ දෙනෙකු පාචනයෙන් පෙළිණ. මල්ලිත් නංගිත් ඊට ගොදුරු වූහ. පස්සර රෝහලට ඔවුන් ගෙන යෑමට වත්කමක්වත් පුළුවන්කමක්වත් නැති අම්මා ගමේ වෙදරාළ ළඟට ගියාය. අප්පච්චි කෙළේ පහසුවෙන් සොයාගත හැකි ගස්වල සහ පැලෑටිවල මුල්, පොතු, කොළ, දලු හා ඇට ගෙනවුත් දීමය. ඔහු සිටියේද තෝන්තුවාවෙන් මෙනි. ලී ඉරීම නැවතී තිබීමත් බූරුවා පොළට කිසිවෙකු නොපැමිණීමත් ඊට හේතු වූවා විය හැකිය. ආරච්චිලා සමග ගෙයින් ගෙට ගිය සැන්ටිපෝට් මහත්තයා පැවසුවේ සෑම ගෙදරකටම වැසිකිළියක් සාදාගන්නා ලෙසය.

"මුන්ට පිස්සු.... ඕවා හදාගන්ට සල්ලි තියෙනවා නම් මං මේ කොල්ලයි කෙල්ලයි පස්සර ඉස්පිරිතාලෙට එක්කගෙන යනවා..." යි ඔවුන් අපේ ගෙදරට අවුත් ගිය දවසේ අම්මා පොඩිමැණිකේ නැන්දා සමග කීවාය.

පාචනය හැදුණ ගමේ තුන් හතර දෙනෙක්ම මිය ගියහ. මුත්තා බේරුණේ අනූ නවයෙනි. නංගීත් මල්ලිත් සුව අතට හැරුණේ ගලේ ගැසුවත් මරන්නට බැරි නිසා විය හැක. එහෙත් ඔවුන් පෙනුණේ ඇටසැකිලි විදියටය. වැස්ස අවසන් වූයේ දන්න කියන සියලුදෙනාම අන්ත අසරණ තත්ත්වයට පත් කරමිනි. ඉහවහා ගිය ඒ අසරණකම ටිකෙන් ටික මග හැරී යන්නට පටන් ගත්තේ තේ වත්තේ වැඩ පටන් ගත් පසුය. එහි බොහෝ වැඩ තිබිණ. ගල්වැටි බැඳීම, කාණු කැපීම, සොරඬි ගෑම, තේ දලු නෙලීම, ලැයිම් කාමර ගොඩ නැගීම, තේ ෆැක්ටරිය ප්‍රතිසංස්කරණය කිරීම ඒ වැඩ අතර ප්‍රමුඛත්වය ගෙන තිබිණ.

අම්මා ජීවිතයේ පළමු වරට තේ වත්තේ වැඩට ගියාය. සොරඬි ගෑම, ගල්වැටි බැඳීම හා කාණු කපන පිරිමින්ට සහාය වීම, ලැයිම් කාමර හා ෆැක්ටරිය හදන මිනිසුන්ට අත්උදව් කාරියක වීම වැනි කවර කාරියක් වුවද ඇය අත් නොහළාය.

මල්ලිත් මමත් පාසල් ගියෙමු. අක්කා නංගීත් බලාගෙන ගෙදරට වී උන්නාය. අප්පච්චි සිය සුපුරුදු ජීවිතයට අවතීරණ වී තිබිණ. පාසල ඇරී ගෙදර එන මම තියන දෙයක් කා අම්මා වැඩ කරන තැනට යමි. ඇයට උදව් කරමි. අම්මාත් මාත් කෙරෙහි අනුකම්පා කරන මල්රම්බන් කන්කානි පඩි ගෙවන විට වැඩිපුර රුපියලක් අම්මා අතට දෙයි. ඒ මුදල දෙන ගමන් "නී ඉදින් එඩිංග. පොඩියනුන් වේලසෙන්ඩ්‍ර තානේ" යි, ඔහු දෙමළෙන් කියයි. 'ඉඳා මේකත් තියාගනින්. පොඩි එකාත් වැඩ කළානේ...' අම්මා එහි තේරුම සිංහලයට නගා කියා දුන්නාය.

"මලරම්බන් කන්කානිට මිනිස්සුන්ගේ දුක තේරෙනවා. ඒකට කොන්දොස්තරයා. ඌ දන්නෙ වැඩ කරන මිනිස්සුන්ටයි ගෑනුන්ටයි බැණ බැණ ඇවිදින්න විතරයි" අම්මා තමන් ලත් පළමු පඩි මුදල හැට්ටය අස්සේ රුවාගෙන එමින් සිටියදී පොඩිමැණිකේ නැන්දාය කීවාය.

"ඌ මහ වලා...." ඇය පහත් හඬින් කියනු මට ඇසිණ.

"උඹ අලුත් එකියක් හින්දා ටිකක් පරිස්සම් වෙයන්. පොත්ත ටිකක් රතු උන් ඌට පෙන්නන්ට බෑ..." අම්මා ඇය දෙස නෙත් මහත් කොට බැලුවා මිස කිසිවක් නොකීවාය. ඇය කීවේ කුමක්දැයි මට හරිහැටි නොවැටහිණ. කොන්දොස්තර වත්තේ එහා මෙහා යන විට අම්මා දුටුවහොත් ඇයටත් බැණ වදිනු ඇතැයි මම ඉන් තේරුම් ගතිමි.

අම්මා ගමේ සෙසු අය සමග දෙසතියකට වරක් සුපුරුදු ලෙස පස්සර ඉරිදා පොළට යයි. අලෙවි කළ හැකි පුවක්, කෝපි, ගම්මිරිස්, අල, බතල ආදිය ඇය සතුව ඇත්තේ සුළු ප්‍රමාණයකි. වත්ත පිටියේ ඇවිදිමින් අක්කා විසින් අහුලා ගනු ලැබූ පුවක් ගෙඩි හාර පන්සීයකට හා ගෙවත්තේ කඩා වේලාගත් කෝපි සහ ගම්මිරිස් කිලෝ හත අටකට අපේ වෙළඳ භාණ්ඩ සීමා වූ අවස්ථා කොතෙකුත් තිබිණ. ඒවා අලෙවි කිරීමෙන් ලැබෙන මුදලත්, දෙසතියකට වරක් ලැබෙන තේ වත්තේ



32 වන පිටුව බලන්න

# එයා හරි අපූරු...

31 වන පිටුවෙන්

පඩි මුදලත් වැය කර ඇය වැඩිපුර ගත්තේ ගෙදරට අවශ්‍ය කෑම බීමය. ලුණු, දුරු, මිරිස්, පිටි, කරවල ආදිය ඉන් ප්‍රධාන තැනක් ගත් බව මට මතකය. නිදාගන්නට අවශ්‍ය පැදුරු පහසුවෙන් ගත හැකි වුවද අඳින්නට හා පොරවන්නට අවශ්‍ය රෙදි ගැනීම අතිශය දුෂ්කර කාරියක් විය. සීනි, තේ කොළ වැනි දේ ගමේ සමුපකාරයේ ඇතත් එහි රෙදි විකුණන්නේ කූපන්වලටය. ඒකත් සීමාසහිත ප්‍රමාණයකිනි. ඒ ප්‍රමාණය වුවද මිල දී ගැනීම ලේසි පහසු නොවීය.

"රෙදි අඳින්ට හම්බවෙන්නෙ නෑ බං. රෙදි නැව් දෙකක් මුහුදේ ගිල්වලාලු..." යි සමුපෙ මැනේජර් මහතා කියා ඇත. මුහුදවත්, නැව්වත් දැක නැති ගමේ මිනිස්සු ඒ කතාව අසා නිහඬ වෙති. ඒ නිසා රෙදි කෑල්ලක් ගැනීම පිණිස නාකි මරක්කල වෙළෙන්ඳාට පින්සෙන්ඩු වීමට අම්මාට සිදුවිය.

අප හැර නොයන අගහිඟකම් මැද වුවද එක්තරා විදියක සහනසීලී ගතියක් ගෙතුළ ගොඩ නැගෙමින් තිබිණ. ඊට රුපියලකින් නමුත් දායක වෙන්නට ලැබීම ගැන මම බෙහෙවින් සතුටට පත් වීමි. අප්පච්චි බූරුවා ගැහිල්ලට නාස්ති කරන මුදල් ගෙදර අවශ්‍යතාවන් සඳහා වැය කළේ නම්, පාසල ඇරී ගෙදර අවුත් ඒ පිම්මටම තේ වත්තට දුවගෙන යෑම නවතා ඒ කාලය පොතක පතක වැඩක් කර ගැනීමට යොදවන්නට මට පුළුවන්කම තිබිණ. එහෙත් මම පින් මඳ පුතෙක් වීමි. ඒ පින නැතත් ඉගෙනීමේ ආශාව දිනෙන් දින දලු ලමින් තිබිණ. මම භූමිතෙල් කුප්පිය ළඟින් තියාගෙන පාසලේදී දෙන අභ්‍යාස කළෙමි. පොත් පාඩම් කළෙමි. ගමේ ළමයින් සමග එකතු වී ගස් නගිමින්, ගඩා ගෙඩි කමින් සෙල්ලම් කිරීමට මට ඉඩකඩ ලැබුණේ කලාතුරකිනි. මල්ලී ඒ අඩුව පුරවන්නට තැත් කරන්නෙකු මෙන් කල් ගෙවීය.

එදින අපේ පන්තිය බාර ගුරු මහතා පැමිණ සිටියේ නැත. ලොකු මහත්තයා කළුලෑල්ලේ ගණන් දහයක් දැමීය.

"කෑ කෝ ගහන්නෙ නෑ... මේ ගණන් දහය හදල තියන්න ඕනෑ. මං පැය බාගයකින් එනවා බලන්න...." ගණන් දහය කළුලෑල්ලේ දැමීමෙන් පසු ලොකු මහත්තයා කීවේ පන්තිය පුරා විසිරී යන බැල්මක් හෙලමිනි. ඉන්පසු ඔහු පස්වෙනි පන්තිය වෙත ගියේය.

ලොකු මහත්තයා විසින් පවරනු ලැබූ වැඩක් නිසා සියලුම ළමයින් වඩාත් සැලකිලිමත් ලෙස ගණන් සෑදීමෙහි නිරතවෙන බවක් පෙනිණ. ඒ ගණන් කිසිසේත් මට අමාරු ඒවා නොවීය. මම විනාඩි පහළොවක පමණ කාලය තුළදී ගණන් දහයම සාදා නිම කළෙමි. සෑදූ ගණනක් හරිද වැරදිදැයි මා බලන්නේ කලාතුරකිනි. එහෙත් එදා ගණන් සෑදීමෙන් පසු ඒවා හරිද වැරදිදැයි බලන්නට මම අමතක නොකෙළෙමි. 'මගේ ගණන් ඔක්කොම හරි' මම සිතින් කීවේ මහත් ආඩම්බරයෙනි.

"අප්පුහාමි හොඳයි. ඔක්කොම ගණන් හරි..." ලොකු මහත්තයා සතුටින් කියන සැටි මට ඇසෙන්නා සේ විය. පස්වෙනි පන්තියේ උගන්වන ඔහු දෙස මම කීප වරක්ම බැලිමි. ඔහු දෙවරක් මා දෙස ඕනෑකමින් බලාගෙන සිටියේ අනිත් ළමයින් ගණන් සාදද්දී මා වටපිට බලමින් සිටි නිසා විය යුතු යැයි මට සිතිණ. ගල්ලෑල්ල වහා පසෙකින් තැබූ මම කියවීම් පොත ගෙන පාඩමක් කියවන්නට වීමි.

"අප්පුහාමි ගණන් හැදුවද?" මට පිටුපසින් ඉඳගෙන සිටි හේමලතා රහසෙන් මෙන් ඇසුවාය. මම හැරී බැලීමි.

"අප්පුහාමි ගණන් හැදුවද?"

"ඔව්..."

"මට ගල්ලෑල දෙන්න..."

හේමලතා ගල්ලෑල්ල ඉල්ලන්නේ 'කොප්පෙ' ගසන්නට බව මම තේරුම් ගතිමි. කොපි කිරීමත්, ඊට අනුබල දීමත් වරදක් බවද මම දැන සිටියෙමි. එහෙත් ඇයට ගල්ලෑල්ල නොදී සිටින්නට මට පුළුවන්කමක් නොවීය. ඇය ලොකු මහත්තයාගේ දියණිය වූවාය. මම හේමලතාට ගල්ලෑල්ල දී නිහඬව පාඩම කියවන්නට පටන් ගතිමි. මට ගල්ලෑල ලැබුණේ ලොකු මහත්තයා පහේ පන්තියෙන් පිට වූ කෙණෙහිමය. ඔහු ආවේ බිම බලාගෙනය. වේවැලද ඔහුගේ අතෙහි විය. මගේ පපුව ගිඩි ගිඩි ගා ගැහෙන්නට පටන් ගැනිණ.

"ගල්ලෑල්ල දෙනවාත් ගන්නවාත් දකින්ට ඇති..." මගේ සිත කෑගසන්නට විය.

ඔහු පන්තියට පිවිසෙත්ම අපි නැගී සිටියෙමු. පන්තිය පුරා සුපුරුදු විමසුම් බැල්ම හෙලූ ඔහු "ළමයි ගණන් හැදුවදැ" යි ඇසීය.

"එහෙමයි" පන්තියෙන් හඬ නැගිණ. ඒ වදන මගෙන් හරිහැටි පිටවිණැයි මට කිව නොහැක. මගේ තොලකට වේලී ගොස් ඇති සැටියක් මට දැනිණ.

"ඉඳගන්නවා..." යි කියමින් ගුරු පුටුව මත වාඩි වූ ඔහු කෙළින්ම මා දෙස බැලීය.

ලබන කලාපයෙන් තවත් කොටසක්











# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2016 අගෝස්තු 01 දින සිට අගෝස්තු 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි, කුජ සමග යෝග වී 10 වැන්නේ ගමන් කරයි. ආදායම අතින් යහපත්ය. රැකියා තනතුරු උසස්වීම් ලැබීමේ වාසනාව සහිතයි. ඉඩකඩම් මිල දී ගැනීමේ භාග්‍යය වාසනාව ඇත. මංගල යෝග සහිතයි. තම සිතට අනුව වැඩ කරයි. වේගවත් සිතිවිලි ඇති වේ. දරුවන්ට ශුභයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 6 වැන්නේ ගමන් කරයි. තම මතයට අනුව වැඩ කිරීමට සිත් දෙන කාලයකි. පිරිස් බලය ඇත. රැකියාවේ වෙනසක් පදිංචියේ වෙනසක් ඇතිවිය හැක. මිතුරු මිතුරියන්ගේ උදව් උපකාර ලැබේ. අධ්‍යාපනයට ශුභයි. ආදායම් මාර්ග සරු වේ.

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 8 වැන්නේ ශනි සමග යෝග වී ගමන් කරයි. කුජ ස්වක්ෂේත්‍රව ගමන් කරන අතර ශනි සතුරුව එහි ගමන් කරයි. සඳුත් 8 වැන්නේ නම් බාධක, කරදර, අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් කල්පනාකාරී වන්න. උසස් තනතුරු ලැබීමේ භාග්‍යය ඇත. ඉගෙනුමට හොඳයි. ආදායම් මාර්ග සුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 7 වැන්නේ ගමන් කරයි. ගේ දොර වාසස්ථාන ලබා ගැනීමට වාසනාව ඇත. රැකි රක්ෂා කටයුතුවල දියුණුව සැලසේ. අධ්‍යාන කටයුතුවලට ශුභයි. ක්‍රියා ශූරත්වය ඇති වේ. පිරිස් බලය ලැබේ. ධන ලාභ ඇත.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 3 වැන්නේ ගමන් කරන අතර 19 වැනි දින 4 වැන්නට පැමිණීම ශුභ දායකයි. ඉගෙනීමේ කටයුතු වඩාත් සාර්ථකව සිදුවේ. සතුරු බාධක අඩු වේ. රැකියා කටයුතු දියුණු වේ. ස්ථාන මාරු ඇති වීමට පුළුවන. යාන වාහන ඉඩකඩම් ලබා ගැනීමට භාග්‍යය ඇත.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. ආදායම් තත්ත්වය යහපත් වේ. රැකියා ස්ථාන මාරු සහ පදිංචිය වෙනස් විය හැක. හවුල් ව්‍යාපාරවලින් ලාභ ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි.



### කටක ලග්නය

ලග්නාධිපති සඳු 12 වැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. රැකියා කටයුතු දියුණු වේ. රැකියා අපේක්ෂිත අයටද ශුභඵල උදා කෙරේ. අළුතින් රැකියා ව්‍යාපාර ආරම්භ කිරීමට ශුභ කාලයකි. වෙළඳ ව්‍යාපාරවල නිරත අයටද වාසි සැලසේ. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 9 වැන්නේ ගමන් කිරීම ශුභයි. ආදායම් මාර්ග යහපත් වේ. ව්‍යාපාර හා රැකියා කටයුතුවල දියුණුව ඇතිවන අතර රාජ්‍ය අංශයේ රැකියා ලබා ගැනීමේ අවස්ථාව සැලසේ. ගේ දොර ඉඩකඩම් මිල දී ගැනීමේ හැකියාවද පවතී. පිනට දහමට යොමුවන කාලයකි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 12 වැන්නේ ගමන් කරන අතර මේ මාසයේ 16 වෙනිදායින් පසු ලග්න ගත වේ. බුධ ග්‍රහයාද දෙවැන්නට පැමිණීම ශුභයි. රැකි රක්ෂා කටයුතු හා ව්‍යාපාර කටයුතු දියුණු වේ. ගමන් බිමන් අධිකව යෙදෙන කාලයකි. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව පවතී. වචනය බලවත් වේ. ධන ලාභ ඇත. ඉගෙනීමේ කටයුතු සාර්ථක වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ ලග්නයේ ගමන් කරයි. ශනි කුජ සමග යෝග වී පවතී. තම මතයට අනුව වැඩ කිරීමට සිත් දේ. වාද විවාදවලට දක්ෂතාවක් ඇති වේ. ඉක්මන් තීරණ ගනී. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. උසස් තනතුරු ලැබේ. දියුණුව ශුභයි. ආදායම් මාර්ග සරු වේ. ලග්නයේ ශනි, කුජ ගමන් කරන නිසා අනතුරුවලින් ප්‍රවේසම් විය යුතුයි.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 11 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. කීර්ති ප්‍රශංසා ලැබේ. රැකියා ව්‍යාපාර කටයුතු දියුණුව සැලසේ. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාවක් පවතී. හදිසි ධන ලාභ ඇත. දියුණුවට ශුභ කාලයකි.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ අගෝස්තු 19 වෙනි දින ලග්නයට පැමිණීම ශුභයි. සතුරු බලවේග අඩු වේ. බුද්ධිමත්ව කටයුතු කරයි. මිතුරු මිතුරියන්ගේ උදව් උපකාර ලබාගත හැකි කාලයකි. ඉගෙනීමට ශුභයි. නොයෙක් දේ ඉගෙනීමට සිත් ඇති වේ. රැකියා දියුණුව ඇත. ආදායම් මාර්ග සරු වේ. එහෙත් වියදම අධික බව පෙනේ. පදිංචියේ වෙනසක් විය හැක.




**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca



# නිධන් මිථ්‍යාව හා පුරාවිද්‍යාව

■ මහාචාර්ය
පත්මසිරි කන්නන්ගර

ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ දක්වා ඇති ආකාරයට ‘නිධන් යනු ආරක්ෂා කොට තැබූ ධනය’ වේ. මේ අනුව නිධානයක් පැවතීමට නම් අතීතයේ කිසියම් කලෙක රන්, රිදී, මුතු, මැණික් වැනි කල් පවත්නා ධනයක් කිසියම් පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් යම් කිසි ස්ථානයක සුරක්ෂිත ලෙස තැන්පත් කොට තිබිය යුතුය. වර්තමානයේ නිධන් සොයා බොහෝ දෙනා, අපේ අතීත මුතුන් මිත්තන් අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා ධනය තැන්පත් කොට ඇතැයි වැරදි ලෙස සිතන නමුත් මෙරට අතීත ශිෂ්ටාචාරයේ වගතුග හෙළිකරන ශිලා ලේඛනයක, අභිලේඛනයක හෝ සාහිත්‍ය පොතපතකවත් එසේ නිධන් වශයෙන් ධනය තැන්පත් කිරීමේ සිරිතක් පැවති බවක් කිසිම විටෙක කියා නැත. ලිඛිත සාක්ෂි මඟින් හෙළි නොවන අතීත සංස්කෘතිය පිළිබඳ බොහෝ කරුණු පුරාවිද්‍යා කැණීම් මඟින් අනාවරණය කර ගත හැකි වේ. දැනට ශතවර්ෂයකට වැඩි කාලයක් තිස්සේ ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කැණීම් සිදුකොට ඇති අතර දස දහස් සංඛ්‍යාත එකී කැණීමකින් හෝ නිධන් වශයෙන් තැන්පත් කළ ධනයක් සොයා ගෙන නැත.

පුරාවිද්‍යා බිමක හෝ කිසියම් ස්මාරකයක් තුළ නිධන් තැන්පත්කොට තිබේ නම් පැය කිහිපයක් තුළ හදිසියේ එක් ස්ථානයක් හාරා අඳුරේ අතපත ගාන නිධන් සොරකුට වඩා මාස ගණනක් ඉතා විධිමත් ලෙස එකී ස්ථාන ආශ්‍රිතව කැණීම් කරන පුරාවිද්‍යාඥයන්ට එබඳු නිධන් හමුවිය යුතුය. පුරාවිද්‍යාඥයන්ට කැණීම්වලදී නිධන් හමුනොවනුයේ රන්, මුතු, රිදී, මැණික් වැනි වටිනා දේ නිධන් ලෙස තැන්පත් කිරීමේ සිරිතක් අතීතයේ මෙරට නොතිබූ බැවිනි. මේ අනුව ලංකාව තුළ නිධන් සෙවීම යනු මිරිඟුව පසු පස යනවා මෙන් මිථ්‍යාවකි. පුරාවිද්‍යා කැණීම්වලදී නිධන් හමු නොවූවත් පුරාවස්තු ලැබේ. එකී පුරාවස්තුවල වටිනාකම තීරණය වනුයේ ඒවා තනා ඇති ලෝහය, ඛණිජ වර්ගය හෝ වෙනත් අමුද්‍රව්‍යවල වටිනාකම අනුව නොව එම නිර්මාණවල ඇති සංස්කෘතික වැදගත්කම අනුවය.

නිධන් පිළිබඳ මෙරට පවතින මිත්‍යා විශ්වාස අද ඊයේ ඇතිවූවක් නොව දිගු කලක සිට සමාජගතව පවතින්නකි. මිථ්‍යා විශ්වාස වැඩි දියුණු වීමට බාහිර වශයෙන් ලැබෙන උත්තේජන නිසා නිධන් මිථ්‍යාවද වරින් වර තීව්රව වනු පෙනේ. එහෙත් නිධන් පිළිබඳ විශ්වාස කරන හැම දෙනාම නිධන් සොයා පුරාවස්තු විනාශ කිරීමට ඉදිරිපත් නොවන බවද සඳහන් කළ යුතුය. යම් යම් ස්ථානවල නිධන් ඇතැයි විශ්වාස කරන ඇතැම් පිරිස් එකී බිම්වල පවතින පුරාවිද්‍යා නටබුන් නිධන් සොරුන්ගෙන් රැක ගැනීමට පවා ඉදිරිපත් වන අවස්ථා කොතෙකුත් දක්නට ලැබේ. මේ නිසා රටේ අතීත උරුමය කියාපාන පුරාවස්තුවලට හානි සිදුකරනුයේ නිධන් මිථ්‍යාව වැළඳගත් සුළු පිරිසක් පමණි. මේ පිළිබඳව අවධානය යොමු කිරීමේදී නිධන් මිථ්‍යාව ඇතිවීමට බලපාන හේතු රැසක් හඳුනාගත හැකිය. එම එකිනෙක හේතු සැකවින් විමසා බලමු.

## රටේ ඉතිහාසය පිළිබඳ නොදැනුවත්කම

විෂයක් වශයෙන් ගෙන බලන විට ඉතිහාසය යනු පොතපත කියවීමේ රුචිය වැඩි දියුණු කරන යමෙකු දැනුම රැස් කිරීමට පොළඹවන විෂයකි. මෙසේ පොත්පත් කියවීම ගවේෂණය ආදිය මගින් දැනුම රැස්කිරීම නිසා ඉතිහාසය හදාරන්නෙකු තුළ නිරායාසයෙන් විචාර බුද්ධිය දියුණු වේ. විචාර බුද්ධිය දියුණු වූ අයෙක් ගැටලු නිසි පරිදි තේරුම් ගැනීමටත් නිර්මාණාත්මකව සිතීමටත් පෙළඹේ. ඉතිහාසය විෂය තුළ මෙබඳු ගුණාංග පවතින නමුත් 1972 සිට 1995 දක්වා මෙරට පාසල් පද්ධතිය තුළ ඉතිහාසය විෂයයක් වශයෙන් ඉගැන්වීම අතහැර දමා තිබිණි. එම කාල සීමාවේදී පාසල්වලින් පිට වූ පිරිස් දැන් වයස අවු 30-55 අතර කාලයේ පසුවෙති. මෙම අතරින් සැලකිය යුතු පිරිසකට ඉතිහාසය පිළිබඳ හොඳ අවබෝධයක් ලැබීමට ඉඩ නොලැබිණි. මේ නිසා රටේ පවතින ඓතිහාසික ස්මාරක, පුරාවිද්‍යා බිම්, පුරාවස්තු ආදිය ගැන ඔවුන්ට ප්‍රමාණවත් අවබෝධයක් නොමැති හෙයින් එම පිරිසෙන් කොටසක් පහසුවෙන් නිධන් මිථ්‍යාවට ගොදුරුවීම පුදුමයට කරුණක් නොවේ.

මෙසේ ඓතිහාසික ස්මාරක හා විවිධ පුරාවස්තු පිළිබඳ ඉතිහාසය සමඟ මුසු වූ දැක්මක් නැති පිරිස එම ස්මාරක තුළ වටිනා වස්තු තැන්පත් කොට ඇතැයි සිතති. එදා පාසල් පද්ධතියෙන් ඉතිහාස විෂය ඉවත්කිරීමේ ප්‍රතිඵල වශයෙන් විචාර බුද්ධිය හීන වූ සමාජයක් නිර්මාණය වී තිබේ.

## ගල්වල කොටා ඇති සලකුණු

ගල්වල කොටා ඇති ශිලා ලේඛන යනු පැරණි සන්නිවේදන මාධ්‍යයකි. අතීතයේ භික්ෂූන්ට ලෙන් පූජා කිරීම, විහාරස්ථානවලට ගම්බිම් පිදීම, ප්‍රභූවරුන්ගේ හා රජවරුන්ගේ කටයුතු මහජනතාවට දැනුම්දීම හා පොදු ජනතාව දැනගැනීමට අවශ්‍ය කරුණු ජනතාවට සන්නිවේදනය කිරීම පිණිස විවිධ කාල වකවානුවල ශිලා ලේඛන පිහිටවනු ලැබීය. එහෙත් මෙම සෙල් ලිපි නිධන් ලකුණු යැයි වරදවා සිතන ඇතැම්හු එම ලිපි සහිත ගල් පුපුරුවා හැර නිධන් සොයති. යම් කිසි ප්‍රදේශයක ඉතිහාසය ගොඩනැඟීමේදී හෝ ඓතිහාසික ස්ථානයක කාලවකවානු පිරික්සීමේදී අකුරු දෙක තුනක්වත් කියවා ගත හැකි ශිලා ලිපියක විශාල වැදගත්කමක් තිබේ. වැඩිමනත් විස්තර නොමැති අවස්ථාවක අකුරු අයත් කාලය තීරණය කරගැනීමෙන් නිර්මාණයේ කාලය පිළිබඳ හැඟීමක් ඇතිකර ගත හැකිවේ. එබඳු වැදගත් ලේඛන නිධන් මිථ්‍යාවෙන් වනසා දැමීම බරපතළ අපරාධයකි.

ලංකාවේ පැරණි ජනාවාස පැවති ඇතැම් පෙදෙස්වල කලාතුරකින් වුවද ගල්වල කොටා ඇති සලකුණු අද පවා දක්නට ලැබේ. ගල්වල පහසුවෙන් කෙටිය හැකි ඉර, හඳ, දුන්න, ඊතලය, ඇත් අඩිය, ගොන්කුරය, කඩුව, හක්ගෙඩිය, වටාපොත හා විවිධ සත්ව රූප ආදිය මෙසේ ගල්වල කොටා තිබෙනු දැකිය හැකිය. ඉතිහාසය පිළිබඳ අවබෝධයක් නැති පිරිස මේවා නිධන් ලකුණු ලෙස සලකා ගල්වලට විවිධ පුද පූජා පවත්වා නිධන් සොයති.

ගල්වල කොටා ඇති මෙබඳු සලකුණු මොනවාද යන්න මෙහිදී සලකා බැලීම වැදගත් වේ. ලංකාව වර්තමානයේ දිස්ත්‍රික්ක, මැතිවරණ කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාමසේවක වසම් වශයෙන් වෙන්කර ඇතිවා මෙන් අතීතයේදී විවිධ ප්‍රදේශවලට බෙදා දක්වා තිබිණි. ඒ අනුව අතීතයේ මේ දිවයින රට්ඨ, මණ්ඩල, කෝරළ, පත්තු, ග්‍රාම ආදි වශයෙන් විවිධ පරිපාලන ප්‍රදේශවලට වෙන්කර පාලන කටයුතු සංවිධානය කර තිබිණි. ඒ ඒ ප්‍රදේශ වෙන් කිරීමේදී සීමා දැක්වීමේදී ගල්වල විවිධ සලකුණු කොටනු ලැබීය. ඒවා කඩඉම් ලකුණු වශයෙන් හඳුන්වනු ලැබේ. ගල්වල කොටා ඇති ඉහත කී කඩඉම් සලකුණු ගැන කඩඉම් පොත්වල මෙන්ම ව්‍යවාහාරයේ පවතින කඩඉම් කවිවලද කොතෙකුත් සඳහන් වේ. ඇතැම් රජවරු විවිධ විහාරස්ථානවලට ගම් බිම් පූජා කිරීමේදී එම ගම්වල සීමා දැක්වෙන ලේඛන විශේෂයක් නිකුත් කළ අතර ඒවා ඉම්පත්රූ වශයෙන් හැඳින්වේ. ‘ඉම’ යනු සීමාව වන අතර ‘කඩඉම’ යනු සීමාව වෙන්කිරීම වේ. සීමාව වෙන් කිරීමට භාවිත කළ සලකුණු කඩ ඉම් සලකුණු ලෙස හැඳින්වේ.

අතීතයේ ඇතැම් ශිලා ලිපි පිහිටුවීමේදී අකුරුවලට අමතරව සංකේත හෝ සලකුණු ගල්වල කොටවා තිබේ. විවිධ විහාරස්ථානවලට හෝ පුද්ගලයන්ට ගම් බිම් ප්‍රදානය කිරීමේදී එකී දීමනා ඉර හඳ පවතිනා තාක් පවතීවා යන අදහසින් එම දීමනා ගැන කියවෙන ශිලා ලිපිවල ඉර, හඳ සලකුණුද කොටවනු ලැබීය. උදාහරණයක් වශයෙන් දැක්වුවහොත් ඎෂ වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ උඩරට කටයුතු භාරව සිටි ප්‍රාදේශීය පාලකයා වූ ජෝතිය සිටුවරයා විසින් කම්මල්කරුවකුට හා ඔහුගේ පුත්‍රයාට ඉඩමක් ප්‍රදානය කොට ශිලා ලිපියක් පිහිටුවන ලදී. එම දීමනාව ඉර, හඳ පවතින තාක් පවතීවා යන අදහසින් ඉර, හඳ ලකුණු එම ශිලා ලිපියේ කොටවා මෙය කම්මල්කරුවකුගේ ඉඩමක්ය යන අදහස දීම සඳහා මිටිය, කිණිහිරය හා කම්මල් අඬුවද එම ශිලා ලිපියේ කොටවා තිබේ. සත්‍ය තත්ත්වය එසේ තිබියදී ගල්වල කොටා ඇති විවිධ සලකුණු කඩා බිඳ දමමින් නිධන් සෙවීම යනු මහත් වූ මෝඩකමක් මිස අන් කිසිවක් නොවේ.

## නිධන් වදුල පිළිබඳ මිථ්‍යාව

නිධන් වදුල් යනු මෙතෙක් මුද්‍රණය නොවූ තවමත් පුස්කොළ පොත් වශයෙන් පවතින ග්‍රන්ථ විශේෂයකි. සාහිත්‍යයේදී ‘වදුල් පොත්’ වශයෙන් හඳුන්වන මෙකී පොත්වල නිධන් ගැන සඳහන් වන බැවින් ‘නිධන් වදුල්’ ලෙස ව්‍යවහාර වේ. මෙම පොත්වල භාෂා ලක්ෂණ දෙස බලන විට කෝට්ටේ රාජ්‍ය සමයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා කාලයේ මෙම කෘති රචනා කරන්නට ඇතැයි සිතේ. ඎෂ වන පරාක්‍රමබාහු රජුගෙන් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමය දක්වා මෙරට බුද්ධ ශාසනික පරිහානියක් පැවති අතර මෙම කාල පරිච්ඡේදයේදී ලාංකික සමාජය කෙරෙහි ඉන්දියානු බ්‍රාහ්මණ බලපෑම් වැඩි වැඩියෙන් දක්නට ලැබේ. මේ කාලයේ ඉන්දියාවේ සිට මෙරටට පැමිණ ලාංකික සමාජය සමඟ මිශ්‍ර වූ බ්‍රාහ්මණයෝ හා සිව තවුසෝ විවිධ මිථ්‍යා විශ්වාස හා අභිචාර විධි රට තුළ පතුරුවා හැරියහ. නිධන් වදුල් රචනා වූයේ මෙබඳු සමාජ පසුබිමක් පැවති අවධියකය. මෙසේ ලංකාවේ සමාජය සමඟ මිශ්‍ර වූ ඉන්දියානු බ්‍රාහ්මණයෝ හා සිව තවුසන් මෙරට සමාජ අවධානය තමන් කෙරෙහි යොමුකරවා ගැනීම පිණිස වදුල් පොත් ලිවීමේ කලාව යොදාගත් බව පෙනේ. වදුල් පොත්වල සඳහන් ‘රාමද්‍ර සී බ්‍රාහ්මණයාගේ වදුරු ලක්ෂණ ශාස්ත්‍රයයි’ ‘කාල නම් රුසිවරයා පැවසූ වදුරු ලක්ෂණ ශාස්ත්‍රයයි’, වැනි පාඨ දෙස බලන විට මෙම පොත් කෙරෙහි පැහැදිලිවම ඉන්දියානු ආභාසයක් තිබූ බව දැකිය හැකිය.

වදුලු පොත් ලියූ කාලය වන විට කඩඉම් පොත් ව්‍යවහාරයට පැමිණ තිබූ බැවින් වදුලු පොත් කතුවරු තම කෘති රචනා කිරීමේදී කඩඉම් පොත්වලින්ද තොරතුරු ලබා ගත්හ. මේ අනුව කඩඉම් පොත්වල දැක්වෙන පැරණි භූමි සීමා පෙන්වන ගල්වල කෙටූ සලකුණු වදුල් පොත් රචකයන් විසින් නිධන් ලකුණු ලෙස යොදා ගන්නා ලදී. මේ නිසා නිධන් වදුලක් බලා අදාළ ස්ථානය පිරික්සන විට කලාතුරකින් හෝ වදුලේ සඳහන් ගල්වල කෙටූ ලකුණු දැකිය හැකි බැවින් වදුලේ දැක්වෙන වස්තුව එකී ස්ථානවල නිධන් කොට ඇතැයි සමහරු වරදවා සිතති. එහෙත් සත්‍ය තත්ත්වය නම් කියා ඇති වස්තුව කිසිවක් එහි නොමැතිවීමයි. වදුල් කෘති ලියූ කතුවරු අවම වශයෙන් එකී ස්ථානවලට ගොස් සියැසින් ඒවා දැක බලාගෙනවත් මෙම පොත් නොලියූ බව ඇතැම් වදුල් කෘතිවල සඳහන් ස්ථාන පිරික්සන විට පෙනේ.

වදුල් කෘතිවල නිධන් තිබෙන බව දක්වා ඇති ස්ථානවල ඇතැම් විට බොහෝ වස්තුව ඇතැයි කියා තිබේ. රන් ඔටුනු, රන් කඩු, රන් පුහුල්, වරාගන්, මැණික් වර්ග වැනි වටිනා දේ මේ ස්ථානවල ඇතැයි එකී පොත්වල සඳහන් කොට ඒවා ලබා ගැනීමට බොහෝ පහසු ක්‍රම (ඇතැම් විට මන්ත්‍රත් සමග) දක්වා ඇති බැවින් කියවන්නා තුළ නිධන් සෙවීමේ කුතුහලය ඇතිකරවයි. මෙම කෘති ලියූ බ්‍රාහ්මණයන් ඇඟ වෙහෙසා මුදල් ඉපයීමට අකැමැති වූ පිරිස් බැවින් ගනුදෙනුකරුවන් තමන් වෙත අද්දවා ගැනීමට උපායක් වශයෙන් මෙබඳු අතිශයෝක්ති යොදාගෙන තිබේ.

එක් නිධන් වදුලක පැරණි පරිපාලන ප්‍රදේශයක ඒ ඒ ස්ථානවල තැන්පත්ව ඇතැයි දක්වා ඇති වස්තුව එකතු

44 වන පිටුව බලන්න



# මුරලී.... ඔබ අපේ.....!

■ චමරි අබේසිංහ

වසර කීපයකට පෙර ටෙස්ට් ක්‍රිකට් පිටියෙනුත් ජාත්‍යන්තර ක්‍රිකට් පිටියෙනුත් සමුගැනීමෙන් පස්සෙ මුරලි ගැන කවුරුන් හෝ කතා කළා නම් ඒ මොකක් හරි විවෘත කිරීමකට හෝ එවැනි ප්‍රජා කටයුත්තකට ඔහු සම්බන්ධ වීම ගැන විතරයි. ඒත් ඒ නිහැඬියාව බිඳ දමමින් පසුගිය දින කීපය පුරාම ලංකාවේ මාධ්‍යවල ප්‍රධාන කතාබස් අතරට මුරලි ආයෙත් එකතු වෙලා. ගල්, මල්, බැණුම්, සුභ පැතුම් පිරුණු ඒ කතාබහ ගැන අපිත් ටිකක් කතා කරමු.

## මුරලි ක්‍රිකට් විශිෂ්ටයන් අතරට

ශ්‍රී ලංකාවෙන් බිහි වූ අතිවිශිෂ්ටම දඟ පන්දු යවන්නා මුරලිදරන් යැයි කීවොත් ඒක වැඩි ආලවට්ටමක් නොවේ. මුරලිගේ මේ දක්ෂතාව අපේ අයට එතරම්ම ලොකුවට නොදැනුණත් ලෝකයා ඒ දෙස බලන්නේ අසාමාන්‍ය ගෞරවාදරයකින්. ඒ අනුව 'ලෝක ක්‍රිකට් විශිෂ්ටයන්ගේ නාමාවලියට' මුරලිගේ නමත් එකතු කිරීමට අන්තර්ජාතික ක්‍රිකට් සභාව තීරණයක් අරන් තියෙනවා. මේ විදියට අන්තර්ජාතික ක්‍රිකට් විශිෂ්ටයන්ගේ නාමාවලියට එක් වුණ පළමුවැනි ශ්‍රී ලාංකික ක්‍රීඩකයා මුත්තයියා මුරලිදරන්.

ලෝක ටෙස්ට් ක්‍රිකට් ඉතිහාසය වසර 139 ක් පරණයි. මේ ඉතිහාසය තුළ වැඩිම කඩුලු සංඛ්‍යාවක් දවාගත් පන්දු යවන්නාත් (කඩුලු 800 ක්) එක්දින අන්තර්ජාතික තරග ඉතිහාසයේ වැඩිම කඩුලු සංඛ්‍යාවක් දවාගත් පන්දු යවන්නාත් (කඩුලු 534 ක්) කියන ලෝක වාර්තා දෙකටම හිමිකාරිත්වය උසුලන්නෙ අපේ මුරලියි.

මුරලිව විශිෂ්ටයන්ගේ නාමාවලියට එකතු කිරීම ගැන සුභ පතමින් අන්තර්ජාතික ක්‍රිකට් සභාවේ ප්‍රධාන විධායක නිලධාරී ඩේවිඩ් රිචඩ්සන් මෙහෙම කියල තියෙනවා.

"මුරලිදරන් නූතන යුගයේ ක්‍රිකට් ක්‍රීඩාවේ බිහිවුණු විශිෂ්ටතමයෙක්. ඔහුගේ විශිෂ්ට පන්දු යැවීම නිසා ශ්‍රී ලංකාවට එක් දින සහ ටෙස්ට් යන අංශ දෙකෙන්ම ඉතාමත් හොඳ ශක්තිමක් කණ්ඩායමක් ගොඩ නගා ගැනීමට හැකිවුණා"

මුරලිව විශිෂ්ටයන් අතරට පත් කිරීම ගැන නිවේදනය අන්තර්ජාතික ක්‍රිකට් සභාව විසින් ජූලි 27 වෙනිදා ප්‍රකාශයට පත් කොට තිබුණා.

## කලකදි වහලු කලකදි රහ වෙනවාලු

මේ දවස්වල ඕස්ට්‍රේලියානු කණ්ඩායමත් ශ්‍රී ලංකා කණ්ඩායමත් සහභාගි වන ටෙස්ට් තරගාවලිය ශ්‍රී ලංකාවෙ පැවැත්වෙනවා. මෙහි ටෙස්ට් ක්‍රිකට් තරගාවලිය පැවැත්වෙන්නෙ වෝන්-මුරලි කුසලානය සඳහායි.

ඒ අව් අස්සෙ මුරලිට මහ ලොකු චෝදනාවකුත් එල්ල වෙලා. මුරලිව කුසලානයේ නමටත් දාල තියෙද්දි, ලංකාවට ගහන්න ආව ඕස්ට්‍රේලියානුවන්ට මුරලි පුහුණුව දෙනවා කියන එක තමයි මේ චෝදනාව. ඒ චෝදනාව කෙසේ වෙතත් කතාව නම් එක්තරා අන්දමකින් ඇත්ත. මොකද මේ තරගාවලිය පටන් ගන්න කලින් දවස් 10 ක් ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ දඟ පන්දු උපදේශකයා විදියට මුරලි කටයුතු කරල තියෙනවා.

මේ විදියට මුරලි ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ උපදේශකයෙක් වුණ එක ගැන සමහර අයට හොඳටම රිදිලා. ඒත් සමහර අය කියන්නෙ එහි කිසිම වරදක් නෑ කියලයි. පහුගිය දවස්වල එක එක අය ඒ ගැන කියල තිබුණ කතා මේ විදියයි.

මේ සිදුවීම ලංකාවෙ ක්‍රිකට් බලධාරීන් සෑහෙන්න විවේචනය කරල තිබුණා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයා ඒ ගැන මෙහෙම කියල තිබුණා. 'පුහුණුකරුවකු විදියට ඔහුගේ වෘත්තීයභාවය ගැන කිසිම ගැටලුවක් නෑ. ඒත් සදාචාරාත්මක ප්‍රශ්නයක් තියෙනවා. අපේ පැත්තෙන් බැලුවම මුරලි කළ දේ ගැන අපිට ලොකු හිතේ අමාරුවක් තියෙනවා'

හිටපු ක්‍රිකට් නායක අර්ජුන රණතුංග මුරලි කළ දේ ගැන කියල තිබුණෙ මේ විදියෙ කතාවක්. 'මම මුරලි නම් ඔය වැඩේ බාරගන්නෙ නෑ. ඒත් මුරලි ඒක බාරගත්තා. ඒක හරිද නැද්ද කියල පැති කීපයකින් බලන්න ඕන. කාලයක් ඔස්ට්‍රේලියාව අපිට හරියට කරදර කළා. මුරලි පන්දුව දමල ගහනවා කියල දොස් කිව්ව ඕස්ට්‍රේලියාවම අද මුරලිදරන් පුහුණුකරුවෙක් විදියට ගත්තා. මේකෙන් ඔප්පු වෙනවා එදා අපි මුරලිදරන් වෙනුවෙන් නගපු හඬ හරි කියලා. එක විදියකින් බැලුවොත් පුංචි කාලයකට හරි මේ වගේ කොන්ත්‍රාත්තුවක් අත්සන් කිරීම මුරලිදරන්ගේ ජයග්‍රහණයක්'. මුරලි ගැන මෙහෙම කිව්ව අර්ජුන ක්‍රිකට් ආයතනය ගැනත් මෙහෙම කියල තිබුණා. 'අපේ ක්‍රිකට් ආයතනයට ක්‍රිකට් දැනුම නෑ. දක්ෂ ක්‍රීඩකයින්ට අවස්ථාව ලබාදෙන්න ඒ අය කැමති නෑ'

මුරලිගෙ ක්‍රීඩා සගයින් මුරලිගෙ ඕස්ට්‍රේලියානු උපදේශකත්වය දකින්නෙ මේ විදියට.

මාවන් අතපත්තු ඒ ගැන කියල තිබුණෙ මෙහෙම කතාවක්. 'මුරලි පුහුණුකරුවෙක් විදියට කටයුතු කරනව නම් මුළු ලෝකයටම සේවය සැපයීමට ඔහු සූදානම් වෙන්න ඕන. එක කණ්ඩායමකට පමණක් සීමා වී මේ වෘත්තිය ඉදිරියට ගෙන යන්න ඔහුට බෑ. මෙහිදී ඔහු වරදක් කරල නෑ'

කුමාර් සංගක්කාර ට්විටර් පණිවිඩ කීපයකින්ම ඔහුගේ ක්‍රීඩා සගයා ගැන අදහස් පළ කරල තිබුණා. 'ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව නංවන්න පුහුණුකරුවකු විදියට එන්න කියල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඉල්ලීමක් කළා නම් මුත්තයියා මුරලිදරන් පැකිලීමක් නැතිවම ඊට එකඟ වේවි', 'ක්‍රිකට් ක්‍රීඩාවට දැඩි ඇල්මක් දක්වන්නෙක් නිසා මුරලි ඔහු දන්න දේ ගැන ඕනෑම කෙනෙකුට උපදෙස් දෙනවා', 'මුරලි ඕනම වෙලාවක රට වෙනුවෙන් පෙනී ඉන්න ලෑස්තියි. ඒත් ඒ සඳහා ඔහුගෙන් ඉල්ලීමක් කළ යුතුයි', 'ලංකාවේ ඕනම දඟ පන්දු යවන්නෙක් මුරලි ගාවට ඇවිල්ල ඒ ගැන උපදෙසක් ඇහුවොත් මුරලි උපරිම කාලය අරන් ඊට උපදෙස් දෙනවා', 'මුරලි ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙක්. තමන් කැමති ඕනෑම අයෙකුව පුහුණු කිරීමේ අයිතිය ඔහුට තියෙනවා' ඒ සියලුම අදහස් සංගක්කාරගේ ට්විටරයෙන්.

මේ සියල්ල දෙස නිහඬව බලා සිටි මුරලි අවසානයේ තමන්ට එල්ල කරන චෝදනා ගැන මෙහෙම කිව්වා. ඔහු මේ කතා ටික කියල තිබුණෙ මහනුවරදී මාධ්‍යවේදීන් පිරිසක් අමතමින්.

'ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එල්ල කරන චෝදනා මම ප්‍රතික්ෂේප කරනවා. ක්‍රිකට් සභාපතිතුමා ක්‍රිකට් ගැන දන්නෙ නෑ. මම රටට කළ සේවයෙන් සියයට 1 ක් වත් ක්‍රිකට් සභාපතිවරයා සිදුකරල නෑ'. 'තරගාවලිය පුරාම දඟ පන්දු පුහුණු කරු ලෙස වැඩ කරන්න ඕස්ට්‍රේලියානුවන්ගෙන් ඉල්ලීම් තිබියදීත් දින 10 ක කාලයකට පමණයි මම එය බාරගත්තෙ. ඒකත් කළේ මේ තරගාවලිය පටන් ගන්න කලින්. තරග කාලෙදි පුහුණු කිරීම් කරන්න මම බාරගත්තෙ නෑ. එසේ කළේ ශ්‍රී ලංකා කණ්ඩායම ප්‍රතිවිරුද්ධ කණ්ඩායම ලෙස ක්‍රීඩා කරද්දි මට එය කරන්න අපහසු නිසා', '99 දී ඕස්ට්‍රේලියාවෙන් එල්ල වුණු චෝදනාවෙදී මුළු ලංකාවේම මිනිස්සු මාත් එක්ක හිටියා. මට සහාය දුන්නා. ඒව මට අමතක නෑ. ඒ ඕස්ට්‍රේලියාවම අද පුහුණුකරුවෙක් විදියට මාව කැඳවන්නේ එදා ඔවුන් කළ වැරැද්ද පිළිගන්න නිසයි', 'නිශාන්ත රණතුංග ක්‍රිකට් ලේකම් විදියට ඉන්න කාලෙ පමණක් පුහුණුකරුවෙකු ලෙස සහාය දෙන්න කියල මගෙන් ඉල්ලුවා. මගේ සේවය මම එදා නොමිලේම ලබාදුන්නා. එයින් පස්සෙ කිසිම කෙනෙක් මට ඒ වගේ ආරාධනාවක් කළේ නෑ', 'මාවන් අතපත්තු, චමින්ද වාස්, උපුල් චන්දන, රුවන් කල්පගේ, චන්දික හතුරුසිංහ වගේ ක්‍රීඩකයින්ගෙන් අපේ අය ප්‍රයෝජනයක් ගත්තෙ නෑ. අද ඔවුන් විදෙස් රටවල පුහුණුකරුවන් විදියට වැඩ කරනවා', 'ලංකාවෙ දක්ෂයො සිටිද්දි විදේශ පුහුණුකරුවන් ගෙනල්ල ඩොලර්වලින් ගෙවන අය මට වැරදියි කියල චෝදනා කරනවා. ඔවුන් ඒ චෝදනා කණ්ණාඩියක් ඉස්සරහට ගොස් තමා දිහා බලාගෙන කරගත යුතුයි', 'මම දවස් 10 ක් පමණක් ඕස්ට්‍රේලියානු දඟ පන්දු යවන්නන් පුහුණු කළ පමණින් ඔවුන්ගේ කණ්ඩායම ජයග්‍රහණය කරන එකක් නෑ. එහෙම කරන්න පුළුවන් නම් මේ ලෝකයේ ඉන්න හොඳම පුහුණුකරුවා මම වේවි'

මේ විදියට ගොඩාක් දේවල් ගැන සඳහන් කළ මුරලි අවසානයේ කියූ දේ නම් හැමෝම හොඳින් ඇස් කන් ඇරල බලාගෙන අහගෙන සිතා බැලිය යුතු දෙයක්.

'මාව ඔච්චර වටිනවා නම් ශ්‍රී ලංකා කණ්ඩායමේ පුහුණුකරුවෙක් විදියට බඳවාගෙන සෑම තරගයකින්ම ශ්‍රී ලංකාව ජයග්‍රහණය කරගන්න හැකිවෙන්න ඕන. ඒකට ක්‍රියාත්මක වෙන්න ඕන. මේ චෝදනා හැම එකක්ම හිස් ප්‍රලාප පමණයි. මට චෝදනා කරන ක්‍රිකට් සභාපතිවරයා ක්‍රිකට්වලට අඩුම ගානෙ රටට කළ සේවය මොකක්ද කියල පෙන්වා දෙන්න ඕන. මම අවුරුදු 20 ක් රට වෙනුවෙන් ක්‍රීඩා කළා. 2000 අවුරුද්දෙ ඉඳල දුප්පත් අසරණ මිනිස්සු 1000 කට ගෙවල් හදල දුන්නා. 50,000 ක පිරිසකට වාර්ෂිකව සහන සලසනවා. දුෂ්කර පාසල් 45 ක ක්‍රීඩා පිටි සකසා දීල තියෙනවා. මේ සියල්ලම මා සාදාගත් ස්වේච්ඡා සංවිධානයක් හරහායි සිදුකරන්නෙ. මේ අය ඒ අයගෙන් සිද්ධවෙන වැරදි වහගන්න මාව ඉත්තෙක් කරගෙන. මේ චෝදනා ඔප්පු කර පෙන්විය යුතුයි'

මුරලි, හඬ මිස වැඩ නැති කයිවාරුකාරයින් අතර ඔබ සැබෑම වැඩකාරයෙක්. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ජාත්‍යන්තරය තුළ බැබළවූ ඔබ සැබවින්ම ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙක්. කවුරු කොහොම මොනවා කිව්වත් සෑමදාම ඔබ අපට අගෙයි. සෑමදාම ඔබ අපෙයි.

මුරලි ඔබට අපේ සුභ පැතුම්!

# ක්‍රිකට් ඉඩෝරයට පොද වැස්සක් !

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ගැන කාලයක් තිස්සේම අසන්නට දකින්නට ලැබුණෙ එතරම් හොඳ තොරතුරු නොවෙයි. ක්‍රිකට් ආයතනයේ හා ක්‍රිකට් තේරීම් කමිටුවේ තියෙන සීතල යුද්ධයත්, අපේ ක්‍රිකට් කණ්ඩායම් තරගවලින් පිට පිට පරාජයන් ලබා ගැනීමත් නිසා හැමෝටම ක්‍රිකට් එපාවෙන තත්ත්වයක් තමයි ඇතිවෙලා තිබුණෙ. ඒත් දිගටම තිබුණු ඒ ක්‍රිකට් ඉඩෝරය නිමා කරල ඓතිහාසික ජයග්‍රහණයක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පසුගියදා ලබා ගත්තා. ඒ සංචාරක ඔස්ට්‍රේලියානු කණ්ඩායම සමග පල්ලෙකැළේ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේ පැවති පළමු ටෙස්ට් තරඟය ලකුණු 106 කින් ජය ගැනීමත් සමගයි. මෙවර තරගය ජයග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රීඩකයින් ඕස්ට්‍රේලියානුවන්ට ලකුණු 268 ක ඉලක්කයක් ලබා දුන්නත් ඕස්ට්‍රේලියානුවන්ට තම ක්‍රීඩකයන් සියල්ල දැවී ගොස් ලබාගත හැකි වූයේ ලකුණු 161 ක් පමණයි.

ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියානුවන් සමග ක්‍රීඩා කර ජයගත් දෙවන ටෙස්ට් තරගය මෙයයි. පළමු ජයග්‍රහණය ලංකාව හිමිකරගෙන තියෙන්නෙ මීට වසර 17 කට කලින් 1999 දී අස්ගිරිය ක්‍රීඩා පිටියේදියි. මේ වෙනකොට ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර ටෙස්ට් ක්‍රිකට් ඉතිහාසයට අවුරුදු 33 ක්. අපේ රටවල් දෙක එකට ටෙස්ට් ක්‍රීඩා කිරීම පටන් ගත්තෙ 1983 දි. එදා සිට අද වන තෙක් තරග 27 ක් පවත්වලා තියෙනවා. ඒ අතරින් තරග 17 ක්ම ඕස්ට්‍රේලියාව ජයගත්තා. මේ සැරේ ලැබුණ ජයත් එක්ක තරග දෙකක් විතරයි ලංකාවට දිනාගන්න ලැබුණෙ. අනික් තරග ජය පරාජයෙන් තොරව ඉවර වෙලා තියෙනවා.

මේ සැරේ තිබුණු ටෙස්ට් තරගයේ වටිනාම ඉනිම සෙල්ලම් කළේ කුසල් මෙන්ඩිස්. තවමත් අවුරුදු 21 ක පුංචි කොලු ගැටයෙක් වුණත් කුසල් මෙන්ඩිස් මේ තරගයේදී දක්වපු දක්ෂතා නම් සුළුපටු නෑ. අත්දැකීම් බහුල ක්‍රීඩකයෙක් විදියට තමයි ඔහු සෙල්ලම් කළේ. ඒ දක්ෂකම නිසාම ක්‍රිකට් වාර්තා පොතට අලුත් පිටු තුනක් එකතු කිරීමටත් ඔහුට පුළුවන් වුණා. මංගල ශතකය වාර්තා කරමින් අඩුම වයසකින් ඕස්ට්‍රේලියාවට එරෙහිව ශතකයක් ලබාගත් ක්‍රීඩකයා, ශ්‍රී ලංකාව වෙනුවෙන් වේගවත්ම ශතකය වාර්තා කළ තෙවන ක්‍රීඩකයා, ඕස්ට්‍රේලියාව සමග සහභාගි වූ පළමු තරගයෙන්ම ශතකයක් ලබාගත් තෙවන ශ්‍රී ලාංකික ක්‍රීඩකයා විදියට තමයි කුසල් ක්‍රිකට් වාර්තා පොත අලුත් කළේ. මේ තරඟයේදී නොදැවී ලකුණු 169 ක් ලබා ගත්ත කුසල් තරගයේ වීරයා බවටත් පත් වුණා.

කුසල් මේ ජයග්‍රහණය ලබාගත්තෙ ජූනි 29 වනදාකයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයට ජූනි 29 කියන්නෙ හරිම සුවිශේෂී දිනයක්. හරියටම මීට අවුරුදු 10 කට කලින් ජූනි 29 වනදාක තමයි ක්‍රිකට් ලෝකයේ ඉහළම පිතිකරණ සබඳතාව සහිත ක්‍රිකට් වාර්තාව ශ්‍රී ලංකාවෙන් බිහි වුණේ. ඒක පිහිටෙව්වෙ ශ්‍රී ලංකාවේ සුපිරි පිතිකරු කුමාර් සංගක්කාර හා මහේල ජයවර්ධන. එදා ඒ දෙන්නා එක්ව ලකුණු 624 ක සබඳතාවක් ලබාගත්තා. කුමාර් සංගක්කාර් සිය ජීවිතයේ ඉහළම ටෙස්ට් ලකුණු ප්‍රමාණය ලකුණු 287 වාර්තා කළෙත් එදා තමයි. මහේල ජයවර්ධන එදා ලකුණු 374 ක් ලබාගෙන තිබුණා.

## හුදකලාව

තුරුලතා ගල් ගැසුණු
සියොත් නද වියැකී ගිය
මිනිස් හඬකුදු නොමැති
සොවින් බර සැඳෑවක
හඬනු ඇත වලාකුළු
කඳුළු වැස්සක් ලෙසින

සැදැහවන් එකළු කළ
සොඳුරු මා මිතුරු කැළ
පිය තෙපුල් බස් දෙඩූ
නොමැත මා අසලකඳ
මධු බඳුන් අත දරා
පිරූ සව්දිය සතුට
සිහි වේය පෙර දවස

පෙමින් මා හා බැඳී
දෙඅත් ගෙන වීදි ගිය
ඈ කොහිද අද දවස
දූ දරුවන් සෙනෙහෙ මැද
ඈ සිටි ගව් දුරින
මම සිටිමි තනිකඩව

කල්පනා ලෝතලෙහි
නිමග්නව සිටින සඳ
සියුම් රිදුමත් විඳුම්
නැගේ හී සර ලෙසින
පපු කැනති කීතු කර

කය නිසල වූ දිනෙක
පාලු වූ සුසානෙක
තනිව සිටිනා අයුරු
දකිමි මම නිරතුරුව
හුදකලා පාළුවක

**උදේනි සරච්චන්ද්‍ර**



## තාත්තා

නිදිවරා රෑ කවි ලියන සඳ
හදින් පැන නුඹෙ කල්පනා
රළින් සේදී ප්‍රභාමත් වෙයි
සඳ මඬලෙ සොමි ගුණ වෙලා

කුඩා කල අප රැක බලාගෙන
පුංචි බටකොළ ගෙට වෙලා
කවා පොවමින් වඩා හිඳුවා
රැයට සඳ පානක් වෙලා

පොඩි පුතේ යැයි මට කතා කොට
රස කැවිලි ගෙනැවිත් බෙදා
යස ජාති ලෙස හස පාන නුඹ
දුක් දැරූ සඳගිර වෙලා

බවුන් වඩනට එදා බෝසතු
දරුන් දන් දී වෙර වඩා
එවන් මහ බෝසතුට වැඩි ගුණ
හදින් දැරු අපෙ තාත්තා

තත් සුරම්මෙන් වෙණ සදාගෙන
රම්‍ය දිවි මග සොඳුරු මහිමෙන
ගලා එන සොමි ගුණ රැසක් මෙන්
උමතු සොඳුරගෙ දුකද ඉසිලුව

මහා ගිරිකුළ සේම එසැවී
දූ පුතුන් රැකි තාත්තා
රැයේ පුජ්නා සුවඳ කුසුමකි
රැයම විය කඳුළක් නොපෙනුවද

මහා ගිරි හිස සඳ පාන නුඹ
නුඹද දරුම්ණි වරා සිටි තෙද
වගුළ හසරැලි කපක් දලුලා
සෙවණ වුව මැන අපට ප්‍රේමෙන

මල් වැලක් සැඩ වතුරෙ ඉඹිනා
කුරු ගඟේ ගස ගසා යළි ඉඳ
සුවඳ වී සවි බලෙන යන එන
දෙගොඩ ඉඹිනා ගඟ ඉඹින සඳ

සොඳුරු වදනින සෙනේ වතුරින
දුක් නුවර එන පුතේ කියමින
මතක පිපි මල් ගසක් වී ගෙන
සිනාසෙනු මැන බිතක්කන ඉඳ

**ධර්මසිරි රාජපක්ෂ**

## සඳ එළියයි

කඳු මුදුනට නැගුණු එළිය ඈත ඉඳන් අත    වනනව
හඳ මුදුනට එන්න කලින් අහස වලාකුළු    ඉරනව
පරිසරයම හරි පාලුයි ඇඟ තුළ සීතල    දුවනව
අන්න බලාපන් මැණිකේ සමන් කැකුළු ඇස්    අරිනව

කණාමැදිරියන් නටනව නිල් එළිකැට    විලිස්සමින්
වල් බෙලිගස් නිදනු වැනිය ඇඟ පොරවා වලස්    හමින්
සුළඟ තැනින් තැන දුවනව ලදළු ලපළු    හිනස්සමින්
සඳ එළියට පොලොව තෙමිල පය තියන්නෙ    පරිස්සමින්

පළගැටියන් වැලි කඩදහි අරගෙන ලෝකය    මදිනව
තද සුළඟට පොල් අතුවල ඉරටු ඇඟිලි ඇට    කැඩෙනව
හඳට බයේ අඳුරු රංචු හොරු වගෙ ගස් යට    ලගිනව
ළිඳට ගිහින් බලමු මැණිකෙ ළිඳ ඇතුළෙත් හඳ    තියෙනව

කම්බි වැටට පිණි ඇමිණිල සතුටු කඳුළු බිංදු    වගෙයි
මැණිකෙව කැන්දන් ආ රැය මගෙ මතකයට    නැඟෙයි
එදා වගෙම අදත් සිතට ආදරයේ සිසිල    හැඟෙයි
උඹත් එක්ක හඳ පෑවු මේ මුලු ලෝකයම    මගෙයි

ආදරයෙන් නිදිමත නැති පිරුණු දෙනෙත් යුග    අරින්න
නා දළු තොල් තෙත් කරවා අනුරා ගීතය    ගයන්න
සඳ එළියෙන් බැහැ මැණිකේ මැණිකෙගෙ ලස්සන    බලන්න
පැලට ගිහින් පැල ඇතුලේ කුප්පි ලාම්පුව    නිවන්න

**ප්‍රේමකීර්ති ද අල්විස්**
**(1971 දී ලියන ලද කවි පන්තියකි)**

## ප්‍රශ්නාර්ථයක්....?

මනැසින්
ආගාධයේ සරද්දී
තවත්
පතුළටම වැටේ නම්
කෙලෙස එසවෙම්ද...?

සරණක් නොමැති කල
පිහිටට සිටි ඔබත්
අඳුරු සෙවණැලි ගෙනෙද්දී
මඳනලක් වන්නේ කෙලෙසක....

සුවඳ ගෙන
දිව එනු රිසි වුවත්
විඩා දේ තවම ඒ
දිනිකිරණ රැස

සිත්පිත් නොමැති ගිරිහිස් නොව
මිනිසුන් නොවෙමුදැයි
ඔබම පැවසූ පරිද්දෙන්
විසිරෙනා සිතුම් අබියස
කඳුළු වගුරා
දිවා රෑ
කෙලෙස නිවනක් සොයම්ද?

**තිලිණි වත්සලා රත්නායක**

## බුලු ගස

දැන් වැටේ
දැන් වැටේ  බුලු ගස
සිතේ - කළුවරේ
මැදි කරගෙන පුතු
ගුලි වීමු පැදුරේ
මැරුණොත් මැරුණාවේ ඔක්කොම එකට
කුණාටුව නැවතුණු  අලුයම
බැස බලමි මිදුලට
වැටුණු පොල්ගස් දෙකක් සුළඟට
රැඳී ඇත බුළු ගසේ අතු අතර
වළක්වා අපේ පැල
දෑතෙන් දරා සිටිනු වැනි පොල්ගස්
රැයක් පහන් වනතුරු
උස මහත තාත්තා කෙනකු සේ

**මහගම සේකර**

## මිත්‍ර සංදේශය

ඈතා ගලට දළ දුනි නම් එදළ බිඳේ
ඉතා එගල දැඩි දා දළ මුලින් බිඳේ
පතා නොගෙනාව විරසක ඇතොත් හිතේ
සිතා තුන් සිතින් සිඳලමු එවිරසකේ

වේල් හැර වේල් කෑවේ හිඳ එකට
වේල් බලන්නට මල්ලියෙ ගියෙ එකට
හෑල්ලුවට තිබු සිත මහ මෙරක් කොට
ගාල් කර වැනසුවේ කවුදෝ සතුට

සිකුරාදා දවල් යන මග හරස් කොට
බාධා කළේ නෑ අපි කිසිදා නුඹට
පෝදා බතින් බුලතින් දෙන දන්සලට
ඉස්සෙල්ලාම ඇරයුම් ලිවුවේ නුඹට

තත්පරයෙන් ආපසු හැරෙනා ලොවක
මත් වතුරට මුරුග වෙස් ගන්නා කයක
පත් විපතකට තුඩු දුන් කරුණෝ මතක
සිත් රිදවුණත් සබඳිනි කරමු අමතක

රහසින්වත් දොසක් නැති බව සිත දැකලා
කොඳුරා කිවු නිසා නෙත හැඬුවා රිදිලා
පවසින් නුඹේ ළෙන්ගතු බැල්මක් ඉල්ලා
අහසින් එන්න හිතුනයි දෙවියන් පල්ලා

**අජිත් කල්‍යාණ අමරසිංහ**

## පිපිරීම

පිපිරෙන්නේ
රතිඤ්ඤා
බෝම්බ
පමණක්ද
ඇයි ඇය?

**කපිල ජයවිලාල් හේරත්**

## කුල - මල



එකම ඉරක් යට
එකම සඳක් යට
ඔබ මා දෙතැනකය
මතකය පමණය

කෙහෙරැළි එක දෙක
සුදු පැහැ වී ඇත
කුල-මල වත-ගොත
තවමත් එහෙමය

අප හමුවුණ ඒ
කළුවර රැයමය
අරුණාලු නැග එන
සේයාවක් නැත

**කේ. ඒ. පී. රංගන**



AirCare Plus
ONE CALL WILL FIX IT ALL
Heating & Air Conditioning
FAST, AFFORDABLE SERVICE
Ashok Hettege
Licensed H.V.A.C Technician
Sales | Service | Repair | Installation
Line: 416.605.8300
Email: ashokdon@live.ca
WISH YOU A HAPPY SINHALA AND TAMIL NEW YEAR
Furnace
Gas Piping
Hot Water Tank
Tankless Water Heater
Humidifier
Air Cleaner
Air Conditioning
Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation
සීත කාලය නිමා විය. තාපන යන්ත්‍රය (Furnace) ලද විවේකයෙන් නිසි ඵල ලබාගන්න. එහි නඩත්තු කටයුතු, අලුත්වැඩියා කටයුතු සහ අලුතින් සවිකිරීමේ කටයුතු සිදුකර ගැනීමට මෙය සුදුසුම කාලයයි.
ග්‍රීෂ්ම ඍතුව සඳහා ඔබ සූදානම්ද?
ඔබගේ වායුසමීකරණ යන්ත්‍රය නිසි ප්‍රමිතියකින් සහ විදුලිබලය පිරිමසා ගන්නා ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය අලුත්වැඩියා, නඩත්තු කටයුතු මෙන්ම නව වායුසමීකරණ යන්ත්‍ර සවිකර ගැනීම සඳහා විමසන්න.
A MEMBER OF
CanLanka BUSINESS ASSOCIATION
2004-2014 10
CELEBRATING 10 YEARS IN BUSINESS
SATISFACTION 100% GUARANTEE




Why Pay More?
1%
Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN
1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC
1st Prize
8 TVs
I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763

# 1953 අගෝස්තු හර්තාලයේ අරගලයට මූලික වූ ආර්ථික හා දේශපාලන පසුබිම

■ එස්. සුදසිංහ විසිනි

**1953 අගෝස්තු 12 වැනි දින පැවැති හර්තාල් අරගලයට 2016 අගෝස්තු වන විට වර්ෂ 63 ක් සම්පූර්ණ විය. මෙම ලිපිය ඒ නිමිත්තෙනි.**

1951 දී රුපියල් මිලියන 345 ක් වූ වෙළෙඳ අතිරික්තය 1953 වන විට රුපියල් මිලියන 200 ක හිඟයක් බවට පත්විය. 1952 පටන් රටේ විදේශ සම්පත් ක්ෂය වීමට මුල් වූ හේතු අනාවරණය කරමින් එවකට මුදල් ඇමැතිවරයා වූ ජේ. ආර්. ජයවර්ධන මෙසේ පැවැසීය.

ලෝක යුද්ධ සමයේ ඉහළ ගිය ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් කොරියානු යුද සමයේ ඇති වූ වෙළෙඳ වාසි නිසා ක්ෂය වීමට ඉඩ නොදී රැකගත හැකි විය. 1952 ජනවාරි වන විට ශ්‍රී ලංකාව සතු විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 1209 ක් දක්වා ඉහළ ගිය අතර කොරියානු යුද සමයේ සෞභාග්‍යය කෙළවර වීමත් සමඟ රුපියල් මිලියන 30 බැගින් එම ශේෂයද සිඳී ගියේය. 1953 ජූලි අයවැය ඉදිරිපත් කරන විට එය රුපියල් මිලියන 676 දක්වා පහත වැටී තිබිණි. ඒ අතර ධාන්‍ය සඳහා අප ගෙවූ මිල වැඩි වූ අතර රබර්වලින් අප ලද ආදායම අඩු විය. හුදෙක් සියලුම විදේශ සබඳතා බටහිරට යොමුවී තිබූ හෙයින් සමාජවාදී රාජ්‍යයන් කෙරේ බලාපොරොත්තු තැබීමද උගහට කරුණක් විය. එම රටවල් සමග ගනුදෙනු කිරීමේදී වාමාංශික කොටස්වලට දේශපාලන වාසි අත්වේවායි සිතූ රජය ඒ රටවල් නොසලකා හරිනු ලැබීය. ඇමරිකා එක්සත් ජනපදයෙන් ඩොලර් මිලියන 50 ක ආධාර ලබාග උනීමටත්, තේ හා රබර්වලට වැඩි මිලක් ලබාගැනීමටත් ගත් පරිශ්‍රමයත් නිෂ්ඵල විය.

## ලෝක බැංකුවේ උපදෙස්

ලංකාව 1950 සිට ලෝක බැංකුවේ සාමාජිකත්වය ගෙන තිබුණි. ලෝක බැංකුව විසින් මහජන සුබසාධන කටයුතු කපා හැර, සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම නතර කරන්න යැයි ආණ්ඩුවට නිර්දේශ කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1953 අයවැය ලේඛනයෙන් පාසල් දිවා ආහාර වේල කපා හරිනු ලැබීය. අනාථ ආධාර දීමනා අඩු කරනු ලැබීය. දුම්රිය ගාස්තු වැඩි කරනු ලැබීය. තැපැල් ගාස්තු වැඩි කරනු ලැබීය.

ආහාර සහනාධාර රුපියල් මිලියන 300 සිට 160 දක්වා 50% ක් පමණ අඩු කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සහල් සේරුවක මිල ශත 25 සිට ශත 70 දක්වා වැඩි විය. (මෙයද ප්‍රමාණවත් නොවන බව ජේ. ආර්. ජයවර්ධන මුදල් ඇමැතිවරයා පැවැසීය.)

එකල දිවයිනට පැමිණ සිටි ලෝක බැංකු නියෝජිත පිරිසේ නායක සර් සිඩ්නි කේන් මෙම අයවැය යෝජනා නිර්භීතව පිළියෙළ කළ එකකැයි ප්‍රශංසා කරනු ලැබීය. එහෙත් මහජනතාවගේ ප්‍රතිචාරය මීට මුළුමනින්ම වෙනස් විය.

ප්‍රථම වතාවට ලෝක බැංකුවේ උපදෙස් ලබා පොදුවේ මේ කරුණු සියල්ලෙන් විශේෂයෙන් සහල් මිල වැඩි වීමට විරුද්ධව පුළුල් උද්ඝෝෂණ ඇති විය. ආහාර සලාකය ජාත්‍යන්තර වෙළෙඳපොළේ මිල ගණන්වලට වඩා අඩු මුදලකට ලබාදෙන බව එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ පොරොන්දුවක් විය. 1952 අගෝස්තු 1 වැනි දින එක්සත් ජාතික පක්ෂ පුවත්පත වූ 'සියරට' සඳහන් කළේ 'මේ ආණ්ඩුව පවතිනතාක් කල් හාල් සේරුව ශත 25 ක් බවයි. ලෝකයේ ආහාර තත්ත්වය කුමක් වුවත් ලක්වැසියා හාමතේ නොතබන බවයි.' මේ හුදෙක් මැතිවරණ ජයග්‍රහණ සඳහා කරනු ලැබූ අතිශයෝක්ති ප්‍රකාශන වුවත් එම සහනාධාරය සදාකාලික නොවූවත් තව බොහෝ කලක් ඒ අයුරින්ම පවත්වාගෙන යනු ඇතැයි යන්න ජනතා විශ්වාසය විය.

වමේ වෘත්තීය සමිති විසින් කැඳවන ලද සාකච්ඡාවකින් පසු අයවැය යෝජනාවලට ප්‍රථමයෙන් විරෝධයට එක්වූයේ සංවිධානය වූ කම්කරු පිරිසයි. අනතුරුව ලිපිකරු හා ගුරුවරුන්ද සහනාධාර ලැබූ ගොවියන්ද ධීවරයන්ද ඇතුළු සියලුම ජන කොටස් මෙම විරෝධතාවයට එක්වූහ. ගම්සභා, සුළු නගර සභා, මහ නගර සභා ආයතනවල නියෝජිතයන්ද අයවැය යෝජනාවලට විරෝධය පෑහ. ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙස බලපිටිය, ගාල්ල, මාතර, අනුරාධපුරය, බදුල්ල, යාපනය, මඩකලපුව ඇතුළු රටේ ප්‍රධාන නගරවල විරෝධතා ව්‍යාපාර පැවැත්විය. මෙයට විරුද්ධව ජූලි 21 වැනි දින වරාය කම්කරුවන් පැය 3 ක සංකේත වර්ජනයක යෙදුනාහ. රත්මලානේ දුම්රිය කම්කරුවෝ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වටලා උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කළහ. සමහර ප්‍රදේශවල ජනතාව තම පෙදෙස්වල මන්ත්‍රී නිවාස වටලා විරෝධය පෑහ. හැටදහසකගේ අත්සනින් යුතු පෙත්සමක් අග්‍රාමාත්‍යවරයා වෙත පෙළපාලියෙන් ගොස් බාර දුන්හ.

අයවැය විවාදයට ගනු ලැබූ ජූලි 23 වැනි දින වමේ පක්ෂවල මෙහෙයවීම යටතේ විරුද්ධ පක්ෂ විසින් සංවිධානය කළ විරෝධතා රැලියක් පාර්ලිමේන්තුව අභියස ගාලු මුවදොර පැවැත්විණි. අහුන්ගල්ලේද මෙවැනි විරෝධතා රැලියක් විය. ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා විප්ලවකාරී සම සමාජ පක්ෂය යන වමේ පක්ෂ විසින් මෙහෙයවූ වෘත්තීය සමිති එම ව්‍යාපාරය සංවිධානය කළහ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එය අනුමත කළද ක්‍රියාත්මක සහායක් දෙනු නොලැබීය. ලංකා ඉන්දියානු සංගමය හර්තාලයට සහභාගිවීම ප්‍රතික්ෂේප කළද විරෝධතා රැස්වීම්වලට සහභාගි වන බව දැන්වීය.

මේ අතර අගෝස්තු මස 7 වැනිදා 53/54 අයවැය යෝජනා පාර්ලිමේන්තුවේ විවාදයට ගත් අතර වැඩි ඡන්ද 23 කින් දෙවන වර කියවා සම්මත කර ගැනිණි.

## හර්තාල් දිනය

1953 අගෝස්තු 12 වැනි දින හර්තාලය පැවැත්විණි. විවිධ වෘත්තීය සමිති එක්ව හර්තාලය මෙහෙයවනු ලැබීය. වමේ පක්ෂ එය සංවිධානය කරනු ලැබීය. පුළුල් සහායක් ලැබිණි. දුම්රිය, බස්රිය ධාවනය ඇන හිටිනි. දොම්පෙ, අම්බලන්ගොඩ, බලපිටිය, කොස්ගොඩ, නුගේගොඩ ප්‍රදේශවල ජනතාවගේ ක්‍රියාකාරී සහාය විශේෂයෙන් කැපී පෙනුණි. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල හර්තාලය අතිශයින් සාර්ථක විය. නැගෙනහිර පළාතේ හැර දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පාහේ උද්ඝෝෂණ ව්‍යාපාර පවැතුණි. කැබිනට් මණ්ඩලය හදිසි නීතිය ප්‍රකාශයට පත්කර ඇඳිරි නීතිය පැනවීමේ තීරණය ගනු ලැබුවේද වරායෙන් ඈත නවතා තිබූ එච්. එම්. එස්. නිවුපවුන්ස් නම් යුද නැවේදීය. රජය හර්තාලයට මුහුණ දෙනු ලැබුවේ ප්‍රචණ්ඩකාරී ස්වරූපයෙනි. පොලිස් රාජ්‍යයක ස්වරූපයෙනි. එහි ප්‍රතිඵලය වූයේ මහජනතාවද ප්‍රචණ්ඩකාරී ස්වරූපයකින් ඊට මුහුණ දීමය. එහෙයින් මහජන දේපළ, රජයේ ගොඩනැගිලි හා ප්‍රවාහන සේවාවලට දැඩි ලෙස අලාභහානි සිදු කළහ. රජය හා රජයට හිතවාදී පුවත්පත් මෙය දුටුවේ දාමරිකකම් පුළුල් ලෙස පැතිරීමක් ලෙසිනි. එහෙත් හර්තාලය නියම ජනතා නැගිටීමක් විය. ආණ්ඩුව මැතිවරණ පොරොන්දු කඩකිරීමට එරෙහිව ජනතාවගේ නැගී සිටීම තුට්ටුවකට මායිම් නොකිරීම හේතු කොටගෙන කෝපාවිෂ්ට වූ ජනතාවගේ සැබෑ විරෝධය පළකිරීමක් වූහ.

12 වැනිදා පැවැති හර්තාලය 13 වැනිදා තෙක් පැවතුණි. නිදහසින් පසු පත් වූ ආණ්ඩුව ප්‍රථම වතාවට ජනතාවට වෙඩි තැබීමට නියෝගය දුනි. නවදෙනකු පොලිස් වෙඩි පහරින් මිය ගියහ. හදිසි නීතිය හා මහජන ආරක්ෂක පනත යටතේ හර්තාලයට සම්බන්ධ ක්‍රියාකාරී කොටස් අත්අඩංගුවට ගැනිණි. දේපළ රජයට පවරා ගැනීම් සෝදිසි කිරීම් සිදුකෙරිණි. තැන තැන ඇඳිරි නීතිය පැනවුණි. වාමාංශික පුවත්පත් තහනම් කෙරිණි. ආණ්ඩු පක්ෂ පුවත්පත් පමණක් පළවුණි. එම පුවත්වල ප්‍රවෘත්ති සියල්ලම පාහේ හර්තාල් විරෝධී විය.

## හර්තාලය නවත්වන්න

හර්තාලය තවදුරටත් ඉදිරියට ගෙනයෑම අනතුරක් වශයෙන් දුටු ඇන්. ඇම්. පෙරේරා (ල.ස.ස.ප.) පිලිප් ගුණවර්ධන (වි.ල.ස.ස.ප.) පීටර් කෙනමන් (කො.ප.) යන මහතුන් විසින් හර්තාලය නවත්වන ලෙස කරන ලෙස ආයාචනය කරනු ලැබීය.

ඒ ආයාචනය මෙසේය....

'1953 අගෝස්තු මස 12 වැනිදා හර්තාල පවත්වන ලෙස කරන ලද අයැදුමට අනුව අනර්ඝ අන්දමින් ක්‍රියා කිරීම ගැන අපි ලංකාවේ බහු ජනතාවට ප්‍රශංසා කරමුශ්‍රී සහල් ඇතුළු සහනාධාර ඉවත් කිරීම ගැන විරෝධය දැක්වීමේදී ජනතාවගේ ශක්තිය හා සමගිය පළ කිරීමට අපට පුළුවන් විය. ආණ්ඩුව බියෙන් තැතිගෙන හදිසි අවස්ථාවක් පැන නැඟී ඇති බව ප්‍රකාශයට පැමිණවීමෙන් රට පාලනය කිරීමට ස්වකීය අසමත් බව ප්‍රකාශ කළේය. පොලිසියේ හා ආණ්ඩුවේ ප්‍රකෝප කිරීම්වලට හසු නොවන ලෙස හැමදෙනාගෙන්ම ඉල්ලා සිටිමු. මුලින් නිවේදනය කළ පැය 24 ක හර්තාලය බ්‍රහස්පතින්දා උදේ අවසන් විය. එබැවින් නැවත වැඩට ගොස් තම තමන්ගේ කටයුතු කරගෙන යන ලෙස සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමු.'

එහෙත් සේවාවන් යථා තත්ත්වයට ගෙන ඒමට දින ගණනාවක් ගතවනු දැකිය හැකි විය. වැඩවර්ජන ජනතාවට අලුත් දෙයක් නොවීය. එහෙත් හර්තාලය ජනතාවට අලුත් දෙයක් විය. හර්තාලයේදී වැඩ නැවැත්වීම වැදගත් ස්ථානයක් ගන්නේ වී නමුත් එය ප්‍රධාන වශයෙන් වැඩවර්ජන සටනක් නොවීය. කම්කරු ජනතාවට පිටින් සිටින පළාත්වල ජනතාව සහභාගි කරවාගෙන කළ සටනක් විය. කවදාවත් මෙවන් විරෝධයක් අත්නුදුටු ජනතාව මෙම විරෝධතා ව්‍යාපාරයට නායකත්වය දුන් වමේ ව්‍යාපාරයට මහජන විශ්වාසයත් ප්‍රසාදයත් පළ කළහ.

46 වන පිටුව බලන්න



# නිව් වන්නි මාර්කට් ඉන්ක්.

# NEW VANNI MARKET INC.



40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8

Tel: 905 566 5550

NOW OPEN

සුපුරුදු මිත්‍රශීලී සේවාව සමග අපි දැන් අලුත් තැනක

අලුත්ම අලුත් මාලු, නැවුම් එළවළු පළතුරු, කුළුබඩු සහල්
ඇතුළු ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සියලුම ආහාර වර්ග
වඩාත් පහසුවෙන් ඔබේ සිතැඟි පරිදි තෝරා ගැනීමට
නිව් වන්නි මාර්කට් ඉන්ක් වෙත එන්න.

ගෙදර යන ගමන් අතේ ඇති මුදලට හිතේ හැටියට ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන එකම තැනකින් ලබාගන්න NEW VANNI MARKET INC.වෙත පැමිණෙන්න.



දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

## වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

**WWW.DASATHA.COM**

For NO ADDITIONAL CHARGE

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

# ආපසු හැරී බලා අද මෙසේ ලියමි!



■ සුගතපාල ද සිල්වා
උපුටා ගැනීම - සුගතපාල ද සිල්වා අභිනන්දනය

**සිංහල නාට්‍ය කලාවේ පෙරළිකාර නාට්‍යවේදියා ලෙසින් හැඳින්වෙන ප්‍රවීන ලේඛක සුගතපාල ද සිල්වා මහතාගේ ජන්ම දිනය අගෝස්තු 04 වෙනිදාට යෙදී ඇත. මෙම ලිපිය ඒ නිමිත්තෙන් පළ වන්නකි.**

"ආපසු හැරිල බලනකොට මොනවද හිතෙන්නෙ?" බොහෝ දෙනා නිරන්තරයෙන්ම මේ ප්‍රශ්නය මගෙන් අසති. "ආපසු හැරී බලන්න නම් නවතින්න ඕනෑ" මම උත්තර දෙමි. එහෙයින් ගිය ගමන ගියෙමි. ප්‍රේක්ෂකයින්ගේ සහ පාඨකයන්ගේ ආශිර්වාදය ලබමින් ගිය ගමන ගමන් කළෙමි.

එහෙත්,

මේ මෑත දවසකදී මිනී වළේ කට අද්දරටම පැමිණි මට ආපසු බැලීමට කල් වේලා ලැබිණ. මිනී වළේ කට අද්දර සිට ආපසු හැරී බලන මා දුටුවේ මා ආ මග ආලෝක කළ ප්‍රදීපස්ථම්බ සේ සැදි මිතුරන් කීප දෙනෙකි. අද ඔවුන්ගෙන් අවශ්‍යතමයන් කීප දෙනෙක්ම ජීවතුන් අතර නැත්තාහ. මිනීවළ අද්දරටම පැමිණි මා ආපසු තල්ලු කරන්නට ඇත්තේ ඔවුන්ම වෙන්නැති.

අපේ කට්ටියේ පුරෝගාමියකු වූ සිරිල් බී. පෙරේරයන්. අන්න හරි, සතිපතා පළ වූ 'සිංහල ජාතිය' ඔස්සේ අපමණ බටහිර උසස් කෙටිකතා සිංහලයට හඳුන්වා දුන්නේ ඔහුම තමා. මම දිනපතා සිංහල ජාතියේ පරිවර්තකයකු ලෙස සේවය කෙළෙමි. ටික දවසකින්ම මට චිත්‍රපට සහ කලා පිටුවද බාර විය. හාපුරා මට ලැබුණේ ෂෙරිඩන්ගේ RIVALS ඇසුරෙන් හෙන්රි ජයසේනයන් නිෂ්පාදනය කළ 'මනමාලයෝ' නාට්‍යය විචාරයට භාජනය කිරීමටය. මැනවින් අනුවර්තනය කර තිබූ මනමාලයෝ නාට්‍යය RIVALS නාට්‍යයට වඩා රසවත් විය. මම එසේ ලීවෙමි.

"කවුද හෙන්රි ජයසේන කියන්නෙ. සුගත්ගෙ යාළුවෙක්ද?" විචාරය පළ වූ පසුදාම කර්තෘ මණ්ඩලයේ කෙනෙක් ඇසුහ.

නාට්‍යය නැරඹූ දවසත් එක්ක වරක් දැක ඇතැයි මම කිවෙමි.

"ඔය මිනිස්සුන්ගෙ කතා ගණන් ගන්න එපා. I too saw the play. Your findings are revealing' මට හිතෙනවා උඹට ඒ ක්ෂේත්‍රය හරියාවි"

මේ දිනවල 'ජාතිය' පුවත්පත්වල නියෝජ්‍ය කර්තෘ වශයෙන් සිටියේ එවකට ප්‍රකට ගුවන් විදුලි ශිල්පියකු වූ, ඩිංගිරි මැණිකා චිත්‍රපටයේ කෝන්ගොඩ වික්‍රමපාලගේ චරිතය නිරූපණය කළ සයිරස් ඩබ්. සුරේන්ද්‍ර ය. සිය බාප්පා බලා මඳ වේලාවක් කතා බහ කිරීමට 'ජාතිය' කාර්යාලයට එන පුරුද්දක් ජී. ඩබ්. සුරේන්ද්‍රට විය. මීට වසරකට පමණ පෙර ඔහුද අපට අහිමි විය. ජී. ඩබ්. 'දින දින' සඟරාවේ සංස්කාරක ලෙස කටයුතු කෙළේය.

දිනෙන් දින නම් වූ සඟරාව 'දිනදින' වූයේ ඔහු අතය. මා 'මෙතෙක් දුටු හොඳම චිත්‍රපට' යයි මම ඒ වන විට එම සඟරාවට ලිපියක් ලියමින් සත්‍යජිත් රායිගේ 'අපරාජිතෝ' චිත්‍රපටය විචාරයට ලක් කෙළෙමි. චිත්‍රපට ගැන වෙසෙසින් උනන්දුවක් දැක් වූ සිබීරා අප හා එකතුව ජාතිය කැන්ටිමට ගොස් එලදායී පැය කීපයක් ගත කළෙමු. සිරිල් අත කොලින් විල්සන්ගේ OUTSIDER නම් පොත විය.

ඔහු විල්සන් ගැනත් සාංදෘෂ්ටිකවාදය ගැනත් සන්තෝෂයෙන් කතා කෙළේය. අපි ඔහුගේ පොත අතමාරුවට ගෙන කියෙව්වෙමු. කොලින් විල්සන් බොහෝ පොත පතින් ගත් උධෘත පාඨයක් ඉදිරිපත් කරමින් සංදෘෂ්ටිකවාදය පිළිබඳ ඔහුගේ මතය ඉදිරිපත් කෙළේය. එහෙත් ඔහු එසේ තෝරාගත් කොටස්වල අව්‍ය පද තමාට අවශ්‍ය අර්ථය ගනු වස් වෙනස් කළ බව කිසියම් ග්‍රන්ථයක දැක මම එය සඳහන් කෙළෙමි.

"අන්න හරි, මීට පස්සෙ අපි තනියම තීරණ ගන්න පෙර දැනුම බෙදා හදා ගමු" සිරිල් යෝජනා කෙළේය. සිරිල් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ වැදගත් නිලයක් ඉසිලීය. සුරේන්ද්‍ර බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ බ්‍රිතාන්‍ය පුවත්පත කෙළේය. මම බම්බලපිටියේ K.V.G සහ පුත්‍රයන්ගේ පොත් මැදුරේ ගිනුම් ලිපිකරුවකු වශයෙන් සේවය කළ අතර පොත් වික්කෙමි.

දවසක් හදිසියේම ජී. ඩබ්ලිව්. මට ටෙලිෆෝනයෙන් ඇමතීය.

"ඒයි දවස ග්රූප් එක තව පත්තරයක් පටන් ගන්නවා. මට එතනට යන්න වෙලා. උඹ කැමැතිද බ්‍රිටිෂ් හයි කොමිෂන් එකේ වැඩ කරන්න?" ජී. ඩබ්ලිව්. ඇසුවේය.

"පඩිය කීය ද?"

"හය සීයක් විතර"

"මම කැමතියි"

පොත් සාප්පුවෙන් මට දවස් තිහටම ලැබුණේ රුපියල් දෙසීයක් පමණය. මා එතැනට හිර කෙළේ පොත් කියවීමට ලැබුණු අවස්ථා විසිනි.

"එහෙනං හෙට උදේ දහයට වරෙන්...."

"ලියුමක් නැතුව?"

"ඇප්ලිකේෂන් එකක් ලියාගෙන වරෙන්, නැත්තන් එපා. මම එකක් ටයිප් කරල තියන්නං. නොවරදවාම වරෙන්" ඔහු අනිත් කොනේ රිසීවරය තැබුවේය.

මම නොවරදවාම ගියෙමි. එක වරම රුපියල් හාරසියයක වැටුප් වර්ධකයක් K.V.G සාප්පුවට එන්නට පෙර මම ගම්පොළ රෝහණ යන්ත්‍රාලයේ කළමනාකාරකම කෙළෙමි.

රුපියල් පනහක ගනුදෙනුවක් සම්බන්ධයෙන් මා ගත් මෝඩ නොහොබිනා තීරණයෙන් උදහස් වූ මාගේ මාමා සේවකයන් හමුවේම භාවිත කළ වදනකින් සිත් තැවුලට පත් මම K.V.G යට බැඳුණේ රුපියල් හැත්තෑ පහේ වැටුපකටය. මට අවශ්‍ය වූයේ කොළඹ නතර වීම පමණය. රුපියල් හැත්තෑපහ රුපියල් දෙසීය වීමට ගියේ දෙමසක් පමණය. ඒ දෙමස මා නැවතී සිටියේ ආරියවංශ පතිරාජයන්ගේ නිවසේය.

මා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ බ්‍රිතාන්‍ය ප්‍රවෘත්ති පත්‍රයට යෑමත් සමග අපේ දින චරියාවද වෙනස් විය.

සිරිල් දවල් බත ගත්තේ කාර්යාලය අසලම වූ ඉන්දු-සිලෝන් සයිවර් හෝටලයෙනි. මමත් දවල් බත පිණිස කොටුවේ සිට එතැනට පැමිණියෙමි. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ පුස්තකාලයට වහ වැටෙන්නට කල්වේලා ලැබෙන බැවිනි. එතැන බාරව සිටි ධර්මදාස මහතා (ගෝරා පරිවර්තක) අපට හිතවත් විය. එහෙයින් උසස් ඉන්දීය පොත් අපට නිර්දේශ කළේය. ලේඛකයකුද වූ ධර්මදාසයෝ එහි පැමිණෙන ලේඛකයන්ට තෝරා ගත යුතු කෘති ගැන උපදෙස් දුන්හ. මාස කීපයක් ගත වන විට සිරිල්ටත් මටත් කතා බහ පිණිස දිවා ආහාර පැය ප්‍රමාණවත් නොවීය. අපි සවසට මුණ ගැසෙන්නට ගිවිස ගතිමු.

මිතුරන් සමඟ රජවන්නට සයිවර් හෝටලය හොඳ මදි විය. කලාකරුවන් වෙනුවෙන්ම වෙන් වූ සැඳැල්ලෙන් පසු අපි පුවත්පත් කලාවේදීන්ගේ සමාජ ශාලාවට උපාධි ලදිමු. අපි සමාජ ශාලාව වෙත යොමු වූයේ මද්‍යසාරයට ඇති ලෝලත්වයකින් නොව බොහෝ වේලාවක් කතාබහ කිරීමට ලැබෙන අවසරය විසිනි. ඇතැම් දවසක අපි නොදන්න භවත්තුද පැමිණ අපේ කතාබහට හවුල් වෙති. අපි ලැබෙන පොත පත මාරු කරගෙන කියවීමු. එකට නාට්‍ය බලන්නට ගියෙමු. සෑම කතා බහකදීම වාගේ මා නාට්‍යයේ දොස් දකින්නට වූ කල සිරිල්,

"හොඳයි එහෙනම් උඹ හොඳ නාට්‍යයක් කරලා පෙන්නාපන්" කීවේය.

මම ඒ කතාව අනුව 'බෝඩිංකාරයෝ' නම් නාට්‍යය රචනා කෙළෙමි. මේ දිනවලම සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය නාට්‍ය උලෙළ පිණිස කියලාවත් කරගන්න බැරි අයුරින් පිටපත් කැඳවා තිබිණ. මේ දවස් වන විට සිරිල් සහ මා පමණක් නොව කට්ටියේ පතාක යෝදයකු වූ රැලෙක්ස් රණසිංයන්ද අපට එක් වී සිටියහ. කැමරාවෙන් විස්කම් පෑ ඔහු නිර්දය විචාරකයකුද විය. ඔගස්ටස් විනයාගරත්නම්, පියසිරි නාගහවත්තයන් සහ විපුල ධර්මවර්ධනයන්ද කට්ටිය ආලෝක කළහ.

සියල්ලෝම මගේ නාට්‍යය කියවූහ. පිටපත සමග සංස්කෘතික දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු අයැදුම්පතේ 'ඉදිරිපත් කරන කලා සංගමය' යයි පේළියක් විය. එක්තරා උදයක බ්‍රිස්ටල් හෝටලයේ මේසයක් වටා රැස් වූ අපි සංගමයට නමක් සොයන්නට වීමු.

"මේකේ සභාපතිල ලේකම්ල නෑ. කවුරු හරි නාට්‍යයක් කරනවා නම් ඒ කාලය තුළ ඔහු තමයි නායකත්වය ගන්නේ. අනිත් අය උදව් කරනවා" සිරිල් අදහස් කෙළේය.

එහෙත් සංවිධාන නොවූ සංවිධානයක් ගැන පුවත්පත් පළ කරාවිදෝයි සැකයක් පැවැති නිසා අපි සියලු දෙනාගේම කැමැත්තෙන් නිලධාරි මණ්ඩලයක් සකස් කොට ප්‍රවෘත්තියක් පුවත්පත්වලට යැව්වෙමු. සිරිල් බී. සභාපති ධුරයටද මම ලේකම් වශයෙන්ද නම් කරන්නට යෙදිණ.

"අපේ කට්ටියට එකතු වෙලා ඉන්නෙ අලුත් අදහස්වලට බය නැති ලෝක සාහිත්‍යයේත්, කලාවේත් අලුත් නැම්ම ගැන තේරුම් ගන්න මහන්සි ගන්න අය. පිටරටවල දැන් කෙරෙන නොයෙක් අත්හදා බැලීම්වලින් උදව් අරගෙන මේ රටේ මිනිසුන්ගේ සිතුම් පැතුම් ආදිය අමාරුවක් නැතිව ප්‍රාණවත් විදියට කියන්න පුළුවන් නාට්‍ය සම්ප්‍රදායක් ඇති කරන්න උත්සාහ ගන්න. එය තමා අපේ කට්ටියේ ප්‍රධාන පරමාර්ථය. නාට්‍ය ගැන විතරක් නෙවි, වෙනත් කලා මාධ්‍යයන් ගැනත් උනන්දුවකින් වැඩ කරන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා" පුවත්පත් සාකච්ඡාවකදී (1962) සිරිල් බී. පැවසීය.

'බෝඩිංකාරයෝ' නාට්‍යය කලා මණ්ඩලය මගින් අවසාන වටය සඳහා තෝරා ගැනීමෙන් ඉක්බිති ප්‍රධාන ප්‍රශ්නය වූයේ නිෂ්පාදන වියදම්ය. හදිසියේ අපට එකතු වූ මිතුරෙක් මා කොම්පඤ්ඤ වීදියේ අවකන් ජාතියකු වෙත කැඳවාගෙන ගියහ. මම රුපියල් සියයක් ඉල්ලා සිටියෙමි. වංහුං දැන ගැනීමෙන් පසු ඔහු මා සමග තවත් තැනකට ගියේය. ගෙවල් පෙළක එක් කුඩා ගෙයක් වූ එහි ප්‍රධාන දොරට සවිකළ ලොකු කොණ්ඩි පට්ටමක විශාල ඉබි යතුරු දෙකක් සහ යේල් ඉබ්බකු එල්ලා තිබිණ. දොරට කීප වරක් තට්ටු කළ ඔහු ඉනෙන් යතුරු කැරැල්ලක් ගෙන ඉබ්බාගෙන් වැසුනු කටවල් අයා දොර ඇර ගත්තේය.

ඔහු මා ඉස්සර කරගෙන කුඩා කාමරයකට පිළිපන්නේය. කාමරයේ පැත්තක එකට ළං කළ ඇඳන් තුනක් විය. මුල්ලක වූ පරණ තාලේ සනීප පුටුවක දිගා වී දෙපා පුටුවේ දිග හළ අත් ඇඳිවල තබා ගෙන තවත් අවකන් ජාතිකයෙක් සිසිල් බීම බෝතලයක් බටයකින් උරමින් සිටියේය. පසෙක සිටගත් පංකාවක් ඔහුගේ ඩහදිය නිවයි. බඩ පුරා සිනා සෙමින් නැංග ඔහු පළමු බායියා සමග ඔවුන්ගේ බසින් කතා කරන්නට විය. ඔවුහු ටික වේලාවක් මා හිතන අයුරු සතුටු සාමිචියේ යෙදුනහ. අනතුරුව ඇඳන් යටින් පරණ ට්‍රන්ක පෙට්ටියක් එළියට ගත් පළමුවැන්නා ඉනේ යතුරු කැරැල්ලක් ගෙන ට්‍රන්කයේ ඉබි යතුරු හැර පියනෙන් පෙට්ටිය බාගෙට වසාගෙන අහක බලාගෙනම එතුළ අතගාමින් රුපියල් සියයේ නෝට්ටුවක් අතට ගත්තේය. ඔහුගේ ඇස වෙනතක යොමු වී තිබුණෙන් මම ඒ අනුව බැලීමි. දෙවැන්නා මහත් අවධානයෙන් මා දෙස අනිමිස ලෝචනයෙන් බලා සිටී. මගේ උකුණු වලේ සිට පහළට හීන් හිරියක් දුව ගියේය. ඔහු මුල් මාසයේ පොලිය කපාගෙන මට දුන්නේ රුපියල් අසූවක් පමණය.

පසුදා ඔහු ටෙලිෆෝනයෙන් මා අමතමින් මා රැකියාවට පැමිණෙන බස් රියේ අංකය සහ බසින තැන අසා ගත්තේය. පඩි දාට පසුදා නොවරදවාම ඔහු මා හමුවෙයි. මම බස් රියෙන් බැස පොලිය සුරතේ තබාගෙන කාගිල්ස් සාප්පුවේ කොරිඩරය දිගේ ඉදිරියට ගමන් කරමි. ඔහු ඔහුගේ වමත පහතට කඩාගෙන මා සිටින දෙසට ගමන් කරයි. මේ කොරිඩරයේ කිසියම් තැනකදී අපේ අත් එකට ගෑවී මා අත වූ රුපියල විස්ස ඔහු අතට යයි.

මම මේ ණය මුදල

**46 වන පිටුව බලන්න**




කලාකරුවන් දේවත්වයෙන් පුදන ඔවුන් වෙනුවෙන් දිවි නසා ගැනීමට වුවත් සූදානමින් සිටින ඉන්දීය සිනමා රසිකයන් මේ දිනවල කබාලි උන්මාදයෙන් මුසපත් වී සිටින බව ඒ පිළිබඳව පළවන පුවත් දෙස බැලීමෙන් පෙනී යයි. මේ උමතුව කෙතෙක්ද යත් මේ වන විට එක් අයෙකු කබාලි වෙනුවෙන් ජීවිතයද පූජා කර ඇත. ඒ කබාලි ප්‍රදර්ශනය ඇරඹූ ජූලි 22 වැනි දිනයේදීම එය නැරඹීම සඳහා ප්‍රවේශ පත්‍රයක් මිල දී ගැනීමට නොහැකි වූ දුකින් ගොඩනැගිල්ලකින් බිමට පැන සියදිවි නසාගත් මැලේසියානු තරුණයෙකි.

'KABALI' - ඔව් එය සැබෑම උමතුවකි. ඉන්දියාවේ තිරගත වීම ඇරඹූ දින සිට අද දක්වාම එක සීරුවට ජන ගඟ ගලන කබාලි ඉන්දියානු සිනමා ඉතිහාසය තුළ මෙතෙක් තබා තිබූ සියලුම ආදායම් වාර්තා බිඳ හෙළීමට සමත් වී තිබේ.

ඉන්දියාවේ සිනමාහල් 12,000 ක තිරගත කිරීම ඇරඹූ කබාලි, ආදායම් වාර්තා පිහිටුවීමට පටන්ගත්තේ එය තිරගත වීමටත් පෙර සිටය. චිත්‍රපටය එළිදැක්වීමට කලින් අලෙවි කළ ප්‍රවේශ පත්‍රවලින් පමණක් ඉන්දීය රුපියල් කෝටි 250 ක් උපයා ගැනීමට එය සමත් වී තිබුණි.

කබාලි තබා ඇති ආදායම් වාර්තා ඉන්දියාවට පමණක් සීමා වී නොමැත. මේ වන විට ලොව පුරා සිනමාහල් 10,000 ක පමණ කබාලි තිරගත වෙයි. ඇතැම් රටවල් මෙතෙක් ඉන්දීය චිත්‍රපට තිරගත කර තබා තිබූ ආදායම් වාර්තා කඩා බිඳ හෙළීමට කබාලි සමත් වී ඇත. මෙහිදී ඇමරිකාව, ප්‍රංශය සහ බ්‍රිතාන්‍ය ප්‍රධාන තැනක් ගනී. ඇමරිකාවේ සිනමාශාලා 400 ක තිරගත කෙරෙන කබාලි එතෙක් 'බහුබාලි' චිත්‍රපටය ප්‍රදර්ශනයෙන් තබා තිබූ බොක්ස් ඔෆිස් වාර්තාව පළමු දිනයේදීම බිඳ හෙළීමට සමත් වී තිබුණි. ඩොලර් මිලියන 1.45 ක වාර්තාගත ආදායමක් පළමු දිනයේදීම ඇමරිකාවේදී කබාලි ලබාගෙන තිබුණි.

කබාලි තිරගත වීම ඇරඹූ ජූලි 22 දා තම ජීවිතවල සුවිශේෂී සිහිනයක් සැබෑ වූ දිනයක් ලෙස බොහෝ තමිල්නාඩු ජනතාව සැලකූ බව පෙනේ. සිකුරාදා දිනයක් වූ එදින තමිල්නාඩුවේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් නොවූවත් ඇතැම් ව්‍යාපාරික ස්ථාන හා පෞද්ගලික සේවා ස්ථානවලට එදින නිවාඩු දිනයක් ලෙස නම් කිරීමට සිදුවී තිබුණි. ඒ දවසේ ලෙඩ නිවාඩු දැමූ පිරිස අධික වීමත් ඇතැම් සේවකයින් ජංගම දුරකථන ක්‍රියා විරහිත කොට සේවා ස්ථානවලට නොපැමිණීමත් නිසා එදින නිවාඩු දිනයක් කිරීම හැර වෙන විකල්පයක් ඔවුන්ට නොතිබුණි. කබාලි පිස්සුව සේවකයන්ට පමණක් නොව ආයතන අයිතිකරුවන්ටද වැළඳී තිබී ඇති බව තහවුරු වන්නේ ඇතැම් පෞද්ගලික ආයතන චිත්‍රපටය නැරඹීම සඳහා තම සේවකයින්ට නොමිලේ ප්‍රවේශපත්‍ර ලබා දුන් බව සඳහන් වීමෙනි.

කබාලි නිසා ඉන්දියාවේ දෛනික වැඩකටයුතු ඒ ආකාරයට අඩපණ වෙද්දී ට්විටර් සමාජ ජාල වෙබ් අඩවියටද පැය කිහිපයක් ගල් වී සිටීමට සිදුවිය. කබාලි නැරඹූ පිරිසත් නරඹන්නට සිටින පිරිසත් ඒ සම්බන්ධයෙන් විවිධ අදහස් හා පණිවිඩ ට්විටර් තුළ පළ කිරීමට පටන් ගැනීමත් සමග ඇතිවූ තදබදය නිසා ට්විටර් ඉන්දියා කලාපයට පිවිසීම අපහසු වූ බව ඒ පිළිබඳව වූ වාර්තාවක සඳහන් විය. කබාලි චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක කටයුතු ඉතාමත් සංවිධානාත්මක සිදු කෙරුණු අතර එහිදී විවිධ උපක්‍රම, තාක්ෂණ ක්‍රම මෙන්ම ලෙහෙසි පහසු කෙනෙකුට කළ නොහැකි අධික වියදම් යන වෙළඳ උපක්‍රම රැසක් මේ වෙනුවෙන් යොදාගැනීමට නිෂ්පාදන කණ්ඩායම කටයුතු යොදා තිබුණි.

එම ප්‍රචාරණයේ එක් පියවරක් ලෙස, 2016 මැයි 01 වන දින කබාලි පූර්ව ප්‍රචාරක පටයක් යූ ටියුබ් වෙත නිකුත් කර තිබුණි. පැය 22 ක් ඇතුළත මිලියන සංඛ්‍යාත පිරිසක් එය නරඹා තිබීමෙන්ම කබාලි එනතුරු බලා සිටින්නන් කෙතෙක්දැයි යන්න පැහැදිලි විය. ඉතා කෙටි කලක් තුළ ඉන්දියාවේ චිත්‍රපටයක පූර්ව ප්‍රචාරක පටයක් නැරඹූ වැඩිම ප්‍රේක්ෂක සංඛ්‍යාව මෙය වේ. කබාලි චිත්‍රපටය ප්‍රදර්ශනයට සූදානම් කරමින් තිබියදී විවිධ භාෂාවලින් හඬ කැවූ පූර්ව ප්‍රචාරක පට ලොව නන් දෙසට ලැබීමට සලස්වා තිබුණි. සැබෑ එකක්ද අපේ අයගේ හපන්කමක්දැයි හරියටම කිව නොහැකි වුවත් කබාලි ගැන සිංහලෙන් හැදූ පූර්ව ප්‍රචාරක පටයක්ද යූ ටියුබය තුළ ඇත.

ඒ සමගම අධික මුදලක් වැය කරමින් එයාර් ඒෂියා සමාගමේ ගුවන් යානා බඳෙහි කබාලි පෝස්ටර් පින්තාරු කිරීමත් එයාර් ඒෂියා මගීන්ට කබාලි ආහාර වට්ටෝරුවක් ලබාදීමත් මේ පූර්ව ප්‍රචාරයේම එක් අංගයක් විය. මීට අමතරව කබාලි තිරගත වීමට පෙර එයාර් ඒෂිය අනුග්‍රහයෙන් පැවැත් වූ තරඟයකින් ජයග්‍රහණය කළ පිරිසකට කබාලි මංගල දර්ශනය දින රජිනි කාන්ත් සමග එයාර් ඒෂියා යානයක නැගී ගොස් එය නැරඹීමේ අවස්ථාවද උදා වුණි.

එයාර්ටෙල් සමාගමද කබාලි ප්‍රවර්ධන කටයුතුවලට එක් වී තිබුණු අතර විශේෂ පැකේජයක් සමග කබාලි නමින් සිම් පතක් නිකුත් කිරීමට ඔවුන් කටයුතු යොදා තිබුණි. සුප්‍රසිද්ධ භාණ්ඩ තැපැල් සේවාවක් වන ඇමසන්ද කබාලි වෙනුවෙන් වූ විශේෂිත නිෂ්පාදන රැසක් හඳුන්වා දී තිබුණු අතර කබාලි ටී ෂර්ට්, මග්, ජංගම දුරකථන කවර ආදිය ඒ අතරින් ප්‍රධාන විය. කබාලි උමතුව කෙසේ ව්‍යාප්ත වී ඇත්ද යත්, මේ වන විට කේක් හා විවිධ ආහාර ද්‍රව්‍යත් ඇඳුම් පැළඳුමුත් කබාලි නමින් එළිදැක්වීමට පොරයක් පවතින බවද වාර්තා වේ.

දින 10 ක් ඉක්ම යෑමටත් පෙර කබාලි ලබාගත් අතිසාර්ථකත්වය ගැන රජිනි කාන්ත් ප්‍රකාශයක් නිකුත් කර ඇති අතර ඔහු පවසා ඇත්තේ චිත්‍රපටයේ සාර්ථකත්වය පිටුපස සිටින්නේ රසික රසිකාවියන් බවයි. ලැබෙන ප්‍රතිචාරත් සමග තමා ඉතාමත් ප්‍රීතියෙන් සිටින බවත් මේ නිසාම තමාගේ සිරුරේ ඇති ලෙඩ රෝගත් සුව අතට හැරෙන බවක් දැනෙන බවත් මෙහිදී රජිනි කාන්ත් පවසා ඇත. මෙහිදී කබාලි අධ්‍යක්ෂවරයාට හා ඊට දායක වූ සියල්ලන්ටම ස්තූතිය පුද කිරීමටත් රජිනි කාන්ත් අමතක කොට නැත. දකුණු ආසියාවෙන්ම වැඩිම මුදලක් අයකරන සිනමා රංගන ශිල්පියා රජිනි කාන්ත්ය. මේ වන විට 64 හැවිරිදි වියේ පසුවන මේ මහලු තරුණයා වෙත පුද සත්කාර කරමින් දේවත්වයෙන් පුදන්නෝද ඉන්දියාවේ සිටිති. ඒ ඔහු සැබවින්ම ඔවුන්ගේ වීරයා වන බැවිනි.

චෙන්නායිහි ජීවත් වූ සැබෑම පාතාල කෙරුමෙකුගේ කතාවක් පාදක කරගනිමින් නිර්මාණය කර ඇති කබාලිහි එම මැර නායකයාගේ චරිතය නිරූපණය කරන්නේ රජිනි කාන්ත් විසිනි. චිත්‍රපටය තිරගත වන අවස්ථාවලදී එය නැරඹීමට පැමිණෙන ප්‍රේක්ෂකයින්ගේ හැසිරීම පිළිබඳව ඉන්දීය පුවත්පතක් වාර්තා කර තිබුණේ මෙසේය. 'ඔවුන් සිනමා ශාලාව තුළ හැසිරෙන්නේ සැබවින්ම රජිනි කාන්ත් සිනමා තිරය ඇතුළෙ ඉන්නවා කියා සිතාගෙන. චිත්‍රපටයේ උද්වේගකර දර්ශනවලදී ප්‍රේක්ෂකයින් ඊට ප්‍රතිචාර දක්වන්නෙ අඩි පොළොවෙ ගසමින් රජිනි කාන්ත්ව දිරිගන්වන වැකි කියමින්. රජිනි තිරයේ දිස්වන සෑම අවස්ථාවකම අත්පුඩි ගැසීමත් බොහෝ අය අසුන්වලින් නැගිට ආචාර කිරීමත් සිදුකරනවා. මේ අය චිත්‍රපටය නරඹනවාට වඩා රජිනි කාන්ත්ව විඳින බවකුයි පේන්නෙ'

කබාලි අධ්‍යක්ෂණය කර ඇත්තේ Pa. Ranjith විසිනි. රජනි කාන්ත් සමග ප්‍රසිද්ධ තායිවාන රංගන ශිල්පියෙකු වන Winston Chao සහ ඉන්දීය ශිල්පී ශිල්පිනියන් වන Radhika Apte, Dhansika, Dinesh Ravi, Kalaiyarasan, John Vijay ඇතුළු විශාල පිරිස මෙහි රංගන දායකත්වය දක්වා ඇත. මෙම චිත්‍රපටයේ මූලික රූපගත කිරීම් බොහොමයක් මැලේසියාවේදී සිදුකර ඇති අතර බැංකොක් සහ හොංකොං හි රූපගත කළ දර්ශන රැසක්ද එහි ඇතුළත්ව ඇත.




ඩොලර් බිලියන 1.6 ක වාර්තාගත ආදායමක් ලැබූ 2015 වසරේදී තිරගත වූ Jurassic World චිත්‍රපටයේ දෙවන කොටස Jurassic World-2 නමින් නිෂ්පාදනය කිරීමට මේ දිනවල ලහි ලහියේ සූදානම් වෙමින් පවතී. ජුරාසික් වර්ල්ඩ් අධ්‍යක්ෂ කොලින් ත්‍රෙවොරෝ මේ බව සඳහන් කර ඇති අතර 2017 වසරේදී හවායි හිදී එහි රූගත කිරීම් ඇරඹීමට ඔවුන් බලාපොරොත්තු වේ. මෙම චිත්‍රපටයේ සියලු කටයුතු නිම කොට 2018 වසර වන විට ප්‍රේක්ෂකයන් වෙත ගෙන ඒමට චිත්‍රපට කණ්ඩායම අදහස් කර ඇත. ජුරාසික් වර්ල්ඩ් -2 පිළිබඳව කණින් කොනින් ලැබෙන ආරංචිවල දැක්වෙන්නේ දෙවන කොටස සඳහාද පළවන කොටසෙහි රංගනය සිදුකළ Chris Pratt සහ Bryce Dallas Howard තෝරාගෙන ඇති බවයි. අලුත් චිත්‍රපටයේදී ඔවුන්ගේ චරිත ඩයිනෝසෝර පුහුණු කරුවකු සහ ප්‍රධාන උද්‍යාන පාලකවරියක ලෙස වෙනස් වීමට ඉඩ ඇති බවද පැවසේ. ජුරාසික් වර්ල්ඩ් කතා මාලාව කතාංග තුනකින් නිර්මාණය කිරීමට මුල සිටම කටයුතු යොදා තිබුණු බවත් ඒ අනුව මේ එහි දෙවන කොටස මෙසේ නිෂ්පාදනය කරන බවත් අධ්‍යක්ෂවරයා පවසා තිබුණි.

ලෝකයෙන් වඳ වී ගිය සත්ව කොට්ඨාසයක් වන ඩයිනෝසරයන් පිළිබඳව කතා පුවත් නොයෙක් වර සිනමාව නැගී ඇති අතර පළමු වතාවට සිනමාව තුළ ඩයිනෝසරයන් හමුවන්නේ 1914 දීය. ඒ වින්සර් මැක්කේ විසින් තැනූ Gertie the Dinosaur චිත්‍රපටයෙනි. 1917 දීද ඩයිනෝසරයන් සිටින චිත්‍රපටයක් එළි දැක ඇති අතර එය තෝමස් අල්වා එඩිසන් විසින් නිෂ්පාදනය කළ The Dinosaur and the Missing Link වේ. මේ ආකාරයට ඩයිනෝසර කතා රැගත් චිත්‍රපට කීපයක්ම එළි දැක තිබුණත් ස්ටීවන් ස්පීල්බර්ග් ගෙන ආ ඩයිනෝසර සිනමා කතා මාලාව තරම් ජනප්‍රියත්වයට පත් වීමට ඒ කිසිවකට අවස්ථාවක් නොලැබුණි.

1993 දී ප්‍රදර්ශනය වූ 'ජුරාසික් පාක්' එහි පළමුවැන්න වන අතර එම චිත්‍රපටය නිමකිරීම සඳහා ඩොලර් මිලියන 63 ක් වැය කර තිබුණි. තිරගත වී වසර ගණනාවක් යන තුරුම (1997 වනතුරු) ලෝකයේ ඉහළම ආදායමට හිමිකම කියූ චිත්‍රපටය එය විය. ජුරාසික් පාක් ආදායම් වාර්තාව බිඳ හෙලන්නේ ස්පීල්බර්ග ‘ම වීම මෙහි ඇති තවත් විශේෂත්වයකි. ඒ ඔහු විසින් 1997 දී නිර්මාණය කරන ලද ටයිටැනික් චිත්‍රපටයෙනි.

මේ ඩයිනෝසර් චිත්‍රපට පෙළේ දෙවැන්නද ස්පීල්බර්ග් විසින්ම අධ්‍යක්ෂණය කරනු ලැබූ අතර එය 'ලොස්ට් වර්ල්ඩ්' නම් විය. 1997 දී තිරයට ආ ලොස්ට් වර්ල්ඩ් සඳහා ඩොලර් මිලියන 73 ක් වැය කර ඇත. එහෙත් එය ජුරාසික් පාක් තරම් ආදායමක් ඉපයීමට සමත් වී නැත. මෙම කතා මාලාවේ තෙවැන්න 'ජුරාසික් පාක් - 3' ලෙසින් 2001 වසරේදී එළිදුටු අතර එහි විධායක නිෂ්පාදකවරයා ස්පීල්බර්ග්ම විය. ඩොලර් මිලියන 93 ක් ඒ වෙනුවෙන් යොදවා තිබුණි. එයද පළමුවන ජුරාසික් පාක් චිත්‍රපටය තරම් ආදායම් ඉපයූවේ නැත.

මේ චිත්‍රපට පෙළ නිපදවීමෙන් පසු දිගු කළක් නිහඬව සිටි ස්පීල්බර්ග් ඇතුළු ජුරාසික් නිෂ්පාදන කණ්ඩායම නැවතත් ඩයිනෝසරයන් ඇතුළත් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට අත ගැසුවේ 2014 වසරේදීය. ත්‍රිමාණ ක්‍රියාදාමයන් සහිත නවීන ප්‍රේකෂකයන්ට අවශ්‍ය සර්ව සම්පූර්ණ චිත්‍රපටයන් ලෙස එළි දැක්වුණු මෙය 'ජුරාසික් වර්ල්ඩ්' නම් විය. චිත්‍රපටය සෑදීම සඳහා මුළු පිරිවැය ඩොලර් මිලියන 150 ක් වැය වී තිබුණි. ජුරාසික් වර්ල්ඩ් ප්‍රේක්ෂකයින්ට අලුත්ම අත්දැකීම් රැසක් ගෙන ඒමට සමත් වූ චිත්‍රපටයකි.

2014 අප්‍රේල් මාසයේදී හවායිහිදී රූගත කිරීම් ආරම්භ කළ මෙම චිත්‍රපටයේ වැඩ නිම කිරීමට දින 78 ක් ගත වී තිබුණි. හවායිවලට අමතරව නිව් ඕර්ලියන්ස්, ලුසියානා හා කොස්ටාරිකාවේද මේ රූ ගැන්වීම් සිදුකර තිබුණි. 2015 ජූනි 12 වන දින මුල්ම වරට ජුරාසික් වර්ල්ඩ් තිරගත කිරීම ඇරඹුනු අතර එදින ජුරාසික් චිත්‍රපට කණ්ඩායමට විශේෂිත දිනයක්ද විය. ඒ හරියටම ඊට වසර 22 කට පෙර 1993 ජූනි 11 වන දින ජුරාසික් පාක් පළමුවන චිත්‍රපටය තිරගත කර තිබීමයි. ලොව පුරා IMAX සිනමා ශාලා 809 ක් ඇතුළුව දහස් සංඛ්‍යාත සිනමා ශාලාවල ප්‍රදර්ශනය කෙරුණු 'ජුරාසික් වර්ල්ඩ්' දින දෙකක් ඉක්ම යන විටම උතුරු ඇමරිකාවේ පමණක් ඩොලර් මිලියන 204.6 උපයා ගැනීමට සමත් වී තිබුණි.



# රියෝ ඔලිම්පික් 2016

සෑම වසර 4 කටම වරක් පැවැත්වෙන ගිම්හාන ඔලිම්පික් ක්‍රීඩා උළෙල මෙවරත් අගෝස්තු 05 දා බ්‍රසීලයේ රියෝ දි ජැනොයිරෝහිදී ආරම්භ වේ. මේ මහා ක්‍රීඩා සැණකෙළිය අගෝස්තු 21 වනදා දක්වා පැවැත්වීමට නියමිත අතර ඒ වෙනුවෙන් අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර ඇති බව ඒ පිළිබඳ වන පුවත් වාර්තා දක්වා සිටී. ගිම්හාන ඔලිම්පික් උළෙලට සමගාමීව පවත්වන පැරා ඔලිම්පික් තරග සැප්තැම්බර් 7 දා සිට 18 වෙනිදා දක්වා පැවැත්වීමට නියමිතව ඇත.

පසුගිය වසර මැද භාගයේ පමණ සිට Zika වෛරස නිසා බොහෝ පුවත් මැවූ බ්‍රසීලය බොහෝ දෙනෙකු තුළ ත්‍රාසයක් ඇති කළ රටක් විය. මේ වන විටත් Zik භීතිය මග හැරී නොතිබුණත් ඔලිම්පික්වලට එය බාධාවක් නොවන බවත් සහභාගිවන සියල්ලන්ගේම සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සහතික වන බවත් සංවිධායකයින් තරයේ පවසා තිබුණි. කෙසේ වුවත් එම රෝ බිය මැදම දැන් ඔලිම්පික් ඇරඹේ.

ඔලිම්පික් ගැන ලැබෙන නවතම ආරංචි අතර රුසියානු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පැනවීමට සූදානම් වූ තහනම පිළිබඳව බොහෝ දෙනෙක්ගේ අවධානය යොමු වී ඇත. මෙවර උළෙල සඳහා සහභාගි වන රුසියානු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තහනම් උත්තේජක ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද බවට රුසියානු රාජ්‍යයට චෝදනා එල්ල වීමත් සමග එරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගිත්වය පිළිබඳ ගැටලු මතු විය. මෙහිදී ජගත් තහනම් උත්තේජක නිවාරණ ආයතනය පැවසුවේ හෙළිදරව් වූ තොරතුරුවලට අනුව සියලුම රුසියානු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රියෝ ඔලිම්පික් උළෙල තහනම් කළ යුතු බවයි. එහෙත් මෙහිදී සමස්ත රුසියානු ක්‍රීඩක ක්‍රීඩිකාවන් තහනම් කිරීමට විරුද්ධත්වය පළ කිරීමට ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව කටයුතු කර තිබුණි. ඔවුන් එහිදී එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරනු ලැබුණි. ඒ අනුව එයින් සුදුසුකම් ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිය ගණනක් මේ වන විට රියෝ ඔලිම්පික්හි තරග වැදීමට සූදානම්ව සිටී.

මෙවර පැවැත්වෙන ඔලිම්පික් උළෙලෙහි විශේෂ තොරතුරු කීපයක් මෙසේයි.

දකුණු ඇමරිකානු රටක් ගිම්හාන ඔලිම්පික් හා පැරා ගිම්හාන ඔලිම්පික් සත්කාරත්වය උසුලන ප්‍රථම අවස්ථාව මෙයයි. බ්‍රසීලයේ රියෝ දි ජනයිරෝ නගරය ඔලිම්පික් පැවැත්වීම සඳහා සුදුසුකම් ලද බව නිවේදනය කෙරුණේ 2009 දීය. එහිදී ස්පාඤ්ඤයේ මැඩ්රිඩ්, ඇමරිකාවේ චිකාගෝ සහ ජපානයේ ටෝකියෝද 2016 ඔලිම්පික් එම නගර වෙත ලබාගැනීම සඳහා ඉදිරිපත් වී තිබුණි.

නූතන ඔලිම්පික් තරගාවලිය ආරම්භ වීමත් සමග පවත්වා ඇති සමස්ත තරග සංඛ්‍යාව 27 කි. ඉන් 16 ක් යුරෝපයේත් 6 ක් උතුරු ඇමරිකාවේත් 3 ක් ආසියාවේත් 2 ක් ඕස්ට්‍රේලියාවේත් පවත්වා ඇත.

මෙවර ඔලිම්පික් උළෙල සඳහා රටවල් 206 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10,500 ක් සහභාගි වේ.

දින 17 ක කාලයක් පුරා ක්‍රීඩා අංශ 28 ක් මෙවර පැවැත්වේ. මෙවර සිට ඔලිම්පික් තරගවලට අලුත්ම ක්‍රීඩා දෙකක්ද ඇතුළත් කොට ඇති අතර ඒ ගොල්ෆ් සහ සත් සාමාජික රග්බි යන අංශ දෙකයි. ගොල්ෆ් සහ රග්බි යන ක්‍රීඩාව අතීතයේදී ඔලිම්පික් තරගාවලිය තුළ තිබී ඇති අතර ගොල්ෆ් නැවතත් ඇතුළත් කොට ඇත්තේ වසර 112 කට පසු වන අතර රග්බි වසර 92 කට පසු නැවතත් ඔලිම්පික්වලට එක් වී ඇත.

තරග කාණ්ඩ 42 ක් යටතේ ඉසව් 306 මෙවර පැවැත්වේ. එම ඉසව් අතර පිරිමි ඉසව් 161 ක්ද කාන්තා ඉසව් 136 ක්ද මිශ්‍ර තරග ඉසව් 9 ක්ද ඇතුළත් වී ඇත.

මෙවර ඔලිම්පික් ධජය යටතේ සරණාගත ක්‍රීඩක ක්‍රීඩිකාවන් 5 ත් 10 ත් අතර සංඛ්‍යාවක් තරග වැදීමට නියමිත අතර තමන්ගේ මවු රටින් පළා ගිය ක්‍රීඩක ක්‍රීඩිකා කණ්ඩායමක් ඔලිම්පික් උළෙලක තරග වදින ප්‍රථම අවස්ථාව මෙයයි.

2016 අප්‍රේල 21 වනදා චාරිත්‍රානුකූල ඔලිම්පික් ගිනිසිළුව ඔලිම්පික් උපන් බිම වන ග්‍රීසියේ ඔලිම්පියාවෙන් බ්‍රසීලය දක්වා පැමිණීමට ගමන් ආරම්භ කර ඇත. ඔලිම්පියාවෙන් ග්‍රීසියේ අතැන්ස් දක්වා රැගෙන ආ ගිනිසිළුව ඇතැන්ස් කිට්ටුව ඇති Eloenas සරණාගත කඳවුර හරහා යන අවස්ථාවේදී එය අත දැරීමේ වාසනාව එහි පදිංචිකරුවකුටද හිමිවීම විශේෂත්වයකිශ්‍රී

2016 මැයි 03 වන දා ගිනිසිළුව බ්‍රසීලය වෙත ගෙන ආ අතර Brasilli නගරයෙන් එහි ගමන ආරම්භ වියශ්‍රී මේ වන විට ගිනිසිළුව බ්‍රසීලයේ ප්‍රධාන ජනපද 26 ක් පුරා නගර 300 කට අධික සංඛ්‍යාවක් ආවරණය කරමින් රියෝ දි ජනයිරෝ වෙත ළඟා වෙමින් පවතී. (පුවත්පත නිකුත් වන අවස්ථාව වන විට ගිනි සිළුව රියෝ දි ජනයිරෝහි දැල්වෙනු ඇත)

2016 ඔලිම්පික් සමාරම්භක සහ සමාප්ත උළෙලවල් රියෝ නගරයේ Maracanã Stadium හි පවත්වනු ඇත. මෙතෙක් ලොව පාපන්දු තරගයක් නැරඹීම සඳහා පැමිණි විශාලතම ක්‍රීඩා ලෝලීන් සංඛ්‍යාව පිළිබඳ ලෝක වාර්තාව හිමිකරගෙන ඇත්තේ මේ ක්‍රීඩාංගනයයි. 1950 පැවති එම ලෝක කුසලාන පාපන්දු අවසන් මහා තරගය නැරඹීම සඳහා මේ ක්‍රීඩාංගනයට අවම වශයෙන් 173,000 පමණ පිරිසක් සහභාගි වී ඇති බව සඳහන් වේ. 2014 වසරේ ලෝක කුසලාන පාපන්දු අවසන් මහා තරගය පැවැත්වූයේද Maracanã ක්‍රීඩාංගනයේයි. මෙම ක්‍රීඩාංගනයේ වර්තමාන ක්‍රීඩාලෝලී ධාරිතාව 78,000 ක් පමණ වෙතැයි සඳහන් වේ.

තරගාවලියේ තරග ඉසව් රියෝ නගරයේ ප්‍රධාන පළාත් 4 ක පැවැත්වීමට නියමිතව ඇත. Copacabana - ලෝක ප්‍රසිද්ධ සුන්දර වෙරළ තීරයක් මේ පළාතේ පිහිටා ඇත. මෙවර බීච් වොලිබෝල් මෙහි පැවැත්වේ. Barr - මෙවර ඔලිම්පික් ගම්මානය සහ ප්‍රධාන ක්‍රීඩාගාරය මෙහි පිහිටා ඇත. Deodoro - මෙවර ජල ක්‍රීඩා, බයිසිකල් ධාවන තරග, අශ්වාරෝහක තරග මෙහි පැවැත්වේ. Maracanã - සෙසු සියලුම තරග මේ ප්‍රධාන ක්‍රීඩාංගනය තුළ ඇති විශාල ක්‍රීඩාගාර දෙකක පැවැත්වෙනු ඇත.

ඔලිම්පික් ගම්මානයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා එක් දිනකදී කෑම වේල් 60,000 ක් සෑදෙන බව ඔලිම්පික් සංවිධායකයෝ සඳහන් කරති. මෙහිදී බ්‍රසීලියානුවන්ට ආවේණික ආහාර වේල් ලබාදීමට මූලිකත්වය දී ඇති තර ඒ ඒ රටවලින් ආ අයට තම කැමැත්ත පරිදීද කෑම තෝරාගත හැකි ලෙස කටයුතු සූදානම් කර ඇත.

ස්වේච්ඡා සේවකයින් 70,000 ක්ද ආරක්ෂ අංශ සාමාජිකයින් 85,000 ක්ද මෙවර ඔලිම්පික් උළෙල වෙනුවෙන් සිය සේවය ලබා දෙයි.



# අවදිමත් සිත



■ චන්ද්‍රා වික්‍රමාරච්චි

මේ සිත ප්‍රසන්නය. පාරිශුද්ධය. ඇස ආදි පංචේන්ද්‍රියයන් නිසා ඒවායින් ගෙනෙන බාහිර අරමුණුවලින් සිත කිළිටි වෙයි. පෙර භවයේ මරණාසන්න සිත හෙවත් චුති චිත්තය කුසල කර්මයක ප්‍රතිඵලයකි. එයට අනුරූපව වර්තමාන උපතේදී ප්‍රතිසන්ධි සිත පහළ විය. අතොරක් නොමැතිව බිඳී බිඳී යමින් ක්ෂණයක් පාසා එයට අනුරූපව එවැනිම සිත් ඇති වෙයි. එය භවාංග චිත්තයයි. එහෙත් බාහිර අරමුණු එම භවාංග චිත්තයෙහි ගැටී එකිනෙකට වෙනස් විවිධාකාර සිතුවිලි සහිත සිත් පහළ කරයි.

සිතක ආයු කාලය ඉතා කුඩාය. ඇසි පිය ගැටෙන ක්ෂණයකදී ඉපදී බිඳී යමින් ලකෂ කෝටි වාරයක් සිත ඇතිවේ. මෙය සාමාන්‍යයෙන් පුදුම සහගතය. මෙසේ ඇතිවන සිත් පරම්පරාව ගැන අවදියෙන් සිටීමට නම් සිතෙහි ස්වභාවය හඳුනාගත යුතුයි. ඇස, කන, නාසය, දිව හා ශරීරය යන ඉන්ද්‍රියයන්ගෙන් ලැබෙන අරමුණු භවාංග සිතෙහි හැපීම නිසාම මෙම සිත හෙවත් විඥානය ඇතිවෙයි. ඇසට රූපයක් ගැටෙයි. එවිට වේදනා හෙවත් විඳීම සිදුවෙයි. එය සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින්නේ දැකීම යනුවෙනි. ඒ වේදනාව සමග සම්මිශ්‍රව සංඥාව හටගනී. එනම් දකින දෙය පැහැය හැඩය ආදි වශයෙන් හඳුනා ගැනීම සිදුවෙයි. එය සතුට, දුක හෝ ඒ කිසිවක් නොවන උපේක්ෂාවද යන්නත් එක් වරම දැනීම් වශයෙන් ලැබේ. මෙය ඉතා සරල ලෙස අත්හදා බැලිය හැකියි. දැන් දුටු වස්තුවේ ස්වභාවයත් එය ප්‍රිය සතුට දනවන්නක්ද එසේ නොවේ නම් අප්‍රිය හෝ උපේක්ෂා සහගත වීමක්ද යන්න අවබෝධයෙන් විඳගත් පසු එහි හොඳ හෝ නරක ආදි විවේචනයන් සිතෙහි ඇතිවේ. මෙය දකින දෙය පිළිබඳව ඇතිවන චක්ඛු විඥානය හෙවත් දැකීමේ සිතයි.

ශබ්දය, ගන්ධය, රසය ස්පර්ශය ආදි සෑම අරමුණු ගැනීමකදීම සිදු වන්නේ මෙයට සමාන ක්‍රියාදාමයකි. දැකීම ඇසීම ආදියට වස්තු වන සියලු අරමුණු කරා වේගයෙන් ඉගිලෙමින් යන මේ සිතෙහි ක්‍රියාකාරීත්වය කරන කරවන කිසිවෙකුදු නැත. සිතෙහි ස්වභාවය එයයි. පාලනයකින් තොරව නිදැල්ලේ හැසිරෙන සිතද පටිච්ච සමුප්පන්නය. එනම් එය හේතුඵලවාදීව සිදු වන්නකි. එම ගැඹුරු කරුණු ගැන වෙනම ම සාකච්ඡා කළ යුතුව ඇත. විසිරී යන සිතෙහි ස්වභාවය 'උද්ධච්චය' යැයි සනාථන බුදු දහමෙහි දැක්වේ. එම ස්වභාවය නිරීක්ෂණය කිරීමත්, එහි එල්බ සිටීමත් නිසා අකුසල සිතුවිලි මඟ හරවා එයින් වන අසහනය ඉවතලා සැනසීම ලද හැකිය.

තවත් උදාහරණයක් ලෙස කනට ශබ්දයක් ඇසේ. ඒ හඬ රළුය. අහිමිරිය. එහි ස්වභාවය හඳුනාගනිමින්ම එම දුක් වේදනාවත්, ඒ පිළිබඳ විවරණයකුත් නිකුත් කරමින් ශෝක විඥානය පහළ වෙයි. මෙහිදී දුක් වේදනාවක් පහළ වීමත් සමගම ද්වේශ සිතක් හෙවත් අප්‍රිය ජනක සිතක් තමාට පහළ වූ බව අවදියෙන් දැන සිටිය යුතුය. මෙමගින් ක්‍රෝධය හෙවත් අධික කෝපයද නිවාගත හැකිය. මෙම සිත යනු තමා නොව තමාගේද නොව හටගැන්මක් පමණක්ම බව අවබෝධ වන නිසා අකුසල සිතක් මතුවීමට අවස්ථාව නොලැබේ. පංචේන්ද්‍රියයන් වෙත ප්‍රියජනක අරමුණු ගැටුණු විට ඇලුම් සහිත වූ රාග සිත් පහල වේ. එයද අවදිමත් සිතකින් හඳුනාගත විට උපාදානය හෙවත් අල්වා ගැනීමකින් තොරව මැකී යයි. රූප, වේදනා, සංඥා මතින් සංඛාර හෙවත් සිතුවිලි ගොඩනඟා ගැනීමෙන් රාග හෝ ද්වේශ යන අකුසල මූලයන්ට සිත යොමු වේ. එහෙත් මෙසේ ලැබෙන සංඥා මගින් සතුට විඳ ගැනීම අකුසලයට මුල් නොවේ. එහෙත් එය සංඛාර තත්ත්වයට ඔසවා තබා උපාදානයෙන් තෘෂ්ණාවෙහිම එල්බ ගැනීම් අකුසලයෝය. ඒ බව නොදැන සිත හඳුනා නොග ැනීම මෝහයේ ලක්ෂණයයි. රාග, ද්වේශ මෝහ යනු අකුසල මූලයන් යැයි බුදුරජාණන්වහන්සේ දේශනා කර ඇත්තේ එහෙයිනි. සිත යන්න මම නොවන බවත් මගේ නොවන බවත් එය හේතුවාදී දහමක් බවත් වටහා ගනිමින් ප්‍රඥාව වර්ධනය කර ගත හැකිය. මේ සඳහා අවදිමත් සිතකින් ලැබෙන ආශිර්වාදය නිවනට මගකි.

# ක්ලාක්



## කෙටි කතාව

■ පර්සි වර්ණකුල

'ක්ලාර්ක්' යනු බල්ලාගේ නමයි. උෟ ලියන මහතාගේ ගෙදර බල්ලා වූයේ අහම්බයෙනි. සෑම අහම්බයක්ම ක්ෂණිකය. ගැටලු සහිතය. ඒ නිසාම විවාදාත්මකය. එහෙත් සමහර අහම්බයන් ඊයම් බරු මෙන් ජීවිතයේ පතුළටම කිඳා බැස හදවතම ස්පර්ශ කරයි. එවැනි අහම්බයන් සඳහා මතකයේ ස්මාරකයන් පවා ඉදිවනු ඇත.

එක්තරා උදෑසනක ලියන මහතාගේ බිරිඳ ස්තෝප්පුවේ පාපිස්ස මත නිදා සිටින බලු පැටවා දුටුවා. කටුවන් කෑමෙන් ලොම් හැලී ගිය උගේ සිරුර සාගිනි ඉසිලීම නිසාම කටු ගොඩක් බවට පත්ව තිබුණා. ඇය එකවරම කෑ ගැසුවේ බයට නොව පිළිකුලටයි. මැස්සන් විසින් නිරන්තරයෙන් අලුත් කරනු ලැබූ ඕජස ගලා ගිය උගේ තුවාල ඇගේ අතුණු බහන් ඇයට එරෙහිව පෙරළි කරන්නට පෙළඹෙව්වා. ඇය ඔක්කාරය නවතා ගත්තේ ලොකු ආයාසයකින්. බලු පැටවා දැකීමෙන් ගෙදර හැමෝම කලබල වුණා. උෟ කෙරෙන් පහළ වූයේ දරුණු ලෙස පහර දී බලය යොදා නිරන්තරයෙන් පලවා හරිනු ලැබූවකුගේ ඛේදවාචකයයි.

"මේ ජරා සතාට මොකද කරන්නේ...?"

"එළවා දාමු"

ප්‍රශ්නයට උත්තරය වූයේ එයයි.

එහෙත් උෟ පලවා හැරීම ලේසි පහසු වුණේ නෑ. බලු පැටවා මහ හඬින් විලාප නගමින් වරක් දෙවරක් නොව කිහිප වරක්ම ගේ වටා දිව්වා. අහුමුලුවල සැඟවෙමින් ජීවිතය ඉල්ලා කෑ මොර ගැසුවා. බැරිම තැන ලියන මහතා කථා කළා.

"ඔන්න ඔහෙ උන්නාවේ. තියෙන විදියට කන්න දීලා හදාගන්න බලමු."

"මේකා පිස්සු බලු පැටියෙක්ද දන්නේ නැහැ. මට නම් පේන්නේ එහෙමයි" ලියන මහතාගේ බිරිඳ විරුද්ධ වුණා.

"කමක් නැහැ. ටික දවසක් බලමු" ලියන මහතා තීරණාත්මකව කීවා.

එතැන් පටන් බලු පැටවා ලියන මහතාගේ ගෙදර රැඳුණා. උෟ නහවා, කවා පොවා, බෙහෙත් ගල්වා, සාත්තු කළේ ලියන මහතාමයි. ඔහුගේ සිතේ බලු පැටවා කෙරෙහි මහත් අනුකම්පාවක් ඇති වෙමින් තිබුණා. ඔහුගේ සාත්තු සප්පායම් නිසා බලු පැටවාගේ රෝගී පෙනුම ක්‍රමයෙන් පහව ගියා. කරදඬු උස් මහත් වෙන්න පටන් ගත්තා. නැවත වැඩුණු ලොම් කැටිය උෟට සම්භාවනීය 'නාඹර පෙනුමක්' ලබා දුන්නා. ඒ සමගම උගේ හැසිරීමත් වෙනස් වුණා. ගෙවල් මායිමේ දඬාවතේ යන බල්ලකු දුටු විට උගෙන් තැතිගැන්වෙන සුළු තර්ජනාත්මක ගෙරවිලි හඬක් මතුවෙන්නට පටන් ගත්තා. මේ නිසාම උෟට කර පටියක් හා දම්වැලක් ඉක්මනින්ම ලැබුණා.

දිය නෑමෙන් පසු තෙත සිඳෙන තුරු නිදැල්ලේ ගත කරන මොහොත බල්ලාගේ ප්‍රමෝදජනක වේලාව වුණා. කෙටි හුස්ම හෙළමින්, මිදුල පුරා දුව පැන, වැල්ලේ පෙරළෙමින්, ඉතාමත් කෙළිලොල්ව උෟ ලැබූ නිදහස භුක්ති වින්දා. ප්‍රථම වරට ලියන මහතා බල්ලාට 'ක්ලාර්ක්' කියා ඇමතුවේ එවන් මොහොතකයි. බල්ලා හිස ඔසවා කන් ඒ මේ අත යොමු කරමින් බලා සිටියා. නැවතත් ලියන මහතා අසරුසන් දෙමින් 'ක්ලාර්ක්' කියා බල්ලාට කතා කළා. බල්ලා දිවැවිත් ඔහු හා දැවටෙමින් කෙඳිරි ගාමින් ලෙවකමින් ඇගෑලුම්කම් පාන්න වුණා. ඒ දෙස බලා සිටි බිරිඳ,

"උෟට ඒ නම ගැළපෙන්නේ නැහැ නේද?"

"ඇයි මොකෝ?"

"මිනිස්සු ඔයාට ක්ලාර්ක් කියනවා. ඒක හරි මදි"

"ඉතින් මොකද වෙන්නේ. උෟත් මා වගේ එකෙක්"

"ඔයාගේ මනස්ගාත අනේ මන්දා" බිරිඳ නිහඬ වුණා.

කලකට පෙර මාසයක් ඇතුළත තමාව හතර පොළකට මාරු කිරීම පිළිබඳව අමිහිරි මතකය ලියන මහතාගේ සිතින් දුරු වී නැහැ. සේවා කාලය අනුව ඔහුට හිමි විය යුතු උසස්වීම් පවා තවම ඔහුට ලැබී නැහැ. ඔහු එය අසාධාරණයක් ලෙස සැලකුවා. ඒ නිසාම ඔහු වෘත්තීය පිළිබඳව කළකිරුණා. තම වෘත්තිය 'බල්ලාට ගියා' වැනි හැඟීමක් ඔහු තුළ මෝදු වෙමින් තිබුණා. ඔහු බල්ලාට ක්ලාර්ක් කියා ඇමතුවේ මේ නිසා විය හැකිය. ඉන් හාස්‍යජනක වින්දනයක් මෙන්ම ආත්මතෘප්තියක්ද ඔහු ලැබුවා. පෞද්ගලික ලිපි ගොනුවේ තුන්වන ශ්‍රේණියේ ලිපිකරු යන්න තම ගෙලට හිර කර ඇති දම්වැල බවත්, ඉන් ඔහු බැඳ දිගේලි කර ඇති බවත් ඔහු සිතුවා. "උෟත් මං වගේ එකෙක්" නැවත වරක් තමාටම කොඳුරා ගත්තා.

නාඹර පෙනුමෙන් සෙසු බල්ලන් තැති ගන්වමින් ජවසම්පන්නව 'ක්ලාර්ක්' වැඩුණා. උෟ අනුකම්පා විරහිතව දත් විලිස්සාගෙන ගෙරෙව්වා. කඩා පැන සපා කමින් සෙසු බල්ලන් පාගා දැමුවා. උගේ අලුගෝසුකම් ඉදිරියේ බොහෝ බල්ලන් වලිගය බඩයට රුවාගෙන පලා ගියා. සමහරු කෙඳිරි ගාමින් තුන් අණ්ඩෙන් ගමන් කළා.

පැටිකිරිය කෙසේ වුවත් 'ක්ලාර්ක්' ලියන මහතාගේ ගෙදර හුරතලා මෙන්ම ආරක්ෂකයාද වුණා. කාලයත් සමඟ බල්ලා පිළිබඳ වැඩි වැඩ කොටසක් පැවරුණේ ගෙදර ස්වාමි දුවටයි. ඇය බල්ලාට 'ක්ලාර්ක්' කියා ඇමතුවේ වටපිටාවට නොදැනෙන්න ඉතා පරිස්සමින්. එහෙත් ගමේ අය එම ගෙදර 'ක්ලාර්ක්' ලා දෙන්නෙක් ඉන්නා බව දැන සිටියා.

ලියන මහතාගෙන් සිදුවන සමහර ප්‍රමාදයන් බිරිඳ සැලකුවේ තරමක් බරපතළ ලෙසින්, එහිදී විත්තිකරුවා හා සමතකරුවා වශයෙන් දුක්ගන්නා රාළ බවට පත්වූයේ බල්ලයි. ලියන මහතා මිතුරු සාදයකට මැදිව රෑ බෝ වී බමන මතින් ගෙදර පැමිණියේද, පසුදින 'ක්ලාර්ක්' ඇති පදම් බැණුම් ඇසුවා. එදා වූයේද එයයි. ඇය මිට මොළවා ගත් අතේ දබරැගිල්ල ලෙලවමින් බල්ලාට බැණ වදින අන්දම කන්තෝරු යන්න සූදානම් වන ලියන මහතා මඳක් නැවතී අසා බලා සිටියා.

"මේ ක්ලාර්ක් උන්නැහේ තමුසේ දැන් රෝන්දේ යන්න පටන් අරන් වගේ රෑ දෙගොඩහරි ජාමේ වැනි වැනි ගෙදර ආ හැටි මං දැක්කේ නැහැ කියල හිතුවද?"

කෙළිලොල් ගතියෙන් ඔද වැඩුණු බල්ලා මඳක් ඈතට දිව ගොස් හිස ඔසවාගෙන හිඳගත්තේ තවත් පිම්මකට සූදානම් වෙමින්.

"වැරදි වැඩ කරල සමාව ඉල්ලන්නද හදන්නේ. අද නම් මගෙන් කිසිම සමාවක් නෑ. දම්වැල ගත්තොත් දන්නව මං කරන වැඩේ" ඇය දැත් වනමින් බැණ වදිද්දී බල්ලා සිතුවේ ස්වාමි දුව තමාට අත වැනුවා කියායි. උෟ පිම්මක් පැන සුරතල් වෙන්න දිව එමින් සිටියා.

"එපා එන්න මං ළඟට. යන්නයි කීවේ අහකට. හඬු ගඳේ බෑ. බඩ දැඟලනවා" ඇය නහය හකුලාගෙන නැවතත් බැණ වැදුණා. මේ සියල්ල අසා බලා සිටි ලියන මහතා මඟ හැර යෑමට අවස්ථාව බලා සෙමින් සීරුවේ මිදුලට බැස්සා. එහෙත් ඔහුට යෑමට හැකි වූයේ පියවර කිහිපයක් පමණයි.

"අපේ මහත්තයා.... අපේ මහත්තයා..." යි අමතමින් ඇය අඩියට දෙකට ඔහු අසලට පැමිණියා. ලියන මහතාගේ මුහුණ රතු කරමින් ඇය සිනාසුණා.

"අර සියදෝරිස්ගෙ බැල්ලි ගමේම බල්ලන් පිරිවරාගෙන ගම වටේ දුවනවා. අපේ ක්ලාර්ක් කරපටිය කඩාගෙන ඒ නඩයට එකතු වෙලා. අනේ එද්දී මතක් කරලා කර පටියක් ගේන්න. නැත්නම් මූව මේච්චල් කරන්න අමාරුයි" ඇය කීවාය. ලියන මහතා හුස්මක් අල්ලා ළය සැහැල්ලු කර ගෙන කාර්යාලයට පිටත්ව ගියේ ඉන් පසුවයි.

ඔහු කරපටිය ගෙන වෙනදාටත් කලින් ගෙදර පැමිණියද, කරපටියෙන් පලක් වූයේ නැත. බලු නඩය සමඟ කා කොටා ගනිමින් පාර පනිමින් සිටි ක්ලාර්ක් වාහනයකට යට වී මියගිය බව ඔහුට මඟදීම ආරංචි වුණා. ගෙදර සියල්ලන්ම පසුවූයේ දැඩි කම්පනයකින්. බිරිඳ කම්මුලට අත තබාගෙන බලාගත් අත බලාගෙනම සිටියා. තම වෘත්තීය ජීවිතයේ 'හාස්‍යජනක ආස්වාදය' ක්ලාර්ක් අකාලයේ මිය යෑමේ වේදනාව ඔහු නිහඬවම විඳ දරා ගත්තා. වත්ත මායිමේ යන එන සතා සිව්පාවට බුරා පනිමින් ක්ලාර්ක් නැගූ ගාම්භීර හඬ නිවී ගොස් පරිසරයේ සජීවී බව හිඳී ගියා මෙන් ඔහුට දැනුණා. ඒ නිහැඬියාව ගේ තුළට ගලා යමින් ගෙදර එකිනෙකාද හුදකලා කරනු ලැබුවා. බිරිඳ ක්ලාර්ක්ගේ කෑම බඳුන සෝදා පරිස්සම් සහිතව තැබුවේ එය දැකීමෙන් සිත් පෑරෙන නිසා විය හැකියි.

කාලය ගෙවී ගියා. එදා වැඩ ඇරී ගෙදර එන ලියන මහතාගේ රුව යන්තමට ගුරු පාරෙන් මතු වූවා පමණයි. බිරිඳ වහ වහා පෙරමගට ගමන් කර ඔහුගේ කාර්යාලීය බෑගය දෝතින්ම ගත්තා. ඇගේ ඇස් බැබළුණාය. ඇගේ මුහුණ සතුටින් පිපී තිබෙන බව ඔහු දැක්කා.

"දන්නවද වැඩක්. සියදෝරිස්ගෙ බැල්ලි පැටවුන් දාල" ඈ ඉස්පාසුවක් නැතිව කීවා.

"අපේ ක්ලාර්ක් වගේ පැටවුන් තුන්දෙනෙක්ම ඉන්නවා. දෙන්නෙක් බල්ලෝ. අනික් බැල්ලියක්. බැලි කික්කි ඇරපු අතක් නෑ ක්ලාර්ක්ගේම කපාපු පලුවක්" ඇය කියාගෙන කියාගෙන ගියාය.

"කොහොමද ඔච්චර විස්තර දන්නේ." ලියන මහතා පුදුමයෙන් ඇය දෙස බැලුවා.

"බැල්ලි පැටව් දානකම් මම ඇඟිලි ගැන ගැනයි හිටියේ. මං නිච්චියටම හිතුවා අපේ ක්ලාර්ගේ පැටව් ඒ ගොඩේ ඉන්න ඕනෑ කියා"

ක්ලාර්ක් පණ ලැබී නැවත ගෙදර ආවා වැනි සතුටක් ඇය භුක්ති වින්දාය. ඒ සතුට ලියන මහතාටද බෝ වුණා වගේ

"හොඳයි මම සියදෝරිස්ට කියන්නම් අර පැටික්කිව අපට දෙන්නයි කියලා" ඒ ඇසූ බිරිඳගේ මුහුණ වෙනස් වුණා.

"අපොයි බැල්ලිව නම් එපා. අපි බලු කුක්කෙක් ඉල්ලා ගනිමු"

"ඔහේම නේද කිව්වෙ බැලි කික්කි ක්ලාර්ක්ගේ කපාපු පලුවක් කියලා"

"ඒක ඇත්ත ඒ වුණාත්" ඇය ළතවුණා.

"ඒ වුණාත් කියන්නේ ඇයි මොකක්ද ප්‍රශ්නේ"

"ඒක තමයි එතකොට අපි කොහොමද බැලි කික්කිට ක්ලාර්ක් කියන්නේ"

ලියන මහතා තිගැස්සී මොහොතක් ඇය දෙස බලා සිටියා. එක්වරම මහ හඬින් සිනාසෙන්න පටන් ගත්තා. ඇය

දෑස් අයාගෙන මහත් විමතියෙන් ලියන මහතා දෙස බලා සිටියා.

"කමක් නැහැ. අපි හඩු ගඳ ගහන, බැණුම් අහගෙන වලිගෙ වනන පුංචි 'ක්ලාර්ක්' පැටියෙක් ගේමු" ඔහු සිනාසෙමින් බිරිඳගේ ඉල්ලීම අනුමත කළා.



# නිධන් මිථ්‍යාව...

34 වන පිටුවෙන්

කර බැලූ විට රන් පුහුල් 140 ක්ද, රන් කඩු සිය ගණනක්ද, වරාගන් ලක්ෂ ගණනක්ද ඇතැයි දක්වා තිබෙන බව පෙනී ගියේය. නිධන් වදුල්වල සඳහන් මුසාවාදයේ තරම මෙයින්ම පැහැදිලි වේ. වදුල් කෘතිවල රන් කඩු රන් ඔටුනු ගැන සඳහන් වෙනත් පැරණි රජවරුන්ගේ කාලයේ මෙබදු දේ තැනවීම පවා මුළුමනින්ම තහනම්ව තිබූ බව නිධන් වදුල් කියවන්නෝ නොදතිනි.

මේ නිසා නිධන් වදුල්වල සඳහන් නිධන් වස්තුව යනු සම්පූර්ණ මිථ්‍යාවකි. නිධන් වදුල් දුර්ලභ වීමත්, පුස්කොළවල ඒවා ලියා තිබීමත්, රහසිගත ලෙස මෙම කෘති සමාජයේ පරිහරණය වීමත් නිසා මෙම කෘතිවලට කිසියම් ගුප්ත වැදගත්කමක් ආරෝපණය වී තිබේ. එහෙත් සත්‍ය තත්ත්වය නම් මෙම කෘති යනු තවත් එක්තරා සාහිත්‍ය කෘති විශේෂයක් විනා වස්තුව හෝ ධනය ලබා ගැනීම සඳහා මග කියන කෘති වර්ගයක් නොවීමයි. එබැවින් නිධන් වදුල් මිථ්‍යාවට මුලා වී පැරණි කඩ ඉම් ලකුණු කඩා බිඳ දමා නිධන් සෙවීමද මෝඩකමකි.

## නිධන් ලබාගත් බවට කෙරෙන බොරු ප්‍රචාර හා වංචාකාරී ව්‍යාපාරික කටයුතු

වර්තමාන සමාජයේ ඇතැම් පිරිස් නීති විරෝධී කටයුතුවලින් හා අයථා අන්දමින් මුදල් ඉපයීම් කරති. මත්කුඩු වෙළෙඳාම, හොර නෝට්ටු මුද්‍රණය, කොමිස් ගැනීම, වංචා කිරීම, හොරකම් හා මංකොල්ලකෑම් සිදු කිරීම ආදි කටයුතුවලින් මුදල් උපයන අය තුළ බහුල වශයෙන් මුදල් ගැවසෙතත් තමන් මුදල් උපයන මාර්ගය ඔවුන්ට සමාජයට හෙලිකළ නොහැක. එබඳු තැනැත්තන් හෝ කණ්ඩායම් තමන් නිධන් හෑරීමෙන් මුදල් උපයන බව සමාජයට ප්‍රචාරය කරති. එය වෙනත් පිරිස්ද නිධන් මිථ්‍යාවට යොමු වීමට තුඩුදෙන කරුණකි.

තවත් සමහර පිරිස් ඉතා සංවිධානාත්මකව පුරා වස්තු වැනි දේ තනා නිධන්වලින් ගත් දේ ලෙස රහසිගතව අලෙවි කරති. මෙසේ ව්‍යාජ ලෙස රන් ආලේප කර තැනවූ ඔටුන්නක් හා අඹ ගෙඩියක් නිධන් වස්තු ලෙස අලෙවි කර තිබෙනු මාධ්‍යවල පළ විය. මීට අමතරව ව්‍යාජ ලෙස රන් ආලේප කළ වරාගන් කාසි ආදියද නිපදවා අලෙවි කරති. ගල් බෝතල් මෙන් භාජන තනවා නිධන්වලින් ගත් හිරුරාජ, හෙණරාජ වැනි තෙල් වර්ග ලෙස මිනිසුන් මුලාකොට මුදල් ඉපයීම් කෙරේ. නිධන්වලින් ගත් දේ ලෙස දැක්වෙන මෙබඳු නිර්මාණවලට බොහෝ දෙනෙක් රැවටෙන අතර රහසිගතව කෙරෙන මෙම වෙළෙඳාම් නීතියේ රැහැනට අසුවනුයේ කලාතුරකිනි. නිෂ්පාදකයාගේ කූට බුද්ධිය හඳුනා ගැනීමට ගැනුම්කරුවාට විචාර බුද්ධිය නැතිතාක් මෙබදු වෙළෙඳාම් පවතිනු ඇත. එහෙත් මෙබදු දේ නිධන්වල ඇතැයි සිතීමත් එමගින් නිධන් සෙවීමට පෙළඹීමත් මහත්වූ මුලාවකි.

## ජනමාධ්‍ය ප්‍රචාර

පුරාවස්තු පිළිබඳ ජනමාධ්‍ය මගින් ගෙන යන ඇතැම් ප්‍රචාර නිධන් මිථ්‍යාවෙ ව්‍යාප්ත වීමට තඩුදෙන කරුණකි. දඹරන් පිළිම යනු මෙරට ජනමාධ්‍ය මගින් මැවූ පිළිම විශේෂයකි. ලෝකඩවලින් තනා රන් ආලේප කළ ප්‍රතිමා හැඳින්වීමට දඹරන් පිළිම යන නම මාධ්‍යවල යෙදේ. දඹ යනු ජම්බුවලට නමකි. දඹදිව යන්නට ජම්බුද්වීප යන නම ව්‍යවහාර වේ. දඹගල්ල, දඹදෙනිය වැනි ග්‍රාම නාම මෙරට පවතී. ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩමවන ලද්දේ ජම්බුකෝල තොටිනි. දඹරන් යනු ජම්බු නම් නදියෙහි ඇතිවූ රත්රන් ලෙස අර්ථ දැක්විය හැකිය. අතීතයේ දඹදිවින් ගෙනා රන් හැඳින්වීමට මෙම නම යෙදුනා විය හැකිය. එහෙත් වර්තමානයේ කිලෝ ගණන් බර ලෝකඩ පිළිම සඳහා කිසිදු විචාරයකින් තොරව මෙම නම යෙදේ. මෙසේ කිලෝ ගණන් බර රන් පිළිම තැනවීමේ කලාවක් අතීතයේ මෙරට පැවතුණේ නැත. දඹරන් පිළිම සමග මිල කළ නොහැකි යන වචනත් මාධ්‍යවල යෙදෙන හෙයින් නිධන් මිථ්‍යාව පැතිරෙන නිසා රන් ආලේපිත ලෝකඩ ප්‍රතිමාවලට සැනසිල්ලේ වැඩ සිටිමට ලංකාවේ ඉඩක් නොලැබේ.

පුරාවිද්‍යා කැණීමකින් කිසියම් පුරාවස්තුවක් හමුවූ විටත් අසීමිත වටිනාකමක් ඇති වස්තුවක් හමු වූ ලෙසින් මාධ්‍යවල එය ප්‍රචාරය වේ. කැණීමකින් යමක් ලැබුණු විට එයට සිදුවන හානිය අවම කිරීම සඳහා ඒ වටා දැවටී ඇති පස් ගල් සමගම සුරක්ෂිත ලෙස අසුරා අවශ්‍ය පිරිසිදු කිරීම්, පර්යේෂණ හා සංරක්ෂණ කටයුතු සඳහා රසායනාගාර වෙත යෑවේ. ඒ පිළිබඳව නිවැරැදි පුරාවිද්‍යා වාර්තාව එළිදැක්වීමට කලක් ගතවන අතර ජන මතය තුළ බලපැවැත්වෙන්නේ මාධ්‍ය ප්‍රචාරයයි. පුරා වස්තුවේ දැවටී ඇති අපද්‍රව්‍ය ඉවත් කර පිරිසිදු කළ විට එය කලින් ප්‍රමාණයට වඩා තරමක් කුඩාවට පෙනේ. එවිට කැණීමෙන් හමු වූ පුරාවස්තුව පුරාවිද්‍යාඥයන් මාරු කර ඇතැයි මාධ්‍ය ප්‍රචාරයක් යැවේ නම් ජනතාව ඉන් වික්ෂිප්තභාවයට පත්වේ.

වර්තමානයේ ඇතැම් මුද්‍රිත මාධ්‍යා වගකීමෙන් කටයුතු කළත් සමහර මාධ්‍ය නිධන් මිථ්‍යාව දිරිගන්වන ආකාරයේ ලිපි පළ කරයි. දැනට වසර කිහිපයකට පෙර එක්තරා මුද්‍රිත මාධ්‍යක සති 06 ක් පුරා නිධන් හෑරීම ඉදිරිමත් වන ආකාරයේ ලිපි පෙලක් පල කරනු ලැබීය. 1978 ට පෙර යුගයේ මුද්‍රිත මාධ්‍ය බොහෝමයක ශාස්ත්‍රීය සංවාදවලට හා ජනතාවගේ විචාර බුද්ධිය දියුණු කරන ලිපිවලට සැලකිය යුතු ඉඩක් වෙන් කෙරිණි. මෙසේ බලන විට ජනමාධ්‍ය ඓතිහාසික උරුමයන් පිළිබඳ පුවත් පල කිරීමේදී මාධ්‍යයේ පැවැත්ම ගැන පමණක් සලකා කටයුතු කළහොත් පුරාවස්තුවල පැවැත්ම අනතුරුදායක වන බව පෙනේ.

මෙම ලිපිය අවසන් කිරීමට මත්තෙන් ඓතිහාසික උරුමය රැක ගැනීම ගැනත් යමක් සඳහන් කළ යුතුවේ. අපි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට යටත්ව සිටින සමයේ ස්වදේශිකයන්ට දේශපාලන බලතල ඉල්ලා සිටින විට රටේ පරිපාලන කටයුතු ගෙන යෑමට ලාංකිකයන්ට අත්දැකීම් හෝ පුහුණුවක් නැතැයි අධිරාජ්‍යවාදීහු තර්ක කළහ. එබඳු අවස්ථාවල එවකට සිටි ඩී. බී. ජයතිලක, ඊ. ඩබ්. පෙරේරා හා ඩී. එස්. සේනානායක වැනි දේශපාලනඥයෝ මෙරට අතීත ශිෂ්ටාචාරයෙන් කොතෙකුත් උදාහරණ දක්වමින් අතීතයේ අපි යහපත් දේශපාලන සම්ප්‍රදායකින්ද, දියුණු ආර්ථික ක්‍රමයකින් හා උසස් සංස්කෘතියකින්ද පෝෂිත ජාතියක් වශයෙන් මනා අත්දැකීම් සම්භාරයක් ලබා ඇතැයි පෙන්වා දෙනු ලැබූහ. එසේ අතීත උරුමයන් පෙන්වා නිදහස ලබාගත් ජාතියක් වශයෙන් නිදහස ලැබී වසර 60 කටත් වැඩි කලක් ගත වන විට අපි එකී අතීත උරුමයට එරෙහිව යකඩ, කුළු ගෙඩි හා බැකෝ යන්ත්‍ර යොදා ගන්නේ නම් වසර 2500 ක උසස් සංස්කෘතියකින් අප ලැබූ ශික්ෂණය කුමක්දැයි ප්‍රශ්න කළ යුතු වේ. වර්තමානයේ පවතින ආකාරයට නිධන් මිථ්‍යාවට මුලා වී තවදුරටත් අපි රට පුරා පවතින පුරාවස්තු විනාශ කරතොත් අපිට වඩා දියුණු ලෝකයකට බිහිවන අනාගත පරපුර අපට ශාප කරනු නියතය. මේ නිසා අනාගත පරපුරේ එකී ශාපයෙන් මිදීම සඳහාවත් රටේ පුරාවස්තු ආරක්ෂා කිරීම සෑම පුරවැසියකුගේම යුතුකමකි.

පියදාස සිරිසේන මහතා තම සිංහල ජාතිය පුවත්පතේ ආදර්ශ පාඨය ලෙස තෝරා ගත්තේ ජෝන් මිල්ටන් කිවිඳුගේ පද්‍යයක සිංහල අනුවාදයකි. අතීත සංස්කෘතියත් වර්තමාන නිදන් මිථ්‍යාව හා පුරාවස්තු විනාශයත් දෙස බලන විට එම කවිය අදටත් ගැලපේ.

‘කොපමණ උසකින්ද අප වැටුණේ පහත
මෙකලම නොනැඟුණොත් තොපහට වෙයි විපත’




# WANT TO BE A DOCTOR?

THEN CONSIDER

## ALL SAINTS UNIVERSITY
SCHOOL OF MEDICINE




**416-839-6461**

LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA** **ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS



NOW **ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL**



**STUDY MEDICINE AT ALL SAINTS UNIVERSITY**

**CALL TO REGISTER:**
**1-866-602-9555 or 416-743-9222**

**For our 10th Anniversary in operation, All Saints University will offer 50% tuition fee scholarship plus an additional 25% interest free loan, which is payable at the end of the program. MCAT preparatory classes in Toronto will be of one year duration only (three semesters)**

## Saliroo Creations

All Your Publishing Needs
under one roof

### Graphics
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

### Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

### Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**
**Tel : 416 201 0628**



## French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,** B.A (Modern Languages), Dip (AFC)
**T.P - 647 824 1897**



## MARRIAGE PROPOSALS

Sister living in Toronto seeks an Educated partner (below 35 years), for her younger sister, Academically/professionally qualified, 30 year old, 5`6", B.Sc (Eng) at SLITT, MBA at University of Moratuwa, Working for a leading Telecommunication company in Colombo as a Senior Engineer IT and owns substantial assets.

Kindly contact at **Maheeka266@gmail.com**


## බිත්තර ගැන...

30 වන පිටුවෙන්

සුදුසු වේ. ඊට හේතුව 'සැල්මොනෙල්ලා' විෂ බීජය එහි ක්‍රියාකාරී වී තිබිය හැකි නිසයි. සැල්මොනෙල්ලා විෂ බීජය කුකුළන්ගේ අසූචි සමග මිශ්‍රව පවතින අතර ඇතැම් විට මෙය බිත්තර කටුව වටේ තැන්පත් වී තිබිය හැකියි. බිත්තර අමුවෙන් කෑමට ගැනීමේදී මොනයම් ආකාරයකින් හෝ මෙය ඔබගේ ශරීර ගත වුවහොත් පාචනය වැනි රෝගී තත්ත්ව දක්වා එය වර්ධනය විය හැකියි. සැල්මොනෙල්ලා විෂබීජය සෝදා පිරිසිදු කිරීමෙන් විනාශ කළ නොහැකි අතර එය විනාශ වන්නේ අධික රශ්නය ඇති වතුර තුළදී පමණක් බවද මතක තබාගත යුත්තකි.

බර වැඩෙහි යෙදෙන, ව්‍යායාමවල යෙදෙන පුද්ගලයකු දිනකට බිත්තර 2 ක් පමණ ආහාරයට එක් කර ගැනීම සුදුසු වුවත් කය වෙහෙසා වැඩපළ නොකරන අය දිනකට එක් බිත්තරයක් හෝ සතියකට බිත්තර 4 ක් පමණ ආහාරයට ගැනීම සුදුසු වේ. ක්‍රියාශීලීත්වයෙන් යුතු නිරෝගී දරුවකුට දිනපතා බිත්තරයක් දීම සුදුසු බව වෛද්‍ය නිගමනය වන අතර යම් රෝගී තත්ත්වයකින් හෝ ක්‍රියාශීලීත්වයෙන් අඩු දරුවකුට සතියකට බිත්තර 3 ක් පමණ ලබා දීම සෑහේ. විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන දරුවන්ට බිත්තර අත්‍යවශ්‍ය පෝෂණයක් ලබාදෙන්නක් බව සිහි තබාගත යුතුයි. වයස්ගත අයට දිරවීමේ අපහසුතා එතැයි යන බිය නිසා බිත්තර ලබාදීම සිදු නොකරන අවස්ථා අප දැක ඇත. එහෙත් එවැනි බියක් ඇති කරගත යුතු නැති අතර වයසට යෑමත් සමගම ප්‍රෝටීන අවශ්‍යතාව දැඩි වන අතර මාංශ පේශිවල හීන වී යන ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා බිත්තර ආහාරයට එක් කර ගැනීම ඉතාමත් සුදුසු වේ.

"මට කොලෙස්ටරෝල්නෙ. බිත්තර හොඳ නෑ" මෙවැනි කතා අප කොතෙකුත් අසා ඇත. මෙය ඇත්තක්ද?

බිත්තරවල කොලෙස්ටරෝල් නැතැයි පැවසිය නොහැක. සෑම බිත්තරයකම කොලෙස්ටරෝල් මිලිග්‍රෑම් 180-200 ත් අතර ප්‍රමාණයක් අන්තර්ගත වී ඇත. එහෙත් රතු මස්, බටර්, චීස් වැනි සෙසු ආහාර මෙන් කොලෙස්ටරෝල් වැඩි වීමක් බිත්තර ආහාරයට ගැනීමෙන් සිදු නොවන බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. එහෙත් මෙම තත්ත්වය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකියි. ඇතැම් අයගේ සිරුරේ අභ්‍යන්තර තරලවල පවතින කොලෙස්ටරෝල් මට්ටම වැඩි කිරීමට ආහාරවලින් පැමිණෙන කොලෙස්ටරෝල් බලපෑමක් සිදු කරන අතර ඇතැම් අයට එසේ සිදු නොවේ. විශේෂයෙන්ම කොලෙස්ටරෝල් ජීර්ණයට බලපෑම් එල්ල කළ හැකි ඇපෝලිෆෝ ප්‍රෝටීන සිරුරු තුළ පවතින පුද්ගලයන්ගේ ආහාරමය කොලෙස්ටරෝල් වැඩිවීමේ අවධානමක් පවතී.

බොහෝ අය බිත්තර ආහාරයට ගැනීමට බිය වන්නේ කොලෙස්ටරෝල් වැඩිවී හෘදයාබාධ ඇති වෙතැයි සිතන බැවිනි. මේ පිළිබඳව නැගෙනහිර ෆින්ලන්ත විශ්වවිද්‍යාලය මගින් කළ පර්යේෂණයක දැක්වෙන්නේ එසේ දිනපතා බිත්තරයක් ආහාරයට ගැනීමත් හෘදයාබාධත් අතර සම්බන්ධයක් නොමැති බවයි.

## 1953 අගෝස්තු...

38 වන පිටුවෙන්

### හර්තාලයේ දෝංකාරය

අනෙක් අතට හර්තාලය ඉක්මනින් අවසන් වුවද හර්තාලයේ දෝංකාරයෙන් රජය දෙදරා ගියේය. මෙහි ප්‍රතිඵල බලාපොරොත්තු වූවාට වඩා බරපතල විය. හර්තාලයෙන් පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටතටත් හඬක් නැගීමට වාමාංශික කොටස් සමත් වූහ. 1953 අගෝස්තු 18 වැනිදා මහජන ආරක්ෂක පනත් විවාදයේදී රජයට විරුද්ධව දැඩි ප්‍රහාරයක් එල්ල කළ වාමාංශික නායකයන් හර්තාලයේදී සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හමුදාවේ හා පොලිසියේ ප්‍රකෝපකාරී ක්‍රියාවලට විරුද්ධව ආත්ම ආරක්ෂාව පතා මහජනතාව දැක්වූ ප්‍රතිචාරයක් ලෙස හඳුන්වා දෙනු ලැබීය. හර්තාලයට හේතු වූ කරුණු පිළිබඳව විවාදයක් සැප්තැම්බර් පළමුවැනි දින පැවැත්විණි. එහිදී පොලිස් හා හමුදා වෙඩි පහරින් මියගිය ජීවිතවලට රජය වගකිව යුතු බවත් 1915 මෙපිට සිදු වූ විශාලතම මිනිස් ඝාතනය එය බවත් හඳුන්වා දෙනු ලැබීය. අගමැතිවරයාද දැඩි ලෙස දෝෂ දර්ශනයට භාජන කරනු ලැබීය.

1953 හර්තාලය කම්කරු පංතියේ ආර්ථික අරගලය දේශපාලන අරගලයක් දක්වා වර්ධනය වූ අවස්ථාවක් ලෙස සඳහන් කළ හැක. එහි ප්‍රතිඵලය වූයේ අග්‍රාමාත්‍යවරයා සිය තනතුරෙන් ඉල්ලා අස්වීමයිශ්‍රී සර් ජෝන් කොතලාවල මහතා අගමැති තනතුරට පත්වියශ්‍රී ඔහු විසින් මුදල් ඇමැතිවරයාව සිටි ජේ. ආර්. ජයවර්ධන මුදල් ඇමැති ධුරයෙන් ඉවත් කරනු ලැබූ අතර ඔහු කෘෂිකර්ම අමාත්‍ය ධුරයට පත් කළේය. ඔක්තෝබර් 13 වැනිදා සිට ශත 75 ක් වූ හාල් සේරුව ශත 55 දක්වා අඩු කරනු ලැබීය. 1956 මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ පරාජයට මඟ පෑදුනේ ආණ්ඩුවේ දුර්වල ස්වභාවය මෙම හර්තාලය මගින් හෙළිදරව් කිරීම නිසා බව වාමාංශික දේශපාලන විචාරකයන්ගේ අදහස විය.

## ආපසු හැරී...

40 වන පිටුවෙන්

ගැන කීවේ කාර්යාලයේ කාකාසට පමණය. කාර්යාලයක හොඳම මිතුරෝ නම් ඔවුහුය. සමහර දිනෙක පොලීකරු කාර්යාලය සාවියට පැමිණ ගොඩනැගිලි හත අටකට එහා තැනක සිටී. මම කාකාස අත මුදල යවමි.

"මොකක්ද සර් මේ වැඩේ තේරුම? දැන් රුපියල් සීයටත් වඩා පොලී විතරක් දීල තියනවනේ. ඔන්න ඔය රුපියල් සීය එකපාරට ගෙවල දාන්න. මම සර්ට සීයට දහය ගානේ සීයක් ගෙනත් දෙන්නම්"

ඔහු රුපියල් අනුවක් ගෙනත් දුන්නේය.

ඔහුද පොලියට මුදල් දෙන්නකු බව මා දැන ගත්තේ මාස කීපයකට පසුවය.

රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසාන වටයට තේරුණු 'බෝඩිංකාරයෝ' වේදිකා ගත කළ යුතු දිනයක්ද ලැබුවේය. මංගල දර්ශනයට පෙර දින සවස සිරිල් බී. මා සොයා පැමිණියේය.

"දැන් හෙට ෂෝ එක හරිනේ?" ඔහු ඇසුවේය.

"මම නාට්‍ය කරන්නේ නෑ"

"ඇයි?"

"ප්ලේ එකට ඩ්රොයින් රූම් සෙට් එකක් ඕන. සෙට් එකක් ගෙනැත් දීලා ප්ලේ එකෙන් පස්සේ ගෙනියන්නත් එක්ක රුපියල් විසි පහක් ඉල්ලනවා. මං ළඟ සල්ලි නැහැ. නාට්‍යය නොකර ඉඳිමු"

"රිචඩ් සල්ලි දේවි"

සිරිල් බී. ගොස් පැය කීපයකට පසු රිචඩ් මා සොයා පැමිණියේ ය.

"මොකද මේ නාට්‍යය පෙන්නන්නෙ නෑ කියන්නේ ? පිස්සුද? උඹ නාට්‍යය කරපන් වෙලාවට පුටු සෙට් එක ලැබෙයි"

රිචඩ් රුපියල් විසි පහ දුන්නේය. ඩ්රොයිං රූම් සෙට් එක වෙලාවට ලැබුණේය. අපේ කට්ටියේ සාමාජිකයකු වූ රිචඩ් ව්‍යාපාරිකයෙකි. ඔහු පංචිකාවත්තේ මීමැඩුම මෝටර් ස්පෙයාර් වෙළඳ සැල කරන හෙක්ටර් ද සිල්වාණෝගේ බාල සොහොයුරාය. ව්‍යාපාරයත් නාට්‍යයත් එකට නොයන නිසා නාට්‍ය ලෝකයෙන් ඈත් වීමට අපි ඔහු උනන්දු කෙළෙමු.

රුපියල් විසිපහ පිණිස පොලීකරු ළඟට නොගියේ ඔහු දුරු කරන්න යැයි පොලීකරු මට හඳුන්වා දුන් මිතුරා තවත් එහි නොයන්නැයි මට අවවාද කළ හෙයිනි. කාකාසගෙන් මුදල් ගැනීමටද මම මැලිවීමි.

'බෝඩිංකාරයෝ වේදිකා ගත විය'

අර කවුදෝ කීවාක් මෙන් සුරේන්ද්‍ර යකා මාර්ක් එකට රඟපෑවේය. බෝඩිංකාරයෝ 1962 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නිෂ්පාදනය පමණක් නොව හොඳම පිටපත ලෙසද සම්මානයෙන් පිදින.

**උපුටා ගැනීම - සුගතපාල ද සිල්වා අභිනන්දනය**

# Tutoring
## From Grade 08 to 12

| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | <u>Grade 12 Mathematics</u><br>Advance Functions<br>Limits<br>Calculus |
|---|---|

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

Experience and qualified teacher for excellent results

Contact
Kithsiri Jayasinghe
(BSc. , MSc. Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com
Phone: (416) 745-6675, (647) 705-1606



## If you are Buying or Selling
### For a Reliable Inspection

# Yohan De Mel
Certified Home Inspector



TEL:
416 885 4625

E-Mail
nirhanhomeinspections@gmail.com

**Nirhan Property Inspection Services**



# BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers

Any Document Shipping worldwide
DHL EXPRESS

AIR-SEA-LAND

## Household Goods & Commercial Cargo
## Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

| Warehouse In Colombo | Kurunegala Warehouse | Warehouse In Batticaloa |
|---|---|---|
| LAKSIRI SEVA (PVT) Lid<br>66 New Nuge Road,Peliyagoda<br>Kelaniya<br>Tel: 11-257-4180 | Laksiri Seva (PVT)Lid<br>118/96 Negombo Road<br>Malkaduwawa<br>Kurunegala<br>Tel : 037-2052-810 | LAKSIRI SEVA (PVT)Lid<br>26,Hmyl Lane<br>Main Street,Addapalam<br>Ninthavur<br>Tel : 0672051050 |

**Toronto: - 416-321-0400**

Proud member of
IAM International Association Of Movers
CIMC Canadian International Movers Club

**Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288**

Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525

Web:www.briskcargo.com Email: info@briskcargo.com

919 Ellesmere Road Suite # 306 M1P2W7

## පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා

■ ආරියපාල මුදලිගෙ

### එන්න එන්න විෂය කියා ලියාපන්

ඉතා පිටිසරබද පෙදෙසෙක වැදගත් වැන්දඹු කාන්තාවක් තම එකම පුතා සමඟ වාසය කළාය. කල් යෑමේදී පුත්‍රයා ලොකු මහත් බවට පත්ව රජයේ රැකියාවක් ලැබ නගරයේ වාසය සඳහා ගියේ මසකට වරක් පමණ තම මව බැලීමටද පැමිණියේය. ඒ ආසන්නයේම පදිංචිව සිටි ඉහත සඳහන් කතගේ බාල සහෝදරයාද ඇගේ සුවදුක් නිරන්තරව සොයා බැලීය.

දිනක් තම සොයුරිය බැලීමට පැමිණි ඔහුට පෙනී ගියේ ඇය මහත් වූ වේදනාවකින් පෙළෙන බවය. තොරතුරු විමසීමේදී කරුණු කාරණා දැනගත් සොයුරා ඇයට කළ හැකි ඇප උපස්ථාන කරන අතරේ පුතා බැලීමට අවශ්‍ය බව ඇය ඔහුට දැන්නුවාය. තමා කියන විධියට ලියුමක් ලියා තැපැල් කරන මෙන් ඇය ඔහුගෙන් ඉල්ලා සිටියේ පුත්‍රයා දැකීමට ඇති බලවත් ආශාව නිසාය.

පෑනක් හා ලියුම් කඩදාසියක් රැගත් සොයුරා තම සොයුරිය කියන දෙය අසමින් ඒ ආකාරයෙන්ම මෙසේ ලියුවාය.

'කැලේට රිඹ දාන්න ගිය ගෝන්දි කලාන්දුරුවෙක් ලෑටි ගෑවාය. එන්න එන්න විෂය කියා ලියාපන්'

තරමක් ළාමක මෝඩ පහේ පුද්ගලයකු වූ සොයුරා ලියුම ලියුවේද ඒ ආකාරයටමය. සහෝදරිය පුත්‍රයාට දැන්වීමට අදහස් කළේ මෙයයි.

'මලපහ කිරීමට (රිඹ දැමීම) කැලයට ගිය වේලාවේ (ගෝන්දි) විෂ සහිත කෘමියෙක් (කලාන්දුරුවෙක්) ඈට දෂ්ට කර ඇත. (ලෑටි ගෑම) දරුණු ලෙසට විෂ ක්‍රියාත්මක වන බව දන්වාපන්'

### යුද අවි තරගය

සෝවියට් අගමැති නිකිතා කෲෂෙව් මහතා ඇමරිකා එක්සත් ජනපදයේ සංචාරයක යෙදුණේ 1959 සැප්තැම්බරයේදීය. කෑම්ප් ඩේවිඩ් නිවාඩු නිකේතනයේදී ඇමරිකන් ජනාධිපති ඩී. ඩී. අයිසන්හවර් මහතා සමග සාකච්ඡා වට කීපයක්ම පැවැත්වීමට කෲෂෙව්ට හැකි විය. නිල නොවන සුහද සාකච්ඡාවකදී අයිසන්හවර් මහතා කෲෂෙව්ගෙන් පැනයක් ඇසීය.

"මට කියන්න කෲෂෙව්, ඔබ කොහොමද යුද කටයුතු සඳහා වන විය හියදම් සඳහා අරමුදල් ලබාගැනීම තීරණය කරන්නෙ?" කෲෂෙව් යමක් කීමට ප්‍රථම ජනාධිපතිවරයා මෙසේද කීවේය.

"පළමු කොට මමම කියන්නම්, අපි කොහොමද එය කරන්නෙ කියල"

"හොඳයි, කියන්න බලන්න" යි කෲෂෙව් කීවේය.

ජනාධිපතිවරයාගේ මුවගට සිනහවක් නැගුණි. ඒ අනුව කෲෂෙව්ද සිනහ විය.

"ඒක මෙහෙමයි වෙන්නෙ. මගේ යුද නායකයන් මා හමුවට පැමිණ, ජනාධිපතිතුමනි, අසවල් අසවල් වැඩ පිළිවෙළවල් සඳහා මෙච්චර මෙච්චර මුදලක් අවශ්‍යයි. අපට අරමුදල් නොලැබුණහොත් අප සෝවියට්කාරයන්ට දෙවෙනි වෙනවා. එවිට නිත්‍ය වශයෙන්ම ඔවුනට මුදල් ලැබෙනවා. ඔවුන් මගෙන් මුදල් කඩා ගන්නෙ එහෙමයි. ඔවුන් ඒ විධියට තව තවත් මුදල් කඩාගන්නවා. දැන් කියන්න ඔබේ විදිය?"

කෲෂෙව් තම කතාව පටන් ගත්තේය.

"ඔය වගේම තමයි. යුද දෙපාර්තමේන්තුවේ බලධාරීන් ඇවිත් කියනවා, කෲෂෙව් සහෝදරයා බලන්න මේක. ඇමරිකානුවන් අසවල් අසවල් වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරනවා. ඒකට අසවල් ප්‍රමාණයක වියදමක් දරන්න වෙනවා. මම ඔවුනට කියනවා සියලුම මුදල් බෙදා හදා දීලා ඉවරයි. මුදල් නෑ කියල. එතකොට ඒගොල්ල කියනවා,

අපට අවශ්‍ය මුදල් නොලැබී, යුද්ධයක් හෙම පටන් ගත්තොත් සතුරා අපට වඩා බලවත් වෙනවායි කියල. එවිට සාකච්ඡාව තවත් දුරදිග යනවා. අවසානයේ මම තවදුරටත් සිතා බලා ඔවුන්ගේ අවශ්‍යතාව පිරිමැහෙන පරිදි අරමුදල් දිය යුතු බවට තීරණයක් ගන්නවා. ඉන්පසු එම අදහස රජයට ඉදිරිපත් කරනවා. රජය එය අනුමත කරනවා"

## 2016 බසක වරුණ සිංහල භාෂා තරඟ සඳහා අයදුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

තරඟ අංකය :- ..................................

අයදුම්පත් අංකය :- ............................

නම :- ...........................................................................................

උපන් දිනය :- ...........................................................................................

වයස :- ...........................................................................................

ලිපිනය :- ...........................................................................................

ඊ-මේල් ලිපිනය :- ...........................................................................................

දුරකථන අංකය : නිවස :- ....................................... ජංගම :- ...................................

තරඟයේ නම :- ...........................................................................................

වයස් කාණ්ඩය - අදාළ වයස් කාණ්ඩයට ☑ සලකුණ යොදන්න.

6 - 8 ☐ 9 - 11 ☐ 12 - 15 ☐ 16 - 19 ☐ 20 න් ඉහළ ☐

දැනට ඉගෙනුම ලබන පාසල / විශ්වවිද්‍යාලය / විද්‍යායතනය :- ..............................................................

ශ්‍රේණිය/ වසර :- ...........................................................................................

මේ සමග ඉදිරිපත් කරනු ලබන කිර්මාණය මගේම නිර්මාණයක් බවද මා කැනඩාවේ ස්ථිර පදිංචිකරුවකු බවද ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවද සහතික කරමි.

තරඟ විනිශ්චය හා ත්‍යාග / සහතිකපත් ප්‍රදානය කිරීම පිළිබඳ තීරණ විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය බවට පිළිගන්නා බවටද තරඟ පැවැත්වෙන දිනට මාගේ වයස තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු බවද මෙම තරඟාවලිවය සඳහා අදාළ සියලුම කොන්දේසිවලට එකඟ වන බවද සහතික කරමි.

අත්සන :- ..............................................................

දිනය :- ..............................................................

මව/පියා/ භාරකරුගේ නම :-..............................................................

අත්සන :- ..............................................................

දිනය :- ..............................................................

සාමාජික සංගමය :- ..............................................................

දහම් පාසල :- ..............................................................

සිංහල පංතිය :- ..............................................................




ටොරොන්ටෝ - කොළඹ
SEAT SALE



June 15 - Aug 15

$1550 Included Tax

VMS TRAVELS & TOURS INC.

3351, Markham Road, Unit 137A, Toronto Ont, M1X 0A6
416 293 5800 | 1 888 655 5575 www.flytrips.ca
48 A , Dr. Lester James Peries Mawatha (Dickmans Road) Colombo 5
94 11 250 21 98

info@vmstravels.ca | www.flytrips.ca


srilanka
UNITED LANKAN FEST PRESENTS
FOOD
DANCE
MUSIC
SATURDAY, AUGUST 13TH 2016
Join us in sharing our Sri Lankan culture
10AM to 10PM.
50 vendors booths
Mel Lastman Square
5100 Yonge St, Toronto,
ON, Canada
Proud Sri Lankans are sharing their culture - food, dance
and music with our Canadian family and friends.

RE/MAX Diamond
Realty Inc., Brokerage
Independantly Owned and Operated




IT IS A FANTASTIC TIME TO
INVEST IN REAL ESTATE
LET ME HELP YOU GET STARTED!!



CALL DAN!
ATTANA KUMBURE GEDARA
SALES REPRESENTATIVE
Mobile: (647) 995-3391
Office: (416) 235-2500
danAKG.realtor@gmail.com
www.danakg.ca

RE/MAX Diamond Realty Inc. Brokerage
REALTOR®
MLS MULTIPLE LISTING SERVICE®

# BEYOND YOUR EXPECTATIONS !

**Residential & Commercial**

# Real Estate

proud sponsor of Children's Miracle Network

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



A member of CanLanka BUSINESS ASSOCIATION

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

RE/MAX 100% Club Award

2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award

2015, 2012

RE/MAX Diamond Realty Inc., Brokerage

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements